325 වන කාණ්ඩය - 14 වන කලාපය
தொகுதி 325 - இல. 14
Volume 325 - No. 14

2026 මාර්තු 20වන සිකුරාදා
2026 மார்ச் 20, வெள்ளிக்கிழமை
Friday, 20th March, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**


කථානායකතුමාගේ සහතිකය [තීරුව 2475]

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම [තීරුව 2475]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 2477-2518]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ආගමික නායකයින්ට නිකුත් කරන ලද නිල ගමන් බලපත්‍ර භාවිත කර සිදු කරන ලද සංචාර [තීරුව 2520]

සත්‍යය, වගවීම සහ සංහිඳියාව සහතික කිරීම සඳහා රජයේ මූලපිරීම [තීරුව 2522]

**කල්තැබීමේ යෝජනාව:**

වත්මන් ගෝලීය අර්බුදය හේතුවෙන් දේශීය ආර්ථිකයට වන බලපෑම [තීරු 2534-2648]


---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**


சபாநாயகரது சான்றுரை [ப: 2475]

பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர் பதிலீடு [ப: 2475]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 2477-2518]

**தனி அறிவித்தல் மூல வினா:**

சமயத் தலைவர்களுக்கு வழங்கப்பட்ட உத்தியோகபூர்வ கடவுச்சீட்டுகளைப் பயன்படுத்தி மேற்கொள்ளப்பட்ட விஜயங்கள் [ப: 2520]

உண்மை, பொறுப்புக்கூறல் மற்றும் நல்லிணக்கத்தை உறுதி செய்வதில் அரசாங்கத்தின் முன்முயற்சி [ப: 2522]

**ஒத்திவைப்புப் பிரேரணை:**

தற்போதைய உலகளாவிய நெருக்கடியால் உள்நாட்டுப் பொருளாதாரத்துக்கு ஏற்படும் பாதிப்பு [ப: 2534-2648]


---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:


Speaker's Certificate [Col. 2475]

Committee on Parliamentary Business: Substitution of Member [Col. 2475]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 2477-2518]

QUESTION BY PRIVATE NOTICE:

Visits Made Using Official Passports Issued to Religious Leaders [Col. 2520]

Government's Initiative on Ensuring Truth, Accountability and Reconciliation [Col. 2522]

ADJOURNMENT MOTION:

Effects of Current Global Situation on Our Economy [Col. 2534-2648]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මාර්තු 20වන සිකුරාදා***
*2026 மார்ச் 20, வெள்ளிக்கிழமை*
*Friday, 20th March, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 මාර්තු 20 දින, "ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරිය" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
### பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர் பதிலீடு
### COMMITTEE ON PARLIAMENTARY BUSINESS: SUBSTITUTION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3)හි විධිවිධාන ප්‍රකාරව, 2026 මාර්තු 19 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු කථානායකතුමනි, 2022/2023 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2024 වර්ෂය සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ
(ii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන.

මෙම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු කථානායකතුමනි, නැගම්පහ, කුඹුක්වැව, ගලේගොඩ යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එෆ්. සරත් සෝවිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු තුරෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ சபாநாயகர் அவர்களே, முல்லைத்தீவு, முள்ளியவளை, 1ஆம் வட்டாரம் எனும் முகவரியில் வதியும் திரு. ரத்தினம் ஜெகதீசனிடமிருந்து கிடைக்கப்பெற்ற மனுவைச் சமர்ப்பிக்கின்றேன்.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -24/2024- (1), ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### අටවන ජනාධිපතිවරයා යටතේ වූ ජනාධිපති ලේකම් කාර්යාලය: වාහන සංචිතය
### எட்டாவது சனாதிபதியின்கீழ் சனாதிபதி செயலகம்: வாகனக் குழுமம்
### PRESIDENTIAL SECRETARIAT UNDER EIGHTH PRESIDENT: VEHICLES IN THE POOL

121/2024

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ අටවැනි විධායක ජනාධිපතිවරයාගේ ධූර කාලය තුළ ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ තිබූ නිල වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන සංචිතයෙන් වෙනත් රාජ්‍ය ආයතන වෙත වාහන අනුයුක්ත කර තිබුණේද;

(iii) එසේ නම්, එම වාහන සංඛ්‍යාව කොපමණද;

(iv) 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති ජනාධිපතිවරණයෙන් පසු එම වාහන අතරින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත නැවත භාරදුන් වාහන සංඛ්‍යාව කොපමණද;

(v) භාරදුන් වාහන නැවත භාවිතයට ගෙන තිබේද;

(vi) නොඑසේ නම්, එම වාහන සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මේ වනවිට ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ ඇති නිල වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල වාහන භාවිතය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் எட்டாவது நிறைவேற்று அதிகாரமுடைய சனாதிபதியின் பதவிக் காலத்தில் சனாதிபதி செயலகத்தின் வாகனத்தொகுதியில் காணப்பட்ட உத்தியோகபூர்வ வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி வாகனத்தொகுதியிலிருந்து ஏனைய அரச நிறுவனங்களுக்கு வாகனங்கள் இணைக்கப்பட்டு இருந்தனவா என்பதையும்;

(iii) ஆமெனில், குறித்த வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) 2024ஆம் ஆண்டில் இலங்கையில் நடைபெற்ற சனாதிபதித் தேர்தலைத் தொடர்ந்து மேற்படி வாகனங்களில் சனாதிபதி செயலகத்துக்கு மீள ஒப்படைக்கப்பட்ட வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) அவ்வாறு ஒப்படைக்கப்பட்ட வாகனங்கள் மீளப் பயன்படுத்தப்படுகின்றனவா என்பதையும்;

(vi) இன்றேல், மேற்படி வாகனங்கள் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றளவில் சனாதிபதி செயலகத்தின் வாகனத் தொகுதியில் காணப்படுகின்ற உத்தியோகபூர்வ வாகனங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி உத்தியோகபூர்வ வாகனங்களின் பயன்பாடு தொடர்பான கொள்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of official vehicles available in the Presidential Secretariat vehicle pool during the tenure of the Eighth Executive President of Sri Lanka;

(ii) whether any vehicles from the aforesaid vehicle pool had been assigned to other State institutions;

(iii) if so, the number of such vehicles;

(iv) the number of vehicles returned to the Presidential Secretariat, out of the aforesaid total, following the conclusion of the 2024 Presidential Election in Sri Lanka;

(v) whether the vehicles returned have been utilized again; and

(vi) if not, what action will be taken regarding the vehicles?

(b) Will she also inform this House the -

(i) number of official vehicles currently available in the Presidential Secretariat vehicle pool; and

(ii) policy governing the use of the aforesaid official vehicles?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ලරගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 833කි.

(ii) ඔව්.

(iii) 60කි.

(iv) 8කි.

(v) ඔව්.

(vi) භාරගත් වාහන නැවත භාවිතයට ගෙන තිබේ.

(ආ) (i) 634කි.

(ii) ජනාධිපති කාර්යාලයේ රාජකාරි සඳහා භාවිත වේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

ගරු අගමැතිතුමියනි, මම (අ) (i) ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ, "ශ්‍රී ලංකාවේ අටවැනි විධායක ජනාධිපතිවරයාගේ ධුර කාලය තුළ ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ තිබූ නිල වාහන සංඛ්‍යාව කොපමණද?" කියලා. එය කීයද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
වාහන 833යි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
දැන් අහන්නයි හදන්නේ. මම ඒ ප්‍රශ්නයේම,-

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
සංචිතයේ තිබූ නිල වාහන සංඛ්‍යාව 833; මේ වන විට සංචිතයේ ඇති නිල වාහන සංඛ්‍යාව 634යි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
(අ) (i) නොවෙයි, (අ) (iv) ගැනයි ඊළඟට අහන්නේ. ඒ කියන්නේ, "2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති ජනාධිපතිවරණයෙන් පසු එම වාහන අතරින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙත නැවත භාර දුන් වාහන සංඛ්‍යාව කොපමණද?" කියන එක. ඒ වාහන 800 ගණනම භාර දීලා තිබෙනවා නේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
වාහන 8ක් ආපහු භාර දීලා නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
අටක් භාරදීලා නැද්ද? හොඳයි.

පිළිතුර ලබා දීම පිළිබඳව ගරු අගමැතිතුමියට මා ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ජනාධිපති ලේකම් කාර්යාලය සතුව වාහන 800ක සංචිතයක් තිබෙනවා. ඒ කියන්නේ, ජනාධිපතිවරයා සහ නිලධාරින් සතු වාහන. ගරු අගමැතිතුමිය, ඔබතුමිය දුන් පිළිතුරේ සඳහන් කළා, එම වාහනවලින් 8ක් නැහැ, අනෙක් සියල්ල පාවිච්චියට ගන්නවා කියලා. හැබැයි, ඔබතුමියගේ දකුණු අත පැත්තේ ඉන්න ඇමතිතුමා ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහ ඒ වාහන පෙළ ගස්වලා පෙන්නුවා. පෙන්නලා කිව්වා, ඒවා වෙන්දේසි කරනවා කියලා. ඒවා පාවිච්චියෙන් අයින් කරනවා කිව්වා. දැන් ඔබතුමියම මේ පිළිතුරේ කියනවා, ඒවා පාවිච්චියට ගන්නවා කියලා. නමුත් මේ ආණ්ඩුව ආරම්භයේදීම කිව්වා, ඒ වාහන අපි පාවිච්චියට ගන්නේ නැහැ කියලා. යම් සීමාවක් කරලා ඇති. නමුත්, ඔබතුමිය සඳහන් කරනවා, "වාහන 8ක් ආපහු භාර දීලා නැහැ, ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ තිබෙන නිල වාහන සියල්ල මේ වන විට භාවිතයට ගන්නවා" කියලා. මම ප්‍රශ්නයෙන් අහලා තිබුණා, "ඒවා භාවිතයට ගන්නවාද?" කියලා. ඔබතුමිය කියනවා, "ඔව්" කියලා.

ගරු කථානායකතුමනි, නමුත් සමාජගත වුණේ වෙනත් කාරණයක් නේ. "මේ අලුත් ආණ්ඩුව ඇවිල්ලා ජනාධිපතිවරයා ප්‍රමුඛ සියලු දෙනා වාහන පාවිච්චිය අඩු කළා. ඉන්ධන පාවිච්චිය අඩු කළා" කියන එක තමයි සමාජගත වුණේ. නමුත්, අපි පිළිතුරු ඉල්ලනකොට මෙතුමන්ලා කිව්ව ඒ දේ නොවෙයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඇයි, මේ ගරු අගමැතිතුමියනි? ඔබතුමිය වග කිවයුතු කෙනෙක්. අපි සාමාන්‍යයෙන් ගරු කරන, අලුත් දේශපාලන සම්ප්‍රදායක් හදන්න ආපු පක්ෂයක නායිකාව හැටියට මේ වාගේ අසත්‍ය ප්‍රකාශ කිරීම නිවැරදි කරන්න ඔබතුමිය හිට ගන්නේ කොහොමද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, දැනට පාවිච්චි වෙන්නේ වාහන 634යි. වාහන 833ක් තිබුණා. වාහන 200 ගණනක අඩු කිරීමක් කරලා තිබෙනවා. ඒ වාගේම වෙනත් රාජ්‍ය ආයතන වෙත අනුයුක්ත කරපු වාහන 60ත්, වාහන 8ක් තමයි ආපසු භාර දීලා තිබෙන්නේ. එතකොට, ඇත්තටම වාහන පාවිච්චිය අඩු කරලා තිබෙනවා. ඒක නේ, අපි පොරොන්දු වුණේ. අපි පොරොන්දු වුණා, අපේ සියලු අමාත්‍යාංශවල - ජනාධිපති කාර්යාලය ඇතුළුව - වාහන පාවිච්චිය අඩු කරනවා කියලා. ඒක අඩු කරලා තිබෙනවා. ඉතින් මට මෙතැනදී පරස්පරයක් තේරෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න තමයි හදන්නේ. පළමුවෙනි අතුරු ප්‍රශ්නයමයි අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙනි අතුරු ප්‍රශ්නයට පිළිතුර ලබා දුන්නා. දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

දෙවැනි අතුරු ප්‍රශ්නය තමයි අහන්නේ. කලබල වෙන්න එපා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ. මට තිබෙන්නේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඔබතුමා කලබලයි නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, නැහැ. කලබල නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට අහන්න තිබෙන්නෙත් ඒකම තමයි. මම ඇහුවේ මේකයි, ගරු අගමැතිතුමියනි. මම පළමුවෙනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ, ජනාධිපති ලේකම් කාර්යාලයේ වාහන සංචිතයේ වාහන කීයක් තිබෙනවාද කියලායි. එතකොට ඔබතුමිය කිව්වා, වාහන 800යි කියලා. හරි නේ. තත්පරයක්වත්, විනාඩියක්වත් ගියේ නැහැ, සම්පූර්ණ වාහන 800ක් තිබුණා කියලා ඔබතුමිය කිව්වා. මම ඔබතුමියගෙන් පැහැදිලි කර ගැනීමේදී කිව්වා, "8ක් ලැබිලා නැහැ" කියලා. එතකොට, ඉතිරි 700 ගණනක වාහන ප්‍රමාණය පාවිච්චියට ගන්නවා. ඇයි, මේ කියන දේවල් මොහොතින් මොහොත වෙනස් කරන්නේ? ඔබතුමිය පිළිගෙන තිබෙනවා, වාහන අටක් නැතුව අනෙක් ඔක්කෝම පාවිච්චි කරනවා කියලා. ඔබතුමිය නැවත කියනවා, "නැහැ, අපි 200 ගණනක් පාවිච්චියට ගන්නේ නැහැ" කියලා. ඔබතුමිය, "sorry" කියනවා. හැබැයි, අපි කියනවා මේ බොරු කියලා ඉස්සරහට ඔබතුමියට worry වෙන්න වෙනවා කියලා. ඔබතුමිය පිළිබඳව ජනතාව බලාපොරොත්තු තියාගෙන ඉන්න නිසා, "sorry" කිය කියා ඉන්න එපා, worry වෙන වැඩ ඉදිරියේදී වෙනවා. මේක නිවැරැදි කරලා කියන්න. විනාඩි දෙකකට කලින් කිව්වා, පාවිච්චියට ගන්නවා කියලා. දැන් කියනවා, වාහන 200ක් පාවිච්චියට ගන්නේ නැහැ කියලා. මේක පුදුම පට්ටපල් බොරු කියවිල්ලක් නේ, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මට නැවත වතාවක් මම කලින් දුන්න උත්තරයම තමයි කියන්න වෙන්නේ. වාහන 200 ගණනක භාවිතාව අඩු කරලා තිබෙනවා. ඒ දෙන උත්තරය අවබෝධ කරගන්න බැරි නම් මට කරන්න දෙයක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 3 -208/2024- (1), ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -231/2024- (1), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. ගිය අඟහරුවාදාත් මගේ ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ. අද හරි උත්තර දෙයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, මේක, මේ ප්‍රශ්නය අහන පළමුවැනි දවස. එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහන පළමුවැනි දවස නිසා උත්තර දෙන්නේ නැහැයි කියලා කියන්න බැහැ නේ. අපිත් වටිනා කාලය නාස්ති කරගෙන අද මේ සභාවට ඇවිල්ලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය අහන පළමුවැනි දවස නිසා උත්තර දෙන්න බැහැ කියලා කියන්න බැහැ නේ. වැඩ බැරි නම් යන්න ඕනෑ, ගරු කථානායකතුමනි. දූෂිත අය විතරක් නොවෙයි, වැඩ බැරි අයත් ඉන්නවා. වැඩ බැරි නම් යන්න ඕනෑ.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අද තමයි මේ ප්‍රශ්නය පළමුවැනි වතාවට අහන්නේ. ඒක නිසා එතුමාට එතැන point of Order එකක් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
උත්තර දෙන්න බැරි ඇයි?

## 2015දී වවුනතිව්හි ආරම්භ වූ නිවාස ව්‍යාපෘතිය: නිම කිරීම

2015இல் வவுணதீவில் ஆரம்பிக்கப்பட்ட வீட்டுத்திட்டம்: பூர்த்திசெய்தல்

HOUSING PROJECT IN VAVUNATIVU COMMENCED IN 2015: COMPLETION

356/2024

**5. ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ පැවති යහපාලන රජයේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් මඩකලපුව, මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වවුනතිව් හි නිවාස 50කට අධික සංඛ්‍යාවක් ඉදිකරන ලද බවත්;

(ii) ඒ අතරින් බොහෝමයක් නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් නොකර අඩුපාඩු සහිතව පවතින බවත්;

(iii) ඊට පසුව බලයට පත්වූ රජයන් විසින් එම නිවාසවල වැඩ කටයුතු අවසන් නොකළ බවත්;

(iv) ඒ හේතුවෙන් මේ වනවිට වර්ෂ 8කට වැඩි කාලයක් එම ජනතාව විවිධ දුෂ්කරතාවන්ට මුහුණදී සිටින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, ඉහත නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඉහත නිවාසවල වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට අපේක්ෂිත කාල වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் நல்லாட்சி அரசாங்கத்தின் வீடமைப்பு மற்றும் நிர்மாணிப்பு அமைச்சினால் மட்டக்களப்பு, மண்முனை மேற்குப் பிரதேச செயலாளர் பிரிவிலுள்ள வவுணதீவில் 50க்கும் மேற்பட்ட வீடுகள் நிர்மாணிக்கப்பட்டன என்பதையும்;

(ii) அதில் பெரும்பாலான வீடுகளின் நிர்மாணப் பணிகள் முழுமையாகப் பூர்த்திசெய்யப்படாத நிலையில் குறைபாடுகளுடன் உள்ளது என்பதையும்;

(iii) அதன் பின்னர் ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் குறித்த வீடுகளின் நிர்மாணப் பணிகளைப் பூர்த்திசெய்யவில்லை என்பதையும்;

(iv) அதன் காரணமாக, இன்றளவில் 8 வருடங்களுக்கும் மேலாக அந்த மக்கள் பல்வேறு இன்னல்களை எதிர்நோக்குகின்றார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், அந்த வீடுகளின் நிர்மாணப் பணிகளை முழுமையாகப் பூர்த்திசெய்வதற்கு நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

(ii) மேற்படி வீடுகளின் நிர்மாணப் பணிகள் முழுமையாகப் பூர்த்திசெய்யப்படும் காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Is he aware that -

(i) the Ministry of Housing and Construction of the Good Governance Government of 2015 constructed more than 50 houses in Vavunativu in Manmunai West Divisional Secretary's Division in Batticaloa;

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

(ii) construction work of most of the aforesaid houses remain incomplete and have various shortcomings;

(iii) the successive governments have not completed the construction of the aforesaid houses; and

(iv) as a result, the aforesaid people have been facing various difficulties for more than eight years?

(b) Will he inform this House -

(i) if so, whether steps will be taken to complete the construction work of the aforesaid houses; and

(ii) the time frame within which the construction work of the aforesaid houses will be fully completed?

(c) If not, why?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order. - *[Interruption.]* ගරු කථානායකතුමනි, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, කිසිම මන්ත්‍රීවරයෙකුට මයික් එක ලබා දීලා නැහැ. ඔබතුමාට point of Order එකකුත් නැහැ. කරුණාකර වාඩිවෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ඔබතුමා නිශ්ශබ්ද වෙනකම් ප්‍රශ්නයට උත්තරය කියවන්න විධියක් නැහැ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අධිකරණ ඇමතිතුමා අපහාසාත්මක අභිනයක් කළා. මම ඒ අභිනය නැවත පෙන්වන්නේ නැහැ, ඒක මට ගැළපෙන්නේ නැති නිසා. එතුමා ඒකට සමාව ගන්න ඕනෑ. මේ මන්ත්‍රීවරු ඔක්කෝම ඒක දැක්කා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මයික් එක ලබා දීලා නැහැ. *[බාධා කිරීම්]* එතුමාට මයික් එක ලබා දීලා නැහැ. මයික් එක නැතුව සභාව තුළ කරන සංවාද හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මෙතුමා ඇඟිල්ල මෙහෙම කරලා පෙන්නුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා හැන්සාඩ්ගත වෙන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කිසිම point of Order එකක් නැහැ. සභාව තුළ ඔය විධියට හැසිරෙන්න එපා. ඔය විධියට හැසිරෙන්න එපා කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order! *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා, ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න.

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ - වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ - නිවාස 885කින් සමන්විතව ආදර්ශ ගම්මාන 40ක් ඉදිකර ඇත.

සටහන : මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වවුනතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන දෙකම එකක් වේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91(උ) කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමා කිව්වා, මයික් නැතිව කථා කරන දේවල් හැන්සාඩ්ගත වන්නේ නැහැ කියලා. නමුත්, මයික් නැතිව අභින කරන්න පුළුවන් නේ. දැන් එතුමා අභිනයෙන් කරපු එක මම පෙන්වන්නම්. මමත් ඒක දැක්කා. ඒකට මයික් එක ඕනෑ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒවා හැන්සාඩ් වාර්තාවට යන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට පිළිතුර ලබා දෙන්න පුළුවන්. *[බාධා කිරීම්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කරුණාකර වාඩිවෙන්න.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට අදාළ පිළිතුරේ ඉතිරි කොටස මෙසේයි.

(ii) ඔව්.

එයින් නිවාස 270ක වැඩ සම්පූර්ණයෙන්ම නිම කර ඇති අතර, වැඩ අවසන් නොකරන ලද නිවාස සඳහා ප්‍රතිපාදන වෙන් වන ආකාරයට ඉතිරි නිවාසවල වැඩ අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(iii) ඔව්.

වැඩ අවසන් කිරීමට ඇති ඉතිරි නිවාසවල වැඩ අදියරගතව ප්‍රමුඛතා පදනමක් මත ඉදිරි වර්ෂ 03ක පමණ කාලයක් තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව මෙම වර්ෂය තුළ නිවාස 136ක් සහිත ආදර්ශ ගම්මාන 06ක වැඩ අවසන් කිරීම සඳහා කටයුතු යොදා ඇති අතර, මන්මුනෙයි බටහිර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස 48කින් යුත් ආදර්ශ ගම්මාන 02ක් ද ඒ අතර වේ.

(iv) ඔව්.

මේ සම්බන්ධයෙන් දැනටමත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වෙත යෝජනා ලබා දී ඇති අතර, වැඩ අවසන් නොකළ නිවාස ඉදිකිරීම සඳහා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට ඇති වැඩසටහනක් ලෙස කච්චේරියේ පස් අවුරුදු සැලැස්මට ද ඇතුළත් කර ඇත. *[බාධා කිරීමක්]*

(ආ) (i) ඔව්.

2026 වර්ෂයේදී මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආදර්ශ ගම්මාන 02ක ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු යොදා ඇත. වර්ෂ 03ක් වැනි කාල පරිච්ඡේදයක් තුළ

අර්ධ වශයෙන් ඉදිකර ඇති මෙම නිවාස සියල්ලෙහිම වැඩ අවසන් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ඉල්ලා ඇති අතර, එම ප්‍රතිපාදන ලැබෙන පරිදි වාර්ෂිකව වැඩසටහන ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇත.

(ii) ඔව්.

2025 වර්ෂයේදී ආදර්ශ ගම්මාන 8ක් සඳහා අනුමැතිය ලැබුණු අතර, ඒවායේ ඉදිකිරීම් කටයුතු නිම කර ඇත. එලෙසම, 2026 වසර සඳහා ද ආදර්ශ ගම්මාන 6ක නිවාස 136ක් සඳහා අනුමැතිය ලැබී ඇති හෙයින්, ඒවායේ ඉදිකිරීම් කටයුතු මේ වසර තුළ නිම කිරීමට බලාපොරොත්තු වේ. අනාගතයේදී ද ඉතිරි ගම්මානවල වැඩ නිම කිරීම සඳහා අනුමැතිය ලබා දෙන්නේ නම්, ඒවායේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට ද හැකියාව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය ඇසීමට පෙර මම කියන්න ඕනෑ, අපේ මේ ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට උත්තර දුන්නා නම්, මේ ප්‍රශ්න ඇති වෙන්නේ නැති බව. ඒ කාරණය මම කියන්න ඕනෑ, මේ ඇමතිතුමන්ලාට.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඒකටත් ඉතින්, මගේ ප්‍රශ්නයට දීපු උත්තරයෙන් සියයට 50ක්ම ඇහුණේත් නැහැ නේ, ගරු කථානායකතුමා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොඳයි මම අහන්නම්. උත්තරයෙන් සියයට 50ක් ඇහුණේත් නැහැ. ඒ වුණත්, උත්තරය ආපහු කියන්න කියලා මම කියන්නේත් නැහැ. ඔබතුමා පොඩ්ඩක් මේ සභාව පාලනය කරලා, මේ මන්ත්‍රීවරුන්ට කථා කරන්න තත්පරයක්, දෙකක් ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා headphone එක පාවිච්චි කළ නිසා ඔබතුමාට උත්තරය ඇහෙන්න ඇති කියලා මම හිතනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

හොඳයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවට තේරී පත් වුණේ, 2020 වසරේදී. நான் முதன் முறையாக பாராளுமன்றத்துக்கு 2020ஆம் ஆண்டு தெரிவு செய்யப்பட்டேன். அந்தக் காலப்பகுதி யிலிருந்து இன்றுவரை மட்டக்களப்பு மாவட்டத்திலுள்ள வீடமைப்பு அதிகாரசபை யுடன் சம்பந்தப்பட்ட பிரச்சினைகள் பற்றி தொடர்ச்சியாகப் பேசி வருகிறேன். கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் வீடமைப்பு அமைச்சராக இருந்தபொழுது, வடக்கு, கிழக்கில் வீடமைப்பு அதிகாரசபை ஊடாக அதிகளவான திட்டங்களைக் கொண்டுவந்தார். 2020ஆம் ஆண்டு கோட்டாபய அரசாங்கம் வந்ததற்குப் பிறகு, வெறுமனே சஜித் பிரேமதாஸ அவர்களால் கொண்டுவரப்பட்ட வேலைத்திட்டங்கள் என்பதற்காக, வீடமைப்பு அதிகாரசபையால் முன்னெடுக்கப்பட்ட அந்த வேலைத்திட்டங்களை அப்படியே முழுமையாக நிறுத்தி னார்கள். 2024ஆம் ஆண்டு உங்களுடைய அரசாங்கம் வந்ததற்குப் பிறகும் நீங்கள் "கிராமத்துக்கு ஒரு வீட்டுத்திட்டம்" என்ற அடிப்படையில் வேலைத்திட்டமொன்றை முன்னெடுக் கின்றீர்கள். கிராமங்களில் ஒரு வீடு, இரண்டு வீடு என்று கட்டுகின்றீர்கள். ஆனால், மட்டக்களப்பு மாவட்டத்தில் 133க்கும் அதிகமான model villages திட்டங்கள் இதுவரை முழுமையாகப் பூர்த்தியடையாத நிலையில் இருக்கின்றன. 3,000க்கும் அதிகமான வீடுகள் foundation மட்டம், lintel மட்டம், கூரை மட்டம் என்ற நிலையில் இருக்கின்றன. வடக்கு, கிழக்கில் வீடு இல்லாதவர்களே இதன் பயனாளிகளாகத் தெரிவு செய்யப்பட்டு இருக்கிறார்கள். அவர்கள் 6-10 ஆண்டுகள் கடந்தும் இன்னும் கடனாளிகளாகவே இருக்கின்றார்கள்.

நீங்கள் வழங்கிய பதிலிலும் விளக்கமாகச் சொல்லி யிருந்தீர்கள், இந்த வீடுகளைப் பூர்த்திசெய்வதற்கு Treasuryஇடமிருந்து நிதி கோரியிருப்பதாக. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இதைச் சொல்வதற்கு ஓர் அமைச்சர் தேவையா? என்ற கேள்வி என்னுடைய மனதில் எழுகின்றது. வீடமைப்பு பிரதி அமைச்சராக இருக்கின்ற நீங்கள் சொல்ல வேண்டும், "இந்த வருடம் இத்தனை கோடி எங்களுடைய அமைச்சுக்கு ஒதுக்கப்பட்டு இருக்கின்றது; 3,300 வீடுகளைக் கட்டிமுடிக்க வேண்டி இருக்கின்றது; 2026ஆம் ஆண்டில் 1,000 வீடுகளைக் கட்டி முடிப்போம்; 2027இல் இன்னும் 1,000 வீடுகளைக் கட்டி முடிப்போம்; 2028இல் இன்னும் 1,000 வீடுகளைக் கட்டி முடிப்போம்; 2029ஆம் ஆண்டு எங்களுடைய ஆட்சிக் காலம் முடிவடைவதற்குள் 3,300 வீடுகளையும் கட்டி முடிப்போம்" என்று. அப்படிச் சொன்னால், இந்தக் கேள்வி எழாது!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය අහන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

අහනවා.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக கேள்வியைக் கேட்கின்றேன்.

உங்களுடைய ஆட்சிக் காலத்திலாவது இந்த வீடுகளை நிறைவுசெய்யும் வகையில், எங்களுக்கு work plan ஒன்றையும் time schedule ஒன்றையும் தாருங்கள்! அதாவது, இந்த மாதம் இதைச் செய்வோம், அடுத்த ஆறு மாதங்களுக்குள் இதைச் செய்வோம் என்று. இல்லாவிட்டால், எங்களுடைய வடக்கு, கிழக்குப் பிரதேசத்திலுள்ள இந்த மக்கள் தொடர்ந்தும் கடனாளிகளாகவே வாழ வேண்டிய நிலை ஏற்படும்.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය පැහැදිලියි. 2015-2019 කාල වකවානුවේ රට පුරාම ඔබතුමා කියන ආකාරයේ නිවාස 40,000කට වැඩි ප්‍රමාණයක් මුල්ගල් තබා, සමහර ඒවායේ අත්තිවාරම් මට්ටමට, සමහර ඒවායේ බිත්ති මට්ටමට හදලා තිබෙනවා. එක් එක් මට්ටමේ තිබෙන නිවාස 40,000ක් පමණ තිබෙනවා. ඔබතුමා අහන ප්‍රශ්නයට අදාළ ප්‍රදේශයේ නිවාස 855ක් තිබෙනවා. ඉන්, නිවාස 270ක් අපි පසුගිය අවුරුද්දේ හදලා අවසන් කළා.

මේ අවුරුද්දේ අපි තවත් නිවාස 136ක් හදලා අවසන් කරනවා. ඉතිරි අවුරුදු 3 ඇතුළත ඔබතුමා අහන මේ බල ප්‍රදේශයේ තිබෙන මේ නිවාස ටික හදලා අවසන් කරන්න අපි සැලැස්මක් හදලා තිබෙනවා. ඒ අනුව ඉදිරි අවුරුදු 3 අවසාන වනකොට ඔබතුමා අහන අදාළ ප්‍රදේශයේ නිවාස අටසිය ගණන හදලා අවසන් කිරීමේ සැලැස්මකට අනුව තමයි අපි කටයුතු කරමින් ඉන්නේ. මේ අවුරුද්දේත් අදාළ ග්‍රාම නිලධාරි වසම්වලට අයත් ගම්මාන 6ක තිබෙන නිවාස 136ක වැඩ අවසන් කරනවා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! வவுணதீவு, வாகரை போன்ற பிரதேசங்கள் அதிகளவு கஷ்டத்தில் வாழுகின்ற மக்கள் உள்ள பிரதேசங்கள் என்ற அடிப்படையில், இந்த விடயத்தில் கூடுதல் கவனத்தைச் செலுத்துமாறு கேட்டுக் கொள்கின்றேன்.

என்னுடைய இரண்டாவது மேலதிக கேள்வியை கௌரவ துரைராசா ரவிகரன் அவர்கள் கேட்பார்.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நல்லாட்சி அரசாங்க காலத்தில் தேசிய வீடமைப்பு அதிகாரசபையால் வன்னிப் பிரதேசத்திலும் - முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங் களிலும் - வீடுகள் கட்டப்பட்டன. தற்பொழுது, அவை அரைகுறையில் இருக்கின்றன. அங்குள்ள மக்கள் மிகவும் நொந்துபோயுள்ள மக்கள்; வறுமையால் வாடிக்கொண்டு இருக்கின்ற மக்கள்! வன்னியில் இறுதி யுத்தம் மோசமாக நடைபெற்றது உங்களுக்குத் தெரியும்! அவர்கள் அந்த வீடுகளை முழுமையாகக் கட்டிமுடிக்க முடியாமல் இப்பொழுதும் அலைந்துதிரிந்து கொண்டு இருக்கின்றார்கள். அவர்கள் பணத்துக்குப் படும்பாடு பெரும்பாடு! கடன்பட்டுத் தாங்களாகச் சில வேலைகளைச் செய்தாலுங்கூட, அந்த வீடுகளைக் கட்டிமுடிக்க முடியாமல் இருக்கின்றார்கள். எனவே, அந்த வீடுகள் கட்டிக் கொடுக்கப்படுமா, இல்லையா?

என்பதை நீங்கள் தயவுசெய்து சொல்ல வேண்டும். உங்களுடைய அரசாங்க காலத்தில் இது நிச்சயமாகச் செய்யப் படுமென நாங்கள் நம்புகின்றோம்; மக்களும் நம்புகின்றார்கள். தயவுசெய்து, நீங்கள் இதைச் செய்துதர வேண்டும் என்றுதான் நாங்கள் கேட்கின்றோம். அதற்கான பதிலை உங்களிடம் எதிர்பார்க்கின்றேன்.

**ගරු ටී.බී. සරත් මහතා**
(மாண்புமிகு ரீ.பி. சரத்)
(The Hon. T.B. Sarath)

ඔබතුමා එම ප්‍රශ්නය ඇහුවාට ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. අපි මේ අවුරුද්දේ උතුර, නැඟෙනහිර පවුල් යළි පදිංචි කිරීමේ නිවාස ක්‍රමය යටතේ නිවාස 2,500ක් ඉදිකිරීම වෙනුවෙන් මුදල් වෙන් කර තිබෙනවා. එක නිවාසයක් සඳහා මෙතෙක් ලබා දීපු රුපියල් ලක්ෂ 9 සහ රුපියල් ලක්ෂ 15 වෙනුවට ජනාධිපතිතුමා විශේෂ අවධානයක් යොමු කරලා, ඒ ප්‍රදේශයේ නිවාසවලට රුපියල් ලක්ෂ 10 නොවෙයි, රුපියල් ලක්ෂ 20ක් ලබා දෙන්න කියන පණිවුඩය අපට ලබා දීලා තිබෙනවා. ඒ අනුව රුපියල් ලක්ෂ 20 ගාණේ එක නිවාසයකට ලබා දෙමින් පවුල් යළි පදිංචි කිරීමේ නිවාස ක්‍රමය යටතේ නිවාස 2,500ක් හදන්නත්, ඉදිරි අවුරුදු තුන ඇතුළත ඒ අදාළ ප්‍රදේශවල ඉතුරු නිවාස සියල්ල සකස් කර අවසන් කරන්නත් වැඩ පිළිවෙළක් උතුරු ප්‍රදේශයේත් අපි සකස් කර තිබෙනවා.

ඒ වාගේම වන්නි ප්‍රදේශයේත් ඒ යටතේ නිවාස ඉදිකිරීම සඳහා මුදල් වෙන් කර තිබෙනවා. ඉදිරි වසර තුන ඇතුළත උතුරු, නැඟෙනහිර තිබෙන මේ ප්‍රශ්නයට සම්පූර්ණයෙන්ම අදාළ විසඳුමක් ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීමේ කටයුතු අපි අමාත්‍යාංශය මඟින් මෙහෙයවමින් සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! I wish to welcome the Romanian Ambassador and the Delegation from Romania in the Speaker's Gallery.

## සීනි, කිරි පිටි, පරිප්පු, සහල්, තිරිඟු පිටි සහ පොල් පරිභෝජනය: විස්තර

சீனி, பால்மா, பருப்பு, அரிசி, கோதுமை மா மற்றும் தேங்காய் நுகர்வு: விபரம்
CONSUMPTION OF SUGAR, MILK POWER, DHAL, RICE, WHEAT FLOUR AND COCONUT: DETAILS

465/2025

**6. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අද වනවිට ශ්‍රී ලංකාවේ සීනි, කිරි පිටි, පරිප්පු, සහල්, තිරිඟු පිටි සහ පොල්වල මුළු පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේ ඉහත අයිතමවල පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) සහ (ii) අනුව ඒක පුද්ගල පරිභෝජනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය සහ ආනයනය කරන ලද ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයේ ආනයන වටිනාකම ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයෙන් අය කරන ලද ආනයන බදු ප්‍රමාණය කවරේද;

(vii) ඉහත (i)හි සඳහන් එක් එක් අයිතමයේ තීරු බදු ඇතුළුව මිල කවරේද;

(viii) ඉහත සඳහන් එක් එක් අයිතමයේ නිෂ්පාදන පිරිවැය සහ සිල්ලර මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ix) ශ්‍රී ලංකාවේ ඉහත අයිතමවල නිෂ්පාදන පිරිවැය අතර සැලකිය යුතු වෙනසක් ඇති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இன்றளவில் இலங்கையில் சீனி, பால்மா, பருப்பு, அரிசி, கோதுமை மா, தேங்காய் ஆகியவற்றின் மொத்த நுகர்வு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேலுள்ள பொருட்களின் ஒவ்வோர் ஆண்டுக்கு மான நுகர்வு 2010ஆம் ஆண்டிலிருந்து இன்று வரை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேலுள்ள (i) மற்றும் (ii) இன் பிரகாரம் தனிநபர் நுகர்வு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேலே (i) இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு பொருளினதும் இலங்கையில் உற்பத்தி செய்யப் பட்ட அளவு மற்றும் இறக்குமதி செய்யப்பட்ட அளவு ஆகியவற்றை வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(v) மேலே (i) இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு பொருளினதும் இறக்குமதிப் பெறுமதியை அமெரிக்க டொலர் மற்றும் இலங்கை ரூபாயில் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(vi) மேலே (i) இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு பொருள்மீதும் விதிக்கப்பட்ட இறக்குமதித் தீர்வை எவ்வளவு என்பதை வெவ்வேறாகவும்;

(vii) மேலே குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு பொருளி னதும் தீர்வை உள்ளடங்கலான விலை எவ்வளவு என்பதையும்;

(viii) மேலே (i) இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு பொருளினதும் உற்பத்திச் செலவு மற்றும் சில்லறை விலை ஆகியன எவ்வளவு என்பதை வெவ்வேறாகவும்;

(ix) இலங்கையில் மேலுள்ள பொருட்களின் உற்பத் திச் செலவுக்கிடையில் காணப்படும் குறிப்பிடத் தக்க வேறுபாட்டுக்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු රවී කරුණානායක මහතා]

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) total consumption of sugar, milk powder, dhal, rice, wheat flour and coconut in Sri Lanka as at today, separately;

(ii) consumption of the above items in each year from 2010 to date, separately;

(iii) per capita consumption as per (i) and (ii) above, separately;

(iv) quantity produced in Sri Lanka and the quantity imported relating to each item mentioned in (i) above, separately;

(v) import value of each item mentioned in (i) above, separately both in US Dollars and Sri Lankan Rupees;

(vi) Import Duty levied on each item mentioned in (i) above, separately;

(vii) duty inclusive price of each item mentioned above;

(viii) cost of production and retail price of each item mentioned above, separately; and

(ix) reasons for the significant difference between the cost of production of the above items in Sri Lanka?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

- කිරි පිටි හැර අනෙකුත් ආහාර ද්‍රව්‍යවල වාර්ෂික ගෘහස්ථ පරිභෝජනය - household consumption - පහතින් දැක්වේ.

| අනු අංකය | අයිතමය | මුළු පරිභෝජනය |
|---|---|---|
| 1. | සීනි (මෙට්‍රික් ටොන්) | 270,000 |
| | පරිප්පු (මෙට්‍රික් ටොන්) | 170,500 |
| 2. | කඩල පරිප්පු | 5,800 |
| | මයිසූර් පරිප්පු | 162,900 |
| | වටානා පරිප්පු | 1,800 |
| | සහල් (මෙට්‍රික් ටොන්) | 2,205,900 |
| | සුදු කැකුළු සාමාන්‍ය | 393,700 |
| | සුදු කැකුළු සම්බා | 49,400 |
| | රතු කැකුළු සාමාන්‍ය | 527,200 |
| 3. | රතු කැකුළු සම්බා | 23,000 |
| | සම්බා | 344,100 |
| | රතු නාඩු | 77,100 |
| | සුදු නාඩු | 744,300 |
| | බාස්මතී | 4,500 |
| | වෙනත් | 42,600 |
| 4. | තිරිඟු පිටි (මෙට්‍රික් ටොන්) | 129,600 |
| 5. | පොල් (ගෙඩි මිලියන) | 1,495.15 |

- පොල් හැර අනෙකුත් අයිතමයන්ගේ 2025 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ වාර්ෂික ගෘහස්ථ පරිභෝජනය දක්වා ඇති අතර පොල් සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් යොමු කරන ලද මුළු පරිභෝජනය දක්වා ඇත.

- පොල් හැර ඉහත අයිතමයන්ගේ වාර්ෂික අවශ්‍යතාව පහතින් දක්වා ඇත.

| අනු අංකය | අයිතමය | වාර්ෂික අවශ්‍යතාව (මෙට්‍රික් ටොන්) |
|---|---|---|
| 1. | සීනි | 540,000 |
| 2. | කිරිපිටි ( සම්පූර්ණ යොදය සහිත) | 72,000 |
| 3. | පරිප්පු | 180,000 |
| 4. | සහල් | 2.7 (මිලියන) |
| 5. | තිරිඟු පිටි | 720,000 |

(ii)

**කිරිපිටි හැර අනෙකුත් ආහාර ද්‍රව්‍යවල වාර්ෂික ගෘහස්ථ පරිභෝජනය (Household Consumption) පහතින් දැක්වේ.**

| අනු අංකය | වර්ෂය | පරිභෝජනය | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පරිප්පු (මෙ. ටො.) | | | සහල් (මෙ. ටො.) | | | | | | | | | | |
| | | සීනි (මෙ. ටො.) | කඩල පරිප්පු | මයිසූර් පරිප්පු | වටානා පරිප්පු | සුදු කැකුළු සාමාන්‍ය | සුදු කැකුළු සම්බා | රතු කැකුළු සාමාන්‍ය | රතු කැකුළු සම්බා | සම්බා | රතු නාඩු | සුදු නාඩු | බාස්මතී | වෙනත් | තිරිඟු පිටි (මෙ. ටො.) | පොල් (ගෙඩි මිලියන) |
| 1. | 2010 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,568.73 |
| 2. | 2011 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,855.67 |
| 3. | 2012 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,872.60 |
| 4. | 2013 | 274,400 | 3,800 | 139,000 | 1,900 | 459,600 | 57,800 | 479,100 | 24,900 | 355,200 | 90,200 | 724,800 | 2,500 | 26,300 | 139,400 | 1,826.04 |
| 5. | 2014 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,829.76 |
| 6. | 2015 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,573.80 |
| 7. | 2016 | 269,400 | 5,600 | 148,500 | 1,800 | 410,000 | 54,800 | 507,500 | 22,800 | 335,700 | 79,600 | 762,500 | 4,200 | 39,000 | 129,600 | 1,786.70 |
| 8. | 2017 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,655.51 |
| 9. | 2018 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,793.83 |
| 10. | 2019 | 270,600 | 5,800 | 163,300 | 1,800 | 394,500 | 49,500 | 528,300 | 23,000 | 344,800 | 77,300 | 745,900 | 4,500 | 42,700 | 129,900 | 1,806.91 |
| 11. | 2020 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,826.15 |
| 12. | 2021 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,832.53 |
| 13. | 2022 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,848.08 |
| 14. | 2023 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,849.81 |
| 15. | 2024 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,414.01 |
| 16. | 2025 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,495.15 |

- **පොල් හැර අනෙකුත් අයිතමයන්ගේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කළ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය 2012/13, 2016 හා 2019 සමීක්ෂණ වර්ෂ සඳහා ඇස්තමේන්තු කළ වාර්ෂික පරිභෝජනය දක්වා ඇත.**

(iii)

ඉහත (i) සහ (ii) අනුව කිරිපිටි හැර අනෙකුත් ආහාර ද්‍රව්‍යවල වාර්ෂික ගෘහස්ථ පරිභෝජනය (Household Consumption) අනුව ඒක පුද්ගල පරිභෝජනය පහතින් දැක්වේ.

| අනු අංකය | වර්ෂය | ඒක පුද්ගල පරිභෝජනය (මාසික) | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පරිප්පු (ග්‍රෑම්) | | | සහල් (ග්‍රෑම්) | | | | | | | | | | |
| | | සීනි (ග්‍රෑම්) | කඩල පරිප්පු | මයිසූර් පරිප්පු | බටානා පරිප්පු | සුදු කැකුළු සාමාන්‍ය | සුදු කැකුළු සම්බා | රතු කැකුළු සාමාන්‍ය | රතු කැකුළු සම්බා | සම්බා | රතු නාඩු | සුදු නාඩු | බාස්මති | වෙනත් | තිරිඟු පිටි (ග්‍රෑම්) | පොල් (ගෙඩි) වාර්ෂික |
| 1. | 2010 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 76 |
| 2. | 2011 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 89 |
| 3. | 2012 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 89 |
| 4. | 2013 | 1,110.93 | 15.46 | 562.53 | 7.77 | 1,860.73 | 233.92 | 1,939.68 | 100.87 | 1,437.97 | 365.04 | 2,934.27 | 10.32 | 106.40 | 564.40 | 89 |
| 5. | 2014 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 88 |
| 6. | 2015 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 89 |
| 7. | 2016 | 1,058.43 | 22.03 | 583.40 | 7.13 | 1,610.79 | 215.35 | 1,994.22 | 89.46 | 1,319.05 | 312.71 | 2,996.04 | 16.37 | 153.06 | 509.21 | 84 |
| 8. | 2017 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 77 |
| 9. | 2018 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 83 |
| 10. | 2019 | 1,034.31 | 22.23 | 623.97 | 77.07 | 1,507.86 | 189.17 | 2,019.22 | 87.94 | 1,317.86 | 295.39 | 2,850.79 | 17.20 | 163.26 | 496.56 | 83 |
| 11. | 2020 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 83 |
| 12. | 2021 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 83 |
| 13. | 2022 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 83 |
| 14. | 2023 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 84 |
| 15. | 2024 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 75 |
| 16. | 2025 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 80 |

- පොල් හැර අනෙකුත් අයිතමයන්ගේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කළ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය 2012/13, 2016 හා 2019 සමීක්ෂණ වර්ෂ සඳහා ඇස්තමේන්තු කළ සාමාන්‍ය මාසික ඒක පුද්ගල පරිභෝජනය දක්වා ඇති අතර පොල් සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් යොමු කරන ලද වාර්ෂික ඒක පුද්ගල පරිභෝජන දත්ත දක්වා ඇත.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, සහල් සම්බන්ධයෙන්-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

සහල් වර්ග ගණනාවක් තිබෙනවා, සුදු කැකුළු (සාමාන්‍ය), සුදු කැකුළු සම්බා, රතු කැකුළු (සාමාන්‍ය), රතු කැකුළු සම්බා, සම්බා, රතු නාඩු, සුදු නාඩු, බාස්මතී, වෙනත් කියලා. මේවායෙන් ඔබතුමා අහන්නේ මොන හාල් වර්ගය ගැනද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

වැඩියෙන්ම තිබෙන්නේ මොනවාද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

වැඩියෙන්ම තිබෙන්නේ, සුදු නාඩු සහ රතු නාඩු. ඔබතුමාට ගණන ඕනෑද? *[බාධා කිරීමක්]* මිලියන 2.7යි තිබෙන්නේ.

(iv)

| අනු අංකය | අයිතමය | නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|
| 1. | සීනි (දුඹුරු) | 74,676 |
| 2. | කිරිපිටි (සම්පූර්ණ යොදය සහිත) | 11,746 |
| 3. | පරිප්පු | - |
| 4. | සහල් | 3,165,500 (භෝග පුරෝකථන වාර්තා අනුව - 2025 |
| 5. | තිරිඟු පිටි (තිරිඟු ඇට මගින්) | 715,366 |
| 6. | පොල් (ගෙඩි මිලියන) | 1,495 |

- 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා නිෂ්පාදන දත්ත ඇසුරෙනි.

| අනු අංකය | | අයිතමය | රේගු සංකේතාංක | ආනයන වටිනාකම (රු. මිලියන) | ආනයන වටිනාකම (එ.ජ.ඩො. මිලියන) |
|---|---|---|---|---|---|
| | | | 1701.91.10 | | |
| | | | 1701.91.20 | | |
| | | | 1701.99.10 | | |
| 1. | සීනි | | 1701.99.20 | 103.443 | 344 |
| | | | 1701.99.30 | | |
| | | | 1701.99.40 | | |
| | | | 1701.99.90 | | |
| | | | 0402.10.00 | | |
| 2. | කිරිපිටි | | 0402.21.00 | 100,694 | 335 |
| | | | 0402.29.00 | | |
| | | පියලි කළ | 0713.40.12 | 2,867 | 10 |
| 3. | පරිප්පු | | 0713.40.22 | | |
| | | පියලි නොකළ | 0713.40.11 | 37,053 | 123 |
| | | | 0713.40.21 | | |
| 4. | සහල් | කැකුළු සහල් | 1006.30.19 | 5,241 | 17 |
| | | තැම්බූ සහල් | 1006.30.29 | 20,599 | 68 |
| 5. | තිරිඟු පිටි | | 1101.00.10 | 6,670 | 22 |
| 6. | පොල් ගෙඩි | | 0801.19.90 | ආනයනය කර නොමැත | ආනයනය කර නොමැත |

- 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආනයනික දත්ත ඇසුරෙනි.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

(v)

| අනු අංකය | අයිතමය | | රේගු සංකේතාංක | ආනයනය කරන ලද ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|---|---|---|
| 1. | සීනි | | 1701.91.10 | |
| | | | 1701.91.20 | |
| | | | 1701.99.10 | |
| | | | 1701.99.20 | 628,051 |
| | | | 1701.99.30 | |
| | | | 1701.99.40 | |
| | | | 1701.99.90 | |
| 2. | කිරිපිටි | | 0402.10.00 | |
| | | | 0402.21.00 | 79,812 |
| | | | 0402.29.00 | |
| 3. | පරිප්පු | පියලි කළ | 0713.40.12 | |
| | | | 0713.40.22 | 10,784 |
| | | පියලි නොකළ | 0713.40.11 | 173,060 |
| | | | 0713.40.21 | |
| 4. | සහල් | කැකුළු සහල් | 1006.30.19 | 35,428 |
| | | නැම්බු සහල් | 1006.30.29 | 130,718 |
| 5. | තිරිඟු පිටි | | 1101.00.10 | 56,742 |
| 6. | පොල් (ගෙඩි) | | 0801.19.90 | ආනයනය කර නොමැත |

- 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආනයනික දත්ත ඇසුරෙනි.

(vi)

| අනු අංකය | අයිතමය | | රේගු සංකේතාංක | ආනයන බදු (රු.මිලියන) | වෙනත් කරුණු | |
|---|---|---|---|---|---|---|
| 1. | සීනි | | 1701.91.10 | 31,413 | සුදු සීනි | SCL - කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 50 |
| | | | 1701.91.20 | | | |
| | | | 1701.99.10 | | | |
| | | | 1701.99.20 | | | |
| | | | 1701.99.30 | | | |
| | | | 1701.99.40 | | | |
| | | | 1701.99.90 | | | |
| | | | 1701.14.10 | - | දුඹුරු සීනි | CID - කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 30<br>VAT - 18%<br>SSCL - 2.5% |
| | | | 1701.14.90 | | | |
| 2. | කිරිපිටි | | 0402.10.00 | 59,581* | කිරිපිටි | CID - 20% හෝ කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 225<br>VAT - 18%<br>PAL - 10%<br>SSCL - 2.5% |
| | | | 0402.21.00 | | | |
| | | | 0402.29.00 | | | |
| 3. | පරිප්පු | පියළි කළ | 0713.40.12 | 3 | පියළි කළ | SCL - ශත 25 කි. ග්‍රෑ. 1ක් සඳහා |
| | | | 0713.40.22 | | | |
| | | පියළි නොකළ | 0713.40.11 | 43 | පියළි නොකළ | |
| | | | 0713.40.21 | | | |
| 4. | සහල් | | 1006.30.19 | 10,793 | කැකුළු සහ නැම්බු සහල් | SCL - කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 65 |
| | | | 1006.30.29 | | | |
| | | | 1006.30.11 | 1,530 | අනෙකුත් සහල් (බාස්මති) | CID - 20% හෝ කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 80<br>CESS - 10% හෝ කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 40<br>VAT - 18%<br>SSCL - 2.5% |
| | | | 1006.30.21 | | | |
| 5. | තිරිඟු පිටි | | 1101.00.10 | 2,497* | තිරිඟු පිටි | CID - 20% හෝ කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 27<br>VAT - Ex<br>PAL - 10%<br>SSCL - 2.5% |
| 6. | පොල් (ගෙඩි) | | 0801.19.90 | ආනයනය කර නොමැත. | පොල් (ගෙඩි) | CID - 20%<br>CESS - 40% හෝ කි. ග්‍රෑ. 1ක් සඳහා රු. 330<br>VAT - 18%<br>SSCL - 2.5%<br>(ආනයන බලපත්‍ර ලබා ගැනීමට යටත් කර ඇත) |

- 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආනයනික දත්ත ඇසුරෙනි.

* රේගු ආනයන බද්ද සහ වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද පමණි.

දුඹුරු සීනි සඳහා අය කරනවා, CID එක කිලෝ ග්‍රෑම් 1ක් සඳහා රුපියල් 30ක්. VAT එක සියයට 18ක්. SSCL එක සියයට 2.5ක්. නමුත් අපි ආනයනය කරලා නැහැ. ඒක තහනම් කර තිබෙන්නේ; නවත්වා තිබෙන්නේ.

ඒ වාගේම පොල් ගෙඩි ආනයනය කර නැහැ. ආනයනය කරනවා නම් ඒකටත් අදාළ බදු structure එකක් තිබෙනවා.

(vii)

| අනු අංකය | අයිතමය | | රේගු සංකේතාංක | වෙනත් කරුණු | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය (මෙ.ටො.) | මිල රක්ෂණ ගැල් කුලී වටිනාකම (රු.මි.) | කි.ග්‍රෑ. 1ක ආනයන මිල (කි.ග්‍රෑ./ රු.) | කි.ග්‍රෑ. 1ට බදු මුදල (කි.ග්‍රෑ./ රු.) | ගොඩබෑමේ මිල (කි.ග්‍රෑ./ රු.) |
| 1. | සීනි | | 1701.91.10<br>1701.91.20<br>1701.99.10<br>1701.99.20<br>1701.99.30<br>1701.99.40<br>1701.99.90 | 628,051 | 103,443 | 165 | 50 | 215 |
| 2. | කිරිපිටි | | 0402.10.00<br>0402.21.00<br>0402.29.00 | 79,812 | 100,694 | 1,262 | 747 | 2,009 |
| 3. | පරිප්පු | පියළි කළ | 0713.40.12<br>0713.40.22 | 10,784 | 2,867 | 266 | 0.25 | 266 |
| | | පියළි නොකළ | 0713.40.11<br>0713.40.21 | 173,060 | 37,053 | 214 | 0.25 | 214 |
| 4. | සහල් | කැකුළු සහල් | 1006.30.19 | 35,428 | 5,241 | 148 | 65 | 213 |
| | | නැම්බු සහල් | 1006.30.29 | 130,718 | 20,599 | 158 | 65 | 223 |
| 5. | තිරිඟු පිටි | | 1101.00.10 | 56,742 | 6,670 | 118 | 44 | 162 |
| 6. | පොල් (ගෙඩි) | | 0801.19.90 | ආනයනය කර නොමැත | | | | |

- 2025 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආනයනික දත්ත ඇසුරෙනි.

(viii)

| අනු අංකය | අයිතමය | ඒකකය | නිෂ්පාදන/ ආනයනික පිරිවැය (CIF අගය අනුව) රුපියල් | 2026.02.23 දින සිල්ලර මිල (රුපියල්) |
|---|---|---|---|---|
| 1 | සීනි (සුදු) | කි.ග්‍රෑ. 1 | 201.00 | 202.00 - 230.00 |
| 2 | කිරිපිටි | ග්‍රෑ. 400 | 745,00-928.00 | 1,050.00 - 1,150.00 |
| 3 | පරිප්පු | කි.ග්‍රෑ. 1 | 200.00 | 240.00 - 300.00 |
| 4 | සහල් - දේශීය කැකුළු සහල් - සුදු | කි.ග්‍රෑ. 1 | 219.00 (කර්මාන්තශාලා පිටවුම් මිල) | 190.00 - 220.00 |
| | සහල් - දේශීය කැකුළු සහල් - රතු | කි.ග්‍රෑ. 1 | 219.00 (කර්මාන්තශාලා පිටවුම් මිල) | 185.00 - 220.00 |
| | සහල් - දේශීය නාඩු සහල් - සුදු | කි.ග්‍රෑ. 1 | 225.00 (කර්මාන්තශාලා පිටවුම් මිල) | 200.00 - 230.00 |
| 5 | තිරිඟු පිටි | කි.ග්‍රෑ. 1 | 147.00 | 155.00 - 190.00 |
| 6 | පොල් | ලොකු | දත්ත නොමැත | 140.00 - 188.00 |
| | | පොඩි | දත්ත නොමැත | 100.00 - 120.00 |

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් දිස්ත්‍රික්ක අනුව ලබා ගන්නා දෛනික මිල ගණන් (2026.02.23) ඇසුරෙනි.

(ix)
- අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ ක්‍රමවේදයෙහි ඇති වෙනස්කම්
- අමුද්‍රව්‍යයන්හි ගුණාත්මකභාවයෙහි ඇති වෙනස්කම්
- අමුද්‍රව්‍ය ගෙන ඒමේ ක්‍රමවේදය නිසා ඇති වන වෙනස්කම්
- ආනයනය කිරීමේදී ලෝක වෙළෙඳ පොළෙහි මිල ගණන්වල ඇති වෙනස්කම්
- නිෂ්පාදන ක්‍රියාවලියේදී ඇති වන වෙනස්වීම්. එනම්, මිනිස් ශ්‍රමය බහුලව හෝ යාන්ත්‍රිකව හෝ ස්වයංක්‍රිය වශයෙන් යනාදිය
- ආයතනිකව පවත්වාගෙන යනු ලබන ඵලදායීතාව හා කාර්යක්ෂමතාව
- පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කරනු ලබන ක්‍රමවේදයෙහි ඇති වෙනස්කම්
- නිෂ්පාදකයන් විසින් පවත්වාගෙන යනු ලබන ලාභ ප්‍රතිශතයන්හි වෙනස්කම්
- ඒ ඒ භාණ්ඩ සඳහා රාජ්‍යමය, දේශපාලන, භූගෝලීය හා දේශගුණික වශයෙන් වන වෙනස්කම්
- රාජ්‍ය ප්‍රතිපත්ති, ආයතන ප්‍රතිපත්ති යනාදිය

(ආ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා දුන්නු සවිස්තර උත්තරය තුළින් පැහැදිලි වන්නේ මේ රටට අවශ්‍ය භාණ්ඩවලින් සියයට 65ක් තවමත් ආනයනය කරන බවකුයි. පරිභෝජනය කරන භාණ්ඩවලටත් මෙය අදාළ වෙනවා. මෑත කාලයේදී සහ මීට පෙරත් රක්ෂණ ගාස්තු සහ නැව් ගාස්තු ශීඝ්‍රයෙන් වැඩි වෙලා තිබූ අවස්ථාවේදී සහ මිල ශීඝ්‍රයෙන් වැඩි වෙන්න පටන් ගෙන තිබූ අවස්ථාවේදී පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් ඇති කරන්න අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද? මීට පෙරත් මේ වාගේම යුද්ධ ඇති වෙලා තිබෙනවා. මීට පෙර පැවැති ආණ්ඩුවලට බැන්නේ ඒ ආණ්ඩුවල අදක්ෂතාව, 76 වසරක ශාපය කියලා වුණාට, දැන් පෙනෙනවා මෙහිත් ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා කියලා.

ඔබතුමා මේ අවස්ථාවේදී පාරිභෝගිකයාට සාධාරණ මිලට භාණ්ඩ ලබා දීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද, ගරු ඇමතිතුමනි? මොකද, ඊයේ පෙරේදා නොවෙයි, මේ අවුරුදු එකහමාර තුළ මිල ගණන් සියයට 25කින්, 30කින් වැඩි වෙලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී අගය කරනවා ඔබතුමා ආරම්භක අවස්ථාවේදී හැම භාණ්ඩයකටම උපරිම සිල්ලර මිලක් දැමීම. දැන් ඒවා පැත්තකට දමලා තරගකාරී ස්වරූපයක් තුළින් මිල තීරණය වීමට ඉඩ හැරීමේ තත්ත්වයක්, යම් විධියකට මිල සාධාරණීකරණයක් ඇති කරගෙන යනවා.

ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය වන්නේ මෙයයි. ශීඝ්‍රයෙන් වැඩි වන මිල කෙරෙහි රක්ෂණ ගාස්තු, නැව් ගාස්තු හා ඩොලරය පිරිහීම ආදිය බලපානවා. මහ බැංකුව කියන්නේ උද්ධමනය නැති වෙලා තිබෙනවා කියලා නේ. හැබැයි, සැබැවින්ම මිල වැඩි වෙලා තිබෙනවා. කොහොමද මේකට උත්තර දෙන්නේ?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය හරි. ගරු මන්ත්‍රීතුමා කරුණු කියද්දී කිව්වා වාගේ අපි හැම එකටම පාලන මිලක් දැම්මේ නැහැ. සමහර භාණ්ඩවලට පාලන මිලක් ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒක දමලා තිබෙනවා. *[බාධා කිරීමක්]* නැහැ, සමහර ඒවාට දමන්න ඕනෑ. එපා කිව්වාට, එහෙම පාලන මිලක් දැම්මේ නැත්නම්, ගොවියාගේ ආරක්ෂාව, දේශීය නිෂ්පාදකයාගේ ආරක්ෂාව බරපතළ ප්‍රශ්නයකට ලක් වෙනවා. *[බාධා කිරීමක්]* නැහැ නේ, දැන් ආනයනය නවත්වලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ගරු මන්ත්‍රීතුමා, අපේ රටේ - *[බාධා කිරීමක්]* මම උත්තරය දෙන්නම්කෝ.

ආනයනය කරනවා කියලා ඔබතුමා කිව්වාට, අපි සහල් ආනයනය නවත්වලා තිබෙන්නේ. මොකද, අපේ රටේ වැඩිපුරම - සියයට 85ක් - පරිභෝජනය කරන්නේ රතු නාඩු, සුදු නාඩු, සුදු කැකුළු සහ රතු කැකුළු. ඒ සියයට 85ක පරිභෝජනයට අවශ්‍ය කරන නිෂ්පාදනයේ අතිරික්තයක් අපි ළඟ තිබෙනවා. අපි ළඟ මාස 3කට හාල් තිබෙනවා. අපේ රටේ මාස 3කට අවශ්‍ය හාල් අතිරික්තයක් තිබෙනවා, සුදු කැකුළු සහ රතු කැකුළු, සුදු නාඩු සහ රතු නාඩු වශයෙන්. ඒ නිසා තමයි අද වෙළෙඳ පොළේ රුපියල් 220ට විකුණන කැකුළු සහල් රුපියල් 185ත්, 200ත් අතර මිලකට තිබෙන්නේ. ඒ වාගේම රුපියල් 230ට උපරිම සිල්ලර මිල නියම කරපු නාඩු සහල් රුපියල් 220ත්, 200ත් අතර මිලකට තිබෙනවා. ඒ නිසා සහල් *[බාධා කිරීමක්]* -

ඔබතුමා බලන්න සතොසේ තිබෙනවා. ඔබතුමා සතොසට ඇවිත් බලන්න. අපි අද සතොස ආයතන හරහා campaign එක පටන් ගත්තා. මේ මිල වැඩිවීම් අතර, *[බාධා කිරීමක්]* - ඔබතුමා අහපු අතුරු ප්‍රශ්නයට මම මේ උත්තර දෙන්නේ. ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය අපි කාටවත් පාලනය කරන්න පුළුවන් එකක් නොවෙයි. සමහර නැව් ලංකාවට ආවාට, - *[බාධා කිරීමක්]* කන්ටේනර් ආපසු යනවා. *[බාධා කිරීමක්]* ඒක පිළිගන්න වෙනවා නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, අදාළ අතුරු ප්‍රශ්නයට පමණක් පිළිතුර ලබා දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම ප්‍රශ්නයට උත්තරය දෙන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, දෙගොල්ලන් අතර සංවාදයක් කරන්න බැහැ නේ. අතුරු ප්‍රශ්නයට උත්තර දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, මම එතුමා අහපු ප්‍රශ්නයට තමයි උත්තර දෙන්නේ. එතුමාට ප්‍රශ්න වැඩි වෙලා තිබෙන්නේ. ඒකයි වැඩේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අදාළ අතුරු ප්‍රශ්නයට විතරක් උත්තර දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්න වැඩි කරගන්න එපා. ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වයට මුහුණ දෙන්න තමයි

[ගරු වසන්ත සමරසිංහ මහතා]

රජයක් හැටියට අපි කටයුතු කරලා තිබෙන්නේ. ඒ අනුව අපි - ලංකා සතොස ආයතනය - CWE එක, STC එක උත්සව සමයටත් එක්ක මාසයකට- කල් තියා භාණ්ඩ වර්ග ආනයනය කරලා භාණ්ඩ ස්ථාපිත කරලා තිබෙනවා. අද අපි පටන් ගත්තා, campaign එකක්. වෙළෙඳ පොළේ පවතින මිලටත් වඩා රුපියලක් අඩුවෙන් දෙනවා. මාසයකට අවශ්‍ය භාණ්ඩ වර්ග - වශ්‍යතාවටත් වඩා වැඩි ප්‍රමාණයක් - අපි ගෙන්වා තිබෙනවා. මිල පාලනයක් සහිතව වෙළෙඳ පොළ තුළ ඇති වෙලා තිබෙන මේ තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍ය තොග ප්‍රමාණයක් අපි රැස්කරලා සතොස හරහා අපි ඒවා පාරිභෝගිකයාට ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම අගය කරනවා, වසන්ත සමරසිංහ මැතිතුමා දැන් සැබෑ වෙළෙඳ ඇමතිවරයකු වශයෙන් කටයුතු කරන්න පටන් ගෙන තිබෙන එක. මට සැබෑ උත්තරය අවශ්‍ය වන්නේ මෙන්න මේ කාරණයටයි. රටේ මිලියන 22ක ජනගහනයක් ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මට ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පූර්විකා නැතුව ප්‍රධාන ප්‍රශ්නයෙන් පැන නඟින අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතකොට තේරෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳට කියවන්නකෝ. ගරු මන්ත්‍රීතුමන්ලාත් ඉතින් ලොකු - *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මිලියන 22ක ජනගහනයක් ඉන්න රටක, සතොස retail outlets 500ක් විතර තමයි තිබෙන්නේ. එතකොට සියයට 3කට තමයි සතොස හරහා භාණ්ඩ මිලදී ගෙන පරිභෝජනය කරන්න පුළුවන් වන්නේ. එතකොට ඔබතුමන්ලාගේ මිල කොහොමද සියලු ජනතාවට ලබා දෙන්නේ? ආණ්ඩුව තුළින් අද දත්ත ඇවිල්ලා තිබෙනවා, කොළඹ වාගේ තැනක එක පුද්ගලයෙකුට ජීවත් වෙන්න මසකට රුපියල් 19,000ක් වෙනවා, මොනරාගල වාගේ තැනක මසකට රුපියල් 17,800ක් වෙනවා කියලා. ගරු ඇමතිතුමනි, සාමාන්‍ය කෙනෙකුගේ ක්‍රය ශක්තිය අඩු වෙලා තිබෙන අවස්ථාවක, නැව් ගාස්තු, රක්ෂණය ඇතුළු ඔක්කෝම වැඩි වෙනකොට කොහොමද මේ අය ජීවත් වෙන්නේ? තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවේ හැම දේම මිල අඩු කරනවා කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහන්නේ නැතුව ප්‍රශ්න පත්තරයක් අහනවා. ප්‍රශ්නයක් ඇහුවොත් මම ඒ ප්‍රශ්නයට උත්තර දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, රටේ ඇතිවෙලා තිබෙන බඩු මිල වැඩිවීම පාලනයට අවශ්‍ය මැදිහත්වීම කරන්න ආහාර සුරක්ෂිතතා කමිටුව හැටියට අපි තීන්දු තීරණ ගණනාවක් අරගෙන තිබෙනවා. ඒ වාගේම, පසුගිය කැබිනට් මණ්ඩල රැස්වීමේදී තීරණය කළා, මේ මොහොතේ ඇති වෙලා තිබෙන තත්ත්වයට උත්තරයක් ලෙස ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය ඒ ප්‍රවාහන සැපයුම් මාර්ග යථාවත් කරගෙන පවත්වාගෙන යැමට අවශ්‍ය තීන්දු තීරණ ගැනීමට. ඒ වාගේම, අපි ආනයනකරුවන්, රටේ භාණ්ඩ නිෂ්පාදනය සහ බෙදා හැරීමේ ක්ෂේත්‍රයේ සියලුදෙනා එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. ඊයේත් අපේ අමාත්‍යාංශය රටේ ඉන්න ප්‍රධානම ආනයනකරුවන් වන Pettah Traders' Association එක එක්කත් සාකච්ඡා කළා. ඒ වාගේම, පිටි නිෂ්පාදකයන් එක්ක සාකච්ඡා කළා, කිරිපිටි නිෂ්පාදකයින් එක්ක සාකච්ඡා කළා. ඒ අයගේ තොග තත්ත්වය, ප්‍රවාහන තත්ත්වය, මේ වෙනකොට ඒගොල්ලන්ට අවශ්‍ය අමුද්‍රව්‍යවල තත්ත්වය පිළිබඳව අපි පසුවිපරම් කරලා තිබෙනවා. ඒ සියලුදෙනාට මේ මොහොතේ මතු වෙලා තිබෙන ප්‍රශ්නය තමයි, තෙල් ප්‍රමාණාත්මකව ලබා ගැනීම සහ ප්‍රවාහන පද්ධතිය අඩාළ නොකර පවත්වා ගැනීම. ගරු ජනාධිපතිතුමා එයටත් අදාළ උපදෙස් ලබා දීලා තිබෙනවා. විශේෂයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රයට සහ භාණ්ඩ ප්‍රවාහනයට අවශ්‍ය තෙල් ටික ලබාදෙන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. ඒ අනුව අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අදත් ගිහිල්ලා බලන්න, වෙළෙඳ පොළ මිල. සමහර ව්‍යාපාරිකයන් කිහිපදෙනෙක් මිල උස්සන්න උත්සාහ කළාට, වෙළෙඳ පොළේ සාධාරණ මිලක් තිබෙනවා. බලන්න, සුදු සීනි කිලෝවක් රුපියල් 208ත්, රුපියල් 210ත් අතර මිලකට තිබෙනවා. පරිප්පු කිලෝවක් රුපියල් 270ට තිබෙනවා. ලූනු කිලෝවක් රුපියල් 140ත්, 160ත් අතර මිලකට තිබෙනවා. හාල් මිලත් ඒ වාගෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න. ගරු අමාත්‍යතුමා, මේ ප්‍රශ්නයට විතරක් දැන් විනාඩි 18ක් අරගෙන තිබෙනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒ නිසා මේ මොහොතේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වයට අවශ්‍ය ලෙස වෙළෙඳ පොළ තුළ පාලනය ඇති කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -553/2025- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය සඳහා ගොඩක් විස්තර එකතු කරගන්න තිබෙනවා. එම නිසා, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය: විස්තර
## பண்டகசாலைக்கான பற்றுச்சீட்டு நிதியீட்டு முறைமைக் கருத்திட்டம்: விபரம்
## WAREHOUSE RECEIPTS FINANCING PROJECT: DETAILS

566/2025

**8. ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේදී "ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය" නමින් ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට ස්ථාපිත කර ඇති ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූ ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் "பண்டகசாலைக்கான பற்றுச்சீட்டு நிதியீட்டு முறைமைக் கருத்திட்டம்" எனும் பெயரில் கருத்திட்டமொன்று ஆரம்பிக்கப்பட்டதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தின் நோக்கங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டத்தின்கீழ் இன்றளவில் நிறுவப்பட்டுள்ள களஞ்சியசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்குறிப்பிட்ட கருத்திட்டத்தின்மூலம் பயனடைந்துள்ள விவசாயிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) மேற்படி கருத்திட்டத்தை முன்னெடுத்தல் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House -

(i) whether he is aware that a project called "Warehouse Receipts Financing Project" was initiated in the year 2015;

(ii) the objectives of the said project;

(iii) the number of warehouses that have been established under the project so far;

(iv) the number of farmers who have benefited from the project; and

(v) the measures that will be taken to proceed with the said project?

(b) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ අස්වනු නෙළන කාලයේදී ලැබෙන අස්වැන්න සඳහා ගොවීන්ට සුදුසු මිලක් ලැබෙන තෙක් ගබඩා කර තැබීම සඳහා උසස් තත්ත්වයෙන් යුතු ගබඩා පහසුකම් සපයා දීම සහ එම ධාන්‍ය තොග සුරැකුම් ලෙස යොදාගෙන බැංකු හරහා ඔඩපන ණය - pledge loan - පහසුකම් ලබා ගැනීමට අවස්ථාව ලබා දීමය.

(iii) ස්ථාපිත කරන ලද ගබඩා සංඛ්‍යාව 06කි. මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ලෝක බැංකු ආධාර භාවිත කර, 2015 වර්ෂයේදී ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථාන 03ක් අනුරාධපුරය, මොනරාගල, මන්නාරම යන දිස්ත්‍රික්කවල ඉදි කළ අතර, 2018 වර්ෂයේදී දේශීය අරමුදල් භාවිත කර කිලිනොච්චිය, පොළොන්නරුව හා රත්නපුරය යන දිස්ත්‍රික්ක තුළ තවත් ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථාන 03ක් ඉදි කර ඇත.

නමුත්, 2021 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ ඉදි කළ ඇඹිලිපිටිය ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානය

[ගරු නිශාන්ත ජයවීර මහතා]

වැව්ලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කුළුබඩු හා ඒ ආශ්‍රිත අලෙවි මණ්ඩලය වෙත ලබා දී ඇත. ඒ අනුව, දැනට ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනුයේ ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථාන 05ක පමණි.

(iv) මෙම ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානවල ගොවීන් 4,187ක් ලියාපදිංචි වී ඇත. මීට අමතරව ලියාපදිංචි නොවන ගොවීන්ට ද දෛනික කුලී පදනම මත ධාන්‍ය වේලා ගැනීම, පිරිසිදු කිරීම වැනි සේවා ලබා ගත හැකිය. එබැවින් මෙම ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානවලින් ප්‍රතිලාභ ලබා ගන්නා ගොවීන් සංඛ්‍යාව ලියාපදිංචි ගොවීන් සංඛ්‍යාවට වඩා වැඩි වේ.

(v) වර්තමානයේදී මෙම ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානවල කළමනාකරණ කටයුතු ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් සිදු කරන අතර, අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් අධීක්ෂණය කරනු ලබයි. එහිදී කළමනාකරණ හා මෙහෙයුම් තීරණ ගැනීම සඳහා සෑම ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානයකම උපදේශන කමිටුවක් පිහිටුවා ඇත. එම කමිටුවේ සභාපතිවරයා වන්නේ දිස්ත්‍රික් ලේකම් වන අතර, මහා භාණ්ඩාගාරයේ නිලධාරියකු, පසු අස්වනු කළමනාකරණ ආයතනයේ නිලධාරියකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නිලධාරියකු ඇතුළු අදාළ දිස්ත්‍රික් මට්ටමේ ආයතනවල නිලධාරීන් එහි සාමාජිකයන් වේ.

(ආ) පැන නොනඟී.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ගරු කථානායකතුමනි, මේක රටේ ගොවි ජනතාවට තිබෙන දැවෙන ප්‍රශ්නයක්. මේ අස්වනු අලෙවි කර ගැනීමේදී, කුණු කොල්ලයට අස්වනු අලෙවි කිරීම සම්බන්ධ ගැටලු ගොවි ජනතාවට මතු වුණා. ඒ සඳහා ලෝකයේ තිබුණු විසඳුමක් විධියට අපි ලෝක බැංකුවත් එක්ක කටයුත්තක් ආරම්භ කළා. ඒක ඉතා සාර්ථකව ඇඹිලිපිටියේයි, අනෙක් ස්ථානවලයි හොඳ ආකාරයෙන් ක්‍රියාත්මක වෙනවා, ස්ථාන දෙපොළක හැර. නමුත් අද වනවිට ඒ කටයුත්ත ප්‍රායෝගික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අද ඉන්ධන ප්‍රශ්නයත් එක්ක ගොවි ජනතාවගේ අස්වනු ඈතට ගෙනියන්නත් බැහැ. මොකද, ඒවා ගබඩාවලට ගෙනියන්නත් පහසුකම් නැති තත්ත්වයක් තිබෙන නිසා. නමුත් මේ කර්තව්‍යය ඉතා සාර්ථක කර්තව්‍යයක් බවට පත් කර ගැනීමට හැකි බව ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේදී පෙන්වා දීලා තිබෙනවා. මේ කර්තව්‍යය ප්‍රචලිත කළොත් ගොවි ජනතාවගේ අස්වනු කුණු කොල්ලයට විකුණන එක නතර කරන්න හැකි වෙනවා.

ගොවීන්ට තිබෙන දැවෙන ප්‍රශ්නය වෙන්නේ අස්වනු නෙළනකොට ඒ හා තිබෙන වියදම් ටිකවත් පියවා ගන්න බැරිවීමයි. ඒ නිසා නේ සියයට 70ක් දක්වා ණය පහසුකම් දෙන්න ගියේ. ඒක කරගත්තා නම් හොඳයි. මොකද, ගොවි ජනතාවට එතකොට ලොකු බරක් නැහැ. එතකොට අස්වනු කුණු කොල්ලයට විකුණන්න ඕනෑ නැහැ. ගොවියෝ හිර වෙන්නේ එතැන නේ. භූතයා මැෂිමේ කුලිය ගෙවන්න ඕනෑ, වැඩ කරපු කට්ටියගේ කුලිය ගෙවන්න ඕනෑ, තෙල් ටිකට ගෙවන්න ඕනෑ. ඒ නිසා ගොවියා අමුවට හෝ අස්වනු විකුණන්න පෙළඹෙනවා නේ. මේ කර්තව්‍යය තව ඉදිරියටත් සාර්ථක කර ගන්නට ඔබතුමන්ලා මුදල් අමාත්‍යාංශය විධියට අවධානය යොමු කරලා තිබෙනවාද? ඒ ඉදිරි පියවර මොකක්ද කියලා දැන ගන්න කැමතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු කථානායකතුමනි, පැහැදිලිවම මුදල් අමාත්‍යාංශය විධියට මේ සඳහා අවධානය යොමු කරලා තිබෙනවා. මීට අමතරව අපි මෙවර 2026 වර්ෂයේ දී ඉදිරිපත් කරපු අය වැයේදීත් ගොවීන්ට වී වේළා ගන්න අවශ්‍ය උපකරණ සපයා දෙන්න කටයුතු කර තිබෙනවා. ඇත්තටම මුදල් අමාත්‍යාංශය විසින් පැහැදිලිවම අවධානය යොමු කරලා ඉදිරියේ දී ඒ සඳහා අවශ්‍ය දේවල් කරන්න කටයුතු කරමින් පවතිනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දැනුත් කිව්වා, මුදල් අමාත්‍යාංශයේ අවධානය යොමු කරවලා විජලන යන්ත්‍ර ලබා දීමට කටයුතු කරනවා කියලා. මෙවර අය වැයෙන් මුදල් වෙන් කරලා තිබුණාට, තවම මම නම් දැක්කේ නැහැ ප්‍රායෝගිකව කොහේවත් තැනක විජලන යන්ත්‍ර ලබා දීලා කටයුතු කරන බවක්. ඒ නිසා මේ සැරේ ගොවි ජනතාවට ඒ ප්‍රශ්නය ඉතා විශාල විධියට බලපෑවා. මුදල් වෙන් වුණත් දැන් ඒ කටයුත්තත් මඟ නතර වෙලා නේ තිබෙන්නේ.

ඔබතුමන්ලා මුදල් අමාත්‍යාංශය විධියට මේ කියන දේවල් ගොවි ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ වාගේම ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය හරහා තමයි ගොවි ජනතාවගේ පොහොරවලට සහනාධාර ලබා දීමත් ක්‍රියාත්මක වෙන්නේ. එතකොට, දෙවැනි අදියරේ දී ඔබතුමන්ලා තව කොච්චර ප්‍රමාණයකට පොහොර සහනාධාරය දීලා නැද්ද? ඔබතුමන්ලා ප්‍රශ්න හඳුනා ගන්නවා. ඔබතුමන්ලා ඒ ප්‍රශ්න අය වැය ලේඛනයටත් ඉදිරිපත් කරනවා. හැබැයි, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මේ ගබඩා 2015 සිට ක්‍රියාත්මක වෙන්න තිබිලා, ගබඩා හයකින් නතර වුණා. ඔබතුමන්ලා විජලන යන්ත්‍ර පිළිබඳ කරුණු පහගිය නොවැම්බර් මාසයේ අය වැයට ඉදිරිපත් කළා. නමුත් තවම එක විජලන යන්ත්‍රයක්වත් මේ රටේ ස්ථාපනය කරලා නැහැ. ඔබතුමන්ලා කියනවා විතරයි, ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මේ වැඩ අඛණ්ඩව ගලා ගෙන යන ක්‍රමයක් ඔබතුමන්ලා සකස් නොකරන්නේ මන්ද? එදිනෙදා ප්‍රශ්න මතුවෙනකොට ඒවාට උත්තරයක්, දෙකක් හොයා ගන්නවා. හැබැයි, අඛණ්ඩව ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැතිව නතර වෙනවා නේ. ඔබතුමන්ලා කියන මේ දේවල් තුළින් යමක් වෙනවාද? ගොවි ජනතාවගේ පොහොර සහනාධාරය කාලයක් තිස්සේ ක්‍රියාත්මක වෙනවා; ඒ ගැන කථා කරනවා. දැන් ඒක නැහැ.

අද වෙනකොට ගොවි ජනතාවට ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. පොහොර මිටියක් කීයට ගන්න වෙයිද දන්නේ නැහැ. මේ යුද වාතාවරණයත් එක්ක පොහොර මිටිය සමහර තැන්වල රුපියල් 12,000ත් පන්නලා තිබෙනවා. සමහර තැන්වල යූරියා මිටිය රුපියල් 18,000ට විකුණන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගොවි ජනතාවට දෙන සුරක්ෂිතතාව මොකක්ද? තෙල් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ගස්ලබු, කොමඩු වාගේ දේවල් වගා කරන ගොවීන්ට ලාම්පු තෙල් ලබා ගැනීමට ක්‍රමවේදයක් නැහැ.

අද වෙනකොට ගොවි ජනතාව මේ වාගේ දැවෙන ප්‍රශ්න ගණනාවකින් පෙළෙනවා. ඉතා ඉක්මනින් අස්වනු අළෙවි කර ගැනීම වාගේම අස්වනු නෙළීමේදී, අස්වනු නිෂ්පාදනය කරන්න අවශ්‍ය ඉන්ධන ප්‍රශ්නය වාගේම පොහොර ප්‍රශ්නයටත් ප්‍රායෝගික වැඩ පිළිවෙළක් මුදල් අමාත්‍යාංශය විධියට ඔබතුමන්ලා ලබා දෙන්න කටයුතු කරනවාද කියලා තමයි මම අහන්නේ.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඔබතුමාගේ යෝජනාව ඉතාම වැදගත්. මුදල් අමාත්‍යාංශය විධියට වී වෙළන යන්ත්‍ර සඳහා මේ වනවිට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒකට යම් කාල සීමාවක් ගත වෙනවා. අපි ගොවීන්ගේ ගැටලු වඩාත් හොඳින් හඳුනාගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් රජය පැහැදිලිව මැදිහත් වෙනවා. ගොවීන්ට ඒ කටයුතු කරගෙන යන්න අවශ්‍ය පොහොර, ඉන්ධන අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා දෙන්න අපි අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතිනවා.

## පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය: සහල් ආශ්‍රිත වැටලීම්
## பாவனையாளர் அலுவல்கள் அதிகாரசபை: அரிசிசார் சுற்றிவளைப்புகள்
## CONSUMER AFFAIRS AUTHORITY: RAIDS RELATING TO RICE

640/2025

**9. ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2024.01.01 දින සිට මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සහල් සම්බන්ධයෙන් සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම්වලදී අයකර ගන්නා ලද දඩ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) සහල් සම්බන්ධයෙන් සිදු කරනු ලබන වැටලීම් තවදුරටත් වැඩි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2024.01.01ஆம் திகதி தொடக்கம் இதுவரை பாவனையாளர் அலுவல்கள் அதிகாரசபையால் அரிசி தொடர்பாக மேற்கொள்ளப்பட்ட சுற்றிவளைப்புகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி சுற்றிவளைப்பு நடவடிக்கைகள்மூலம் அறவிடப்பட்ட அபராதத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) அரிசி தொடர்பாக மேற்கொள்ளப்படும் சுற்றிவளைப்புகளை மேலும் அதிகரிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House the -

(i) number of raids conducted by the Consumer Affairs Authority in relation to rice from 01.01.2024 up to now;

(ii) amount of fines collected from the raids referred to above; and

(iii) measures that will be adopted to further increase the number of raids conducted in relation to rice?

(b) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2024 වර්ෂයේදී වැටලීම් 4,266ක් ද, 2025 වර්ෂයේදී වැටලීම් 4,850ක් ද සහ 2026 වර්ෂයේ පෙබරවාරි දක්වා වැටලීම් 359ක් ද වශයෙන් සිදු කර ඇත. මුළු වැටලීම් සංඛ්‍යාව 9,475කි.

(ii) 2024 වර්ෂයේදී රුපියල් මිලියන 75.4ක් ද, 2025 වර්ෂයේදී රුපියල් මිලියන 148.6ක් ද සහ 2026 වර්ෂයේ පෙබරවාරි දක්වා රුපියල් මිලියන 20.8ක් ද වශයෙන් දඩ මුදල් අයකර ගෙන ඇත. ඒ අනුව සමස්ත දඩ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 244.8කි.

(iii) වැටලීම් වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ග සහ වත්මන් තත්ත්වය:

දිවයින පුරා සහල් සම්බන්ධ වැටලීම් සහ පරීක්ෂණ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම මෙම වර්ෂය තුළ විමර්ශන නිලධාරීන් 120ක් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර එම නිලධාරීන් කඩිනමින් බඳවා ගෙන විමර්ශන හා වැටලීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, වසර දෙකක වාගේ කාලයක් තුළ දේශීය කිරි සම්බා සහ සම්බාවල විශාල හිඟයක් තිබෙනවා. රජය කිරි සම්බාවලට රුපියල් 260ක සහතික මිලක් දැම්මා. සම්බාවලට

[ගරු කිංස් නෙල්සන් මහතා]

රුපියල් 240යි කියලා සහතික මිලක් දැම්මා. ගරු ඇමතිතුමනි, කළු කඩ වෙළෙඳ සැල්වල කීරි සම්බා රුපියල් 380ටත්, සම්බා රුපියල් 290ටත් ගන්න තිබෙනවා.

මේ වෙළෙඳ සැල්වලට සම්බා සහ කීරි සම්බා එන්නේ කොහෙන්ද? රට තුළ ප්‍රධාන වී මෝල් තුනක් තිබෙනවා. ඒ වී මෝල්වල සම්බා සහ කීරි සම්බා තබාගෙන ඉන්නවාද? රජය විධියට ඔබතුමන්ලා ඒ සඳහා මොකක් හෝ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවාද? මට මතකයි, හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පසුගිය කාලයේ හමුදාව යොදවලා ඔය කියන වී මෝල් ඇතුළට ගිහිල්ලා බැලුවා. හැබැයි, බැලුවා විතරයි වෙන කිසි දෙයක් වුණේ නැහැ. විශේෂයෙන්ම, 'සඟවාගෙන සිටින සහල් වෙළෙඳ පොළට ගේනවා, පාරිභෝගිකයාට සහන මිලට ලබා දෙනවා' කියලා තමයි ඔබතුමන්ලා බලයට පත් වුණේ. ඔබතුමන්ලා දඩ මුදල් අය කර ගත්ත එක ඇත්ත. හැබැයි, අදටත් සම්බා සහ කීරි සම්බා නැහැ නේ, ගරු ඇමතිතුමා. මේක නේ ඇත්ත කථාව. ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් මේ සඳහා මොකක් හෝ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යනවාද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් අපේ රටේ සහල් නිෂ්පාදනයේදී ඔබතුමා මතු කළ සහල් වර්ගවල අඩුවක් තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ සහල් පරිභෝජනයෙන් සියයට 85ක් නාඩු සහල්, සියයට 9ක් කීරි සම්බා සහ සියයට 5ත්, 6ත් අතර තමයි සම්බා සහල් පරිභෝජනය තිබෙන්නේ. විශේෂයෙන්ම කීරි සම්බා සහල් නිෂ්පාදනය ප්‍රමාණාත්මකව වැඩි නොවීම නිසා තමයි වෙළෙඳ පොළ තුළ හිඟයක් ඇති වෙලා තිබෙන්නේ. මොකද, මැද පන්තිය සහ විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය සඳහා හෝටල් විසින් කීරි සම්බා මිලදී ගැනීමක් සිදු කරන නිසා. පසුගිය අවුරුදු 3ක දත්ත දිහා බැලුවාම අපට ඒක පෙනෙනවා. සියයට 6 සිට සියයට 9 දක්වා කීරි සම්බා පරිභෝජනයේ වැඩි වීමක් තිබෙනවා. ඒකට උත්තරයක් ලෙස පසුගිය අවුරුද්දේ යල සහ මහ කන්න දෙකේම කීරි සම්බා නිෂ්පාදනය වුණේ හෙක්ටෙයාර 70,000කට ආසන්න ප්‍රමාණයක් පමණයි, ගරු කථානායකතුමනි. හෙක්ටෙයාර 70,000ක් ගත්තාම, නිෂ්පාදනය ආවේ මෙට්‍රික් ටොන් 240,000ත්, 280,000ත් අතර ප්‍රමාණයක්. හැබැයි, අපි මේ පිළිබඳව සාකච්ඡා කරලා කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධව 2026 මහ කන්නයේ විතරක් හෙක්ටෙයාර 78,000ක් වගා කරලා තිබෙනවා. ඒ අනුව ගත්තොත්, මෙට්‍රික් ටොන් ලක්ෂ 3කට ආසන්න කීරි සම්බා අස්වැන්නක් මේ කන්නයේ ලැබෙනවා. හැබැයි, එසේ ගන්නා කීරි සම්බා අස්වැන්න ගබඩා කරන්න පටන් ගෙන තිබෙනවා. මොකද, කීරි සම්බා වී මාස 6කට පස්සේ සහල් කිරීම තුළින් තමයි ඒ සහලේ හොඳම සුවඳ සහ රසය ගන්න පුළුවන් කියන විශ්වාසය ඒ අයට තිබෙන නිසා. මේ තත්ත්වය නිසා තමයි කීරි සම්බාවල හිඟයක් ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා අපට අවස්ථා දෙකකදී කීරි සම්බා ආදේශන රට තුළට ගෙනෙන්න වුණා, ගරු මන්ත්‍රීතුමා. මේ කන්නයේ තිබෙන්නේ සියයට 10කට ආසන්න කීරි සම්බා නිෂ්පාදනයක්. හැබැයි, ඒ සහල් වෙළෙඳ පොළට එනකල් කීරි සම්බා සහල් හිඟයේ යම් මවාපෑමකුත් ඇති කරනවා. මහ මෝල් හිමියන් සතුව තිබෙන සහල් තොග නිදහස් කිරීම කරන්නේ සහල් හැටියට නොවෙයි, "වෙනත්" කියලා. ඒක නිසා තමයි අපි වැටලීම් කරන්නේ. මොකද, විකිණීමේදී තමයි අපට මේ වැටලීම් කරන්න පුළුවන්.

ඊට අමතරව වී අලෙවි මණ්ඩලය වී මෝල් ලියාපදිංචි කිරීමක් සිද්ධ කරලා තිබෙනවා. රට ඇතුළේ සහල් නිෂ්පාදනයක් තිබෙනවා වාගේම, වර්ගවල යම් හිඟයකුත් ඇතිවෙලා තිබෙනවා. ඒකට උත්තරයක් ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක ඒකාබද්ධව වගා වපසරිය දෙගුණ කරලා තිබෙනවා. යල කන්නයේ තව හෙක්ටෙයාර 55,000ක් වවන්න අපි සැලසුම් කරනවා. ඒ අනුව ගත්තාම, මේ කන්නයේ කීරි සම්බා ඉල්ලුමෙන් සියයට 1කට වැඩි ප්‍රමාණයක සහල් අස්වැන්නක් අපට ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඒකට අවශ්‍ය විසඳුම් අපි සොයලා තිබෙනවා. ඒ අනුව තමයි කටයුතු කරලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඊට අමතරව රුපියල් 260ට වඩා වැඩිපුර විකුණනවා නම්, වැටලීම් කරන්න පුළුවන්. ඒක තමයි පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත අනුව අපට පැවරිලා තිබෙන බලය. ඒ අනුව අපි කටයුතු කරනවා.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයි මෙයයි.

2025දී වී අලෙවි මණ්ඩලයට වී මිලදී ගන්න රජය විසින් රුපියල් මිලියන 6,000ක් අය වැයෙන් වෙන් කළා. එතකොට යල කන්නයේ යම් කිසි වී ප්‍රමාණයක් වී අලෙවි මණ්ඩලයෙන් මිලදී ගත්තා. රජය ජනතාවට කිව්වා, මේ මිලදී ගත්ත වී ටික සහල් බවට පරිවර්තනය කරලා පාරිභෝගිකයාට සහන මිලට ලබා දෙනවා කියලා. තෝරාගත්ත මෝල්වලට මේ වී ලබා දීලා සහල් බවට පරිවර්තනය කළා. ගරු ඇමතිතුමනි, එතකොට කොච්චර සහල් ප්‍රමාණයක් වෙළෙඳ පොළට ඇවිල්ලා තිබෙනවාද, ඒ වාගේම ලක් සතොස හරහා පාරිභෝගිකයාට ලබා දීලා තිබෙනවාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු ඇමතිතුමනි, යල කන්නයේ මිලදී ගත්ත වී කිලෝ ලක්ෂ 15ක් මේ වෙනකොට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි ගබඩාවේ තිබෙනවා. පසුගිය දිනවල මේ වී ගබඩාව අලි කඩලා වර්ෂාවට තෙමුණු වී ප්‍රමාණයකුත් තිබෙනවා. එතකොට මේ වී කිලෝ ලක්ෂ 15 සහල් බවට පරිවර්තනය කරන්න පුළුවන්ද, බැරිද කියන එක ඔබතුමාට හොයලා බලන්න වෙනවා. මේ, එක තැනක් ගැන විතරයි මම කිව්වේ. රට පුරාම ගබඩාවල යල කන්නයේ මිලදී ගත්ත සැලකිය යුතු වී ප්‍රමාණයක් තිබෙනවා. එතකොට, මේ වී ප්‍රමාණය සහල් බවට පරිවර්තනය කරලා, කොච්චර සහල් ප්‍රමාණයක් වෙළෙඳ පොළට දැම්මාද කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, මෙතුමා සහල් ගැන අතුරු ප්‍රශ්නයක් ලෙස අහපු නිසා මම උත්තරයක් දෙන්නම්. වී අලෙවි මණ්ඩලය සතු වී තොග ජාතික සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව හරහා සේවා සපයන්නන්ගෙන්, වී මෝල් හිමියන්ගෙන්, වී අලෙවි මණ්ඩලයේ ලියාපදිංචි වී මෝල් හිමියන්ගෙන් සේවා සැපයීම, නැත්නම් වී කොටා ගෙනැවිත් දීම සම්බන්ධයෙන් මිල ගණන් කැඳවලා ඒ ක්‍රියාවලිය කරගෙන යනවා. පසුගිය යල කන්නයේ වී අලෙවි මණ්ඩලය මඟින් වී මෙට්‍රික් ටොන් 50,000ක් මිලදී ගෙන තිබෙනවා. එම වී මෙට්‍රික් ටොන් 50,000ට අමතරව ජාතික සතොස වී මෙට්‍රික් ටොන් 4,000ක් මිලදී ගෙන තිබෙනවා. ඔක්කොම වී මෙට්‍රික් ටොන් 54,000ක් මිලදී ගෙන තිබෙනවා. එම වී මෙට්‍රික් ටොන් 54,000 සහල් බවට පත් කරලා වෙළෙඳ පොළට නිදහස් කිරීම මේ වෙනකොට සිද්ධ කරනවා. මාසයකට සහල් මෙට්‍රික් ටොන් 5,000කට ආසන්න ප්‍රමාණයක්, විශේෂයෙන් ලක් සතොසටත්, රාජ්‍ය ආයතන හැටියට ත්‍රිපෝෂ සමාගමටත්, ආහාර මණ්ඩලයටත් ලබා දෙනවා. ඒ වාගේම පෞද්ගලික අංශයටත්, සමුපකාරවලටත් මේ සහල් නිදහස් කරනවා. පසුගිය මාස දෙකේ වී අලෙවි මණ්ඩලය සතු වී තොග සහල් කරලා මෙට්‍රික් ටොන් 8,000කට වැඩි සහල් ප්‍රමාණයක් වෙළෙඳ පොළට නිකුත් කරලා තිබෙනවා. මේ ක්‍රියාවලිය අඛණ්ඩව සිද්ධ වනවා. ඒ වාගේම ඔබතුමා මතු කළ, වී අලෙවි මණ්ඩලයේ ගබඩාවල තිබෙන වී තොග, අදාළ සැපයුම්කරුවන්ට, එහෙම නැත්නම් වී මෝල් හිමියන්ට තමයි අපි ලබා දෙන්නේ. ඒ

අය ගබඩාවෙන් වී අරගෙන කොටලා අපට හාල් ගෙනැල්ලා දෙන්න ඕනෑ. එහෙම තමයි අප සමඟ agreement එක තිබෙන්නේ. ඒ අනුව ඒ ක්‍රියාවලිය දැන් සිද්ධ වනවා, ගරු මන්ත්‍රීතුමා.

## ශ්‍රී ලංකා සහ මාලදිවයින් සංචාරකයින්: පැමිණි විගස වීසා ලබා දීමේ පහසුකම

## இலங்கை மற்றும் மாலைத்தீவு சுற்றுலாப் பயணிகள்: வருகைக்கு பின்னரான வீசா வசதிகள்

## SRI LANKAN AND MALDIVIAN TOURISTS: VISA ON ARRIVAL FACILITY

1311/2025

**10.ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2022 සිට 2024 දක්වා ව්‍යාපාරික කටයුතුවලට, සංචාරය සඳහා හෝ වෙනත් කටයුතු සඳහා මාලදිවයිනට ගිය ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව සහ ශ්‍රී ලංකාවට පැමිණි මාලදිවයින් ජාතිකයින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මාලදිවයිනේ සංචාරය කරනු ලබන ශ්‍රී ලාංකිකයින් සඳහා පැමිණි විගස වීසා - visa on arrival - ලබා දීමෙන් ශ්‍රී ලංකාවට අත් වූ ප්‍රතිලාභය කවරේද;

(iii) දින අනූවක නිදහස් වීසා පහසුකම් ලබා දෙන ලද්දේ මාලදිවයිනට යන ශ්‍රී ලාංකිකයින් සඳහා පමණක්ද;

(iv) නොඑසේ නම්, ශ්‍රී ලංකාවට පැමිණෙන මාලදිවයින් ජාතිකයින්ටත් එම පහසුකම් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2022ஆம் ஆண்டு தொடக்கம் 2024ஆம் ஆண்டு வரை வர்த்தக நடவடிக்கைகளுக்காக, சுற்றுலா அல்லது பிற நடவடிக்கைகளுக்காக மாலைத்தீவுக்குச் சென்ற இலங்கையர்களின் எண்ணிக்கை மற்றும் இலங்கைக்கு வருகை தந்த மாலைத்தீவு நாட்டவர்களின் எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மாலைத்தீவுக்கு சுற்றுலா செல்லும் இலங்கையர்களுக்கு 'வருகைக்கு பின்னரான வீசா' (visa on arrival) வழங்குவதால் இலங்கைக்குக் கிடைக்கும் அனுகூலம் யாது என்பதையும்;

(iii) தொண்ணூறு நாள் இலவச வீசா வசதிகள் மாலைத்தீவுக்குச் செல்லும் இலங்கையர்களுக்கு மட்டுமா வழங்கப்படுகிறது என்பதையும்;

(iv) இன்றேல், இலங்கைக்கு வருகைதரும் மாலைத்தீவு நாட்டவர்களுக்கும் மேற்படி வசதிகள் வழங்கப்படுகிறதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of Sri Lankans who had visited the Maldives for business, travel or other purposes, as well as the number of Maldivians who had visited Sri Lanka, separately for each year from 2022 to 2024;

(ii) the benefit accrued to Sri Lanka from the visa on arrival facility for Sri Lankans visiting the Maldives;

(iii) whether the 90-day visa-free facility was provided only to Sri Lankans visiting the Maldives; and

(iv) if not, whether the same facility will also be provided to Maldivians visiting Sri Lanka?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| වර්ෂය | මාලදිවයිනට ගිය ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව | ශ්‍රී ලංකාවට පැමිණි මාලදිවයින් සංචාරකයින් සංඛ්‍යාව |
|---|---|---|
| 2022 | 93,406 | 18,880 |
| 2023 | 110,680 | 37,328 |
| 2024 | 85,244 | 47,222 |
| **එකතුව** | **289,330** | **103,430** |

(ii) 1. සංචාරක සහ ව්‍යාපාරික ගමන් පහසු වීම.

* දින 90ක, පැමිණි විගස වීසා - visa on arrival - පහසුකම ලබා දීමෙන් වීසා පෙර ලබා ගැනීමේ අවශ්‍යතාව නැති වීම සහ සංචාරක වීසා ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවීම නිසා කාලය සහ මුදල් ඉතිරි වීම මත ශ්‍රී ලාංකිකයින්ට පහසුවෙන් මාලදිවයිනට ගමන් කළ හැකි වීම.
* කෙටි කාලීන සංචාර, ව්‍යාපාරික හමුවීම්, අධ්‍යාපන හුවමාරුව, වෛද්‍ය සංචාරක සේවා සහ නිවාඩු සංචාර වැඩි වීම.

2. ආර්ථික සහ වාණිජ සබඳතා වර්ධනය වීම.

* වාණිජ කටයුතු - trade - සහ ආයෝජන වැඩි වීමට උපකාරී වීම.
* ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට නව වෙළෙඳ අවස්ථා ලබා ගත හැකි වීම.

3. සංස්කෘතික හා සමාජ සබඳතා ශක්තිමත් වීම.

* දෙරට ජනතාව අතර සම්බන්ධතා වැඩි වීම.
* සංස්කෘතික හුවමාරු - cultural exchanges - වැඩි වීම.

සමස්තයක් වශයෙන්, පැමිණි විගස වීසා පහසුකම ලබා දීමෙන් දෙරට අතර සමීප ද්විපාර්ශ්වික සබඳතා ප්‍රවර්ධනය කරන අතර, ශක්තිමත් රාජ්‍ය තන්ත්‍රික, ආර්ථික සහ සමාජයීය සබඳතා පවත්වා ගැනීමට දායක වේ.

(iii) නැත.

[ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා]

(iv) ශ්‍රී ලංකාවට පැමිණෙන මාලදිවයින් ජාතිකයින් සඳහා ද "පැමිණි විගස වීසා" - visa on arrival - ක්‍රමවේදය යටතේ ගාස්තු අය කිරීමකින් තොරව දින 90ක සංචාරක වීසාවක් ලබා දේ.

(ආ) අදාළ නොවේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මාලදිවයින් ජාතිකයින් වැඩි පිරිසක් ලංකාවට එන්නේ සංචාරය කරන්න නොවෙයි, බෙහෙත් ගන්න. ඉතින් දින 90ක වීසා නොමිලේ ලබා දෙන එකෙන් වැඩි වාසිය තිබෙන්නේ ශ්‍රී ලාංකිකයින්ටද, නැත්නම් මාලදිවයින් ජාතිකයින්ටද කියලා මම අහනවා.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)
ගරු කථානායකතුමනි, අපි දන්නවා, මාලදිවයිනේ ක්‍රියාත්මක වන ජාතික සෞඛ්‍ය රක්ෂණාවරණය වන "Aasandha" යටතේ සහ මේ වීසා ක්‍රමය යටතේ මාලදිවයින් ජාතිකයින් විශාල වශයෙන් ලංකාවේ පෞද්ගලික රෝහල්වලට එන බව, ප්‍රතිකාර ලබා ගන්න. ඒ, medical tourism scheme එක යටතේ. නමුත්, ශ්‍රී ලාංකිකයින් විශාල වශයෙන් මාලදිවයිනට යන්නේ රැකියාවල යෙදෙන්නයි. එයිනුත් විශාල වශයෙන් ආර්ථික වාසි අපට අත්වනවා. ඒ නිසා, මේ වීසා ක්‍රමය හරහා වැඩි වාසි අත්වෙලා තිබෙන්නේ ශ්‍රී ලංකාවට කියලා තමයි අපි විශ්වාස කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## 2019 සිට පීඩාවට පත් වූ ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්: වන්දි

### 2019 முதல் இன்னல்களுக்குள்ளான இலங்கையின் புலம்பெயர் தொழிலாளர்கள்: இழப்பீடு

### SRI LANKAN MIGRANT WORKERS EXPERIENCED HARDSHIPS SINCE 2019: COMPENSATION

24/2024

1. **ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hesha Withanage Ankumbura Arachchi)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා විදේශ රැකියාවල නිරතව සිටියදී විවිධ පීඩාවන්ට පත්වී ඇති ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වන විට වන්දි ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) මෙලෙස පීඩාවන්ට පත්වන ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ට ලබා දෙන ලද වන්දි මුදල වැඩි කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2019ஆம் ஆண்டிலிருந்து இதுவரை வெளிநாட்டுத் தொழில்களில் ஈடுபட்டிருந்தபோது பல்வேறு இன்னல்களுக்கு உள்ளாகிய, இலங்கையின் புலம்பெயர் தொழிலாளர்களின் எண்ணிக்கை ஒவ்வோர் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) இவர்களில், இதுவரை இழப்பீடு வழங்கப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) இவ்வாறு இன்னல்களுக்கு உள்ளாகும் இலங்கையின் புலம்பெயர் தொழிலாளர்களுக்கு வழங்கப்படும் இழப்பீட்டுத் தொகையை அதிகரிப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of Sri Lankan migrant workers who have experienced various hardships while being employed overseas in each year from the year 2019 up to now;

(ii) the number of persons who have been provided with compensation by now, out of the aforesaid persons; and

(iii) the measures that will be taken to increase the amount provided as compensation to Sri Lankan migrant workers who have experienced hardships, as is mentioned above?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | පීඩාවට පත් වූ සංඛ්‍යාව |
|---|---|
| 2019 | 4,914 |
| 2020 | 5,130 |
| 2021 | 4,185 |
| 2022 | 4,500 |
| 2023 | 7,534 |
| 2024 | 7,448 |
| 2025 | 8,323 |
| 2026 පෙබරවාරි මස දක්වා | 1,178 |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පරිගණක දත්ත පද්ධතියට අනුව විගමනික ශ්‍රමිකයින් මුහුණපාන ලද විවිධ ආකාරයේ ගැටලු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත ලැබුණු පැමිණිලි එක් එක් වර්ෂය අනුව ඉහත සඳහන් කර ඇති අතර එම පැමිණිලිවලට අදාළ ගැටලුවල ස්වභාවයන් පිළිබඳ තොරතුරු ඇමුණුම 01**හි දක්වා ඇත.

(ii) විදේශ රැකියාවෙහි නිරතව සිටියදී විවිධ පීඩාවන්ට පත් වූ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලැබූ විගමනික ශ්‍රමිකයින් සඳහා ගෙවන ලද මුදල් සම්බන්ධ විස්තර ඇමුණුම 02**හි දක්වා ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ලියාපදිංචිය ලබා විදේශගත වන ශ්‍රමිකයින්ට එතෙරදී මුහුණදීමට සිදුවන හදිසි අනතුරු, කරදර-හිරිහැර, ලෙඩ රෝග, මරණ සඳහා හිමිකම් ලබා දීමට රක්ෂණාවරණ ක්‍රියාත්මක වේ.

එම රක්ෂණාවරණයක හිමිකම් ලබා ගැනීම සඳහා, ඉහත තත්ත්වයන්ට මුහුණ දුන් ශ්‍රමිකයින් හෝ ඔවුන්ගේ යැපෙන්නන්, අදාළ ලිපි ලේඛන සමඟ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයට හෝ දිස්ත්‍රික් මධ්‍යස්ථානවලට පැමිණ අදාළ ඉල්ලීම් සිදු කරනු ලබන අතර, එම ඉල්ලීම් කාර්යාංශය විසින් රක්ෂණායතනයට යොමු කරනු ලබයි. රක්ෂණායතනය ඒවා පරීක්ෂා කර බලා අදාළ ගෙවීම් සිදු කරන අතර, ප්‍රමාදවීම් ආදිය සිදුවුවහොත් පසුවිපරම් කොට ඒවා ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මැදිහත් වීම සිදු කරනු ලබයි. මේ යටතේ ලංකාවට පැමිණීම සඳහා වන ගුවන් ටිකට්පත් ගාස්තු, ලංකාවේදී කරනු ලබන ප්‍රතිකාර සඳහා වන වියදම් හා මරණ සඳහා යැපෙන්නන්ට හිමිකම් ලබා දීම සිදු කරනු ලබයි. එම සියලු ගෙවීම් චෙක්පත් මඟින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලබා දෙන අතර, කාර්යාංශය ඉල්ලුම්කරුවන්ගේ ගිණුම්වලට බැර කරනු ලබයි.

තවද, රක්ෂණයෙන් ආවරණය නොවන ඉහත අවස්ථා සඳහා සහනයක් ලබා දීමට සේවක සුබසාධන අරමුදල (දේශීය) ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ලැබෙන ඉල්ලීම් සලකා බලා සහන සැලසීම සිදු කරනු ලබයි. ලැබෙන සියලු ඉල්ලීම් සේවක සුබසාධන අරමුදල් කමිටුව වෙත යොමු කරනු ලබන අතර, නිර්ණායකයන්ට යටත්ව කමිටු තීරණය මත ගෙවීම් සිදු කිරීම කරනු ලබයි. ඒ සඳහා සෘජු ඉල්ලීම්වලට අමතරව සංවර්ධන නිලධාරින්, ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් ලැබෙන ඉල්ලීම් ද සලකා බලනු ලබයි. ප්‍රධාන කාර්යාලයට හෝ දිස්ත්‍රික් කාර්යාල හරහා මෙම ඉල්ලීම් ඉදිරිපත් කළ හැක.

එසේම විදේශ රැකියා නියෝජිත ආයතන මඟින් විදේශගත වූ විගමනික ශ්‍රමිකයින් රැකියා ස්ථානයේදී මුහුණපාන ලද වැටුප් නොගෙවීම්, සේවා ගිවිසුමෙහි කොන්දේසි කඩකිරීම් ආදී වශයෙන් වූ විවිධාකාරයේ පැමිණිලි සමථකරණ කටයුතු සිදු කිරීමේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 44(1) වගන්තිය අනුව කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුක්ත යම් තැනැත්තෙකුගෙන් හෝ ඔහු වෙනුවෙන් පැමිණිල්ලක් සමථ අංශයේ ගොනු කිරීමෙන් පසු සමථ නිලධාරි විසින් පැමිණිලි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව පැමිණිල්ලේ කරුණු ඔප්පු කර ඇති බව නිගමනය කළහොත්, ඒ තැනැත්තාට ලැබිය යුතු නොගෙවන වේතන, නිවාඩු දින වෙනුවෙන් ගෙවීම්, සේවා ස්ථානයේ සිදුවන කරදර/හිරිහැර, සන්නිවේදනය නොමැති වීම - lack of communication - සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ යනාදියේ වටිනාකම ලබා නොදීම යනාදී ගැටලු මෙන්ම, සේවා යෝජකයා විසින් එම කොන්දේසි කඩකිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් එම තැනැත්තා විසින් දරනු ලැබූ ශ්‍රී ලංකාවට පැමිණීමේ ගමන් ගාස්තු ඇතුළුව වෙනත් වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් යැයි ඔහු තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයක් ඒ තැනැත්තාට ගෙවන ලෙසට බලපත්‍රලාභියාට විධානයක් ප්‍රදානය කර ඒ අනුව ක්‍රියා නොකිරීම හේතුවෙන් දේශීය රැකියා නියෝජිත ආයතනය හා විදේශ රැකියා නියෝජිත ආයතනය අසාධු ලේඛනගත කිරීම සිදු කරනු ලබන අතර නීති මඟින් ද කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා බඳවා ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් ගොනු කරනු ලබන පැමිණිලි විශේෂයෙන්ම "හදිසි" යැයි සලකන, කඩිනමින් විසඳුම් ලබා දිය යුතු ගැටලු සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදු නොකරන අවස්ථාවලදී දේශීය රැකියා නියෝජිත ආයතනය හා විදේශ රැකියා නියෝජිත ආයතනය අසාධු ලේඛනගත කිරීම සිදු කරනු ලබයි.

ස්වයං මාර්ගයෙන් විදේශගත වූ විගමනික ශ්‍රමිකයින් සඳහා හිඟ වැටුප්, පාරිතෝෂික දීමනා, විදේශ රක්ෂණාවරණයෙන් ලැබූ මුදල් ආදිය ගෙවනු ලබයි. එහිදී පැමිණිලි විසඳා ගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සහාය දක්වන ලද නමුත්, ඇතැම් ශ්‍රමිකයින්හට හිමි මුදල් ඔවුන්ගේ පෞද්ගලික ගිණුම්වලට විදේශීය බැංකු හරහා සෘජුවම මුදල් තැන්පත් කර ඇත. කාර්යාංශ දත්ත අනුව 2025 වර්ෂයේ එසේ පීඩාවට පත් විගමනික ශ්‍රමිකයින් 31දෙනෙකු සඳහා රු. 67,175,873.39ක මුදලක් සෘජුවම විදේශීය බැංකු හරහා අදාළ ශ්‍රමිකයින්ගේ බැංකු ගිණුම් වෙත බැර කර ඇත. එහිදී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි.

- අදාළ රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ රැකියා හා සුබසාධන අංශය සමඟ සම්බන්ධීකරණයකොට පැමිණිලිකරු වෙත තොරතුරු ලබා දීම හා අවශ්‍ය තොරතුරු තානාපති කාර්යාලය වෙත ලබා දීම.
- අදාළ ශ්‍රමිකයා මෙරට රැඳී සිටින්නේ නම් ඔහුට සම්බන්ධ නඩු කටයුත්තක් අදාළ රටේ පවතින්නේ නම් හා අවශ්‍ය වූ විට ඒ සඳහා ඇටෝර්නි බලපත්‍ර සකස් කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම හා අදාළ ලේඛන තානාපති කාර්යාල වෙත යොමු කිරීම.
- නඩු කටයුත්තක් අවසානයේ තීරණය වන හිඟ වැටුප් හා දීමනා තානාපති කාර්යාලයේ ගිණුම් වෙත තැන්පත්කොට ඇත්නම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා අදාළ පැමිණිලිකරුවන් වෙත ගෙවීම් කිරීම.

(iii)

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ලියාපදිංචිය සහිතව විදේශ සේවයේ සිටියදී විගමනික ශ්‍රමිකයින්ගේ යැපෙන්නන්හට රක්ෂණාවරණයෙන් ලබා දෙනු ලබන රු. 600,000ක මුදල ප්‍රමාණවත් නොවන බැවින්, 2025.06.25 දිනෙන් පසු යම් ශ්‍රමිකයකු මියගියහොත් එම ශ්‍රමිකයාගේ යැපෙන්නන්හට තවත් රු. 1,400,000ක මුදලක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවක සුබසාධන අරමුදලින් ගෙවීම් කිරීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ රැකියා සඳහා පිටත්වන සියලුදෙනාට නොමිලයේ රක්ෂණ ආවරණයක් ලබා දීම සිදු කරන අතර, ඒ සඳහා වැය වන රක්ෂණ වාරික මුදල කාර්යාංශය විසින් සම්පූර්ණයෙන්ම ගෙවනු ලබයි.
- එසේම ඉහත රක්ෂණ යෝජනා ක්‍රමයට වඩා වැඩි ප්‍රතිලාභ සහිත රක්ෂණ යෝජනා ක්‍රමයක් රක්ෂණලාභියාගේ කැමැත්ත මත තෝරාගත හැකි අතර, එහිදී අමතර මුදලක් රක්ෂණලාභියා විසින් ගෙවා මෙම ප්‍රතිලාභ වැඩි ක්‍රමය තෝරා ගැනීමට පහත පරිදි අවස්ථාව ලබා දී ඇත. (අවුරුදු 02ක කොන්ත්‍රාත් කාලය සඳහා අමතරව රුපියල් 935.66ක මුදලක් ද, අවුරුදු 03ක කොන්ත්‍රාත් කාලය සඳහා රුපියල් 1,087.38ක මුදලක් ද ඒ සඳහා ගෙවිය යුතු වේ.)

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

| රක්ෂණ ප්‍රතිලාභය | දැනට පවතින රක්ෂණ හිමිකම (පළමු තේරීම) | තෝරා ගැනීමට හඳුන්වා දී ඇති වැඩි ප්‍රතිලාභ හිමි රක්ෂණ හිමිකම (දෙවන තේරීම) |
|---|---|---|
| ලියාපදිංචිය වලංගු කාලය තුළ විදෙස් සේවයේ නියුක්තව සිටියදී මුහුණදීමට සිදුවූ බරපතළ රෝගී තත්ත්වයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණ මාස 03ක් ගතවීමට පෙර ජීවිතක්ෂයට පත්වීම | රු. 250,000 | රු. 500,000 |
| ලියාපදිංචිය වලංගු කාලය තුළ විදෙස් සේවයේ නියුක්තව සිටියදී මුහුණදීමට සිදු වූ හදිසි අනතුරක් හේතුකොටගෙන පූර්ණ හෝ අර්ධ ආබාධිත තත්ත්වයට පත්වීම. | උපරිමය රු. 500,000 | උපරිමය රු. 600,000 |
| *ලංකාවට පැමිණීමෙන් පසු දැරීමට සිදුවන වෛද්‍ය වියදම් සඳහා | උපරිමය රු. 50,000 | උපරිමය රු. 150,000 |
| ලෙඩ රෝග / හදිසි අනතුරු / වධහිංසා ආදිය හේතුවෙන් ලංකාවට පැමිණීමෙන් පසු දැරීමට සිදුවන වෛද්‍ය වියදම් සඳහා ආදී වශයෙන් තවත් ප්‍රතිලාභ ඇත. | උපරිමය රු. 50,000 | උපරිමය රු. 150,000 |

(ආ) අදාළ නොවේ.

## වෛද්‍ය සැපයුම් අංශය: "ලැක්මියුලෙස්" එන්නත් මිලදී ගැනීම
## மருத்துவ வழங்கல் பிரிவு: 'லெக்மியுலெஸ்' தடுப்பூசி கொள்வனவு
## MEDICAL SUPPLIES DIVISION: ALLEGATION REGARDING PURCHASE OF "LACMULASE" VACCINE

208/2024

**3. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நலின் பண்டார ஜயமஹ சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Nalin Bandara Jayamaha)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 'ලැක්මියුලෙස්' එන්නත් මිලට ගැනීමේදී වෛද්‍ය සැපයීම් අංශයේ සිදු වී ඇති වංචාව සම්බන්ධයෙන් දැනුවත් වී තිබේද;

(ii) එම වංචාව සම්බන්ධයෙන් චෝදනා එල්ල වූ නිලධාරීන්ගේ නම් හා තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම වංචාව සම්බන්ධව සිදු කරනු ලබන පරීක්ෂණවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 'லெக்மியுலெஸ்' தடுப்பூசிகளைக் கொள்வனவு செய்தபோது மருத்துவ வழங்கல் பிரிவில் இடம்பெற்றுள்ள மோசடி தொடர்பாக அறிவாரா என்பதையும்;

(ii) மேற்படி மோசடி தொடர்பாக குற்றஞ்சாட்டப்பட்ட அலுவலர்களின் பெயர்கள் மற்றும் அவர்களின் பதவிகள் என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி மோசடி தொடர்பாக மேற்கொண்டுவரும் விசாரணைகளின் முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware of the fraud that has been committed at the Medical Supplies Division in the purchase of "Lacmulase" vaccine;

(ii) the names and designations of the officers who have been accused of the fraud referred to above, separately; and

(iii) the progress of the investigations that are being conducted into the fraud concerned?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 'ලැක්මියුලෙස්' නමින් එන්නතක් වෛද්‍ය සැපයීම් අංශයේ ඖෂධ වට්ටෝරුවේ නොමැති අතර මෙවැනි එන්නතක් මිලදී ගෙන නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 28(උ) යටතේත්, ස්ථාවර නියෝග 92(1) යටතේත් මම කරුණු ඉදිරිපත් කරනවා. ගරු කථානායකතුමනි, මගේ ළඟ මේ තිබෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය. මේක තිබෙන්නේ

ඔබතුමාට ක්‍රියාත්මක කරන්න. ගරු කථානායකතුමනි, පැමිණීම, හැසිරීම සහ ආචාරශීලීත්වය යටතේ මේකේ 30වන වගන්තියෙහි මෙසේ සඳහන් කර තිබෙනවා:

> "මන්ත්‍රීවරයන් ආචාරශීලීව කටයුතු කළ යුතු අතර, දේශපාලන කථාවල දී සහ විශේෂයෙන් ම පාර්ලිමේන්තු විවාදවල දී උචිත භාෂාවක් භාවිත කළ යුතු ය."

ගරු කථානායකතුමනි, අපේ අධිකරණ ඇමතිතුමා මැද ඇඟිල්ල පෙන්වා දිව එළියට දානවා. ඔබතුමා කියනවා, හැන්සාඩ්ගත වෙන්න ඕනෑ නැහැ කියලා. එහෙම නීතියක් නැහැ. එතුමා දිව එළියට දාලා මැද ඇඟිල්ල පෙන්වීම පිළිබඳව ඔබතුමා විමර්ශනයක් කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. එහෙම දෙයක් ඔබතුමා දැක්කාද කියලා මම දන්නේ නැහැ. එතැනදී එය මම දැක්කේත් නැහැ. ඔබතුමා එම ඉල්ලීම ලිඛිතව ලබා දෙන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
විමර්ශනයක් කරන්න. මෙහි 54වන වගන්තියෙහි දක්වා තිබෙනවා, ක්‍රියාත්මක වෙන්න ඕනෑ ආකාරය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා එම ඉල්ලීම ලිඛිතව ලබා දෙන්න, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point එක මොකක්ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, දැන් ඔබතුමා එම ඉල්ලීම ලිඛිතව ලබා දෙන්න කියලා කියන්නේ, ඔබතුමාගේ ඉස්සරහ නේ, මේ සිද්ධිය වුණේ. මේ මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම ඒ සිද්ධිය දැක්කා. මේක අසත්‍ය දෙයක් නොවෙයි නේ, ගරු කථානායකතුමනි. ඒක සියයට සියයක් සත්‍ය කථාවක් නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒක දැක්කේ නැහැ නේ. මයික් එක ලබා දීලාත් නැහැ, TV screen එක ලබා දීලාත් නැහැ. අනික, මම ගරු ඇමතිතුමා දෙස බලාගෙන සිටියේත් නැහැ, ඔබතුමන්ලා බලාගෙන සිටියාට. මොකක්ද වුණේ කියන එක මම දන්නේ නැහැ නේ. ඔබතුමා එම ඉල්ලීම මට ලිඛිතව ලබා දෙන්න.

ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ආගමික නායකයින්ට නිකුත් කරන ලද නිල ගමන් බලපත්‍ර භාවිත කර සිදු කරන ලද සංචාර
### சமயத் தலைவர்களுக்கு வழங்கப்பட்ட உத்தியோகபூர்வ கடவுச்சீட்டுகளைப் பயன்படுத்தி மேற்கொள்ளப்பட்ட விஜயங்கள்
### VISITS MADE USING OFFICIAL PASSPORTS ISSUED TO RELIGIOUS LEADERS

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி!

காலத்துக்குக் காலம் நாட்டில் அதிகாரத்திலிருந்த ஆட்சியாளர்கள், பிரதான மதங்களைப் பாதுகாத்துப் போஷிக்கும் நோக்கத்தை முன்வைத்து, குறித்த சமயங்களின் உயர்மட்ட சமயத் தலைவர்களுக்கும் அரசியல் ரீதியாக ஆட்சியாளர்களுடன் நெருக்கமாக இருந்த அல்லது அவர்களது அரசியல் நடவடிக்கைகளுக்கு ஒத்துழைப்பு வழங்கிய சமயத் தலைவர்களுக்கும் பல்வேறு சலுகைகள் மற்றும் அன்பளிப்புகளை வழங்கியதாக பொது மக்கள் மத்தியில் கருத்துகள் நிலவுகின்றன. இத்தகைய சூழ்நிலையில், நிறைவேற்று அதிகாரமிக்க சனாதிபதியின் விசேட ஏற்பாடுகளின்கீழ் அல்லது அமைச்சரவையின் அனுமதியுடன் அல்லது சம்பந்தப்பட்ட அமைச்சின் ஏற்பாட்டின் அடிப் படையில் பௌத்தம், இந்து, இஸ்லாம் மற்றும் கத்தோலிக்க சமயத் தலைவர்களுக்கு மாவட்ட அடிப்படையில் விசேட சலுகைகளுடன் இலங்கை அரசின் உத்தியோகபூர்வ கடவுச்சீட்டுகள் - official passports - வழங்கப்பட்டுள்ளதா என்பது குறித்து தெளிவான தகவல்களை மக்கள் எதிர்பார்க்கின்றனர். அதன்படி, பின்வரும் வினாக்களை கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

1. இதுவரை இலங்கை அரசின் உத்தியோகபூர்வ கடவுச்சீட்டுகள் வழங்கப்பட்டுள்ள சமயத் தலைவர் களின் பெயர், அவர்களது மாவட்டம் மற்றும் கடவுச்சீட்டு வழங்கப்பட்ட திகதி பற்றிய விபரங்கள் என்ன?
2. குறித்த உத்தியோகபூர்வ கடவுச்சீட்டுகளைப் பயன் படுத்தி, அந்தந்த சமயத் தலைவர்கள் பயணம் செய்துள்ள நாடுகள், பயணித்த திகதிகள் மற்றும் ஒவ்வொரு பயணத்துக்குமான முழுமையான தனித்தனிப் பயண விபரங்கள் என்ன?
3. காலாவதியான உத்தியோகபூர்வ கடவுச்சீட்டுகளை மீளப் புதுப்பிப்பதற்கு நிர்ணயிக்கப்பட்டுள்ள தகைமைகள் மற்றும் நிபந்தனைகள் என்ன?
4. மேற்கூறிய நிபந்தனைகளின் அடிப்படையில் மீண்டும் புதுப்பிக்கப்பட்ட உத்தியோகபூர்வ கடவுச் சீட்டுகளைப் பெற்றுக்கொண்ட சமயத் தலைவர்களின் பெயர் விபரம் என்ன?
5. இன்றேல் ஏன்?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය යොමු කර තිබෙනවා. 2008 අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් පදනම් කර ගනිමින් සහ 2016 අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් පදනම් කර ගනිමින් ආගමික නායකයින් සඳහා නිල ගමන් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව සහ ඔවුන් පදිංචි දිස්ත්‍රික්ක, ඔවුන් ගිය සංචාර පිළිබඳව දීර්ඝ පූර්ණ විස්තරයක් ලබා දෙන්න කියලා තමයි මේ ප්‍රශ්නයෙන් ඉල්ලා තිබෙන්නේ. එම තොරතුරු ඉතා කෙටි කාලයකින් ලබා ගැනීමට අපහසුයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමනි, සති දෙකක කාලයක් තුළ මේකට පිළිතුරක් ලබා දෙන්න උත්සාහ කරන්නම්. මොකද, මීට අදාළව තොරතුරු විශාල ප්‍රමාණයක් ඒක රාශි කර ගන්න අවශ්‍ය වනවා. බොහොම ස්තුතියි.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் பதில் வழங்கும் பொழுது, இவர்களுக்கு எந்த criteriaஇன் அடிப்படையில் passport வழங்கப்பட்டுள்ளது என்ற விபரத்தையும் சேர்த்து வழங்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, ඒ criteria පසුගිය ආණ්ඩු විසින් අමාත්‍ය මණ්ඩලයෙන් හෝ යම් යම් චක්‍රලේඛ මත අනුමත කරපු ඒවා. ඒ විස්තර විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ සියල්ල ලබා දෙනවා. ඒකට සාධාරණ කාලයක් ලබා දෙන්න කියලා තමයි ඉල්ලා සිටින්නේ. සති දෙකක් ඇතුළත පිළිතුරු ලබා දෙන්න උත්සාහ කරනවා. එහෙම බැරි වුණොත් තවත් සතියකවත් සාධාරණ කාලයක් ලබා දෙන්න. මොකද, මේ සම්බන්ධයෙන් දීර්ඝ පිළිතුරක් ලබා දෙන්න වෙයි. මම හිතන විධියට, පිටු දෙතුන්සියයකට වැඩි පිළිතුරක් මේ තුළ තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

## II

## සත්‍යය, වගවීම සහ සංහිඳියාව සහතික කිරීම සඳහා රජයේ මූලපිරීම

## உண்மை, பொறுப்புக்கூறல் மற்றும் நல்லிணக்கத்தை உறுதி செய்வதில் அரசாங்கத்தின் முன்முயற்சி

## GOVERNMENT'S INITIATIVE ON ENSURING TRUTH, ACCOUNTABILITY AND RECONCILIATION

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Hon. Speaker, in light of the UN Human Rights Council 61: Sri Lanka Core Group Statement, which calls for credible accountability, strong independent institutions and meaningful engagement with OHCHR, and noting that victim communities, particularly families of the disappeared, have rejected domestic mechanisms and continue to call for credible international investigations, I ask the Hon. Minister of Justice and National Integration the following questions.

Further, while previous Governments, at least, engaged in discussions on truth, reconciliation and accountability mechanisms, the present Government's policy framework focuses on governance and anti-corruption without clearly addressing war-time accountability and justice. Hon. Minister of Justice, the mandate you got was not only to deal with corruption, but also to address accountability and justice issues.

1. What is the Government's current official estimate of persons missing during the final stages of the armed conflict in 2009 and has that been updated?
2. Does the Government accept that there is still no credible consolidated database of missing persons and what steps are being taken to establish one?
3. What is the status of investigations into the Chemmani mass graves discovered in 2025 and the timeline for forensic analysis, identification and accountability?
4. How many mass grave sites have been officially identified to date and what progress has been made in those investigations?
5. Will the Government permit or seek international forensic and investigative assistance into these cases?
6. What is the Government's position on individuals who allegedly surrendered to the military in the final days of the war and are now missing?
7. Will the Government utilize evidence compiled by the Sri Lanka Accountability Project - SLAP - in pursuing such cases?
8. What outcomes has the Office on Missing Persons delivered since this Government assumed office?
9. What actions has the Office for Reparations taken and how does the Government respond to concerns that reparations without truth and justice are insufficient?

10. Finally, will the Government commit to a time-bound credible process, including international involvement, to deliver accountability and non-recurrence?

Hon. Minister, I am asking you these questions in light of your President having been in power for a year and six months now and most of these concerns have still not been addressed. I have asked the Hon. Prime Minister two such questions previously under Questions posed to Hon. Prime Minister, and she also confirmed that it is work in progress. But, we are yet to see any concrete steps; as Representatives of the victim community, we are unable to see them.

Especially, with regard to the Chemmani mass graves - you have unearthed a certain number of skeletons - there has been no forensic analysis or anything; you have not done anything. Unearthing further skeletons is another matter, but with regard to the skeletons or the remains found so far, what have you all done?

And, one last matter I would like to add, Hon. Minister, is the issue of political prisoners. The previous Government under President Ranil Wickremesinghe used to engage with us and even though we did not accept the TRC, they, at least, had a proposal. When we demanded the release of political prisoners, they released, at least, one or two. Actually, President Ranil Wickremesinghe released a few. But, you all have not released any. You are not even agreeing that there are political prisoners.

So, in light of this situation, Hon. Minister, I would like to have answers to my Question.

Thank you.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Hon. Speaker, first of all, I would like to thank the Hon. Shanakiyan Rasamanickam for raising this most pertinent Question. He is one of the very few Members who periodically raise these questions, which actually bring the Government also into accountability. So, thank you for this timely and thoughtful Question. Despite the short duration, I have also prepared thoroughly to answer because I understand that the Question is important and again, I am very grateful that you raised it. As you know, although we have been in power for the last one-and-a-half years, we have to work with records and databases that existed prior to us even contemplating coming here.

1. The Government has acknowledged that a significant number of persons remain unaccounted for following the final stages of the armed conflict in 2009. Official figures have varied over time, reflecting different sources and methodologies such as Presidential Commissions of Inquiry, the Lessons Learnt and Reconciliation Commission and the Office on Missing Persons, which only started in 2018, a number of years after the war. So, we may not necessarily agree with the number here, but according to the records, this is all I have. I do not know whether it is right or wrong and whether anyone would agree that they are it is right or wrong. But, I can only give you what is on record from 2009. So, the number I can come up with is, 2,764. That could be debated, which I would not go against in the case of a debate.

2. Then, a credible consolidated database. Hon. Member, it is very correct that that has been a massive challenge. From the time we came in, we were working with the ICRC in developing this database. So, let me answer you on that question. The Government accepts that the absence of a fully credible, consolidated National Database has been a longstanding challenge. Fragmentation across multiple institutions such as the OMP, the Human Rights Commission and prior to that, *ad hoc* commissions which have been going on for a very long time has hindered the creation of a unified record. However, the following steps are currently being taken by the Office on Missing Persons:

- Information from different sources has been consolidated and entered into a temporary database to ensure that existing records are preserved and accessible.
- A formal proposal has been developed for the establishment of a comprehensive Database Management System - DBMS - to serve as the long-term solution.

  In these instances, we might get help from our international friends to assist us with that.
- A requirement identification process with relevant stakeholders is currently underway to ensure that the system is designed to meet humanitarian, legal and accountability needs.
- In parallel, the Office on Missing Persons is being strengthened to centralize data collection, coordinate with law enforcement and civil registries and introduce digital platforms to improve transparency and accuracy.
- Engagement with international partners and civil society continues to ensure methodological rigor and public trust in the process.

I must say that I myself was involved with Troika as well as the UN Resident Coordinator on Human Rights. The moment we develop these proposals, they would be given to them, and we are working on them.

3. About the Chemmani mass graves, I am glad that you asked because there is a lot of misinformation doing in the media, saying that the Government is not releasing enough funds or things of that nature, which are not correct at all. Even last time, we had released Rs. 19 million and as you are aware, the

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

graves were discovered on the 19th of February, 2025 and currently, that site is protected by civil community groups as well as the Police, jointly, so that evidence does not get damaged. If you take a certified copy of the court record, it would be seen that Police and the local community are jointly protecting this, and as I told you, the Ministry of Justice and National Integration has given the budget. We are using a lot of technologies at the moment to minimize the risk of damaging potential evidence and to ensure that the process adheres to international best practices and standard operating procedures - SOPs - in forensic archaeology and human rights investigations. The ultimate objective is to ensure a scientifically rigorous and transparent excavation process that upholds judicial inquiry and delivers justice to the families of the victims. The means and methods and the timeline are actually decided by the court house together with forensic anthropologists and archaeologists who are working on the sites, JMOs and police and crime scene investigators in accordance with international protocols.

Let me add something else which is not here. That is, we are also trying to prepare a timeline to bring a closure to this, and once the remains are gathered, the court will direct us to send them for forensic investigations. Some investigations are being done for identification - a public identification process went through - and I will give you more updates as they come.

4 & 5. I will respond to the questions collectively since both are similar.

The Office on Missing Persons has reported information relating to 19 mass grave sites and it is currently working closely with eight sites located in Colombo, Mullaitivu, Mannar, Batticaloa and Trincomalee. Overall, the OMP plays a critical role in advancing its mandate by expanding its operations. For this, technical support was obtained from the ICRC through workshops on forensic archaeology and engaging in training more than 40 excavation officers from the Department of Archaeology, who were trained on mass grave investigations. An extension of the workshop on advanced forensic archaeology was also organized with 60 participants from the Department of Archaeology. This training and technical support was provided to the expert team in order to create a pool of Excavation Officers to investigate the mass graves and to accelerate the process in finding out the fate of the missing persons. The OMP is working closely with the ICRC and there are commitments established to work collaboratively for the next three years. So, we are working with them.

6. Hon. Rasamanickam, let us accept the fact that these are very painful histories involving victims and very painful memories for all parties concerned. War is no game; war, we do not want to repeat. However, we have to accept the fact that during a period of war, people are made to disappear by both sides. It is not right, but wrong, and we stand against it. But, that is the nature of war. However, we do not justify it.

Currently, there are a couple of court cases going on with regard to specific disappearances and let them take their due course because the law does not look at what is right or wrong in the eyes of a war, but what is right and wrong according to law. So, if someone had surrendered to the Army and had gone missing, then courts must investigate under the legal process. Therefore, the court process is ongoing. However, since you brought this to my notice as well, I would invite you to, if there are any specific instances where, still, there are blocks in the system or some things have not been brought before courts under the legal process, please indicate them, too. I am quite willing to sit down on a separate conversation with you and attend to it.

7. The question is with regard to the Sri Lanka Accountability Project - SLAP. As far as that is concerned -that came up in January and it is a unilateral publication on the part of the UN - soon, a statement will be made by the UN Permanent Representative to Geneva.

But, my response for the time being is this. Sri Lanka has not accepted the Sri Lanka Accountability Project as it constitutes an external initiative that is counterproductive to the ongoing domestic reconciliation processes. Therefore, the Government will not engage with that external mechanism.

Addressing the 60th Session of the Human Rights Council in September 2025, the Hon. Minister of Foreign Affairs, Foreign Employment and Tourism stated, "The Government is opposed to any external mechanism imposed on us such as the SLAP, which will only serve to create divisions, thereby jeopardizing the genuine and tangible national processes that have already been set in motion."

Also, if I add a few things - this will be officially communicated in time to come - how they have unilaterally gathered facts and the methodologies used are something that we cannot accept, and we have maintained it to be that way.

8. Since assuming office, the Government has supported and strengthened the work of the Office on Missing Persons - OMP- resulting in several tangible outcomes:

First and foremost, Hon. Member, you and I both know that, although the Office on Missing Persons came into being in 2018, for any of these mechanisms to function, there must be a proper political will and I still maintain that despite the shortcomings of the staff as such, the political will had not been there from 2019 until we came into power. So, from the time we came into power, the first challenge was manpower. Now, we have

recruited nearly 100 people to carry out the work of the OMP and the OR. And, they were extremely short of staff and was not functional. Now, we have also allocated them money. So, now what has happened? Cabinet Approval has been granted to extend the OMP's mandate to inquire cases beyond the year 2000 and newly reported cases, too. So, now, there are more cases being reported and the numbers are going up.

Also, I must say that by the Cabinet, Rs. 375 million was allocated for the OMP's inquiry panel of 75 people. It is now carrying out inquiries into complaints on missing persons and we are intending to complete 5,000 complaints this year and the remaining 6,000 next year. So, within two years, we are hoping that these panels will be able to finish investigations into those complaints and I have told them separately and in person also to keep in mind when they are doing it that this is not just about paying money and but about finding truth and justice for the people. Therefore, if there are any perpetrators being identified in this process, relevant steps would be taken to alert the other official authorities to carry out the necessary measures.

When it comes to the mass graves, the OMP is acting as an observer in eight ongoing cases and is assisting the court in different ways, including assisting in coordination between different agencies while making interventions.

The OMP has been involved in supporting on technical capacity and has provided training for archaeologists (focusing on forensic archaeology - two trainings in 2025) and for JMOs and odontologists (Focusing on age techniques for sub-adults in 2025.)

With regard to database development, different sources of information have been consolidated into a temporary database. A formal proposal has been developed for a comprehensive Database Management System, as I told you earlier. And also, the Government has allocated a dedicated budget for the initiative.

A requirement of identification process with stakeholders is underway to ensure the system meets humanitarian, legal and accountability needs.

With regard to supporting families, the OMP has expedited the issuance of Certificates of Absence, enabling families to access interim relief and manage legal/administrative matters. Continued engagement with families and civil society has been prioritized to ensure credibility and transparency in all processes.

With regard to regional outreach, the OMP continues to operate regional offices in Jaffna, Batticaloa, Mannar, Matara and Killinochchi. In 2025, the OMP set up a sub-office in Mullaitivu to ensure access.

9. The Office for Reparations was established in 2018 under Act, No. 34 of 2018, succeeding the Rehabilitation of Persons, Properties and Industries Authority Act, No. 29 of 1987. That is the legal background.

Reparations are provided aiming at individuals as well as through collective mechanisms guided by policies and frameworks.

Develop an OR Act through following thematic areas of interventions: compensation and financial support, livelihood support and psychosocial support.

The Government of Sri Lanka continues to extend support to families of missing persons through the reparation framework administered by OR. Monetary grants referred to as revival payments are disbursed to dependents of missing persons based on recommendation from Office on Missing Persons in accordance with Section 11(a) Part II of the Act.

As of 31st December, 2025, a total of 4,456 claimants have received final revival payments. This process ensures that financial assistance is delivered in a transparent and an accountable manner. During the period 2003-2005, a total of 31 collective reparation initiatives were implemented across multiple districts in Northern and Eastern Provinces. These programmes benefitted 1,523 conflict-affected individuals including 1,021 women, 532 men, 231 students with disabilities and 211 girls. All initiatives were developed through participatory process involving consulting with affected communities, community -based organizations, District and Divisional Secretaries and the Department of Social Services under the Ministry of Women and Child Affairs.

Now, just to add a small thing, I do accept the fact that last year, the Office for Reparations has not been able to function to its optimum because the Office on Missing Persons' inquiries were a little slow; they were not moving through because of lack of staff. So, because of that, the OR was not going as fast as it ought to have, but this year that problem has been solved. At the same time, we are preparing a package for missing persons, not just money, but a complete social package, a one-off, where they would get psychosocial support, other livelihood support and recognition as a special category of victims. So, that much, we are doing.

10. The Government is committed to advancing accountability through credible domestic processes.

The Government's commitment to advancing reconciliation, human rights and well-being of all Sri Lankans arises from our genuine belief in the fundamental importance of human rights and the need to ensure the rights and well-being of our own people. The Government has the mandate and is firmly and sincerely committed to working towards a country that respects and celebrates the diversity of its people with no division or discrimination based on race, religion, class and caste. The Government is resolved not to leave

[ගරු නිතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

> room for resurgence of racism or extremism in Sri Lanka. As Sri Lanka moves forward on this path through its domestic processes, the understanding, encouragement and support of the international community is welcome and appreciated.

Let me say just a few lines to finish off. Once again, I would like to thank you, Hon. Member, for raising all these questions. As much as we are pushing, I would also prefer things to happen a little faster. But, believe me, we are on the correct direction. And, wherever we are having shortcomings, Hon. Member, I am very glad and very happy to engage with you.

Especially with regard to prisoners, prison overcrowding and those issues, right now, a Committee is working on it, and soon, we will be able to sort out most of them.

I once again thank you very sincerely for the Question raised.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயம் சம்பந்தமாக மிக நீண்டதொரு பதிலை வழங்கியிருக்கிறீர்கள். அதற்கு 20 நிமிடங்களுக்கும் மேல் சென்றிருக்கிறது. இந்த விடயம் சம்பந்தமான சில விடயங்களைச் சொல்வதற்கு கௌரவ சபாநாயகர் அவர்கள் அனுமதிப்பாரென நான் நினைக்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது கேள்வியில் கேட்கப்பட்டுள்ள, 2009ஆம் ஆண்டு இறுதிப் போரின்போது காணாமல் ஆக்கப்பட்டவர்களுடைய எண்ணிக்கையானது தமிழ் மக்களுடைய கருத்துப்படி, ஓர் இலட்சத்துக்கும் அதிகமாகும். அதாவது, 160,000 பேர் வரை காணாமலாக்கப்பட்டு இருக்கிறார்கள். ஐ.நா. சபை மற்றும் சர்வதேச நிறுவனங் களுடைய கருத்துப்படி, 60,000-70,000 பேர் காணாமல் ஆக்கப்பட்டிருக்கின்றார்கள். ஆனால், இலங்கை அரசு 2,764 பேர் என்று கூறுகின்றது. இது வேடிக்கையான ஒரு விடயமாக இருக்கின்றது. நான் இங்கு எல்லா விடயங்களையும் குறிப்பிட விரும்பவில்லை. 1995-1996ஆம் ஆண்டு காலப்பகுதியில் மேற்கொள்ளப்பட்ட அகழ்வுப் பணியின்போது கண்டெடுக்கப் பட்ட மனித எச்சங்கள் இன்னும் ஸ்கொட்லாந்திலே, அயர்லாந்திலே, இங்கிலாந்திலே research instituteஇல் இருக்கின்றது என்பது உங்களுக்கும் தெரியும். செம்மணி மனிதப் புதைகுழி அகழ்வுப் பணியின் போது கண்டெடுக்கப் பட்ட மனித எச்சங்களை ஏன் நீங்கள் சர்வதேச ரீதியான- All that the Government has to do is to give consent to do DNA testing on the already exhumed skeletons. So, what is the point in exhuming skeletons, if you are not going to do anything about them?

Then, Hon. Minister, I understand that the Government can only have a position. I appreciate your response; it was a very lengthy response. As the Minister, you can only provide what the Government is doing. But, unfortunately, to the victim community, Hon. Minister, it seems that it is only lip service that this Government is also paying. In my Question itself, I have very clearly said that the victim community rejects any domestic mechanism. பாதிக்கப்பட்ட சமூகம் முழுமையாக நிரா கரித்த உள்நாட்டுப் பொறிமுறை பற்றி நீங்கள் தொடர்ந்து பேசுவதில் எந்தவித அர்த்தமும் இல்லை. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் நிதி ஒதுக்கீடுகள் பற்றி, காணாமற்போன ஆட்கள் பற்றிய அலுவலகம் பற்றி சொல்கிறீர்கள். கொல்லப்பட்ட மக்களுக்கான, காணாம லாக்கப்பட்ட மக்களுக்கான, கடத்தப்பட்ட மக்களுக்கான நீதி பற்றி ஒரு வார்த்தைகூட உங்களுடைய பதிலில் இல்லை. There have been no measures mentioned about justice in your response, Hon. Minister. It was about reparations and social welfare. Where is justice? What is the accountability that you propose? Like I said வெறுமனே ஊழல் மோசடியை இல்லாதொழிப்பதற்காக மாத்திரம் உங்களுடைய அரசாங்கத்துக்கு தமிழ் மக்கள் வாக்களித்தார்களென நான் கருதவில்லை. ஏனெனில், இந்தக் கொலைகளால் பாதிக்கப்பட்டவர்களுக்கு உங்களுடைய அரசாங்கத்தில் நீதி கிடைக்குமென அவர்கள் எதிர்பார்த் தார்கள். நீங்கள் சில நேரங்களில் NPP, JVPஐச் சேர்ந்தவர் களுக்குச் சொல்லலாம், "2005ஆம் ஆண்டு காலப்பகுதியில் நாங்களும் அங்கம்வகித்த அரசாங்கம்தான் இந்தப் படுகொலை களைச் செய்தது; ஆகையால், இதை விசாரணை செய்யாமல் விட்டுவிடுங்கள்" என்று. அவ்வாறு சொல்வதற்கு வாய்ப்புகள் உண்டு. நீங்கள் JVP இல்லை என்று எனக்குத் தெரியும். இருந்தாலும், கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் குறிப்பிட்ட பதிலில் -

With regard to the SLAP - Sri Lanka Accountability Project - there is a contradiction between your initial statement and your response. If you are genuine and if you really want to get to the bottom of what had happened - you said you could only go by the information you have and that you were not in the Government at that time - the SLAP has enough information for you to use, but you are refusing to acknowledge it based on a domestic process that you propose.

Okay, let me now come on to the Office for Reparations. You mentioned about understaffing. Hon. Minister, for the Office for Reparations, the Government has appointed three members connected to the military, out of five.

இழப்பீட்டுக்கான அலுவலகத்துக்கு நியமிக்கப் பட்டுள்ள ஐந்து உறுப்பினர்களில் மூன்று உறுப்பினர்கள் இராணுவப் பின்னணியைக் கொண்டவர்கள். பாதிக்கப் பட்டவர்கள் பாதிக்கப்பட்டது இராணுவத்தினரால். இராணுவத்தினரால் பாதிக்கப் பட்டவர்கள் தொடர்பில் இழப்பீட்டுக்கான அலுவலகம் ஊடாக இராணுவமே விசாரணை நடத்தப் போகின்றது; இழப்பீடுகள் வழங்கப் போகின்றது. கௌரவ அமைச்சர் அவர்களே, நேரத்தைக் கருத்திற்கொண்டு நான் இந்தக் கேள்வியோடு முடித்துக் கொள்கின்றேன். எனக்கு நீண்ட விளக்கம் தேவையில்லை.

I do not want a lengthy response from you, Hon. Minister. I only have two or three questions for you. Number one, is this. You are fully opposed to an international mechanism. You will never agree to international mechanisms; you will not accept any

international mechanisms. Is that your Government's position? If so, you can tell us straight up. Otherwise, there is no point in talking about it because the victim community has rejected domestic mechanisms.

Number two, even if you propose a domestic mechanism, is there a judicial mechanism under that? There is no mention of anything to do with the Judiciary. So, where would any of these criminals be tried? Even though we do not agree with it, would you be having that in your plans? You only spoke about reparations.

The last one is this. While we speak about oppression and crimes committed against people, Hon. Minister, yesterday, three Jafnna University students were summoned to the TID. Imagine that! You are the Minister of Justice and National Integration in this country. The three that were summoned were Dharmaseelan Yadurshan, A. Abhishek and Dayabaran Lajithan. Those three Jaffna University students were summoned to the TID yesterday for hoisting a black flag in university premises on Independence Day. That is their right. This is a free country. One of the students had been harassed and intimidated. The officers had shown photos of his house and his relatives.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please shorten your question.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Okay, Sir.

அந்தப் பல்கலைக்கழக மாணவர்களுடைய பெற்றோரின் புகைப்படங்களைக் காட்டி, "இதுதான் உங்களுடைய உறவினர்கள்" என்று சொல்தகிறார்கள். வீதி ஒன்றைக் காட்டி, "இந்த வீதியில்தானே நீங்கள் வசிக்கிறீர்கள்: நீங்கள் தொடர்ந்து அரசுக்கு எதிரான போராட்டத்தில் ஈடுபடு வீர்களா?" என்று கேட்கிறார்கள். இப்படியான விடயங்கள் நீங்கள் நீதி அமைச்சராக இருக்கும்பொழுதே நடக்கின்றன. 2009ஆம் ஆண்டில் கொல்லப்பட்டவர்களுக்கும் நீதி இல்லை; சர்வதேச விசாரணைக்கும் நீங்கள் இணங்கவில்லை. *[இடையீடு]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please shorten it. You have already taken six minutes.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
அரச பயங்கரவாதத்தின் ஆரம்பமே நீங்கள்தான் என்று அண்ணன் மனோ கணேசன் அவர்கள் சொல்கிறார். கௌரவ அமைச்சர் அவர்களே, தமிழ் மக்கள் உங்கள்மீது வைத்த நம்பிக்கையை எப்போதே கைவிட்டு விட்டார்கள் என்பது என்னுடைய கருத்து. இருந்தாலும், நீங்கள் தமிழ் மக்கள்மீதும் தமிழ் மக்கள் உங்கள்மீதும் நம்பிக்கை வைத்திருந்தால், இதற்கொரு பதிலை அளிப்பீர்களென நான் நினைக்கின்றேன்.

Again, I thank you, Hon. Minister. I know that in your capacity as Minister, you have provided the information that is available to you. And, there is nothing personal here.

Thank you.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Thank you, Hon. Member. I do understand that victims need justice and justice is what our Government is going to give. When it comes to justice for people, the families of missing persons, we do not divide on North, East or South; it is "One country, one people". With regard to the issue of missing persons, a closure is necessary, justice is necessary. Whether one year and four months is sufficient for that is another matter altogether, but we are moving in the right direction and are on the right path.

Secondly, regarding persons who went missing towards the end of the war in 2009, obviously, I could sit and argue, but it is not going to serve any purpose because we do not know all the details. But, we understand the pain of it and we are working on it.

Then, the members of the Office for Reparations are appointed by the Constitutional Council based on the applications received. I will, however, take up your concerns at appropriate forums.

Also, I would like to say that we went through the Commission for Truth, Unity and Reconciliation in Sri Lanka Act - the CTUR Act - but there is a problem. It was hastily drafted during the previous regime and some Sections of it are conflicting with the OR Act and the OMP Act, which are very powerful Acts. So, right now, I have sent that Act to the Law Commission to find a suitable way of getting it passed through.

Further, I would like to say that causing a person to go missing is a crime; killing is a crime. But, whatever the crime is, the local criminal law will be applied equally to everybody who had committed it. If new laws are necessary, they will be brought in.

Finally, when it comes to international mechanisms, right now, we are working to get expertise, help, training or whatever that is necessary for those. And, believe me, when it comes to their enforcement, within the next three or four years, you would see that we would do a fair job. We are committed to doing a fair and a decent job to address the grievances of the people.

Once again, Hon. Member, I thank you very sincerely for raising this Question.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
### பாராளுமன்ற அமர்வு
### SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම තත්පර 30ක කාලයක් ලබා ගන්නවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ දූරකථන ක්‍රියාකරු ලෙස 1986 සිට 2026 දක්වා වසර 40ක කාලයක් සේවය කළ බී. සිසිර කුමාර මහතා අද දිනයේදී -වසර 40ක සේවා කාලයකට පසුව- විශ්‍රාම යනවා. කැපවීමෙන් සේවය කළ ඒ නිලධාරිතුමාට අපි පාර්ලිමේන්තුව වෙනුවෙන් සුබ විශ්‍රාම දිවියක් ප්‍රාර්ථනා කරනවා.

## කල්තැබීම
### ஒத்திவைப்பு
### ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026.03.19 දින කල් තබන ලද විවාදය තවදුරටත් පැවැත්වීම. The Hon. Kabir Hashim, please. You have 12 minutes.

## වත්මන් ගෝලීය අර්බුදය හේතුවෙන් දේශීය ආර්ථිකයට වන බලපෑම
### தற்போதைய உலகளாவிய நெருக்கடியால் உள்நாட்டுப் பொருளாதாரத்துக்கு ஏற்படும் பாதிப்பு
### EFFECTS OF CURRENT GLOBAL SITUATION ON OUR ECONOMY

[පූ.භා. 11.06]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, මේ දවස්වල ගම්වල තරුණයන් අතර නිතරම කථාබහට ලක් වන කාරණාවක් තිබෙනවා. ඔවුන් නිතරම ප්‍රශ්නයක් මතු කරනවා, "සහෝදරයා, අධිරාජ්‍යවාදය කියන්නේ මොකක්ද?" කියලා. ඒ ප්‍රශ්නය අහන කොට සාමාන්‍යයෙන් දෙන උත්තරය තමයි, "ජේවීපී ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ගනුදෙනු කරන්න පටන් ගන්න කලින් ලෝක ආර්ථිකය පාලනය කරපු ඇමෙරිකාවට කියන්නේ අධිරාජ්‍යවාදින් කියලායි" යන්න. එතකොට අහනවා, ඉන්දියානු ව්‍යාප්තවාදය කියන්නේ මොකක්ද කියලා. ඉන්දියානු ව්‍යාප්තවාදය කියන්නේ, ජේවීපී එකයි, ටිල්වින් මහත්මයා ඇතුළු අය ඉන්දියාවත් එක්ක හවුල් වෙලා වැඩ කරන්න කලින් ඉන්දියාව අනුගමනය කරපු ඉන්දියානු ධනේශ්වර චින්තනය. ඒක දැන් නැහැ. ඒක තමයි දැන් ගමේ යන ප්‍රසිද්ධ කථාව.

ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ වසර 40ක් පුරාම දේශපාලන බලවේගයක් හැටියට සමාජවාදය, ලෙනින්වාදය, ඒ වාගේම මාක්ස්වාදය පිළිබඳව දැඩි විශ්වාසවන්තයෙකු හැටියට කටයුතු කරලා තමන්ගේ ප්‍රතිපත්ති වෙනුවෙන් වැඩ කරපු, ඇත්ත වශයෙන්ම ඇමෙරිකානු අධිරාජ්‍යවාදයට එරෙහිව, නව යටත්විජිතවාදයට එරෙහිව දැඩි ස්ථාවරයක හිටපු කණ්ඩායමක්. ඇත්ත වශයෙන්ම ඒ ප්‍රතිපත්තිය පිළිබඳව අපට වුණත් ඒ දවස්වල ජේවීපී එක පිළිබඳ ගරුත්වයක් තිබුණා. මොකද, ඔවුන් ඒ ප්‍රතිපත්තියේ, ඒ ස්ථාවරයේ ඍජුවම, විවිධ අවස්ථාවල බලපෑම්වලට යටත් නොවී හිටියා කියලා. නමුත් ඒ ජේවීපී එකම අද ජේවීපී ආණ්ඩුව බවට පත් වුණාට පස්සේ, ඒ ස්ථාවරය පිළිබඳව ශක්තිමත් ප්‍රකාශයක්වත් කරන්න බැරි තැනකට වැටිලා තිබෙන එක ගැන ලොකු ප්‍රශ්නාර්ථයක් ඇති වෙනවා, ඔබගේ ඒ ප්‍රතිපත්තිය පිළිබඳව අද ඔබ කොහේද ඉන්නේ කියන එක ගැන. මොකද, ඔබතුමන්ලා අධිරාජ්‍යවාදීන්ගේ හෝ යටත්විජිතවාදීන්ගේ අතකොළුවක් බවට පත් වෙලා වැඩ කරනවාද කියන ප්‍රශ්නය අද ඇත්තටම මතු වෙනවා. රජයක් හැටියට ඔබ කරන ප්‍රකාශ සහ ගන්නා තීන්දු තීරණ පිළිබඳව ඇත්තටම ප්‍රශ්නයක් මතු වෙනවා.

ගරු කථානායකතුමනි, කොහොමද මේ යුධ තත්ත්වය ඇති වුණේ? ඇත්තටම මේ සාකච්ඡා සහ සංවාද පවත්වාගෙන යද්දී, ඒ වාගේම, ඉරානයෙන් කිසිම ප්‍රකෝප කරවන ක්‍රියාවක් නොකර සිටි අවස්ථාවේ, ඊශ්‍රායලය ඉරානයට පහර දෙනවා. පළමුවෙන්ම ඊශ්‍රායලය ඉරානයට පහර දෙනවා. මේ සාකච්ඡා කරගෙන යන අවධියේ ඕමානයේ විදේශ අමාත්‍ය සෙයියර් බද්ර් බින් හමාඩ් බින් හුමුද් අල් බුසායිඩ් ඒ සාකච්ඡාවල ප්‍රධානියකු හැටියට කටයුතු කරමින් සමාදානයට ඔන්න මෙන්න තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා ලෝකයටම ප්‍රකාශ කරන වේලාවේ තමයි, - ඊළඟ දවසේ - ඊශ්‍රායලය ගහන්නේ. ඒ මදිවාට ගරු කථානායකතුමනි, "The Guardian" කියන බ්‍රිතාන්‍යයේ ප්‍රසිද්ධ මාධ්‍ය ඒකකයත් ප්‍රකාශ කරලා තිබෙනවා, පෙබරවාරි මාසයේ ජිනීවාවල තිබුණු එක්සත් ජනපදය සහ ඉරානය අතර

කරපු සාම සාකච්ඡාවේදී -යම් එකඟතාවයකට එන්න කරපු ඒ සාකච්ඡාවේදී- ජොනතන් පවෙල් කියන බ්‍රිතාන්‍යයේ ආරක්ෂක උපදේශකවරයා කියනවා ඉරානය කිව්වා කියලා, ඔවුන්ගේ න්‍යෂ්ටික වැඩසටහන අත්හිටුවීම සඳහා යෝජනා කරනවා කියලා. ඒ යෝජනාව ගැන මේ ජොනතන් පවෙල්  පුදුම සහගත යෝජනාවක් කරලා තිබෙනවා, ඇත්තටම යුද්ධයක් අවශ්‍ය නැහැ කියලා. නමුත් බ්‍රිතාන්‍යය කියනවා, ජොනතන් පවෙල් නිල වශයෙන් එතැනට ගියේ නැහැ කියලා. හැබැයි, ඔහු එතැනට සහභාගි වෙලා තිබෙනවා.

Hon, Speaker,  "The Guardian" of 17th March, 2026, states, I quote:

> "The UK saw no compelling evidence of an imminent threat of an Iranian missile attack on Europe,..."

It further states, I quote:

> "Instead the UK regarded the attack as unlawful and premature since Powell believed the path remained open to a negotiated solution....."

මේක, "The Guardian" පුවත්පතේ තිබෙන සටහනක්. මේ වාගේ තත්ත්වයකදී යුද්ධයේ ආරම්භකයා, ආක්‍රමණිකයා කවුද කියන එක මේකෙන් පැහැදිලි වෙනවා. අපි - ශ්‍රී ලංකාව -  මේකට ප්‍රවේශ වීමේදී අතිශයින්ම පරික්ෂාකාරී සහ රාජතාන්ත්‍රික විය යුතුයි කියලා මම විශ්වාස කරනවා. මම හිතනවා, රජයත් ඒ ගැන හොඳට තේරුම්ගෙන ඇති කියලා. මොකද, අපි මෙතැනදී මධ්‍යස්ථ විය යුතුයි කියන එක අපි දන්නවා. හැබැයි, ආණ්ඩුව මධ්‍යස්ථව සිටිනවාද කියන ගැටලුව අපට පැන නඟිනවා. මම ඊයේ මාධ්‍ය හරහා දැක්කා, අතිගරු ජනාධිපතිතුමා කටාර් එමීර්තුමාත් එක්ක දුරකථන සාකච්ඡාවක් කර තිබෙන බව. එම සාකච්ඡාවෙන් පසුව එතුමා අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒක "Qatar Tribune" කියන පත්තරයේ සඳහන් කරලා තිබෙනවා. හැබැයි, ඒක ව්‍යාකූලයි. මම දන්නේ නැහැ, ඒක හරියට අර්ථ කථනය කරලා තිබෙනවාද, නැද්ද කියලා. ඒකේ කියනවා, I quote:

> "President Dissanayake expressed his country's solidarity with Qatar, on the ongoing Iranian aggression affecting Qatar and the wider region."

So, it states about the Iranian aggression. It would seem that Sri Lanka accepts that there is an ongoing Iranian aggression. Does it mean that Sri Lanka tacitly or explicitly justifies or supports the US-Israeli war on Iran? Are we taking a side? This is something that the Opposition needs to know, where our Foreign Policy heads.

අද රට මුහුණ පා සිටින ප්‍රධානම අර්බුදය තමයි විදේශ ප්‍රතිපත්තිය. අපේ රට, අපේ රජය ගන්නා විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ ව්‍යාකූලත්වයක් තිබෙන බව අපි විපක්ෂය  හැටියට විශ්වාස කරනවා. ඒක ඉතාම වැදගත්. මෙතැනදී අපි ගන්නා ස්ථාවරය වැදගත්. අපේ රටට ලොකු බලපෑමක් ඇති නොවෙන විධියට අපි කටයුතු කරන්නේ කොහොමද කියන එක අපේ විදේශ ප්‍රතිපත්ති මත රැඳෙනවා.

ගරු කථානායකතුමනි, නිදහසින් පසුව අපේ හිටපු නායකයන් විදේශ ප්‍රතිපත්තිය තුළින් රට ගෞරවයක් ලැබෙන තැනකට ගෙන ගිය ආකාරය පිළිබඳව නිදසුන් ගොඩක් මට කියන්න පුළුවන්. හැබැයි, මේ කෙටි වෙලාව ඇතුළත මම ඒවායෙන් එකක් දෙකක් පමණක් කියන්නම්. දෙවන ලෝක යුද්ධය කාලයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සැන් ෆ්‍රැන්සිස්කෝ සමුළුවේදී ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ධම්මපදයේ ගාථාවක් උපුටාගෙන, "නහී වේරේන වේරානි" යනුවෙන්  කළ ප්‍රකාශය ඒ වෙලාවේ  අපේ රටට ලොකු ගෞරවයක් වුණා. ඒක ලොකු පූර්වාදර්ශයක් වුණා. ඒ වාගේම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, ඉන්දියානු සාගරය සාම කලාපයක් බවට පත් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඉදිරිපත් කරන ලද යෝජනාවත් අපට කරපු ලොකුම ගෞරවයක්, හයියක්. ඒකත් අපට පූර්වාදර්ශයක්. ඒ වාගේම තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉන්දු-චීන ගැටුමේදී ලංකාව මැදිහත්කරුවෙක් බවට පත් කරලා, - මෙය  පොඩි රටක් කියලා හිතුවේ නැහැ - මේ රට යෝධ රටක් බවට පත් කළා. ඒක විදේශ ප්‍රතිපත්තිවලදී අපේ රට ඉහළටම ඔසවා තැබූ පූර්වාදර්ශයක්. අපි ඒ වාගේ තත්ත්ව  ඇති කළාට, මේ ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිවල එවැනි සාධනීය ලක්ෂණයක් අද වෙනකම් දකින්න නම් නැහැ.

ගරු කථානායකතුමනි, ඉරාන පළමුවෙනි නෞකාවට පැය 11ක් යනකම් අපේ මුහුදු සීමාවට ඇතුළත් වෙන්න අවසර නොදුන්නේ විදේශ ප්‍රතිපත්තියේ ගැටලුවක් නිසාද කියන ප්‍රශ්නය මතු වෙනවා. දෙවැනි නෞකාවට පහසුකම් දුන්නා, පළමු එකට නොදී. එතකොට විදේශ ඇමතිතුමා අපට පැහැදිලි කරන්න ඕනෑ, එක නෞකාවකට අපේ මුහුදු සීමාවට ඇතුළු වෙන්න අවසර නොදී - පැය 11ක් යනකම් තියාගෙන, පහර දෙනකම් ඉඳලා - දෙවැනි එකට අවසර දුන්නේ ඇයි කියලා. එතැනදී විදේශ ප්‍රතිපත්තිවල යම් ගැටලුවක් තිබුණාද කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. එතැනදී අපේ විදේශ ප්‍රතිපත්තියට තව පාර්ශ්වකරුවෙකුගේ අනුමැතිය ලබා ගන්න ඕනෑද කියන ප්‍රශ්නය මතු වෙනවා. මේක ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක්. අපේම රට තුළ තව පාර්ශ්වකරුවෙකුගෙන් අහලා වැඩ කරන්න වෙනවාද කියන ප්‍රශ්නය මතු වෙන්නේ නැද්ද, මේකෙන්? එතකොට මේක බරපතළයි.

Hon. Speaker, I would like to say that the Government, technically, fulfilled its humanitarian duties when it rescued the survivors and recovered the bodies of the first ship even 11 hours later after their request and escorted the second vessel into safety. That, we appreciate. But, those operations raise broader issues across policy, across laws, morality and strategy and that is very serious. The delay of 11 hours in rescue response prompts concerns. Failure to assist them would have violated humanitarian laws and the obligations that Sri Lanka has under the United Nations Convention on the Law of the Sea. Was there a need to consult any power before embarking upon such humanitarian operations? We are a neutral State. As a neutral State, did we have to talk to somebody before we took the action? We have decided that the Indian Ocean is a “Zone of Peace” and we cannot allow anybody to bring a regional war into our sea area. So, we had acted as a neutral State, but why did we have to ask somebody away? The incident raises questions on the concept of “Net Security Provider” in the Indian Ocean and what that concept means to Sri Lanka. Did the Government have to surrender its rights in sovereign decision-making in this instance? If that is so, then how do we play this? By now, the Minister of Foreign Affairs, Foreign Employment and Tourism should be able to inform the House, in terms of our Foreign Policy, as to how we are acting in this particular case.

This also opens up the gaps in Sri Lanka’s maritime security planning. There were many issues. I think how we behave under our Foreign Policy impacts on how our

[ගරු කබීර් හෂීම් මහතා]

country is going to be placed and how it is going to be affected economically while this war is going on and at the end of it. And, though our country is a small nation, we have been proud and strong because we have been pursuing proper policies. So, we urge the Ministry of Foreign Affairs, Foreign Employment and Tourism to clarify our position in terms of our sovereign rights within our territory and if and how we are maintaining our neutrality in this war, as we are seeing conflicting reports in the local and international media as statements made by the Government and we are confused. So, are we maintaining our neutrality in this war? And, what is the stand we are taking since that becomes very important?

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Anil Jayantha, please. You have 15 minutes.

[පූ.භා. 11.17]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, ලෝකයේ ඇති වී තිබෙන යුදමය තත්ත්වය ලංකාවට බලපාන ආකාරය පිළිබඳව පැවැත්වෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව පිළිබඳ මෙම විවාදයේදී ඉදිරිපත් වුණු අදහස්වලින් ලංකාවේ අර්බුදයක් නිර්මාණය වෙලා තිබෙනවා, එම අර්බුදයට අපි නිසි පරිදි මැදිහත් වෙලා නැහැ, එමඟින් ජනතාව පීඩනයට පත් වනවා කියන අදහසක් ගම්‍ය වනවා. ඇත්ත වශයෙන්ම රටක් ඇතුළේ අර්බුදයක් කියන්නේ මොකක්ද, එහෙම අර්බුදයක් පැන නැඟිලා තිබෙනවාද කියන කාරණය හරියට තේරුම් කරලා පැහැදිලි කර ගත යුතුයි. මේ මොහොත වනකොට සිදු වෙලා තිබෙන්නේ බාහිර තත්ත්වයක් නිසා ඇති වුණු external shock එකක්. විශේෂයෙන්ම ප්‍රවාහනය, තෙල්, ගෑස් වාගේ අත්‍යවශ්‍ය දේවල් සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒ කියන්නේ, නාවික ගමනාගමනයට එල්ල වෙච්ච බාධකයක් නිසා එය ලංකාවේ ආර්ථිකයට බලපාන ගැටලුවක් වෙලා තිබෙනවා. ලංකාවේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම සෑම ආර්ථිකයටම එය බලපා තිබෙනවා. හැබැයි, එය රට ඇතුළේ අර්බුදයක් බවට පත් නොවන ආකාරයට කළමනාකරණය කර ගැනීමට අදාළ කටයුතු අපි සිද්ධ කර ගනිමින් තිබෙනවා. මේ තත්ත්වය කළමනාකරණය කරන්න අපි මැදිහත් වෙලා තිබෙන කාරණා මොනවාද කියා මම එකින් එක පැහැදිලි කරන්නම්.

ඊට ප්‍රථමයෙන් මම කියන්න ඕනෑ, මෙය රටවල් දෙකක් අතර ඇති වුණු යුදමය තත්ත්වයක් හේතුවෙන් ඇති වෙච්ච ගැටලුවක් බව. එය අපි කවුරුත් දන්නවා. විශේෂයෙන්ම නාවික ගමනාගමනයට ඇති වෙච්ච බාධකය නිසා භාණ්ඩ ප්‍රවාහනයට යම් ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා. තෙල් මිල ගණන් ඉහළ යාම එහි ක්ෂණික ප්‍රතිඵලය බවට පත් වුණා. තෙල් පිරිපහදුවලට සිද්ධ වෙච්ච ප්‍රහාර වැනි කරුණු නිසා වළක්වන්න බැරි විධියට තෙල් මිල ගණන් ඉහළ ගොස් තිබෙනවා; සියයට 50කට, 60කට වඩා විශාල ප්‍රමාණයකින් තෙල් මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ අතරත්, අපේ රට පිරිපහදු කරපු තෙල් ආනයනය කරනවා. ඒ වාගේම තෙල් පිරිපහදුව ඇතුළේ පිරිපහදු කිරීම් කරනවා. තෙල් මිල ගණන් ඉහළ යෑමේදී වැඩිම බලපෑම සිද්ධ වෙලා තිබෙන්නේ පිරිපහදු තෙල්වලට. බොරතෙල්වලට සාපේක්ෂව එහි මිල ගණන් වේගයෙන් වැඩි වෙලා තිබෙනවා. එය සියයට 50කින්, 60කින් ඉහළ ගිහින් තිබෙනකොට, අනෙක් පැත්තෙන් තෙල් නිෂ්පාදනය කරන රටවල් පවා දැන් තෙල් මිල වැඩි කරලා තිබෙනවා. නමුත්, උද්ධමනයට අඩු බලපෑමක් ඇති වන ආකාරයට මේ තෙල් මිල සියයට 8කින් විතර වැඩි කරන්න අපට සිද්ධ වෙනවා. එතැන තිබෙන තත්ත්වය, යථාර්ථය අපි තේරුම් ගන්නට ඕනෑ. මේ තත්ත්වය ඉදිරියටත් පැවතුණොත් සමහරවිට දේශීය වශයෙනුත් තෙල් පරිභෝජනය වැඩිවීමේ ඉඩකඩක් තිබෙනවා. අපි ඒක අවබෝධ කර ගන්නට අවශ්‍යයි.

තෙල් මිලට අමතරව රක්ෂණයත් බලපෑම් කරනවා. විශේෂයෙන්ම තෙල් ප්‍රවාහනය කරන සමාගම්, ඒ වාගේම රක්ෂණ සමාගම්, ප්‍රතිරක්ෂණ සමාගම් තමන්ගේ රක්ෂණ ගාස්තු - war-risk premiums - වේගයෙන් වැඩි කරලා තිබෙනවා. අපි දන්නවා, මෙවැනි අර්බුදයක් එනකොට සාමාන්‍ය තත්ත්වයට වඩා වෙළෙඳ පොළ බලවේගවල හැසිරීම වෙනස් වන බව. සමහර අවස්ථාවල ඒ cartels, මේක යුද තත්ත්වයක්ද, මනුෂ්‍යත්වය පිළිබඳ තත්ත්වයක්ද කියන කාරණාත් නොසලකා හරිමින් මිල ගණන් වැඩි කරනවා. ඉතාම අසාමාන්‍ය විධියට මිල ගණන් වැඩි වෙලා තිබෙනවා. War-risk premium එක නිසාම රක්ෂණයේ මිල ගණන් වැඩි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් නැවක වටිනාකමෙන් 0.2ක් තිබුණු එක සියයට 1-3 අතර ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට, ඩොලර් මිලියන 750ක් විතර වැඩි වෙන තත්ත්වයක් තිබෙනවා. ඒ රක්ෂණ ගාස්තු වැඩි වීම ප්‍රතිශතාත්මකව ගත්තාම සියයට 1,000ක් විතර වෙනවා. එතැනත් එක බලපෑමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම නැව් ප්‍රවාහන ගාස්තු සියයට 20-25 අතර ප්‍රමාණයකින් වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම ගුවන් යානා ඉන්ධන ගාස්තු සියයට 100කින් වාගේ වැඩිවීමක් සිද්ධ කරලා තිබෙනවා.

මේ තත්ත්වයන් මත අනිවාර්යයෙන්ම තෙල් සැපයුමට සහ තෙල් මිල ගණන්වලට බලපෑමක් එන්න ඉඩ තිබෙනවා. අපි එය කළමනාකරණය කරන්නේ කොහොමද? එය කළමනාකරණය කිරීමේදී අපට කාරණා දෙකක් පාලනය කර ගන්න සිද්ධ වෙනවා. පළමුවෙන්ම කළ යුතු දේ තමයි, උද්ධමනය පාලනය කර ගැනීම. උද්ධමනය පාලනය කර ගැනීමේදී මේ වෙනකොට අපි අනුගමනය කරමින් සිටින්නේ flexible inflation targeting framework එකක්. ඒ කියන්නේ, අපි නම්‍යශීලී උද්ධමනයක් ඉලක්ක කර ගත්ත රාමුවක් ඇතුළේ තමයි වැඩ කටයුතු කරන්නේ. එය සියයට 5ක් කියලා අපි අවුරුදු 3කට ඉලක්ක කර ගත්තා. පසුගිය අවුරුද්දේත් එය ඒ සියයට 5 කියන රාමුව ඇතුළේ, එයට යටින් තියා ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ කියන්නේ, උද්ධමනකාරී බලපෑම සියයට 5 ඉක්මවා ගිහින් නැහැ; 2025 වර්ෂයේදීත් බින්දුවට ආසන්නයේ තිබුණේ. 2026 ජනවාරි මාසයේදීත් සියයට 2.3යි, පෙබරවාරි මාසයේ සියයට 1.6යි. ඒ කියන්නේ, එය ඉලක්කයට වඩා ගොඩක් යටින් තිබෙන නිසා ඉන්ධන මිල වැඩිවීම මඟින් ඇති වෙන බලපෑම අසාමාන්‍ය උද්ධමනකාරී තත්ත්වයකට යන්නේ නැතිව පාලනය කර ගන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒ තත්ත්වය අපට වඩාත් වාසිදායක තත්ත්වයක් කියලා මම හිතනවා. අනෙක් පැත්තෙන්, මෙවැනි තත්ත්වයකදී උද්ධමනකාරී තත්ත්වයට රට ඇතුළේ පොලී අනුපාතය බලපානවා. පොලී අනුපාතය අනවශ්‍ය විධියට

උච්චාවචනය වෙන්න පටන් ගන්නවා. නමුත්, තවමත් ඒ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගනිමින් පොලී අනුපාතය පහළ අගයක තියාගෙන යන්න අපට පුළුවන්කම තිබෙනවා. ඉතින්, ඒකත් හොඳ තත්ත්වයක්. මේ තත්ත්වයට මුහුණ දීමේ හැකියාව, ඒ resilient තත්ත්වය, ඒ කියන්නේ දරා සිටීමේ හැකියාව අපේ රටේ ආර්ථිකය ඇතුළේ අපි ඉතාම කෙටි කාලයකින් ගොඩ නඟා ගත්තා.

ඒ වාගේම මෙවැනි බාහිර අංශයක බලපෑම් එනකොට, ඊළඟට ක්‍රියාත්මක වෙන්නේ විදේශ විනිමය වෙළෙඳ පොළ. විදේශ විනිමය ගත්තොත්, මේ මොහොත වෙනකොට ඩොලරය අනෙකුත් මුදල් ඒකකයන්ට සාපේක්ෂව වේගයෙන් ඉහළ යන්න ගන්නවා. ඒ වාගේම තමයි, රත්‍රන් පිළිබඳ market එකත්. ඒ කියන්නේ, වෙනත් රටවල් තමන්ගේ රටේ දුර්වල මුදල් ඒකක වෙනුවට මේ වාගේ අර්බුදකාරී තත්ත්වයකදී ඩොලරය ආයෝජනය කරන්න පෙළඹීමක් එනවා. ඒ නිසා ඩොලරයට ඇති වන ඉල්ලුම නිසාම, රට ඇතුළේ ආයෝජනය කරලා තිබෙන ඩොලර් වේගයෙන් එළියට ගමන් කරන්න ඉඩ තිබෙනවා. හැබැයි, ලංකාවේ තවමත් එවැනි තත්ත්වයක් නිර්මාණය වෙලා නැහැ. නමුත්, වෙනත් රටවල ඩොලර් ආයෝජන වැඩි වෙලා තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විධියට ඩොලරයේ අගය වර්ධනය වෙලා තිබෙනවා. නමුත්, ලංකාවේ ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම අඩු මට්ටමක තිබෙනවා. මේ යුද තත්ත්වය නිර්මාණය වුණාට පස්සේ තවමත් ඩොලරයේ අගය රුපියල් 310-315 අතර ප්‍රමාණයක තිබෙනවා. සාපේක්ෂව ගත්තාම, මෙවැනි අර්බුදකාරී තත්ත්වයකදී සමපේක්ෂණ චේතනාව - speculative motive - වැඩි වෙනවා. ඒ නිසා එය ගොඩක් වැඩි වෙන්න පුළුවන්. එහෙම වැඩි වෙලා නැහැ. එහි ප්‍රතිඵලයක් විධියටත් විදේශ විනිමය අනුපාතය වැඩිවීම නිසා, ආනයනවල මිල ගණන් වැඩිවීමෙන් උද්ධමනකාරී බලපෑමක් එන්න අපට තිබෙන ඉඩකඩ අඩු කරලා තිබෙනවා. ඒ නිසා මා විශ්වාසයෙන් කියනවා, උද්ධමනකාරී බලපෑමක් අපට ලැබෙන්න පුළුවන්, හැබැයි එය අපට පාලනය කර ගන්න පුළුවන්, අවශෝෂණය කර ගන්න පුළුවන් ආර්ථික වටපිටාවක් ලංකාව ඇතුළේ නිර්මාණය කරලා තිබෙන බව. ඒ ආර්ථික ස්ථාවරත්වය පසුගිය අවුරුද්ද පුරාවටත්, දැනටත් අප අනුගමනය කරමින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට අපිට මුහුණ දෙන්න තිබෙන්නේ බාහිර අංශයට. ඒ කියන්නේ, අපට විදේශ සංචිත කොච්චර තිබෙනවාද, ඒක ප්‍රමාණවත්ද කියන එක. ඇත්තටම මේ ආර්ථික ස්ථාවරත්වය ගොඩනැඟීමේ ක්‍රියාවලිය ඇතුළතදී 2025 වර්ෂය අවසාන වන විට විදේශීය සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන 7 ඉක්මවන තත්ත්වයකට ගෙන එන්න අපට පුළුවන්කම ලැබුණා. එම සංචිත තත්ත්වය ගොඩ නඟා ගන්න ප්‍රධාන වශයෙන්ම අපේ අපනයන ආදායමේ වර්ධනය හේතු වුණා. අපි දන්නවා, මෙවැනි යුදමය වාතාවරණයකදී අපනයන ආදායමට යම් බලපෑමක් එන්න ඉඩ තිබෙන බව. ඒ සම්බන්ධයෙනුත් අපනයන සංවර්ධන මණ්ඩලය විතරක් නොවෙයි, අපනයන ක්ෂේත්‍රයේ සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ සිටින කණ්ඩායම් කැඳවා ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අඛණ්ඩව රැස්වීම් පවත්වා තිබෙනවා. අපි ඒ සඳහා මැදිහත් වෙන්නේ කොහොමද, ආණ්ඩුවෙන් ඒ සහයෝගය ඔවුන්ට ලබා දෙන්නේ කොහොමද කියන සාකච්ඡා අපි පවත්වා තිබෙනවා.

මේ තුළින් ඔවුන්ට විය හැකි බලපෑම අපි අවම කර ගන්නවා. මෙතැනදී කිසිදු ආකාරයකින් රට ඇතුළේ ආර්ථිකයට බලපෑමක් ඇති වන්නේ නැහැ කියලා අපි කියන්නේ නැහැ. බලපෑමක් ඇති වනවා. අපට පාලනය කරන්න බැරි තත්ත්වයකදීයි මේ සිදුවීම් වෙන්නේ. අපේ උපාය මාර්ගය තමයි, ගනු ලබන සෑම තීන්දුවක්ම ඒ ආර්ථික ක්‍රියාකාරිත්වයට අවම බලපෑම් ඇති වන ආකාරයට ගැනීම. තිබෙන සම්පත්, විශේෂයෙන්ම තෙල් සම්පත උපාය මාර්ගිකව ප්‍රමුඛගත කරලා අපි භාවිත කළ යුතුයි. ඒ අනුව තමයි අපි විශේෂ සහතිකයක් ලබා දෙන්නේ. සෞඛ්‍යය වාගේ අත්‍යවශ්‍ය සේවාවලට, ආහාර බෙදා හැරීම වැනි දේවල්වලට තෙල් සංචිත තබා ගනිමින් තමයි අපි අනෙකුත් වැඩ කටයුතු කරන්නේ. එතැනදී මහජනතාවගේ සහයෝගය අපට ලබා ගන්න පුළුවන් වුණොත් හොඳයි. මොකද, පෞද්ගලික කටයුතු සඳහා පාවිච්චි කරන ඉන්ධන පරිභෝජනය යම් ආකාරයකින් අඩු කර ගැනීමට පුළුවන් නම්, එය අපට වාසිදායක තත්ත්වයක් වනවා.

ඒ වාගේම සංචාරක කර්මාන්තයටත් මෙමඟින් බලපෑමක් එල්ල වනවා. ඒක වළක්වන්න බැහැ. දැනටමත් සැලකිය යුතු - සියයට 20ත්, 30ත් අතර - ප්‍රමාණයකින් ගුවන් ගමන් අවලංගු කර තිබෙනවා. අපි මේ කාරණය දෙසත් උපාය මාර්ගිකව බැලිය යුතුයි. ගුවන් ගමන් අඩු වනවා නම්, එකවරම ඒක අපට replace කරගන්න විධියක් ලැබෙන්නේ නැහැ. නමුත් අපි උපාය මාර්ගිකව සාකච්ඡා කරමින් තිබෙනවා, අපට දැනට අහිමි වී යන සංචාරක ආදායම ඉදිරියේදී ඒ ඒ රටවල් අතර සෘජු ගුවන් ගමන් ඇති කරමින් වර්ධනය කර ගන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධව. තව මාසයකින් දෙකකින් පමණ සංචාරක season එක අවසාන වනවා. අපට ඒ කාලය තුළදී පුංචි වාසියක් අත්වනවා, මේ සංචාරක කර්මාන්තයට ඇති වන බලපෑම අවම කර ගැනීමට අදාළව. ඒ කියන්නේ එම කාල පරිච්ඡේදයේදී අපි සංචාරක කර්මාන්තය දියුණු කර ගැනීමේ වැඩ පිළිවෙළ තුළ උපක්‍රමයක් භාවිත කරනවා, කෙසේ හෝ මේ බලපෑම අඩු කරගන්නට.

ඒ වාගේම දැනට තිබෙන දත්ත මත විදේශ ප්‍රේෂණ ගැනත් සඳහන් කළ යුතුයි. අපේ විදේශ සංචිත ගොඩනඟා ගැනීමේදී ඊට ප්‍රධාන වශයෙන්ම බලපාන්නේ අපනයන ආදායම, ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තයෙන් කරන ඉපැයීම්. ඒ නිසා විදේශ ප්‍රේෂණ හරහා අපේ ආර්ථිකයට විශාල බලපෑමක් සිදු වනවා. 2025 වර්ෂයේදී ඩොලර් බිලියන 8 ඉක්ම වූ ප්‍රේෂණ ප්‍රමාණයක් අපට ලබා ගන්න පුළුවන්කම ලැබුණා. හැබැයි, මේ පෙබරවාරි මාසය අගදී පැන නැඟුණු යුද්ධය නිසා ප්‍රේෂණ ගලා ඒමට සිදුවන බලපෑම බලන්න පුළුවන් වන්නේ, මාර්තු, අප්‍රේල් වැනි ඉදිරි මාසවලදීයි. හැබැයි, ජනවාරි සහ පෙබරවාරි මාසවලදීත් ප්‍රේෂණ ගලා ඒමේ ප්‍රවණතාවට කිසිදු බලපෑමක් ඇති වෙලා තිබුණේ නැහැ. එය ඊට කලින් වර්ෂයට සාපේක්ෂව ගත්තාම, ඒ මාස 2 තුළත් වැඩි වෙලා තිබුණේ. තිබෙන තොරතුරු අනුව බැලුවාම මෙම අර්බුදකාරී තත්ත්වයේදී පිට රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයින්ගේ රැකී රක්ෂාවලට, ආදායම්වලට යම් ප්‍රමාණයකින් බලපෑමක් ඇති වෙන්න පුළුවන්. ඒ හැර, ඔවුන් විදේශ විනිමය ප්‍රේෂණය කිරීමේ කාල පමාවක් තමයි මෙතැනදි ඇති වන්නේ. ඒ නිසා මූල්‍ය ක්ෂේත්‍රය තුළ මේ ප්‍රේෂණ ප්‍රමාණය වැඩි කර ගන්නේ කෙසේද කියන කාරණය සම්බන්ධව අපි සාකච්ඡා සිදු කරනවා. ඒ හරහා පවතින සංචිත ආරක්ෂා කර ගැනීමටත්, තවදුරටත් සංචිත ගොඩනඟා ගැනීමටත් අපි බලාපොරොත්තු වනවා.

ඒ වාගේම අපට තවත් පිටුවහලක් ලැබුණා, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ ඇතුළේ. ඒ හරහා ආයෝජකයින්ගේ විශ්වාසය දිනා ගනිමින්, ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීම ඉතා සාර්ථකව ඉහළට ඔසවා ගැනීමට අපට පුළුවන්කම ලැබුණා. ඒ අනුව SriLankan Airlines එකේ bond එකත් අපි ප්‍රතිව්‍යුහගත කර ගත්තා. අපට ගිය වර්ෂයේදී බලපෑ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 5වන සහ 6වන සමාලෝචන 2ම අවසාන කර ගන්න බැරි වුණා. නමුත් එම සමාලෝචන කටයුතු සිදු කිරීමට මේ මාර්තු මාසයේ අග

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

වනකොට - ලබන සතිය වනකොට - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කණ්ඩායමක් ලංකාවට පැමිණීමට නියමිතයි. අපි ඒ රාමුව තුළ තිබෙන වැඩසටහන්වලට අපේ පැත්තෙන් කරන්න පුළුවන් කටයුතු උපරිමයෙන් කරලා ඒ නිර්ණායක අත්පත් කරගෙන තිබෙනවා. ඒ නිසා අපට දැඩි විශ්වාසයක් තිබෙනවා, එම අධ්‍යක්ෂ මණ්ඩල විධායක රැස්වීමෙන් පසුව අප්‍රේල්, මැයි මාස වනකොට අපට ඒ වාරික 2ම ලබා ගන්න පුළුවන් වෙයි කියලා. එහෙම වුණොත් ඩොලර් මිලියන 700ක වාගේ cash inflow එකක් - ඇතුළට ගලා ඒමක් - සිද්ධ වනවා. ඒ නිසා මේ සංචිතවලට ඇතිවන බලපෑම ගැන අපි අනවශ්‍ය බියක් ඇති කර ගත යුතු නැහැ. ඒ බලපෑම සමනය කර ගැනීමට හැකි තත්ත්වයක් මේ තුළ නිර්මාණය වෙලා තිබෙනවා. අපි ඒක උපරිමයෙන් ලබා ගන්න බලාපොරොත්තු වනවා.

ඒ වාගේම ඒකත් එක්ක සම්බන්ධ වුණු ජාත්‍යන්තර සංවර්ධන පාර්ශ්වකරුවන් වන ආසියානු සංවර්ධන බැංකුව - ADB එක - සහ ලෝක බැංකුව ලබා දීමට එකඟ වෙලා තිබෙන මුදල් ප්‍රමාණය අපට ලබා ගන්නත් පුළුවන් වනවා. ඒ අනුව ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 480කුත්, ලෝක බැංකුවෙන් ඩොලර් මිලියන 100කුත් ඒ හා සමගාමීව අපට ලැබෙනවා.

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

ඒ නිසා අපනයන ආදායමට යම් බලපෑමක් වෙනවා නම්, සංචාරක කර්මාන්තයට යම් බලපෑමක් වෙනවා නම්, ඒ වාගේම ප්‍රේෂණවල යම් අඩුවීමක් සිද්ධ වෙනවා නම්, මේ හරහා එය තුලනය කර ගනිමින් අනෙක් පැත්තෙන් මේ සංචිත ප්‍රමාණය ඉහළට ගෙන යැමටත් අපට පුළුවන්කම ලැබෙනවා.

ඒ වාගේම මේ තත්ත්වය මත විශේෂයෙන්ම බාහිර අංශයේ අපට වැදගත් වන කොටසක් තමයි, ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය. මම සන්තෝෂයෙන් කියන්න කැමැතියි, 2025 වර්ෂයේදී ඉතිහාසයේ පළමු වතාවට මේ ජංගම ගිණුමේ ශේෂය වැඩිම අගය වාර්තා කර ගත් බව. ඒ, ඩොලර් මිලියන 1,733ක්. එයත් අපට සැලකිය යුතු ආකාරයකට මේ පීඩනයට මුහුණ දෙන්න පුළුවන් බලයක්, ඔරොත්තු දීමේ හැකියාවක් - resilient තත්ත්වයක් - නිර්මාණය කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා මම විශ්වාස කරනවා, පිටින් තිබිච්ච බාහිර සාධකය නිසා ලංකාවට ඇති වෙච්ච කම්පනය කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය වටපිටාව අපට තිබෙනවා කියලා. ඒ වාගේම යම් පීඩනකාරී තත්ත්වයකදී රටේ සාමාන්‍ය ජනතාවට එමඟින් ඇති වන පීඩනය අවම කර ගැනීමටත් ගරු අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් අපි කමිටුවක් පත් කර තිබෙනවා. ඒ අනුව අපි ඒ ඉලක්කගත සහන ලබා දීමටත් බලාපොරොත්තු වනවා. අපි එකාවන්ව එකට මේ අර්බුදයට මුහුණ දෙමුයි කියා මහජනතාවටත් යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජනාධිපතිතුමා.

[පූ.භා. 11.32]

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මැද පෙරදිග කලාපයේ ඇති වී තිබෙන යුදමය තත්ත්වයත්, ඒ හරහා ලෝකය පුරා විවිධ රාජ්‍යයන් මුහුණ දී තිබෙන අභියෝග පිළිබඳවත් සාකච්ඡාවක් පවතිනවා. ඒ සාකච්ඡාවට අපේ පාර්ලිමේන්තුවේත් ඉඩ විවර කරමින් මේ යෝජනාව ගෙන එන ලද අයට මම බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මගේ කථාව ආරම්භයේදීම කිව්වොත්, මේ ප්‍රශ්නයේදී අපි දිගටම ඉන්න ස්ථාවරය තමයි, මධ්‍යස්ථභාවය. ඒක තමයි අපේ ස්ථාවරය. අපේ මව්බිමේ ගෞරවයත්, ඒ වාගේම යුක්තිය පිළිබඳ ප්‍රශ්නයත් සහ ජාත්‍යන්තර පිළිගැනීමත් අපට අත්පත් කරගත හැකි වන්නේ අපේ මධ්‍යස්ථභාවය ආරක්ෂා කර ගැනීමෙනුයි. ඒ නිසා අපි කිසිසේත්ම කුමන පීඩනයක් මධ්‍යයේ හෝ මේ මධ්‍යස්ථභාවය ගිලිහෙන්න ඉඩ දෙන්නේ නැහැ. නමුත් මා දන්නවා, සමහර මන්ත්‍රීවරුන්ගෙන් සමහර අදහස් ඉදිරිපත් වනවා, අපි යම් කණ්ඩායමකට පක්ෂපාතීව ඉන්නවා, සමහර දේවල්වලදී අපි නිසි වෙලාවට, නිසි පරිදි තීන්දු තීරණ ගත්තේ නැහැ කියලා. ඒවා සම්පූර්ණ අසත්‍ය අදහස්.

පළමුකොටම මම ඔබතුමන්ලාට කියන්නම්, ඉරාන නැව් පිළිබඳ ප්‍රශ්නය ගැන. විශේෂයෙන්ම 2026.02.26වැනි දා - දිනය මතක තබාගන්න - අපෙන් ඉල්ලීමක් කළා, මාර්තු මාසයේ 9 සහ 13 කියන දිනවලදී ලංකාවට goodwill visit එකක් එන්න ඕනෑය කියලා. ඒ කියන්නේ, සහයෝගීතාව වර්ධනය කිරීමේ සංචාරයකට එන්න අවශ්‍යයි කියලා මේ නාවික යාත්‍රා 3 අපෙන් ඉල්ලීමක් කළා. අපට කියලා තිබුණේ මාර්තු මාසයේ 9 සහ 13 කියන දෙදින තුළ එන්න අවශ්‍යයි කියලා. අපි ඊට අවසර ලබා දීම පිළිබඳව අධ්‍යයනය කරමින් සිටියා.

මා මේ මොහොතේදී මේ කාරණයත් කියන්න කැමැතියි. ඒ හා සමානවම එදිනම හවස ඇමෙරිකා එක්සත් ජනපදයත් අපෙන් ඉල්ලා සිටියා, ජිබුටි රාජ්‍යය ආසන්නයේ තිබෙන නාවික හමුදාවට අයත් ප්‍රහාරක ගුවන් යානා දෙකකට ශ්‍රී ලංකාවේ මත්තල ගුවන් තොටුපළට පැමිණෙන්න අවසර දෙන්න කියලා. ඒ වෙලාවේ අපේ මේසය උඩ තිබුණා, කඩදාසි දෙකක්. එක පැත්තකින් ඉරානය විසින් අපෙන් ඉල්ලා සිටිනවා, මාර්තු 9වැනි දා සහ 13වැනි දා මේ නාවික යාත්‍රාවලට අපේ වරායකට ප්‍රවිෂ්ට වෙන්න අවසර දෙන්න කියලා. අනෙක් පසින් ඇමෙරිකා එක්සත් ජනපදය අපෙන් ඉල්ලා සිටිනවා, ඔවුන්ගේ නාවික හමුදාවට අයත් යුද ගුවන් යානා දෙකකට අපේ මත්තල ගුවන් තොටුපළට එන්න අවසර දෙන්න කියලා. එතකොට මොකක්ද අපි ගන්න ඕනෑ, තීරණය?

අපි ඉතාම පැහැදිලිව තීරණයක් ගත්තා, මෙහිදී අපේ රට මධ්‍යස්ථභාවයෙන් කටයුතු කළ යුතුය කියලා. ඒ වන විටත් යුදමය ගැටුම් පිළිබඳ සංඥා මතු වෙලා තිබුණා. අපි ඒ ඉල්ලීම් දෙකටම අවසර ලබා දුන්නේ නැහැ. ඒක තමයි අපේ මධ්‍යස්ථභාවය. විශේෂයෙන් මට මතකයි, ඉරාන නෞකාවලට අපේ රටට එන්න අවසර නොදුන්නේ ඇයි කියලා මෙතැන ඉන්න අයගෙන්

කවුරුහරි ඇහුවා කියලා. අවසර දුන්නා නම් මොකක්ද සිද්ධ වන්නේ? අපේ මුළු මධ්‍යස්ථභාවයම ගිලිහෙනවා. එක්කෝ, අපි එක පාර්ශ්වයකට පක්ෂපාතීව කටයුතු කරනවා වනවා, එහෙම නැත්නම්, අපට අනෙක් පාර්ශ්වයටත් ඉඩ දෙන්න සිද්ධ වනවා. එහෙම කළා නම් අපෙන් ඈත කලාපයේ තිබෙන යුද ගැටුමක් මත්තලට සහ කොළඹ වරායට ළඟා වනවා. අපි ඒ වැඩේ කළේ නැහැ. කුමන පීඩනයක් මධ්‍යයේ වුවද අපි රට ආරක්ෂා කරලා තිබෙනවා.

ඊට පසුව පෙබරවාරි 27වැනි දා "IRIS Bushehr" කියන නෞකාවේ නාවික සෙබළෙක් වැටිලා තුවාල වෙලා තිබෙනවාය කියලා වාර්තා කරලා ඔවුන් අපෙන් ඉල්ලා සිටියා, එම නාවික සෙබළාත්, ඔහු සමඟ නිලධාරියෙකුත් ලංකාවට ගෙනෙන්න ඕනෑ කියලා. අපේ මධ්‍යස්ථභාවය සහ ජාත්‍යන්තර බැඳීම් අනුව එවැනි අවස්ථාවක අපි ඔවුන්ට සහාය ලබා දිය යුතුයි. අපි පෙබරවාරි 27වැනි දා එම නාවික නිලධාරියාත්, නාවික සෙබළාත් Durdans Hospital එකට ගෙනාවා. ඒ සඳහා අපි අවසර ලබා දුන්නා. එලෙස ඔවුන් ගෙනාවේ එම නැව් සමාගමට අදාළ සැපයුම් කරන සමාගම විසිනුයි. අපි නොවෙයි ඔවුන් ගෙනාවේ. ඔවුන් විසින් ඒ දෙදෙනා ගෙනැවිත් තිබුණා. ඒක තමයි ජාත්‍යන්තර වශයෙන් අපි එළඹිලා තිබෙන සම්මුතිය. අපි ඒ අනුව කටයුතු කළා.

ඉන්පසුව, නැවත මාර්තු 04වැනි දා අපට වාර්තා වුණා, අපේ ආර්ථික කලාප සීමාවේ ඉරානයට අයත් නෞකාවකට ප්‍රහාරයක් එල්ල වී තිබෙන බව. මොකක්ද අපේ බැඳීම? ඕනෑ නම් අපට අහක බලාගෙන ඉන්න තිබුණා. ඒ ප්‍රහාරය එල්ල වෙලා තිබුණේ අපේ මුහුදු සීමාවේදී නොවෙයි, ආර්ථික කලාපයේ. ආර්ථික කලාපයේ ගහ ගන්නත් පුළුවන්, නැව්වලට යන්නත් පුළුවන්, ඕනෑ දෙයක් කරන්න පුළුවන්. එය සිදු වෙලා තිබුණේ අපේ මුහුදු සීමාවේ නොවෙයි. නමුත්, ජාත්‍යන්තර බැඳීම් සහ මනුෂ්‍යත්වය කේන්ද්‍ර කරගෙන අපේ නාවික හමුදාව සහ ගුවන් හමුදාව විශාල මෙහෙයුමක් කළා. ජාත්‍යන්තර ප්‍රමිතීන් තිබෙනවා, එවැනි පිපිරීමක් සිදු වුණාම දවස් කීයක් ආවේක්ෂණය කළ යුතුද, රළ හමන දිශාව අනුව කොච්චර දුරක් අපි ආවේක්ෂණය කළ යුතුද කියලා. අපි ඒ සියල්ල ඒ ප්‍රමිතීන් අනුව සිදු කළා. සාමාන්‍යයෙන් එවැනි ප්‍රහාරයක් සිදු වුණාම ජීවිත ගලවා ගැනීම සහ මළ සිරුරු ගෙන ඒමට ගත යුතු කාලයක් තිබෙනවා. අපි ඒ නියමිත කාලයම ගත්තා. රළ හමන දිශාව අනුව යා යුතු දුරක් තිබෙනවා. අපි ඒ මුළු දුරම ගියා. අපි එහෙම තමයි වැඩ කරලා තිබෙන්නේ. ඒ අනුව තුවාලකරුවන් 32ක් සහ මළ සිරුරු 84ක් අපේ ගොඩ බිමට අපි අරගෙන ආවා. ඒ, අපේ මනුෂ්‍යත්වය සහ අපේ මධ්‍යස්ථභාවයයි.

අනතුරුව මාර්තු 04වැනි දා උදේ ඒ ප්‍රහාරයෙන් පසුව අපෙන් ඉල්ලීමක් කළා, ඔවුන්ගේ අනෙක් නෞකාවේ එන්ජිමේ කඩා වැටීමක් සිදු වෙලා තිබෙනවා, එම නිසා අපේ කොළඹ වරායට ළඟා වෙන්න ඉඩ දෙන්න කියලා. මේ සභාවේ බොහෝ අය කියනවා මට ඇහුණා, පැය 11කට කලින් යන්න තිබුණාය කියලා. පැය 11ක් තිබුණේ නැහැ. පළමුවැනි ඉල්ලීම ආවේ පෙබරවාරි 26වැනි දා, මාර්තු 09 පැමිණීම සඳහායි. පෙබරවාරි 26වැනි දා ඉල්ලීම ආවේ මාර්තු 09වැනි දා එන්න. මම හිතන විධියට මේ අයට දින ගණනයි, පැය ගණනයි පැටලිලාද දන්නේ නැහැ. පළමු නෞකාවට ප්‍රහාර එල්ල කළාට පසුව තමයි දෙවැනි නෞකාව අපෙන් ඉල්ලීමක් කළේ, ඒ නෞකාවේ එන්ජිමේ ආබාධයක් ඇති වෙලා තිබෙන නිසා ගමන් කරන්න බැහැ, එම නිසා අපේ කොළඹ වරායට ළඟා වෙන්න ඉඩ දෙන්න කියලා. මොකක්ද ජාත්‍යන්තර නීතිය? ඔවුන් යුද ගැටුමක එක පාර්ශ්වකරුවෙක්. ඔවුන් අපේ මුහුදු සීමාවට ඇතුළු වනවා නම් ඔවුන්ට අපිට රැඳෙන්න දෙන්න පුළුවන්කම තිබෙන්නේ පැය 24යි. පැය 24කින් පසුව ඔවුන් නැවත යා යුතුයි. පැය 24කට වඩා අපට ඔවුන් තියා ගන්න බැහැ. එහෙම තියා ගන්නවා නම් ඒකේ තේරුම මොකක්ද? යම් යුද ගැටුමක් තිබෙනවා; එක කණ්ඩායමක් අනතුරකට මුහුණ දීලා තිබෙනවා; අනතුරට මුහුණ දුන් කණ්ඩායම අපි බේරා ගන්නවා; නැවත යුද්ධයට යවනවා. ඒ කියන්නේ, අපි එක පාර්ශ්වයක් නියෝජනය කරනවා නේ. ඒ නිසා අපට ඔවුන් තියා ගන්න පුළුවන් උපරිම කාලය පැය 24යි. පැය 24න් පසුව ඔවුන් නැවත යා යුතුයි. එසේ නොමැති නම් ඔවුන් අපේ භාරයට ආ යුතුයි. එතකොට තමයි අපේ මධ්‍යස්ථභාවය ආරක්ෂා වෙන්නේ. අපි සෑම සිදුවීමක්ම සන්සන්දනය කළේ අපේ මධ්‍යස්ථභාවය මත. ඔවුන්ට පැය 24න් යන්න බැහැ. ඒ නිසා අපි කිව්වා, එහෙම නම් අපේ භාරයට එන්න ඕනෑ කියලා. ඔවුන් අපේ භාරයට ආවාට පසුව අපි කිව්වා, සම්පූර්ණ crew එකම බහින්න ඕනෑ කියලා. ඔවුන්ගේ ඉල්ලීමක් තිබුණා, crew එකටම රැඳෙන්න ඕනෑ කියලා. ඒ අනුව අපි ඒ අතර සිටි නාවිකයින් 206ක් අපේ නාවික හමුදා කඳවුරට ගෙනාවා. මම කියන්න කැමතියි, මේ නාවිකයින් 206දෙනාම අපි එකට මුහු වෙන්න තියලා නැහැ කියන එක. අපි දන්නවා, ඔවුන් සොල්දාදුවන් බව. ඔවුන් ආතතියකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා කවරාකාර තත්ත්වයක් වර්ධනය විය හැකිද? ඒ නිසා අපි ප්‍රවේශම්කාරී ලෙස ඔවුන්ට අවශ්‍ය වන ආහාර පාන ලබා දෙනවා. මෑතකදී එක්කෙනෙක් රෝගාතුර වුණා. ඔහුව වැලිසර නාවික හමුදා රෝහලට අපි පිටත් කර හැරියා. අපි ඉතාම මනුෂ්‍යත්වයෙන් යුතුව ඔවුන්ව රැක බලා ගන්නවා. ඒ නිසා තමයි ලංකාව ජාත්‍යන්තරය හමුවේ පිළිගැනීමට සහ කීර්තියට භාජන වෙන්නේ. අනතුරුව ඔවුන් අපෙන් ඉල්ලා සිටියා, ඔවුන්ගේ ඒ මළ සිරුරු ඒ අයගේ රටට ගෙන යන්න අවශ්‍යයි කියලා. අපි ඒ සඳහා අවසර ලබා දුන්නා. ඒ අනුව පසුගිය දිනයක ගුවන් යානයක් ඇවිල්ලා ඔවුන්ගේ මළ සිරුරු ශ්‍රී ලංකාවෙන් ගෙන ගියා. ප්‍රහාරයට ලක් වුණු නෞකාවේ සිට තුවාල වුණු 32ක් කරාපිටිය රෝහලේ හිටියා. ඒ සියලුදෙනාම සුවය ලැබුවාට පසුව ඒ ආසන්නයේ තිබෙන කොග්ගල ගුවන් හමුදා කඳවුරේ රැඳී සිටිනවා. ඒ නිසා ජාත්‍යන්තරව පවතින මේ යුද්ධයේදී අපේ ප්‍රතිපත්තිය හැම විටම මධ්‍යස්ථභාවය ආරක්ෂා කිරීමයි.

ඊළඟට, මේ ප්‍රහාරයන් පිළිබඳව පසුගිය දා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සලයට යෝජනාවක් ආවා. රාජ්‍යයන් ගණනාවක් ඒ යෝජනාවට එකහතාව පළ කරලා තිබුණා; සම සහයෝගීතාව ලබා දීලා තිබුණා. නමුත්, අපි සහයෝගීතාව ලබා දුන්නේ නැහැ. අපි සහයෝගීතාව ලබා නොදුන්නේ ඒ යෝජනාවෙන් අඩක් පමණක් සත්‍ය වන නිසායි. මා දන්නවා, රටවල් 130ක් එම යෝජනාවට සහයෝගීතාව පළ කර තිබුණු බව. නමුත්, අපි සහයෝගීතාව පළ කළේ නැහැ. අපි ඒ සඳහා සහයෝගීතාව පළ කළේ නැත්තේ ඇයි? ඒ යෝජනාව අසම්පූර්ණයි. අපි හැම විටම යුක්තිය හා සාධාරණත්වය පිළිබඳ සටන් පාඨය ජාත්‍යන්තර වේදිකාවට ගෙනියනවා. ඒ අනුව අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මා කියන්නේ, හැම විටම අපේ ක්‍රියාකාරකම්, අපේ ප්‍රතිපත්තීන්, අපේ තීන්දු තීරණ, අපේ සම්මුතීන් කියන මේ සියල්ලේදී අපි, අපේ මධ්‍යස්ථභාවය ආරක්ෂා කරමින් කටයුතු කරනවාය කියන එකයි. එය තමයි, මෙවැනි යුද්ධයකදී මේ මාතෘ භූමියේ අනන්‍යතාවත්, ගෞරවයත්, ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමත් ආරක්ෂා කර ගැනීම සඳහා තිබෙන ක්‍රමවේදය.

බොහෝ අය බොහෝ දේවල් කියනවා. පාර්ලිමේන්තුවේදීත් කියනවා මම අහගෙන හිටියා, පැය 11කට කලින් ගෙනාවා නම් ඔවුන්ව බේරා ගන්න තිබුණාය කියලා. ඒ වාගේ බොරු කථා කියනවා. ඒවා ඉතාම අසත්‍ය චෝදනා. මා හිතනවා, පාර්ලිමේන්තුවේදී විශේෂයෙන්ම ඩීසල් ප්‍රශ්න, ආහාර ප්‍රශ්න ආදී අනෙක් ඕනෑම ප්‍රශ්නයක් ගැන කියන්න පුළුවන් කියා. ඒවා අපේ ප්‍රශ්න; රටේ තිබෙන ප්‍රශ්න. හැබැයි, ජාත්‍යන්තර වශයෙන් ඉතා වැදගත් තීරණාත්මක සන්ධිස්ථානයක සිටිමින් ලෝකය කැලඹෙමින් තිබෙන වෙලාවක සත්‍යය කියන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ නිසා අසත්‍ය චෝදනා එල්ල කරමින් කුමක්ද

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

කරන්නේ? ශ්‍රී ලංකා ආණ්ඩුව මහ හැරීම විසින් තමයි පළමු නෞකාව බිලි වුණේ කියලා මතයක් හදනවා. එය සාහසිකයි, අමානුෂිකයි. එය ජාත්‍යන්තර වශයෙන් ගත්තොත්, අන්ත ප්‍රතිගාමී ක්‍රියාවක් බව හොඳට මතක තබා ගන්න. පාර්ලිමේන්තුවේදී මට කියන ඒවා, අපේ අගමැතිතුමියට කියන ඒවා අපි ගණන් ගන්නේවත් නැහැ. හැබැයි, මේ ප්‍රශ්නයේදී තමුන්නාන්සේලා මීට වඩා වගකීමෙන් යුතුව කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. මේක තමයි, සත්‍යය.

එක්සත් ජනපදයේ ගුවන් යානා දෙක අපෙන් ඉල්ලා සිටියේ මාර්තු 04 සහ 08 කියන දෙදින තුළ මත්තල ගුවන් තොටුපොළේ රඳවා තබන්න කියායි. මා දන්නවා, ඔවුන් සතු නෞකා නාශක මිසයිල 8ක් එම ගුවන් යානාවල පියාපත්වල එල්ලා ඇති බව සඳහන් කර තිබුණු බව. සමහර අය මේ සභාවේ තර්ක කරන්න හදනවා, අපි එක්සත් ජනපදයත් එක්ක ආරක්ෂක ගිවිසුමකට එළඹිලා තිබෙනවා, ඒ නිසා මේ යුද්ධයේ පාර්ශ්වකරුවන් වීම අපට වළක්වන්න බැහැ කියලා. ඒක අසත්‍යයි. අපි එළඹිලා තිබෙන එකඟතාවයේ කරුණු ප්‍රධාන වශයෙන් ගත්තොත්, එම එකඟතාවයේ කිසිසේත්ම මෙවැනි යුද්ධයකදී අපි අතර තිබෙන හවුල්කාරිත්වය පිළිබඳව කිසිදු සඳහනක් නැහැ. අපි අතර යම් සම්මුතීන් තිබෙනවා. යම් අවබෝධතාවන්වලට අපි අත්සන් කරලා තිබෙනවා. ඒවායේ තිබෙන්නේ මොනවාද? ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්, සේවා, නඩත්තු හා සම්බන්ධ පුහුණු වැඩසටහන්.

ඊළඟට, සමුද්‍රීය බලප්‍රදේශය පිළිබඳ දැනුවත්භාවය. සමුද්‍රීය බලප්‍රදේශයේ සිදු වන්නේ මොකක්ද කියන තොරතුරු අපට අවශ්‍යයි. ඒවා තමයි මේ සහයෝගිතා ගිවිසුමේ තිබෙන කරුණු. ඊළඟට, සයිබර් ආරක්ෂාව සහ සුරක්ෂිත සන්නිවේදනය. එය අද තර්ජනයකට ලක් වෙලා තිබෙනවා. ඒ පිළිබඳව විශාල පහසුකම් සහ පුහුණුවීම් එක්සත් ජනපදය විසින් අපට ලබා දෙනවා. ඒ වාගේම තමයි, මානුෂීය ආධාර සහ ආපදා හදිසි ප්‍රතිචාර. මේ වගන්තිය අනුව තමයි C-130 ගුවන් යානා දෙකක් අපට "දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේදී අපේ රටට ආවේ. යුද්ධයකදී අපි කවර පාර්ශ්වයක්ද ගන්නේ කියන එක ගැන බැඳීමක් කිසිසේත් එම අවබෝධතා ගිවිසුම්වල නැහැ. නමුත් සමාජයේ මතයක් ගොඩ නඟන්න උත්සාහ කරනවා, එක්සත් ජනපදයත් එක්ක එළැඹුණු අවබෝධතා ගිවිසුම් අනුව තමයි අපි කටයුතු කරන්නේ කියලා. ඒ නිසා තමයි අපි මේ ප්‍රතිපත්තියේ ඉන්නේ, ඉරානයේ නැව ගත්තේ නැත්තේ වාගේ කථා කියනවා. බොරු. මම ඔබට පැහැදිලිව කිව්වා, 26වැනි දා එක් පාර්ශ්වයකින් නාවික යාත්‍රා රට තුළට ඇතුළු කරන්න අවසර ඉල්ලනවා, අනෙක් පාර්ශ්වයෙන් ගුවන් යානා ගොඩබාන්න අවසර ඉල්ලනවා කියලා. අපි එවැනි බැඳීමක් තිබෙනවා නම් ගුවන් යානාවලට ඉඩ දෙන්න ඕනෑ නේ. අපි එහෙම ඉඩ දීලා නැහැ. ඒ නිසා අපි පැහැදිලිව අපේ ජාත්‍යන්තර ප්‍රතිපත්ති රකිමින් තිබෙනවා.

මීට කලිනුත් මා කියලා තිබෙනවා, මේ යුද්ධයේ ස්වභාවය. එක් පාර්ශ්වයක් මේ යුද්ධය තීව්‍ර කරමින් සහ යුද්ධයේ ගැටුමට අවතීර්ණ වෙලා තිබෙන්නේ මුළුමනින්ම එම රාජ්‍යයේ තිබෙන පාලන තන්ත්‍රය වෙනස් කිරීමේ අරමුණින්. ඒ පාලන තන්ත්‍රය හරිද, වැරැදිද කියලා තීරණය කරන එක ඒ ජනතාවගේ අයිතිය. එය වෙනස් කිරීමේ අරමුණින් තමයි එක් පාර්ශ්වයක් මේ යුද්ධයට මැදිහත් වෙලා තිබෙන්නේ. අනෙක් පාර්ශ්වය යුද්ධයේ ක්‍රියාකාරකමට සම්බන්ධ වෙලා තිබෙන්නේ කොහොමද? සන්සන්දනාත්මකව බැලුවොත්, ඔවුන්ට ශක්තිමත් යුද බලයක් නැත්නම් ඔවුන්ගේ යුද්ධයේ උපක්‍රමය බවට පත් වී තිබෙන්නේ ලෝක පරිමාණයෙන් ආර්ථිකයට පීඩනයක් එල්ල කිරීම. ඒ අනුව තමයි ආරම්භයේදී ගුවන් තොටුපොළවල්, පසුව වරායවල්, පසුව තෙල් පිරිපහදු, පසුව තෙල් ප්‍රවාහනය කරන නාවික යාත්‍රා ඉලක්ක වුණේ. ඒකෙන් පෙන්නුම් කරන උපක්‍රමය මොකක්ද? ආර්ථික වශයෙන් ලෝකය පීඩනයට ලක් වීම තමයි ඔවුන්ගේ ආරක්ෂාව කියලා ඔවුන් කල්පනා කරනවා.

යුද්ධයකදී පාර්ශ්වයකට ගැති වෙන්නේ නැතුව, පිටස්තරව ඉඳන් අපට ඔවුන්ගේ යුද්ධයේ අරමුණ පිළිබඳව විශ්ලේෂණය කරන්න පුළුවන්. අපි තේරුම් ගන්න ඕනෑ මේකයි. එක පාර්ශ්වයකට අවශ්‍යයි, මුළුමනින්ම මේ රෙජිමය වෙනස් කරන්න. ඒ සඳහා අනෙක් පාර්ශ්වය මුහුණ දෙන විධිය තමයි ලෝක පරිමාණයෙන් ආර්ථිකය පීඩාවට ලක් කරලා, ඒ හරහා තමන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කර ගැනීම. ඒක තමයි මේ යුද්ධයේ තිබෙන අන්ත දෙකේ ස්වභාවය කියලා අපි තේරුම් අරගෙන තිබෙනවා. අන්න එහිදී තමයි අපට මේ කාරණය වැදගත් වෙන්නේ. විශේෂයෙන්ම අපනයන වෙළඳාම පසෙකින් තිබ්බත්, ප්‍රධාන වශයෙන් මැද පෙරදිග කලාපය කේන්ද්‍ර කරගත් අපේ ආර්ථික ප්‍රභව දෙකක් තිබෙනවා.

පළමුවැනි කාරණය තමයි, ඒ හරහා ගොඩනැඟිලා තිබෙන ගෑස් සහ ඉන්ධන සැපයුම් මාර්ග. ඒක අපේ ආර්ථිකයට වැදගත්. දෙවැනි කාරණය තමයි, අපේ රටේ විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ලක්ෂ 10කට ආසන්න ප්‍රමාණයක් එම කලාපයේ වැඩ කරන එක. එම ශ්‍රමිකයන් අපේ ආර්ථිකයේ විශාල පංගුවක්. අපට අභ්‍යන්තරයේ වෙන අර්බුදයක් නැහැ. අභ්‍යන්තරයේ වෙන ගැටුමක් නැහැ. අපට විය හැකි දේ තමයි, අපේ විදෙස් සංක්‍රාමවල පසුබැසීමක් ඇති වෙන්න පුළුවන්, ඒ රටවල වැඩ කරන අපේ ජනතාව මුහුණ දෙන ගැටලු නිසා. දෙවැනි එක තමයි, සැපයුම් මාර්ග අඩපණ වීම නිසා අපේ බලශක්ති සැපයුමට ප්‍රශ්න මතු වෙන්න පුළුවන් කියන එක. අපි බලන්න ඕනෑ බාහිරව ඇතිවන මේ කම්පනයෙන් එන ප්‍රශ්න අපට මොන ආකාරයෙන්ද බලපාන්නේ කියලා. එහෙම නේ, අපි තේරුම් ගන්න ඕනෑ. අපේ කෘෂි කර්මාන්තයට කොහොමද බලපාන්නේ ආදී වශයෙන් බලන්න ඕනෑ. ඒ බාහිර කම්පනයේ ස්වභාවය අපි තැන් දෙකකින් හොඳින් තේරුම් අරගෙන තිබෙනවා. අංක එක, අපේ විදෙස් සංක්‍රාම. දෙක, බලශක්ති සැපයුම් මාර්ග.

අපි ඉතා විධිමත්ව අපේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වැඩ කරමින් ඉන්නවා; සැලසුම් කරලා තිබෙනවා. අපේ රටේ තිබුණු ක්ෂණික මිලදී ගැනීම් තමයි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ආශ්‍රිතව ගොඩනැඟිලා තිබුණු ඉතාම විනාශකාරී දූෂණය. ඒ නිසා අපි හැම විටම උත්සාහ කළා, දිගු කාලීන ටෙන්ඩර්වලින් අපේ බලශක්ති සැපයුම ලබා ගන්න. අපි බලයට ආ දින සිට අපි උපරිම උත්සාහ දැරුවේ, දිගු කාලීන ටෙන්ඩර් හරහා බලශක්තිය සපයා ගැනීමටයි. ඒ වාගේම අපි විවිධ රාජ්‍යයන් එක්ක ඒ සම්බන්ධව සාකච්ඡා කරමින් සිටියා. ටෙන්ඩර් ප්‍රමාණයත් සමහර වෙලාවට fix කරන්න පුළුවන්. අපි කවුරුත් ඒක දන්නවා. ඒ නිසා අපි උත්සාහ කරමින් සිටියා, ආණ්ඩු-ආණ්ඩු, government-to-government - G2G - එකඟතාවකට යන්න පුළුවන්ද කියලා බලන්න. අපේ බලශක්ති ඇමතිතුමා ඒ පිළිබඳව රාජ්‍යයන් කිහිපයක් එක්ක සාකච්ඡා කළා. අපේ ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා UAE ගිය වෙලාවේ ඒ අදාළ රාජ්‍යයන් එක්ක සාකච්ඡා කර තිබුණා. අපි ප්‍රයත්නයක සිටියා.

හැබැයි, අපේ සැලැස්ම වෙලා තිබුණේ මොකක්ද? දිගු කාලීන ටෙන්ඩර් තමයි දැන් තිබෙන හොඳම, වාසිදායකම, පිරිවැය අඩුම සහ වංචා දූෂණ අවම ක්‍රමය කියලා අපි කල්පනා කළා. ඒ අනුව අපි සැලසුම් සකස් කරලා තිබුණා. විශේෂයෙන්ම අපට පිරිපහදු කරන ලද තෙල් එන්නේ සිංගප්පූරු සමාගම් සහ ඉන්දියානු සමාගම් හරහා. ඒ නිසා අපේ දිගු කාලීන ටෙන්ඩර්වලට අදාළ පිරිපහදු කරන ලද තෙල් සම්බන්ධයෙන් තවම අර්බුදයක් ඇති

වුණේ නැහැ. හැබැයි, අපට ආපු ප්‍රධාන ප්‍රශ්නය මොකක්ද? බොර තෙල් ගෙන්වීම. විශේෂයෙන්ම ෆුජයිරා වරායෙන් තමයි අපට බොර තෙල් - crude oil - ඒමට නියමිතව තිබුණේ. අපට මේ මාර්තු මාසයේ 24, 25 බොර තෙල් මෙට්‍රික් ටොන් 90,000ක නැවක් එන්න තිබුණා. නමුත් ඔබ දන්නවා, ෆුජයිරා වරායට සිදු වූ විපත. ඒක දිගු කාලීන ටෙන්ඩරයක්. ඔවුන් ඒක ගෙනෙන දිනය පස්සට දාලා තිබෙනවා. ඊළඟට, single tender එකක් තිබුණා. එතැනත් මෙට්‍රික් ටොන් 90,000ක් තිබුණා. ඒකත් අපට එන්න තිබුණේ ෆුජයිරාවලින්. ඒ නැවත් අපට ලැබෙන්නේ නැහැ.

බලශක්ති ප්‍රශ්නය එනකොට අපි බැලුවා, කොහෙන්ද අපට ප්‍රශ්න මතු විය හැක්කේ කියලා. අපේ බලශක්ති අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදීත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිතුමාත් ඉතා පැහැදිලිව කිව්වා, ඉන්දියානු සමාගම් සහ සිංගප්පූරු සමාගම් අතර ඇති වී තිබෙන එකඟතා අනුව, ඒ ගිවිසුම් ප්‍රකාරව අපට ඉන්ධන නැව් එනවා කියලා. එහෙම නම් අපට ප්‍රශ්න මතු විය හැකි තැන මොකක්ද? අර බොර තෙල් නැව් ටික නොලැබීම තමයි අපට ප්‍රශ්න ඇති විය හැකි තැන්. ඒ අනුව අපි මාර්තු මාසයේ 5වැනි දා ටෙන්ඩර් එකක් call කළා. යුද්ධය පටන් ගත්තේ පෙබරවාරි 28වැනි දා. ඒ කියන්නේ මාර්තු 01වැනි දා වාගේ. බලශක්තිය සැපයීම සඳහා අවශ්‍ය පරිදි අපි දිගු කාලීන ටෙන්ඩර් ලබා දීලා තිබුණා. එහෙත්, මෙතැන අර්බුදයක් මතු විය හැකියි කියන සැකය මත අපි ටෙන්ඩර් එකක් call කළා. ඒ ටෙන්ඩරය අපි මේ 17වැනි දා විවෘත කළා. එතැනදී අපි බැලුවේ මොකක්ද? අපට අර්බුදය මතු වෙන්නේ බොර තෙල් නැති නිසා නම්, - සාමාන්‍යයෙන් අපේ තෙල් අවශ්‍යතාවෙන් සියයට 35ක් තෙල් පිරිපහදුව හරහා නිෂ්පාදනය කරනවා - එම කලාපයෙන් අපට බොර තෙල් සපයා ගැනීම අසීරු නම්, අපි මොකක්ද කරන්නේ? පිරිසිදු කරන ලද ඉන්ධන ආනයනය කළ යුතු වෙනවා. එම නිසා අපි 05වැනි දා ටෙන්ඩර් එකක් call කළා, ඩීසල්, පෙට්‍රල්, දැව්තෙල්, Jet A-1 සහ බොර තෙල් නැව් දෙකක් සඳහා. ඊට කලින් අපේ බොර තෙල් නැව් දෙකක් cancel වෙලා තිබුණා නේ. මේ ටෙන්ඩරය අපි 17වැනි දා විවෘත කළා. 17වැනි දා විවෘත කළාම අපි ඩීසල් නැවක් සඳහා ටෙන්ඩරය ප්‍රදානය කළා. ඒක අප්‍රේල් 6, 7 වෙනකොට එනවා. ඊට පස්සේ පෙට්‍රල් නැවක් සඳහා ටෙන්ඩරයක් ප්‍රදානය කළා. ඒක අප්‍රේල් 16, 17 එනවා. ඒ වාගේම දැව්තෙල් නැවක් සඳහා අපි ටෙන්ඩරයක් ප්‍රදානය කළා. ඒක අප්‍රේල් 12, 13 වෙනකොට එනවා. Jet A-1 නැවක් සඳහාත් අපි ටෙන්ඩරයක් ප්‍රදානය කළා. ඒක අප්‍රේල් 10, 11 වෙනකොට එනවා. බොර තෙල්වලටත් අපි එක ටෙන්ඩරයක් දැම්මා, අප්‍රේල්වල දෙන්න කියලා, දෙවැනි ටෙන්ඩරය දැම්මා ජුනිවල දෙන්න කියලා. අප්‍රේල් වෙනකොට දෙන්න කියලා දාපු ටෙන්ඩරයට කවුරුවත් ඉල්ලුම් කළේ නැහැ. අප්‍රේල්වල බොර තෙල් සපයන්න කියලා දැම්මත්, කිසිදු සමාගමක් ඒ ටෙන්ඩරයට ඉදිරිපත් වුණේ නැහැ. හැබැයි, අපට එක සමාගමක් ඉදිරිපත් වෙලා තිබෙනවා, ජුනි මාසයේ බොර තෙල් නැවක් ලබා දෙන්න පුළුවන් කියලා. අපි ඒ ටෙන්ඩරය ප්‍රදානය කළා. ඩීසල්, පෙට්‍රල්, දැව්තෙල්, Jet A-1, ඒ හැම ඉන්ධන වර්ගයක් සඳහාම අපි ටෙන්ඩර් ප්‍රදානය කළා. ඒ වාගේම, ඒ ටෙන්ඩරයේම දිගුවක් හැටියට නැවත ඩීසල් ගෙන්වීම සඳහා අපි 18වැනිදාත් ටෙන්ඩරයක් ඉදිරිපත් කළා. ඒ පිළිබඳව දැනට සාකච්ඡා කරමින් යනවා. අප්‍රේල් මාසයේ 7, 8 වාගේ දවස්වල අපට ඒක ලබා දෙන්න එකඟතාව පළ කරලා තිබෙනවා. බොර තෙල් පිරිපහදුවෙන් අපේ අවශ්‍යතා සපුරා ගන්න බැරි නම්, පිරිපහදු කරන ලද තෙල් ආනයනය කිරීම තමයි අපි ප්‍රමුඛතාව බවට පත් කර ගත්තේ. අපි ඒ ප්‍රමුඛතාව අනුව කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම, අපේ බලශක්ති සැපයුම වෙනුවෙන් මෙට්‍රික් ටොන් 90,000ක් සහිත බොර තෙල් නැව් දෙකක්, ඊට අමතරව අප්‍රේල් 7, 8 වෙනකොට පෙට්‍රල් නැවක් එන්න තිබුණා. මේ අර්බුදය නිසා - මේ ගැටුම නිසා - ඒවා කල් දමා තිබෙනවා. ඊට අමතරව මෙට්‍රික් ටොන් 35,000ක පෙට්‍රල් සහ ඩීසල් දෙකම සහිත පෞද්ගලික සමාගමක නැවක් අප්‍රේල් 7, 8 දිනවල එන්න තිබුණා. ඒ ටිකත් පස්සට ගියා. ඒ නිසා අපි මොකක්ද කරන්න බැලුවේ? හිඟයට අවශ්‍ය තෙල් ටික පුරවා ගන්නේ කොහොමද කියලා තමයි අපි බැලුවේ. ඒකයි අපේ ප්‍රතිපත්තිය. අපට ඉන්ධන විශාල තොග ගේන්න පුළුවන්ද? විශාල තොග ගේන්න බැහැ නේ. තොග ගෙනැල්ලා කොහේද අපි තියා ගන්නේ? එක නැවක් වරායට ඇවිත් තෙල් ටික බාලා යනකොට තමයි අනෙක් නැව වරායට එන්න ඕනෑ. අපට දින 8ක් විතර යනවා, මෙට්‍රික්ටොන් 90,000ක තෙල් නැවක් බාන්න. දින 8ක් යනකල්ම එතැන block වෙලා තිබෙන්නේ. ඒ නිසා එතැනට ඉන්ධන නැවක් ගේන්න කාටවත් බැහැ. එතැන block වෙලා තිබෙන්නේ. ඒ නැව් ටික ඉතාම හොඳින් පෙළ ගස්වාගෙන, හිස් වන තැන කොතැනද කියා බලමින් අපි වැඩ කරමින් ඉන්නවා.

අපි අලුත් ටෙන්ඩර් හරහාත් උත්සාහ කළා මේ අර්බුදකාරි අවස්ථා මඟ හරවා ගන්න. අපි මාර්තු 05වන දා තමයි ටෙන්ඩරය කැඳෙව්වේ, ඉතාම පූර්ව සූදානමකින්. අපි දැක්කා, කොතැනද අර්බුදය මතු වෙන්න පුළුවන් කියලා. ෆුජයිරාවලින් එන බොර තෙල් නැව් දෙකෙන් අර්බුදය මතු විය හැකියි. බොර තෙල්වලින් අපට අවශ්‍ය වන දැව් තෙල් නිෂ්පාදනය කරනවා; Jet A-1 නිෂ්පාදනය කරනවා; ඩීසල් නිෂ්පාදනය කරනවා; පෙට්‍රල් නිෂ්පාදනය කරනවා; භූමිතෙල් නිෂ්පාදනය කරනවා. මේ 5වම අවශ්‍ය වන ටෙන්ඩරය අපි මාර්තු 05වන දා කැඳෙව්වා. ඉතින්, අපි මේ අර්බුදය දෙස කල් තියා බලලා නැද්ද? මේ අර්බුදය දෙස කල් තියා බලලා අපි ඒ ටෙන්ඩරය කැඳෙව්වා.

ඒ වාගේම අපි තවත් දෙයක් කළා. අපි දන්නවා, ලෝකයේ මෙවැනි තත්ත්වයකදී black market එකක් හැදෙනවා කියලා. ඒක තමයි ස්වභාවය. නැවක් තිබෙනවා, ඒ නැවත් එක්ක තුන්හතර දෙනා ඩීල් දමනවා, "මේ ගණනට දෙන්නම්, මේ ගණනට දෙන්නම්" කියලා. අපේ පළමුවැනි අවශ්‍යතාව මොකක්ද? අපේ ප්‍රධානම අවශ්‍යතාව බලශක්තිය අඛණ්ඩව සැපයීමයි. ඒක තමයි අපේ අරමුණ. බිඳ වැටීමකින් තොරව බලශක්තිය සැපයීම තමයි අපේ අරමුණ. ඒ අනුව අපි දෙවැනි පියවරට ගියා. ඒ මොකක්ද? පසුගිය සතියේ අපේ කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා, විශේෂ කමිටුවක් පත් කරන්න. එයට දේශපාලන මැදිහත්වීමක් නැහැ, අදාළ රාජ්‍ය නිලධාරින් එක්ක තමයි ඒ කටයුතු කරන්නේ. විවිධ සමාගම්වලට පුළුවන් ඉල්ලීම් ඉදිරිපත් කරන්න. ඒ කමිටුව ඒවා විමර්ශනයට ලක් කරලා, ඒවායේ පිළිගත හැකිභාවය, ඒවායේ මූල්‍ය වටිනාකම, අපට අවශ්‍ය දිනයට ඒක එනවාද - ඒකත් වැදගත්. කවදා හරි එන එකක් ගෙනැල්ලා බැහැ. මොකද, අපට නිශ්චිත දිනවලට පමණයි වරායේ ඉඩකඩ තිබෙන්නේ. ඒ දිනවලට විතරයි ඒ නැව් ගේන්න ඕනෑ - යනාදි කාරණා ගැන බලලා, ඒවාට ගැළපෙන නැවක් එනවා නම්, අපි අවස්ථාව ලබා දෙන්න ලැහැස්තියි කියලා තීරණයක් අරගෙන තිබුණා. ඒ අනුව යෝජනා කිහිපයක් ආවා. ඒ කමිටුව දැන් ඒවා අධ්‍යයනය කරමින් යනවා. ඒ අනුව බොර තෙල් නැවකට අවස්ථාව ලබා දීමේ හැකියාව අපට තිබෙනවා, ආසන්න වශයෙන් 12වන දාට කලින් බොර තෙල් නැවක් ගෙන්වා ගන්න. ඒකත් සාර්ථක වුණොත් හොඳයි. අපි හැම විකල්පයක්ම ගැන බලනවා. සමහර විට අපි කල්පනා කරනවා, මේ විකල්ප ඔක්කොම එකට සාර්ථක වුණොත් අපට අතිරික්තයක් එයිද කියලා. නමුත් අපි ඒ අවදානම ගන්නවා. අනෙක් පැත්තෙන්, එකක් හරි අසාර්ථක වුණොත් මොකක්ද වෙන්නේ? හිඟයක් ඇති විය හැකියි. සමහර විට අපි හදලා තිබෙන ක්‍රමවේද සියල්ල එක විට හරි ගියොත්, අපට එක මොහොතක අතිරික්තයක් ඇති වේවි. හැබැයි අතිරික්තයට වඩා අපට හානිකර වන්නේ හිඟයක් ඇති වීමයි. නැව් කිහිපයක් වරායේ හිර වෙන්න පුළුවන්. Demurrage ගෙවන්න වෙයි. නමුත් අපි

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ඒකට ලැහැස්තියි. මම දැන්මම කියන්නේ ඒකයි. පසුව කියන්න එපා, "අන්න නැවක් ගෙනැල්ලා දවස් 7ක් තියාගත්තා, ඒකට සල්ලි ගෙව්වා" කියලා. අපි ඒකටත් සූදානමින් තමයි වැඩ කරන්නේ. ඇයි අපි ඒකටත් සූදානමින් වැඩ කරන්නේ? මේ යුද්ධයේ ස්වභාවය කාටවත් හරියට ගණනය කර ගන්න බැරි තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. එය කවර ආකාරයෙන්, කවර තැනකින් වර්ධනය වෙයිද කියන එක පිළිබඳව කාටත් අවිනිශ්චිතභාවයක් තිබෙනවා. ඒ නිසා ගත හැකි හැම විකල්ප ක්‍රියාමාර්ගයක්ම අපි අරගෙන තිබෙනවා.

ඊළඟට, අපි අපනයනකරුවන් හමු වුණා. අපේ රටේ bunkering කරනවා, පෞද්ගලික සමාගම් 5ක්. ඔවුන් අපට කියා සිටියා, අපනයන කර්මාන්තකරුවන්ට අවශ්‍ය ඉන්ධන සපයා දෙන්න ඔවුන්ට පුළුවන් කියලා. අපි ඔවුන්ට ක්ෂණිකව බලපත්‍ර නිකුත් කළා. පොදුවේ වෙළෙඳ පොළට ඉන්ධන නිකුත් කිරීමට අයිතියක් නැහැ, ඒ ගොල්ලන්ට. හැබැයි, ඒ ගොල්ලන් පෙරේදා ඉඳන් exportersලාට අවශ්‍ය කරන ඉන්ධන සපයන්න තීරණය කරලා තිබෙනවා. මොකද, පෞද්ගලික සමාගමකට අපට වඩා ලේසියි මිල දී ගැනීම් කරන්න. මොකද, ඔවුන් වග කියන්නේ ඔවුන්ටම විතරයි. අපි වග කියන්න ඕනෑ ඔයගොල්ලන්ටත් එක්ක. ඇයි මේක ගත්තේ, කොහොමද මේක ගත්තේ කියන ඒවාට උත්තර දෙන්න ඕනෑ නේ. පෞද්ගලික සමාගම් ඉතා වේගයෙන් ඒවා ගෙනැවිත් තිබෙනවා. දැනට ඒ ගොල්ලන් exportersලාට අවශ්‍ය වන ඉන්ධන නිකුත් කරමින් සිටිනවා. ඉතින්, අපි ඒකත් සැලකිල්ලට ලක් කළා.

ඊළඟට අපි කල්පනා කළා, මේ අවස්ථාවේ කොහොමද රාජ්‍යයන් රාජ්‍යයන් අතර ගනුදෙනු කළ යුත්තේ කියලා. රුසියාව සමඟ ගනුදෙනු කිරීම පිළිබඳව සම්බාධක තිබෙනවා මම දැක්කා. ඒක ඉවත් වුණේ 11වන දා. මම දැක්කා සමහර අය ප්‍රශ්න කරනවා, අපට රුසියාවත් එක්ක මීට කලින් ගනුදෙනුවලට යන්න බැරි වුණාද කියලා. තේරුම් ගන්න. අපේ අපනයනවලින් සියයට 25ක් යන්නේ එක්සත් ජනපදයට. ඔබට මතක ඇති, අපේ අසල්වැසි රාජ්‍යයන්ට පවා tariff එක පිළිබඳ ප්‍රශ්නය මතු වුණු අවස්ථාවේ රුසියාවත් එක්ක තිබුණු ගනුදෙනු යම් ප්‍රමාණයකට අඩාළ කරන්න සිද්ධ වුණු බව. අපි දන්නා සත්‍ය මේවා. මේවා වාර්තා වුණු දේවල්. එතකොට අපි ප්‍රවේශම්කාරී විය යුතුයි. අපට මතකයි, tariff ප්‍රශ්නය ආපු වෙලාවේ විපක්ෂය මෙතැනදී කොච්චර හඬ නැඟුවාද කියලා, එක්සත් ජනපදයට යන්න බැරි වුණේ ඇයි, ගිය කණ්ඩායම මදි නේද, ජනාධිපතිවරයාට යන්න පුළුවන් නේද, ඉන්දියාවෙන් මෙහෙම කට්ටිය ගියා නේද, ඇයි ඔයගොල්ලන් ඉන්නේ කියා අසමින්. එතකොට ඒ අයගේ ව්‍යාපෘතිය මොකක්ද? එතකොට මුළුමනින්ම ව්‍යාපෘතිය, එක්සත් ජනපදය යාළු කරගෙන මේක බේරා ගත්තේ නැත්තේ ඇයි කියන එක. දැන් ව්‍යාපෘතිය මොකක්ද? රුසියාව යාළු කරගෙන මේක බේරා ගත්තේ නැත්තේ ඇයි කියන එක.

(8th Start) මේ පාර්ලිමේන්තුවේදී මේ දෙකම එක විට කියනවා, එකම කටින්. ඉතින් මොකක්ද මේ කියන්නේ? මේක විහිළුවක් නේ. අපි මේ tariff ප්‍රශ්නය පිළිබඳව විශාල අවධානයක් යොමු කර තිබෙනවා. එය සාකච්ඡා වෙමින් තිබෙනවා. *[බාධා කිරීමක්]* මොකක්ද?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
අපි එහෙම කිව්වේ නැහැ, ජනාධිපතිතුමනි. *[බාධා කිරීමක්]* අපි ඒ විධියේ කථාවක් කිව්වේ නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
"මනෝ" කිව්වේ නැහැ. මම එහෙම කියන්නම්කෝ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒ තැනට වැටුණේ නැහැ, මම.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඒ තැනට වැටුණේ නැද්ද? *[බාධා කිරීමක්]* ඒ කියන්නේ මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඒ තැනට වැටුණේ නැහැ; ඊට වඩා වුට්ටක් උඩට වැටුණේ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මම ඒ තැනට වැටෙන්නේ නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
මම මේ කියන්න හදන්නේ- *[බාධා කිරීමක්]* විපක්ෂයේ අය කියන දේ නේ මා දකින්නේ. මම ඒක දැක්කා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා නොකියන්න ඇති. හැබැයි, අද විපක්ෂය හැටියට ඉන්නේ පාර්ලිමේන්තුවේ විපක්ෂය විතරක් නොවෙයි නේ. පාර්ලිමේන්තුවෙන් එළියේ ඔබතුමන්ලා එක්ක එකට වාඩි වන විපක්ෂයක් ඉන්නවා නේ. ඔබතුමන්ලා press conference එකක් තිබ්බා. ඔබතුමාත් වාඩි වෙලා හිටියා මම දැක්කා. ඒ වාඩි වෙලා හිටියේ පාර්ලිමේන්තුවේ විපක්ෂයත් එක්ක විතරද? එකමුතුවක් හැටියට වාඩි වෙලා ඉන්නවා දැක්කා නේ. අන්න ඒකේ හිටියා රුසියාව ගැන අර විධියට කියපු අය.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒක සන්ධානයක් නොවෙයි නේ - *[බාධා කිරීමක්]*

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
මම දන්නේ නැහැ ඒක. මම කියන්නේ විපක්ෂය ගැන නේ. මම දැක්කා ඔබතුමාත් වාඩි වෙලා හිටියා. ඒ අයත් එතැන හිටියා. අල්ලපු පුටුවේද හිටියේ? *[බාධා කිරීමක්]* මනෝ, මම දැක්කා ඒක. මම කියන්නේ මේකයි, මනෝ. විපක්ෂය කියලා පාර්ලිමේන්තුව පමණක් නොවෙයි මා සලකන්නේ. එළියේත් මීට අදාළව ඝෝෂාවක් තිබෙනවා. ඒ සියල්ල ගැනයි කියන්නේ.

අපි මොකක්ද කළේ? දැන් මේ tariff ප්‍රශ්නය බේරා ගන්නත් අපට අවශ්‍යයි; රුසියාවෙන් තෙල් ලබා ගන්නත් අපට අවශ්‍යයි. අපට ඒකට අවස්ථාව ලැබුණේ 11වන දා. 11වන දා තමයි අපට විවෘතව අවස්ථාව ලැබුණේ. අපි එතැන් සිට සාකච්ඡා කරන්න පටන් ගත්තා. යම් සාකච්ඡාවල ප්‍රගතියක් තිබෙනවා. ඉතා ඉක්මනින් ඒ ප්‍රගතිය පිළිබඳ වාර්තා තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන්න අපට පුළුවන් වෙයි. මම ඉක්මන් වෙන්නේ නැහැ, රාජ්‍යයන් රාජ්‍යයන් අතර තිබෙන සාකච්ඡා සම්බන්ධයෙන්. මා පමණක් ඒක පාර්ශ්විකව ප්‍රකාශ නොකළ යුතුයි කියන ස්ථාවරයේ ඉන්නවා. එහෙම නම්, මේ බලශක්ති ක්ෂේත්‍රයේ මතු විය හැකි

ගැටලුව පාලනය කර ගැනීම සඳහා රජය හැටියට ගත හැකි, ගත යුතු සියලු ක්‍රියාමාර්ග අපි ඒ නිශ්චිත මොහොතේ අරගෙන තිබෙනවා. ඒක මම වගකීමෙන් කියන්නේ.

ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය, මිල පිළිබඳ ප්‍රශ්නයයි. දැන් මේ මිල උච්චාවචනය වෙන්න හේතු කිහිපයක් බලපානවා. ප්‍රධාන වශයෙන් අපේ මේ මිල උච්චාවචනයට බලපානවා, ඩොලරයේ අගය ඉහළ යෑම. ඩොලරයේ අගය ඉහළ ගියොත්, අපේ ඉන්ධනවල මිල ඉහළ යනවා. දෙවැනි එක මොකක්ද? ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ ගියොත්, අපේ ඉන්ධන මිල ඉහළ යනවා. මීට අතිරේක වශයෙන්, බදු සහ වංචා, දූෂණ ද බලපානවා. ඔහොම නේ වෙන්නේ. ඕවා තමයි මිල මත බලපාන්නේ. ප්‍රධාන වශයෙන් බලපාන්නේ මොකක්ද? ඩොලරයේ අගය ඉහළ යෑම.

2022-2023 කාලයේ බලශක්ති ක්ෂේත්‍රයේ අර්බුදය මතු වුණේ, ලෝක පරිමාණයෙන් බලශක්ති මිල ඉහළ යෑම හේතුකොටගෙන නොවෙයි. එදා ප්‍රධාන ප්‍රශ්නය ලෙස මතු වුණේ මොකක්ද? ඩොලරයේ අගය ඉහළ යෑමයි. මා ඒ ගැන කියන්නම්. උදාහරණයක් හැටියට ගත්තොත්, රුපියල් 185ක්ව තිබුණු ඩොලරයේ අගය 372 දක්වා ඉහළ ගියා. හැබැයි black market එකේ 400 දක්වා ඉහළ ගියා. රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාටත් ඒක මතක ඇති. එම අගය රුපියල් 400 දක්වා ඉහළ ගියා, black market එකේ. එතකොට එදා ඉන්ධන මිල කීයද? පෙට්‍රල් ලීටරයක් රුපියල් 137 සිට 420 දක්වා වැඩි වුණා. ලෝක වෙළෙඳ පොළේ මිල උච්චාවචනය වීම නොවෙයි එයට බලපෑවේ. ඒකට බලපෑවේ ඩොලරයේ අගය රුපියල් 185 ඉඳන් 372 දක්වා වැඩි වීමයි. ඊළඟට, ඔක්ටේන් 95 පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 161 ඉඳන් රුපියල් 450 දක්වා සියයට 279කින් ඉහළ ගියා, ඩොලරයට සාපේක්ෂව රුපියල කඩා වැටීම නිසා. සාමාන්‍ය ඩීසල් මිල ගත්තොත්, ලීටරයක මිල රුපියල් 104 ඉඳන් 400 දක්වා ඉහළ ගියා, ඩොලරයේ අගය ඉහළ යෑමේ බලපෑම මත. ඒ අනුව ගත්තාම එක වෙලාවකදී ඉන්ධන මිල ඉහළ යන්නේ මොකක් මතද? ඩොලරයේ අගයට සාපේක්ෂව රුපියල කඩා වැටීම හේතුකොටගෙනයි. ඒ සඳහා අපට මෑත කාලීන අත්දැකීමක් තිබෙනවා. හැබැයි දැන් අර්බුදය මතු වෙලා තිබෙන්නේ කොහොමද? දැන් අර්බුදය මතු වෙලා තිබෙන්නේ, ලෝක පරිමාණයෙන් ඉන්ධන මිල ඉහළ යෑම නිසා. ඔක්ටේන් 92 පෙට්‍රල් මිල, මාර්තු 02වැනි දා ඉඳලා මාර්තු 18වැනි දා දක්වා ගත්තොත්, සියයට 55කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඔක්ටේන් 95 පෙට්‍රල් මිල ගත්තොත්, 92 ඉඳලා 153 දක්වා සියයට 65කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඩීසල් මිල ගත්තොත්, මාර්තු 02වැනි දා 114යි; මාර්තු 18වැනි දා 195යි; සියයට 74කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. Crude oil ගත්තොත්, ඩොලර් 81 ඉඳලා 114 දක්වා සියයට 40කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා.

මම තමුන්නාන්සේලාට සරල සූත්‍රයක් කියන්නම්, තෙල් මිල ගණනය කරන්න. ඩොලරයකින් තෙල් මිල වැඩි වුණොත්, රුපියල් දෙකකින් අපේ තෙල් මිල වැඩි වෙනවා. ඒක තමයි සූත්‍රය. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල ඩොලරයකින් ඉහළ ගියොත්, රුපියල් දෙකකින් තෙල් මිල ඉහළ යෑමක් වෙනුවෙන් අපේ වෙළෙඳ පොළට බලපෑමක් ඇති කරනවා. එය ගණනය කරන්න හරි ලෙහෙසියි; ඒක අමාරු එකක් නොවෙයි. රුපියල් දෙකක බලපෑමක් අපට තිබෙනවා. දැන් බලන්න, ඩොලර් 90 සිට 139ට, ඒ කියන්නේ ඩොලර් 49කින් ඉහළ ගිහින් තිබෙනවා. එහෙම නම් අපට තේරුම් ගන්න පුළුවන් කොච්චර ප්‍රමාණයකින් රුපියල්වලින් ඉහළ යනවාද කියලා. ඩීසල් ගත්තොත්, 114 සිට 198 දක්වා 84කින් ඉහළ ගිහින් තිබෙනවා. ඒක දෙකෙන් වැඩි කළොත් තේරුම් ගන්න පුළුවන් ඩීසල්වල මිල ඉහළ යෑම. ඔබ අපනයනකරුවන්ගෙන් අහන්න, අර මම අපනයන නිදහස් කරපු අයගෙන්, ඒ bunkering කරන සමාගම් අපනයනකරුවන්ට තෙල් ලීටරයක් දෙන්නේ කීයටද කියලා. ඒකෙන් දැනගන්න පුළුවන් අද market එකේ price එක. අපි විතරක් නොවෙයි ඔවුන් ද තෙල් ගෙනැල්ලා දෙනවා නේ. ඒ price එක බලන්න. ඒ නිසා ඩොලරයට සාපේක්ෂව රුපියල කඩා වැටීමේ හේතුව නොවෙයි, ඉන්ධනවල මිල ඉහළ යෑම විසින් අපට බලපෑමක් ඇති කරනවා.

ඒ වාගේම, තව ප්‍රශ්නයක් මතු වී තිබෙනවා. අපි දිගු කාලීන ටෙන්ඩර් ලබා දීලා තිබෙන්නේ, premium එක ඩොලර් 2.5ට. Singapore Platts rate plus 2.5. අපේ දිගු කාලීන ටෙන්ඩර්. සාමාන්‍යයෙන් ගත්තොත්, ඩොලර් 3ට වඩා අඩුයි. හැබැයි, දැන් premium එක කීයට යනවාද? ඩොලර් 40ට යනවා. ඇයි? ඔවුන්ට ආරක්ෂාව පිළිබඳ සහතිකයක් අවශ්‍යයි. ඒ වාගේම, විවිධ රාජ්‍යයන්වල පොර බැදීමක් තිබෙනවා; විවිධ සමාගම්වල පොර බැදීමක් තිබෙනවා. සමහර premiums ඩොලර් 31යි, 35යි, 45යි වාගේ ගණන්වලට ගිහින් තිබෙනවා. එතකොට ලෝක වෙළෙඳ පොළේ මිල ඉහළ යෑමත්, premium එකේ අගය ඉහළ යෑමත් විසින් කොච්චර බලපෑමක් අපේ ඉන්ධන market එකට සිද්ධ වෙනවාද කියන එක අපි කල්පනා කරන්න ඕනෑ. ඒ අනුව ගත්තොත්, ලෝකය පුරා රටවල් ඔවුන්ගේ තෙල් මිල වැඩි කිරීම පිළිබඳ තීරණයක් අරගෙන තිබෙනවා. ඒ අනුව ආසන්න වශයෙන් ගත්තොත්, සියයට 6 සිට සියයට 50 දක්වා තෙල් මිල වැඩිවීමක් සිද්ධ වෙලා තිබෙනවා. සමහර රාජ්‍යයන් සියයට 6යි. උපරිම වශයෙන් ගත්තොත්, මේ වන විට සියයට 50කින් තෙල් මිල ඉහළ ගිය රාජ්‍යයන් තිබෙනවා. විශේෂයෙන්ම අපේ රට ගත්තොත්, අපි තෙල් මිල වැඩි කර තිබෙන්නේ සියයට 8කින්. Average එක ගත්තොත් සියයට 8යි. හැබැයි, ලෝකයේ සියයට 49 දක්වා වැඩි කිරීමක් සිද්ධ වෙලා තිබෙනවා. අවමය තිබෙන්නේ සියයට 6යි. ඒ ඉතින් විශේෂයෙන් ගත්තොත් UAEවල. ඒ තෙල් තිබෙන රටවල්. අනෙක් හැම රටක්ම ගත්තොත්, අපට වඩා වැඩියෙන් තිබෙන්නේ. මා තෝරා ගත් රටවලින් එක් රටයි අඩුවෙන් තිබෙන්නේ. ඒ තෙල් නිෂ්පාදනය කරන රටවලින්. අනෙක් ඔක්කොම අපට වඩා වැඩි මිල ඉහළ දැමීමක් කර තිබෙනවා.

දැන් අපේ තෙල් මිල පිළිබඳ ප්‍රශ්නයකට අපි මුහුණ දීලා තිබෙනවා. අපේ තෙල් සැපයුමෙන් සියයට 57ක් සපයන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව. අපට තෙල් සංස්ථාව විතරක් තිබුණා නම්, මේ වෙලාවේ පාඩු ලබලා, අනෙක් වෙලාවේ ලාභ ලබනවාය කියලා අපට මේක කළමනාකරණය කරගන්න පුළුවන්. අපේ තෙල් වෙළෙඳ පොළෙන් සියයට 43ක් තිබෙන්නේ පෞද්ගලික අංශයට. ඒ පෞද්ගලික අංශය මොකක්ද කියන්නේ? ඔවුන් කියනවා, මේ මොහොතේ ගෙනෙන තෙල්, මේ මොහොතේ market එකට දමනකොට ඒ මිල දෙන්නේ නැත්නම් අපි තෙල් ගෙනෙන්නේ නැහැ කියලා. සාධාරණයි. ඔවුන්ගේ ගණනය අනුව එක් නැවකින් ඔවුන්ට පාඩු වෙනවා ඩොලර් මිලියන 55ක්. ඉතින්, එහෙම පාඩු වෙන්න කවුරුත් තෙල් ගෙනෙන්නේ නැහැ. අපේ CPC එක අතේ විතරක් තෙල් market එක තිබුණා නම්, අපට මේක කළමනාකරණය කරගන්න පුළුවන්, වැඩි වෙච්ච වෙලාවේ ටිකක් අඩුවට විකුණලා, අඩු වෙන වෙලාවේ ටිකක් වැඩියට විකුණලා. ඒ විධියට අපට මේක balance කරගන්න පුළුවන්; අවුරුද්දේ ලාභ පාඩු ගණනය කරගන්න පුළුවන්. හැබැයි, පෞද්ගලික සමාගම් එහෙම කටයුතු කරන්නේ නැහැ. තෙල් market එකෙන් සියයට 43ක් තිබෙන්නේ පෞද්ගලික සමාගම් අතේ. එහෙනම් මේ ඉන්ධන සැපයුමට ඒපෞද්ගලික සමාගම්වල දායකත්වය අවශ්‍යයි. හැබැයි, ඔවුන් දායකත්වය ලබා දෙන්නේ කොහොමද? ඔවුන් දායකත්වය ලබා දෙන්නේ ඔවුන්ගේ cost එකට අනුවවත් විකුණාගන්න අවස්ථාව ලැබුණොත් විතරයි.

ඒ නිසා මම හිතන විධියට, ඉන්ධන මිල පිළිබඳව අපි ඉතා ඉක්මනින්ම සැලකිල්ලට ලක් කළ යුතුයි. එහෙම නැත්නම් පෞද්ගලික සමාගම්,- *[බාධා කිරීමක්]* මම ඒ ගැනත් කියන්නම්,

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි. දැනට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සමාගම්වලට අපේ agreementsවලින් අවසර දීලා තිබෙනවා මිල වැඩි කරන්න. හැබැයි, අපේ Ceylon Petroleum Corporation Act එකේ තිබෙන්නේ, උපරිම මිල තීරණය කිරීමේ බලය තිබෙන්නේ Ceylon Petroleum Corporation එකට කියලායි. අපි මේ සමාගම් එක්ක ගිවිසුම්වලට ගියාට, පනතට අවශ්‍ය වන සංශෝධන කරලා නැහැ. පනතේ තිබෙනවා, උපරිම මිල තීරණය කරන්න ඕනෑ Ceylon Petroleum Corporation එක කියලා. නමුත්, පෞද්ගලික සමාගම් සමඟ අත්සන් කළ agreementsවල තිබෙනවා, ඒගොල්ලන්ට මිල තීරණය කළ හැකියි කියලා. එම නිසා අපි ඒ කාරණය සැලකිල්ලට භාජන කරනවා. හැබැයි, තෙල් සංස්ථාව සහ පෞද්ගලික ඉන්ධන සමාගම් අතර ඉන්ධන මිලේ gap එක රුපියල් 100ක්, 150ක් වුණොත් මොනවා වෙයි ද? එතකොට පුරවැසියන් ඉන්ධන ගන්න පෞද්ගලික ඉන්ධන සමාගම් වෙත යන්නේ නැහැ. එහෙම නම් ඔවුන්ට වෙන්නේ මොකක්ද? Market එකේ මේ මිල වැඩිවීම අනුව ඉන්ධන ලීටරයකින් රුපියල් 100ක, 150ක විතර gap එකක් හැදෙන්න ඉඩ තිබෙනවා. එහෙම වුණොත් ජනතාව පෞද්ගලික ඉන්ධන සමාගම් වෙත යන්නේ නැහැ. ලීටරයකට රුපියල් 100ක්, 150ක් වැඩියි කියන්නේ ඒක ලොකු ගණනක්. ඒ නිසා මිනිස්සු පැය හයක්, හතක් හරි ඉන්න CPC පෝලිමට එනවා. ඒ නිසා අපි මේ දෙක අතර මිලේ gap එක අඩු කර ගන්නත් ඕනෑ.

ඒ වාගේම, අපේ economy එක ගැනත් අපි කල්පනා කරනවා. මම මේකත් බැලුවා. තෙල්වලින් අපට බදු ආදායම එන්නේ මාසයකට රුපියල් බිලියන 20යි. ගිය අවුරුද්දේ අපට තෙල්වලින් රුපියල් බිලියන 240ක ආදායමක් ඇවිල්ලා තිබෙනවා, ඩීසල් බද්දෙන්. මා කලින් කිව්වා වාගේ, මේ බද්ද ගහන්නත් හේතුව හොඳින් තේරුම් ගන්න. 2023දී තෙල් සංස්ථාවේ ණය රුපියල් බිලියන 884ක් භාණ්ඩාගාරය භාරගෙන තිබෙනවා. සාමාන්‍යයෙන් රුපියල් බිලියන 884ට සියයට 11ත්, 12ත් අතර පොලිය බැලුවොත්, - මේ පොලී ප්‍රමාණය ඊට වඩා වැඩියි - වසරකට රුපියල් බිලියන 100ක් විතර පොලිය ගෙවන්න අවශ්‍යයි. මේ ණය තොගයේ පොලිය විතරක් ගෙවන්න රුපියල් බිලියන 100ක් අවශ්‍යයි. ඒ බදුවලින් යම් ප්‍රමාණයක් භාණ්ඩාගාරයට එනවා. එම නිසා අපි බලනවා මේ බදුවලිනුත් යම් සහනයක් ලබා දෙන්න. ඒකට සමහර අය එකඟ නැහැ. බොහෝ අය කියන්නේ මොකක්ද? බදුවලින් සහන ලබා දුන්නොත් මොකක්ද වෙන්නේ? වැඩියෙන් තෙල් ගහන කෙනාට, වැඩියෙන් වාසියක් එනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ අපේ ප්‍රතිපත්තිය ගත්තොත්, ඇත්ත ගත්තොත්, ඉලක්කසහගත ප්‍රජාවට අපි සහනාධාර ලබා දිය යුතුයි. තෙල් මිල market එකේ මිල අනුව තිබෙනවා. හැබැයි, ඉලක්කසහගත ප්‍රජාවට අපි සහනාධාරයක් ලබා දෙනවා. හැබැයි, ඉලක්කසහගත ප්‍රජාවට ඉන්ධන ලබා දෙනකොට සංකීර්ණතා තිබෙනවා. ඉලක්කසහගත ප්‍රජාවක් තමයි ධීවර ජනතාව කියන්නේ. හැබැයි, ධීවර වරායෙන් එළියට යන බෝට්ටුවලට අමතරව, ධීවර වරායක් නැතිව යන බෝට්ටු 30,000ක් විතර තිබෙනවා. එහෙම නම් අපි ඒ දෙගොල්ලන්ටම සහනාධාරය ලබා දිය යුතුයි. එහෙම නම් ඒ සඳහා තිබෙන ක්‍රමය මොකක්ද? කෘෂි කර්මාන්තයේ යෙදෙන, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ගොවීන් ඉන්නවා, නැති අය ඉන්නවා. මොකක්ද ඒ දෙගොල්ලන්ටම සහනාධාරය දෙන ක්‍රමය? ඒ වාගේම, අපේ පාරවල්වල උදේට බනිස් ඇතුළු කෙටි කෑම වර්ග ගෙනියන "චූන් පාන්" වැනි කුඩා රථ තිබෙනවා. අපි ඔවුන්ට මේ සහනය ලබා දෙන්නේ කොහොමද? ඔවුන් කොහේවත් register වෙලා නැහැ. ඒ නිසා ඉලක්කසහගත ප්‍රජාවට සහනාධාර ලබා දෙන්න පුළුවන් නම්, ඒ තමයි හොඳම ක්‍රමය. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. අපේ තිබෙන දත්ත, තොරතුරු සහ අපේ ආර්ථිකයේ තිබෙන අවිධිමත්භාවය ලොකුයි. විධිමත් ආර්ථිකයට නම් මේ සහනාධාර ලබා දෙන්න පුළුවන්. විධිමත්ව register වෙලා ධීවර වරායෙන් පිටත්ව යන බෝට්ටුවට ලැබිය යුතු සහනාධාරය ධීවර වරායේ ෂෙඩ් එකෙන් ලබා දෙන්න පුළුවන්, සහනාධාරයක් දෙනවා නම්. හැබැයි, අපේ විසිරුණු ආර්ථිකය, අවිධිමත් ආර්ථිකය ලොකුයි. ඒ අවිධිමත් ආර්ථිකයත් ජීවනෝපාය කර ගත්ත පිරිසක් ඉන්නවා. එතකොට අපි ඔවුන් ඉලක්ක කරන්නේ කොහොමද? ඒක සංකීර්ණයි. ඒ නිසා අපි මේ කාරණා දෙක ගැනම කල්පනා කරමින් ඉන්නවා. ඉලක්කසහගත ප්‍රජාවට සහනාධාරය ලබා දෙනවා ද? එහෙම නැත්නම් සහනාධාරය හෝ සහනය සියල්ලන්ටම ලබා දෙනවා ද කියන එක කල්පනා කරන්න වෙනවා. අපි ඒකත් කල්පනා කරමින් තමයි තෙල් මිල පිළිබඳ ඊළඟ තීරණය ගන්නේ. එය ඉතා ඉක්මනින්ම ගත යුතුයි කියලා මා විශ්වාස කරනවා. මොකද, පෞද්ගලික සමාගම් ඒ අයගේ ordersවලට දැන් ඉන්ධන දෙන්නේ නැහැ. මොකද, ඔවුන් එහෙම පාඩු ලබන්න සූදානම් නැහැ.

තෙල් සංස්ථාව පාඩු ලබන්න පුළුවන්. නේද? තෙල් සංස්ථාව මීට පෙරත් පාඩු ලබලා තිබෙනවා. රුපියල් බිලියන 884ක් පාඩු ලැබුවා තෙල් සංස්ථාව. ඒ නිසා අපට පාඩු ලැබීම පිළිබඳව හොඳට කප් ගහපු ඉතිහාසයක් තිබෙනවා. නමුත්, පෞද්ගලික සමාගම් මේ market එකේ සියයට 43ක ඉන්නවා. ඒ නිසා ඔවුන්ට මිල පිළිබඳ යම් සහතිකයක් අවශ්‍යයි. එහෙම නැත්නම් ඔවුන් මොකද කරන්නේ? එහෙම වුණොත් ඔවුන්ට ආනයනය කරන්න තිබෙන තෙල් ටිකත් ආනයනය කරන්නේත් නැතිව යනවා. ඒ නිසා මම හිතනවා, ඉතා ඉක්මනින් අපි ඉන්ධන මිල පිළිබඳ තීරණයක් ගත යුතුයි කියලා. අන්න ඒ මිල පිළිබඳ තීරණයක් ගැනීමේදී තමයි අපට QR code එක අවශ්‍ය වන්නේ. ඒක තමයි වැදගත්. මොකද, සාමාන්‍යයෙන් සුපුරුදු පරිදි ගත්තොත් අප්‍රේල් පළමුවැනි දා ඉන්ධන මිල ගළපනවා. QR code එක අප්‍රේල් පළමුවැනි දා වෙනකොටවත් ක්‍රියාත්මක නොවෙමින් තිබුණා නම්, මාර්තු මාසයේ 27, 28, 29 වෙනකොට මොකක්ද වෙන්නේ? එහෙම නම් මිනිස්සු ෂෙඩ්වල ගහ ගන්නවා. ඒ නිසා තමයි අපි උත්සාහ කළේ, පෙට්‍රල් ෂෙඩ් ඒ විධියටම ක්‍රියාත්මක වෙන ගමන්, - අපි ඒවා අඩපණ කළේ නැහැ - QR code එක ගන්න පුළුවන් කෙනාටත් එතැනට යන්න පුළුවන්. ඒ කේතය ගන්න බැරි කෙනාටත් එතැනට යන්න පුළුවන් තත්ත්වය ඇති කරන්න. මොකද ඒකට තාක්ෂණික බාධා තිබෙනවා. අපට ඩිජිටල් අමාත්‍යාංශයෙන් තොරතුරු ලබා දීලා තිබෙනවා, සියයට සියයක් දැන් අපි ඒ කටයුතුවල සාර්ථකත්වයට ඇවිල්ලා තිබෙනවා කියලා.

දැන් තෙල් මිල වැඩි වෙනවා යැයි කියලා උපකල්පනයකින් ගිහිල්ලා තෙල් එකතු කරන්න බැහැ. මොකද, code එකක් තිබෙනවා. ඒ වාගේම, කවුරු හරි පෙට්‍රල් ෂෙඩ් හිමියෙක් ඊට පරිබාහිරව කටයුතු කරනවා නම්, අපි ඒ licence එක cancel කරනවා. ඒකත් මතක තියා ගන්න. ඒ වාගේම, කවුරු හරි කෙනෙක් මේ අවස්ථාව උපයෝගී කරගෙන තමන්ගේ කළු ආර්ථික සඳහා තෙල් එකතු කරගෙන තිබෙනවා නම්, ඒවාත් වටලන්න ඕනෑ. මම අදත් පොලිස්පතිතුමාට ඒ ගැන කථා කළා. ඊයේ එක තැනක තිබිලා ඉන්ධන ලීටර් 19,000ක් අත්අඩංගුවට ගන්නවා මම දැක්කා. මෙහෙම කළු ආර්ථික, පාතාල ආර්ථික ගොඩ නැඟෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් අපි උපරිම වැටලීම් කරනවා. අපි වැටලීම් කරලා මොකක්ද කරන්න ඕනෑ? අපේ අභිප්‍රාය තමයි බලශක්තිය අඛණ්ඩව ලබා දීම.

ඒ වාගේම, ලෝක වෙළෙඳ පොළේ ඉහළ යන ප්‍රමාණයටම අපි මිල ගළපනවා ද කියන එක ගැනත් සොයා බලන්න ඕනෑ. අපි දැන් ලෝක වෙළෙඳපොළේ මිල සමඟ ගැළපුවොත්, අපනයනකරුවන්ගෙන් දැන ගන්න පුළුවන් තෙල් ලීටරයක් කීයද

කියලා. දැන් call එකක් දැම්මොත්, කීයටද විකුණන්නේ කියලා අපට අහන්න පුළුවන් ඔය සමාගම් පහෙන්. අපි එතැනටම ගියොත් මොකද වෙන්නේ? අපේ ආර්ථිකයේ අනෙක් පැත්ත ඇකිළෙනවා. එතකොට ඒකෙන් වෙන දේ තමයි, අපේ බදු ආදායම එතැනින් නැතුව යන එක. හැබැයි, අපට තෙල් market එකෙන් ලැබෙන්නේ මාසයකට බිලියන 20යි. මෙතැන බදු ආදායම රැක ගන්න අපි ඒක හිලව් කරනවාද, එහෙම නැත්නම් මේකෙන් යම් ප්‍රමාණයක් කප්පාදු කරමින් මෙතැන ආර්ථිකය චලනය කරන්න ඉඩ දෙනවාද? මෙවැනි සමාලෝචන කරමින් තමයි අපි මේ පිළිබඳව තීරණය ගන්නේ. මම හිතන විදියට, ඉතා ඉක්මනින් අපි තීරණයක් ගත යුතුයි. එහෙම නැත්නම් පෞද්ගලික සමාගම් තෙල් order කරන්නේ නැහැ. අපි ඒ පිළිබඳවත් සැලකිල්ලට ලක් කර තිබෙනවා.

ඊළඟට ගෑස් ගත්තොත්, අපට මුළුමනින්ම ගෑස් සැපයුම්කරුවන් ඉන්නේ එක්කෙනායි. ඒ කියන්නේ සැපයුම්කරුවන් එක්කෙනෙක් ඉන්නවා. ඒ, අපේ ලිට්රෝ සමාගම. ලිට්රෝ සමාගමට සපයන එක්කෙනායි ඉන්නේ. දිගුකාලීන ටෙන්ඩර් දීලා අපි ඒවා ලබා දීලා තිබෙනවා. ඒ වාගේම පෞද්ගලිකව market එකේ නිකුත් කරන කෙනෙක් ඉන්නවා. අපේ ලිට්රෝ සමාගමේ ධාරිතාව market එකෙන් සියයට 80යි. පෞද්ගලික සමාගම සියයට 20යි. අපි දිගටම උත්සාහ කරමින් තිබුණා. අපේ මේ සැපයුම්දාමයේ "කාටල" හැදිලා තිබෙනවා. "කාටල". දීර්ඝ කාලයක් - අවුරුදු 20 ගණනක් - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ driving licence, නොම්මර තහඩුව දුන්නේ එක සමාගමකට. කබීර් හෂීම් හිටපු ඇමතිතුමා දන්නවා ඇති, එක සමාගමකටයි දුන්නේ. පාස්පෝට් එක දුන්නේ දීර්ඝ කාලයක් තිස්සේ එක සමාගමකට. ඒ වාගේම සමාගම් කිහිපයක් කාලයක් තිස්සේ ඉන්ධන සපයලා තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ ගෑස් සපයලා තිබෙන්නේ එක සමාගමක්. දීර්ඝ කාලයක් තිස්සේ ගල් අඟුරු සපයලා තිබෙන්නේ එක සමාගමක්. අපි මේ කාටල කඩනවා. මේකට දේශපාලන අධිකාරිය ඉන්නවා, රාජ්‍ය නිලධාරින් ඉන්නවා, කළු ව්‍යාපාරිකයන් ඉන්නවා. ඒ හරහා මොකක්ද වෙලා තිබෙන්නේ? පාස්පෝට් එක වුට්ටක් අනෙක් පැත්තට ගියොත් අර්බුදයක් හදනවා. ගෑස් එක වුට්ටක් ඒ කාටලවලින් එළියට ගියොත් අර්බුදයක් හදනවා. ගල් අඟුරු කාටල් එකෙන් පොඩ්ඩක් එළියට ගියොත් අර්බුදයක් හදනවා. ඇවිල්ලා කෑ ගස්සනවා. සල්ලි දීලා කෑ ගස්සන්නේ. ඇයි? මේ කාටල ඒ තරම් ප්‍රබලයි. දේශපාලන අධිකාරියේ ආශිර්වාද මත අවුරුදු 15, 20 මෙහෙම දීලා තිබෙනවා. DMT එකේ අවුරුදු 28ක් එකම සැපයුම්කරුවා කාටල හදාගෙන තිබෙනවා. නිලධාරින්ට ප්‍රදානය කරලා තිබෙනවා. දේශපාලන අධිකාරිය අල්ලාගෙන තිබෙනවා. කළු ව්‍යාපාරිකයන් අල්ලාගෙන තිබෙනවා. මාධ්‍ය ආයතනවලට පොම්ප කරලා තිබෙනවා. මේක තමයි ඇත්ත කථාව. මේ විදියට කාටල තිබෙනවා.

දැන් මේ කාටල බිඳිනවා. කාටල බිඳිනකොට මොකද වෙන්නේ? කාටල ඇති කරගත් අයත් නිකම් ඉන්නේ නැහැ, ඒගොල්ලනුත් ක්‍රියාත්මක වෙනවා. ඒගොල්ලන් බොරු මත හදනවා. බොරු ප්‍රවෘත්ති හදනවා. තොරතුරු රහසේ දෙනවා. ඊට පස්සේ ඇවිල්ලා කියනවා, "මාර්තු මාසයේ ගෑස් හිඟයක් එනවා, අප්‍රේල් මාසයේ එනවා" කියලා, නේද? ඒ, කාටලවල නියෝජිතයෝ. අපි කාටල කඩනවා. කාටල කඩනකොට මොකද වෙන්නේ? අර සුවපහසුව නැහැ, වුට්ටක් - අරක අවුරුදු 20 ගාණක් තිබුණු එක නේ - පොඩි බාධාවන් ඇති වෙලා තිබෙනවා. හැබැයි, කාටලය නොකැඩුවා නම් අද ගෑස් නැහැ. මොකද, දීර්ඝ කාලයක් ගෑස් දුන්නේ එකම සමාගමක්. හැබැයි, කාටලය කැඩීම නිසා අලුත් සමාගමක් වෙත ගියා. ඒ සමාගම මැදපෙරදිග කලාපයේ නොවෙයි. ඒ නිසා තමයි ගෑස් සැපයුම අපට අඛණ්ඩව තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි කල්පනා කරමින් සිටිනවා, මේ ගැනත්. මේ එක එක කලාපයන්ට විතරක් අපේ සැපයුම් දාමය අපි තහවුරු නොකළ යුතුයි. මැද පෙරදිග කලාපය, නැත්නම් යුරෝපා කලාපයේ ඔය විදියට එක කලාපයකට විතරක් අපි සීමා වෙන්න ඕනෑ නැහැ. අපි මේ සැපයුම් දාමය විවිධාංගීකරණය කළ යුතුයි. සියයට 25, 30 කඩලා එක එක කලාපයට වෙන වෙනම අපි ටෙන්ඩර් කැඳවිය යුතුයි කියා මම කල්පනා කරනවා. එහෙම වුණොත් තමයි ඕනෑම කලාපයක ඇති වන අර්බුදයකදී අපට ස්ථාවරභාවය ආරක්ෂා කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා සැපයුම් දාමයේ විවිධාංගීකරණය පිළිබඳවත් අපි ප්‍රතිපත්ති සකස් කරමින් යනවා. ඒක වැදගත් කියලා මම හිතනවා. ඒ අනුව ගෑස් සමාගමේ ප්‍රශ්නය අපට ආවේ නැහැ. මාර්තු මාසයට ගෑස් මෙට්‍රික් ටොන් 38,000ක් අවශ්‍යයි. ඒ 38,000 මේ වෙනකොට සපයලා තිබෙනවා. හැබැයි, ලංකාවේ නොවෙයි තිබෙන්නේ. මාලදිවයින ආසන්නයේ අපේ පාවෙන ගබඩාවක තිබෙන්නේ. තව මෙට්‍රික් ටොන් 33,000ක් ඊයේ හෝ අද බානවා. අනෙක් මෙට්‍රික් ටොන් 33,000 අපට අප්‍රේල් මාසයේ එන්න නියමිතව තිබෙනවා. ඒ නිසා අපට මේ අර්බුදය මනින්න පුළුවන් දුර දක්වා ගෑස් අර්බුදයක් නැතුව යාමේ හැකියාවක් තිබෙනවා. හැබැයි, market එකේ සමහර තැන්වල ගෑස්වල හිඟයක් මතු වෙලා තිබෙනවා. ඇයි? අපට අතිරේක වශයෙන් සියයට 20ක් සපයන්න ඕනෑකම තිබෙනවා.

විශේෂයෙන්ම පෞද්ගලික සමාගමට වැඩිම ලාභය තිබුණේ ගෘහස්ථ ගෑස් සිලින්ඩර සැපයීම හරහා නොවෙයි. කර්මාන්තවලට ගෑස් දීම ලාභයි. ඒ නිසා ප්‍රධාන ගෑස් අවශ්‍යතා තිබෙන ගොඩක් හෝටල් හිමියන් පෞද්ගලික ගෑස් සමාගමත් එක්ක තමයි එකඟතාවයට ආවේ. දැන්, ඔවුන්ට ගෑස් සපයන්න බැරි වුණාම අපි මොකද කරන්නේ? අපි ඒ හෝටල්වලට ගෑස් සපයනවා. මොකද, අපට ආර්ථිකය වට්ටන්න බැහැ. මොකද, පෞද්ගලික සමාගම ලාභ ලබන්නේ ගෘහස්ථ ගෑස් සිලින්ඩර විකුණනවාට වඩා තොග වශයෙන් විකුණනකොටයි. එම නිසා වැඩිම ගිවිසුම් තිබුණේ එතැන. ලිට්රෝ සමාගමෙන් ඒවාටත් ගෑස් සපයනවා. BoI එක යටතේ export කරන්න තමයි ඒ සමාගමට අයිතිය තිබුණේ. Export කරන එකෙන් සියයට විස්සයි market එකට දාන්න පුළුවන්. හැබැයි, පසුගිය කාලය පුරාවටම export කරලා නැහැ.

මෙතැනදී, බංග්ලාදේශයේ අර්බුදයක් මතු වුණා කිව්වා; මියන්මාරයේ අර්බුදයක් මතු වුණා කිව්වා. එම නිසා ඔවුන්ට market එකට දාන්න බැරි වුණා කිව්වා. ඔවුන්ගේ local market එකේ සියයට 20 රඳා පවතින්නේ ඔවුන් කොච්චර export කරනවාද කියන එක මත. මොකද, export කරන එකෙන් සියයට විස්සයි දාන්න පුළුවන්. ඔවුන්ට අවශ්‍ය වන ප්‍රමාණය සියලු බදු සහිතව local market එකට දාන්න අපි අවසර ලබා දුන්නා, තාවකාලිකව මාස තුනකට. ඒ වාගේම ඔවුන්ගේ හම්බන්තොට ගබඩාවේ ගබඩා කිරීමටත් තාවකාලිකව මාස තුනකට අවසර දුන්නා. අපි බලන්නේ කවුරු ගේනවාද - ආණ්ඩුව ගෙනැල්ලාද, ඒගොල්ලෝ ගෙනැල්ලාද - කියන එක නොවෙයි. රට තුළ ගෑස් තබාගත යුතුයි කියන ස්ථාවරයේ අපි ඒ ප්‍රතිපත්තිමය තීරණය අරගෙන තිබෙනවා. තාවකාලිකව මාස තුනකට ඔවුන් සහ ආණ්ඩුව අතර තිබෙන බැඳීම තමයි, ඔවුන් export කරන එකෙන් සියයට විස්සයි market එකට දාන්න පුළුවන් කියන එක. හැබැයි, ඔවුන් කිසිවක් export කරන්නේ නැත්නම් market එකට කවදාවත් ගෑස් නැතිව යනවා. එම නිසා අපි ඒකත් විවෘත කරලා දුන්නා. මම මේ ගැන කියන්නේ, පසුව මේවාට වෙන වෙන අර්ථ කථන දීලා පැහැදිලි කරන නිසායි. මොකද, මේ වෙලාවේ market එකට ගෑස් අවශ්‍යයි. අපි ළඟ තියාගන්න ඕනෑ, පෞද්ගලික අංශයේ තියාගන්න ඕනෑ. ඔවුන්ට 30,000ක ගබඩා සංකීර්ණයක් හම්බන්තොට තිබෙනවා. ඒකට අවශ්‍ය වන ධාරිතාව ගෙනෙන්න

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

කියන අවසරය අපි ලබා දීලා තිබෙනවා. එම නිසා හැම ක්ෂේත්‍රයක් ගැනම කල්පනා කරමින් බලශක්තිදාමය ආරක්ෂා කරගැනීම සඳහා ගතයුතු හැම පියවරක්ම ඉතා ඉක්මනින්, කඩිනමින් අපි අරගෙන තිබෙනවා කියන විශ්වාසය අපට තිබෙනවා. අපට විශ්වාසවන්ත ලෙස බලශක්තිදාමය යම් කාලයකට තිබිය යුතුයි. මම කියන්නේ නැහැ, දීර්ඝ වශයෙන් කියලා. යුද්ධය කොයි තැනට වර්ධනය වෙයිද කියලා අපි දන්නේ නැහැ. නමුත්, අපට සහතික කළ හැකි සීමාවට අපි සහතික කරනවා. අපට ඒ සඳහා පුළුවන්කම ලැබිලා තිබෙනවා.

ඊළඟට, අපි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළා, මෙන්න මේ කෙරෙහිත්. තීන්දු තීරණ ගැනීමේදී 2025 කියලා කියන්නේ අපේ ආර්ථිකයට ඉතාම වැදගත් වර්ෂයක්. අපේ රටේ ඉතිහාසගත, ඓතිහාසික ඉතාම තියුණු දත්ත වාර්තා කරපු වසර 2025 වසර වෙනවා. ලංකා ඉතිහාසයේ කොච්චර අමාත්‍යාංශ පොර බැදුවාද සියයට 5ට වඩා පහළින් අය වැය හිඟය තියාගන්න? කොච්චර ආණ්ඩු පොර බැදුවාද? මට මතකයි, 2015දී සියයට 10.8ට ගියා. සියයට 6.8ක් තමයි ඉලක්ක කළේ. නමුත්, සියයට 10.8ට ගියා. එම නිසා මොකක්ද වුණේ? කවදාවත් සියයට පහෙන් යටට ගෙනෙන්න බැරි වුණා. නමුත්, අපි තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, 2025 අය වැය හිඟය සියයට 2.4 දක්වා පහළ බහිනවා කියලා. ඒක ලංකා ඉතිහාසයේ අවම අය වැය හිඟය. ජංගම ගිණුමේ ධන අතිරික්තයක් වාර්තා කරගන්න කොච්චර උත්සාහ කළාද? මට මතකයි, ඔබතුමාගේ කාලයේ රවී කරුණානායක මන්ත්‍රීතුමා එක වෙලාවක ඇවිල්ලා කිව්වා, ජංගම ගිණුමේ ධන අතිරික්තයක් වාර්තා කළා කියලා. ඒ අවස්ථාවත් එක්ක ගත්තොත් ලංකා ඉතිහාසයේ අවස්ථා හතරයි. ඒ අවස්ථා හතරේම ඩොලර් මිලියන 500ට වඩා යටින් තිබෙන්නේ. හැබැයි, 2025දී ජංගම ගිණුම වාර්තා කරනවා, ඩොලර් බිලියන 1.8ක ධන අතිරික්තයක්. ඒක ආර්ථිකයේ ඉතාම වැදගත් සාධකයක්.

ඒ වාගේම ඉතාම අමනෝඥ තීන්දු තීරණ හරහා - කෘෂි කර්මාන්තය හැකිළීමට ගත් තීන්දු, අපේ බදු ප්‍රතිසංස්කරණ සඳහා කිසිදු විද්‍යාත්මක පදනමක් නැතිව ගනු ලැබූ තීන්දු - හේතුකොට ගෙන 2022දී අපේ රටේ ආදායම සියයට 7.5ට අඩු වුණා. එදා - 2022දී - අර්බුදය ආකාර දෙකකින් මතු වුණා. පළමුවැනි එක, ඩොලර් අර්බුදය. දෙවැනි එක, රුපියල් අර්බුදය. රුපියල් අර්බුදයෙන් පියමං කරන්න තව තව රුපියල් මුද්‍රණය කරන්න ගියා. එහි ප්‍රතිවිපාක විධියට උද්ධමනය සියයට 70ට ඉහළ ගියා. මතක තියාගන්න, මේ අවුරුදු 4කට කලින් ඉතිහාසය. උද්ධමනය ඉහළ ගියා. Black market එකේ ඩොලරයේ අගය රුපියල් 400ට ගියා, වැරදි ප්‍රතිපත්ති නිසා. අපි මොකක්ද කරලා තිබෙන්නේ? අපේ ආදායම ඉතා විශිෂ්ට ලෙස අපි එකතු කරමින් තිබෙනවා. 2025 අවුරුද්දේ අපේ බදු ආදායම සියයට 15.8 ඉක්මවනවා. සමස්ත ආදායම සියයට 17.2ට එනවා. එය දශක ගණනාවකට පසුව ලංකා ඉතිහාසයේ සිද්ධ වුණු දෙයක්. මට මතකයි, 1996දී සියයට 21ක් වාගේ තිබුණා. ඊට පසුව එළැඹෙන වැඩිම ආදායම 2025 වසරේදී සනිටුහන් කරනවා. විවිධ ක්ෂේත්‍රවල උද්ධමනය පහළින් තියාගෙන ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ ලෙස කථා කරන බැංකු පොලී අනුපාතිකය තනි ඉලක්කමේ තියාගෙන යන්නේ. අපේ පාලනය මාස 17 නම්, ඒ මාස 17 පුරාවටම Treasury Bills, Treasury Bondsවල බැංකු පොලී අනුපාතිකය තනි ඉලක්කමේ තියාගෙන ඉන්නවා; ලංකා ඉතිහාසයේ මාස 17ක් එක දිගට සියයට අටට ආසන්නයේ තියාගෙන ඉන්නවා. මතක තියාගන්න, 2022දී බැඳුම්කරවල පොලී අනුපාතිකය සියයට 33ට, සියයට 36ට ගිය බව. ඉතාම ශක්තිමත්, වැදගත් දත්තවලින් අපේ ආර්ථිකයේ ප්‍රගතිය 2025දී පෙන්නුම් කරලා තිබෙනවා.

ඊළඟට මම කියන්න කැමැතියි, මේ කාරණයත්. අපේ ණය ප්‍රතිව්‍යුහගත කර ගැනීමේදී SriLankan Airlines එකේ ඩොලර් මිලියන 175ක අපි හිර වෙලා තිබුණා. SriLankan Airlines එකේ ඩොලර් මිලියන 175ක බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම අත්සන් කරලා, එම කටයුතු අවසන් කිරීමට පසුගිය අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අපි අනුමැතිය ලබා දුන්නා. ඒක වැදගත් කටයුත්තක්. SriLankan Air Lanka එකේ ඩොලර් මිලියන 175ක බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කර ගැනීමට නොහැකි වීම, ජාත්‍යන්තර වශයෙන් අපේ ratings පහළ යන්න හේතුවෙලා තිබෙනවා. අපි ඒක පසුගිය සතියේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළා. අපි ඒ ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම අද - සිකුරාදා - අත්සන් කරනවා. ඒ අනුව අපි ආර්ථිකයේ ප්‍රශස්ත තැනකට ආවා. අපට මේ තත්ත්වය අවුරුදු 4ක්, 5ක් එකදිගට ගෙනියන්න පුළුවන් නම්, ස්ථාවර, ශක්තිමත්, බාහිර සහ අභ්‍යන්තරයෙන් එල්ල වන ඕනෑම කම්පනයකට ඔරොත්තු දිය හැකි ආර්ථිකයකට යෑමට හැකියාව ලැබෙනවා.

අපේ රටට අභ්‍යන්තරව ආවා, "දිට්වා" සුළි කුණාටුව. අපි ඒ තත්ත්වයත් පාලනය කර ගත්තා. දැන් අපට තවත් බාහිර කම්පනයක් ඇවිල්ලා තිබෙනවා. මෙතැනදි අපි විශේෂයෙන්ම අපේ සැපයුම් දාමය පිළිබඳව කල්පනා කරන්න ඕනෑ. අපි වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර අමාත්‍යාංශයේ ලේකම්තුමාත් ඇතුළුව අපේ බිමල් රත්නායක ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් සැපයුම් දාමය සහ අවශ්‍යතා කළමනාකරණය කර ගැනීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කර තිබෙනවා. එහිදී අපට අවශ්‍ය වන භාණ්ඩ - විශේෂයෙන්ම උත්සව සමයේදී - තොග එක්රැස් කර ගැනීම පිළිබඳව සාකච්ඡා කරලා ඒ සම්බන්ධයෙන් සැලසුම් හදලා තිබෙනවා. හිඟයකින් තොරව භාණ්ඩ සපයා ගැනීමත්, භාණ්ඩ බෙදා හැරීමේ ජාලයත් අපි ශක්තිමත් කරන්න ඕනෑ. පිටකොටුවට එන කෙනෙක් ඇත නියාගමට යන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි බලන්න ඕනෑ. ඒ අනුව අපි ඒ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම වත්තේ තේ දළු ටික factory එකට ගෙනෙන්නේ කොහොමද කියන එක පිළිබඳවත් අපි සැලසුම් සකස් කරලා තිබෙනවා. Tea industry එකේ අය කියනවා, තේ මිල පහළ ගිහිල්ලා නැහැ කියලා. හැබැයි, ආරම්භයේදී තේ වෙන්දේසියෙන් සියයට 20ක් විතර ඉතුරු වුණා. මේ වනකොට ඒ ප්‍රශ්නයත් යම් ප්‍රමාණයකට විසඳෙමින් තිබෙනවා. නමුත් අපි හිතනවා, එතැනත් අර්බුදයක් ඇතිවෙයි කියලා. ඒ ගැනත් අපි කල්පනාකාරීව සිටිනවා. ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රය පැත්තෙන් විශාල අර්බුදයක්, ගැටලුවක් තිබෙනවා කියලා ඔවුන් කියන්නේ නැහැ. ඔවුන් කියන්නේ, world market එකේ තරගකරුවන් සියලුදෙනාටම මේ ප්‍රශ්නය තිබෙන බවයි. ලෝකයේම තෙල් මිල ඉහළ ගිහින් තිබෙන නිසා cost එක කාටත් සමානයි. ඒ නිසා අපනයනකරුවන්ට තරගකාරිත්වයේදී විශාල ගැටලුවක් මතු වන්නේ නැති බව වාර්තා වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, ධීවර කර්මාන්තය සහ කෘෂි කර්මාන්තයත්. කෘෂි කර්මාන්තයේ අවස්ථා දෙකක් තිබෙනවා. අපි මේ වෙලාවේ අස්වැන්න නෙළනවා. ඊළඟට යල කන්නයට බිම් සකස් කර ගන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය වන අඩිතාලම සකස් කිරීම සඳහා බිමල් රත්නායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුව අදත් රැස්වනවා. එම කමිටුව රැස්වෙලා මේ පිළිබඳව තීන්දු තීරණ ගන්නවා. *[බාධා කිරීමක්]* අපි ඒ ඔක්කෝම අධ්‍යයනය කරනවා. මම කියන්නේ මේකයි. අපි ආරම්භයේදි ප්‍රතිපත්තිය හදාගන්න ඕනෑ. ප්‍රතිපත්තිය හැදුවාට පස්සේ ආරම්භයේදී වාගේ ඔක්කෝටම ලැබුණු විධියට ලැබෙන්නේ නැහැ. ප්‍රතිපත්තිය හදා ගත්තාට පස්සේ ලැබිය යුතු

අත්‍යවශ්‍ය තැන් බලමින් අපි ලබා දෙනවා. ඒකට දවස් දෙක තුනක් යනවා. අපි ඉස්සෙල්ලාම කරන්න ඕනෑ, QR කේතය ලබා ගන්න එක. ඊට පස්සේ කරන්න ඕනෑ, අවශ්‍ය තැන් ටික බලලා එම ද්‍රව්‍ය නිදහස් කරන එකයි. ඒක තමයි අපේ ක්‍රියාමාර්ගය. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව අමාත්‍යාංශයෙන් සමාගම් register කරලා තිබෙනවා, අවශ්‍ය ප්‍රමාණය එක්ක. අපි ඒ කටයුතුත් දැන් කරමින් සිටිනවා.

ඊළඟට රාජ්‍ය සේවය. අපේ රටේ බලශක්තියෙන් විශාල වැය බරක් රාජ්‍ය සේවයට දරනවා. ඒ නිසා රාජ්‍ය සේවය කළමනාකරණය කර ගැනීම සඳහා අපි සැලැස්මක් හදලා තිබෙනවා. ඒ සඳහා අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුව නිරන්තරයෙන් රැස්වෙමින් මේ අවස්ථාවේදී රාජ්‍ය සේවය කළමනාකරණය කර ගන්නේ කොහොමද කියා සොයා බලනවා. අපි අමාත්‍යාංශ ලේකම්වරුන්ට උපදෙස් ලබා දීලා තිබෙනවා, අමාත්‍යාංශවල බලශක්ති වියදමින් අඩුම තරමින් සියයට 25ක්වත් ඉතුරු කර ගැනීමට අවශ්‍ය සැලසුම් හදන්න කියලා. සමහර අමාත්‍යාංශ එකඟ වෙලා තිබෙනවා, මේ වෙලාවේ අත්‍යවශ්‍ය නොවන කාර්යාල වසා තැබිය යුතුයි කියන තීරණයට. මොකද, ඉන්ධන පිරිමැස්මට එය ඉතාම හොඳ දෙයක්. එවැනි කාර්යාල තෝරාගෙන, රාජ්‍ය සේවය කළමනාකරණය කිරීම සඳහා අපි සැලැස්මක් හදලා තිබෙනවා. අපි හැම ක්ෂේත්‍රයක් ගැනම අවධානය යොමු කරලා ඒවාට අවශ්‍ය මැදිහත්වීම් කරනවා. විශේෂයෙන්ම විදේශ කටයුතු අමාත්‍යතුමා නිරන්තරයෙන්ම විදේශ රාජ්‍යයන් එක්ක සාකච්ඡා කරනවා, මේ ගනුදෙනු කරගන්න සහ මේ ඇති වී තිබෙන තත්ත්වයන් පිළිබඳව. ඒ වාගේම ආරක්ෂක කවුන්සලයෙන් යෝජනා එනවා. ඊයේත් මම දැක්කා, maritime පිළිබඳ යෝජනාවක් ලැබිලා තිබෙනවා. ඒවා පිළිබඳවත් කල්පනා කරමින් අමාත්‍යාංශයේ ලේකම්තුමියත් එක්ක ඒකාබද්ධ වෙමින් අපි ඒ කටයුතු කරගෙන යනවා.

ඒ වාගේම අපි මේ වෙලාවේදී විශේෂයෙන්ම කල්පනා කරන්න ඕනෑ, අපේ ආරක්ෂාව ගැන. මෙහිදී අපේ මුහුදු සීමාව ආරක්ෂා කර ගැනීම ඉතාම වැදගත් වනවා. ඒ නිසා ආරක්ෂක ලේකම්තුමාත්, නාවික හමුදාපතිතුමාත් මැදිහත්වෙලා අපේ මුහුදු සීමාව ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය සපයා තිබෙනවා. දැනට අපට ප්‍රකාශ කරලා තිබෙනවා, මාස දෙකකට ප්‍රමාණවත් ඉන්ධන අපේ නාවික හමුදාව සතුව තිබෙනවා කියලා. ඒ නිසා කවුරු හරි මේ අර්බුදය පාවිච්චි කරලා කුඩු ගෙනෙන්න උත්සාහ කරනවා නම්, ඒ ඔක්කෝම හසුවෙනවා. පසුගිය දිනවලත් තොග ගණන් අහුවුණා නේ. කොකේන් කිලෝ 270ක් අහු වුණා. මේ අර්බුදය අස්සේ තමයි ලංකාවේ වැඩිම කොකේන් තොගය, අපි දවස් දෙක තුනකට කලින් අත්අඩංගුවට ගත්තේ. ඒ යන්ත්‍රණය, ආරක්ෂක ජාලය බිඳ නොවැටෙන විධියට කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමුඛතාව අපි සපයා තිබෙනවා.

ඒ වාගේම අපි සෞඛ්‍ය ක්ෂේත්‍රයත් මෙහිදී සැලකිල්ලට භාජන කරලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපි විශේෂයෙන්ම කල්පනා කරලා තිබෙන්නේ මොකක්ද? අපි හිතමු, තව මාස දෙකෙකින් මුළුමනින්ම අපට තෙල් නැතිවනවා කියලා. එහෙම වුණත් එතැන ඉඳලා තවත් සති 6කට සෞඛ්‍ය සේවය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් වන ආරක්ෂක තොග අපි ගබඩා කරලා තිබෙනවා. ඒ වාගේම වරාය සහ ගුවන් තොටුපළවලටත් අවශ්‍ය වන ආරක්ෂක තොග ගබඩා කරගන්න කියලා අපි උපදෙස් ලබා දීලා තිබෙනවා. මුළු අර්බුදයම තීව්‍ර වෙලා ගියත්, ආරක්ෂක තොග පවත්වාගෙන යෑම පිළිබඳව අපි කල්පනා කර තිබෙනවා. සමස්තයක් වශයෙන් ගත්තොත්, ආර්ථිකය බිඳ වැටෙන්න නොදී මේ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරමින් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! අද දින දිවා ආහාර විවේකය සඳහා වෙන් වූ කාලයෙන් විනාඩි 5ක කාලයක් සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා යොදා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
මේ ආර්ථිකයේ සුමටව ගිය ගමනේ කොතැන කොතැන හරි බාධා ඇති වනවා; පොඩි ගැටුමක් ඇති වනවා. ඒ ගැටුමේදී ආර්ථික කටයුතුවල නියැළෙන සමහර කණ්ඩායම්වලට යම් අපහසුතා මතු විය හැකියි. ඒක වෙන්න පුළුවන් නේ. ඒ කියන්නේ, ආර්ථික අපහසුතාවලට පත් නොවී සියල්ලම සිදු වෙමින් යනවා නම් බලශක්තිය පරණ ආකාරයටම, ඒ මිලටම ලබා දිය යුතුයි. ඉන්ධන මිල අධික වීම නිසා යම් යම් ක්ෂේත්‍රවලට බලපෑමක් ඇති වනවා. සැපයුම් දාමය බිඳ වැටීම නිසාත් යම් යම් ක්ෂේත්‍රවලට බලපෑමක් ඇති විය හැකියි. ඒ පිළිබඳව අධ්‍යයනය කරලා ජනතාවට ලබා දිය යුතු සහන පිළිබඳව සාකච්ඡා කරන්න ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය අපේ උපාලි පන්නිලගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ ඒ ක්ෂේත්‍ර කැඳවමින්, ඒ ඒ ක්ෂේත්‍රවලට තෙල් හිඟ වීම හෝ තෙල් මිල ඉහළ යෑම විසින් ඇති වන බලපෑම සංසන්දනය කර ඒවාට ලබා දිය යුතු සහනයක් තිබෙනවා නම් ඒ සහන පිළිබඳවත් සාකච්ඡා කිරීම සඳහා අපි වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. ඒ නිසා මේ අර්බුදය සමස්තයක් ලෙස දැකලා අපි කටයුතු කරමින් තිබෙනවා.

අපේ රටේ ජනතාවට මම කියන්නේ, සැපයුම් මාර්ගයේ ඇති වන ගැටුම විසින් අපට යම් ව්‍යාකූලත්වයක් මතු වෙලා තිබෙන බවත්, විශ්වාසවන්ත ලෙස මේ සැපයුම් ජාලය ශක්තිමත් කරන්න අපි උපරිම උත්සාහ කරන බවත්ය. ඒ සඳහා අපි හැමදෙනාම - කැබිනට් මණ්ඩලය, අපේ අමාත්‍යාංශ ලේකම්වරුන්, ඒ ඒ ක්ෂේත්‍රවලට වගකියන නිලධාරින් - විශාල වෙහෙසක් දරනවා. මම දන්නවා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරින් දවස් දෙකක් නිදි නැතිව එක දිගට ඇහැරිලා සිටි බව. ඊයේ රාත්‍රියේත් මේ පිළිබඳව අපි සාකච්ඡා කළා. පෙරේදා රාත්‍රියේත් එහෙමයි. අදාළ ක්ෂේත්‍රවල නිලධාරින් නින්දක් නැතිව වැඩ කරමින් ඉන්නවා. ඒ මොකක් වෙනුවෙන්ද? ඔවුන්ගේ වැටුප් පත වෙනුවෙන් නොවෙයි, ඔවුන්ට පැවරී තිබෙන වගකීම සඳහා පමණක් නොවෙයි. මේ රට වෙනුවෙන් අපි හැම කෙනාටම යුක්ති සහගත මැදිහත්වීමක් තිබෙනවා. මම හැමදෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, ඒ මැදිහත්වීමට එකතු වෙන්න කියලා. ඒක අපට අවශ්‍යයි. විශේෂයෙන්ම සැපයුම් දාමය අඩාළ වීමේ තත්ත්වයක් දැන් මතු වී තිබෙනවා. ඉන්ධන මිල ඉහළ යෑමේ තත්ත්වයක් දැන් මතු වී තිබෙනවා. ඒක අපි සමනය කරගනිමු. ඒ සඳහා අවශ්‍ය වන සහාය, මැදිහත්වීම සියලු ප්‍රජාවගෙන් අපේක්ෂා කරමින් මම නතර වනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත්හිටුවනු ලැබේ.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Sajith Premadasa, Leader of the Opposition. You have 12 minutes.

[අ.භා. 1.00]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා අද දින පාර්ලිමේන්තුවේදී දීර්ඝ විග්‍රහයක් කළා. එතුමා පළමුවෙන්ම කිව්වා, මේ යුද්මය තත්ත්වය තුළ බොහොම මධ්‍යස්ථ ආකාරයට කටයුතු කළා කියලා. මම එතුමාගෙන් අහන්න කැමැතියි, ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කරමින්, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ Article 2(4), Article 2(7) වාගේම අනෙකුත් ජාත්‍යන්තර ප්‍රඥප්තීන් උල්ලංඝනය කරමින්, මේ ක්‍රියාත්මක වුණු යුද්ධය හෙළා දකිනවා කියලා එතුමා ප්‍රකාශ කර නැත්තේ ඇයි කියන එක. ඔච්චර මධ්‍යස්ථ නම් ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳව එතුමා බොහොම පැහැදිලි ප්‍රකාශයක් කරන්න තිබුණා. නමුත්, මේ මොහොත වෙනකම් ජනාධිපතිවරයා අපොහොසත් වෙලා තිබෙනවා, එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කරමින් අනීතික ලෙස ක්‍රියාත්මක වුණු මේ ප්‍රහාරය හෙළා දැක ජාත්‍යන්තර නීතිය කඩ කළා කියන ප්‍රකාශය කරන්නට. මෙතැනදී එතුමාගේ මධ්‍යස්ථභාවය කෙසේ වෙතත්, ජාත්‍යන්තර නීතිය සුරක්ෂා කිරීමේ සදාචාර සම්පන්න ක්‍රියාවලිය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව අපි ඇත්තවශයෙන්ම කනගාටු වෙනවා. අපි නැවතත් කියනවා, මේ යුද්ධය ක්‍රියාත්මක වීම තුළ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය වෙලා තිබෙනවාය කියලා. ඒ වාගේම මධ්‍යස්ථව ඉන්න අපේ රට මේ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම හෙළා දැකලා කථා කරන්නට බිය වෙන්නටත් අවශ්‍ය නැහැ.

ඒ වාගේම එතුමා බොහොම බරපතළ ප්‍රකාශයක් කළා, ඇත්තවශයෙන්ම ඔක්කොම ගිවිසුම් ගහලා තිබෙන්නේ සේවා නඩත්තුවට, සමුද්‍ර කලාපය පිළිබඳව දැනුවත් වෙන්න, සයිබර් තර්ජන, මානුෂීය ආපදා සහ හදිසි ප්‍රචාර සඳහා කියලා. මේවා ගැනලු, සම්මුති තිබෙන්නේ. එතකොට එතුමාගේ ප්‍රකාශයෙන්ම බොහොම පැහැදිලි වෙනවා, සමුද්‍ර කලාපය සම්බන්ධයෙන් දැනුවත්භාවය පිළිබඳව සම්මුතියක් තිබෙනවාය කියලා. එහෙනම් මම අහන්න කැමැතියි, සමුද්‍ර කලාපයේ සිදු වෙන දේ සම්බන්ධයෙන් දැනුවත්භාවය පිළිබඳව සම්මුතියක් තිබෙනවා කියන එක ජනාධිපතිවරයාම පිළිගත්තා නම්, ඉරානයේ "IRIS Dena" නෞකාවට ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රහාරයක් එල්ල කරනවා කියලා සමුද්‍ර කලාපීය පිළිබඳව දැනුවත්භාවය කියන පදනම මත ඒ සම්බන්ධයෙන් දැනුවත් කළාද කියන එක. ඒකයි මම එදා සඳහන් කළේ මේ කාරණාව පිළිබඳව. මේ සමුද්‍ර කලාපයේ සිදු වන දේ පිළිබඳව දැනුවත් කිරීමේ සම්මුති විතරක් ක්‍රියාත්මක කරනවා කියනවා නම්, "USS Charlotte (SSN-766)" කියන සබ්මැරීනය අපේ රටට ආසන්න සමුද්‍ර කලාපයේ තිබෙනවා කියන එක ගැන රජය දැනුවත් කළාද? මොකද, ජනාධිපතිවරයාම පිළිගන්නවා, ඒ වාගේ සමුද්‍ර කලාපය පිළිබඳව දැනුවත් කිරීමේ ගිවිසුමක් තිබෙනවාය කියලා. එසේ දැනුවත් කළේ නැත්නම් එතැනදී සිද්ධ වෙලා තිබෙන්නේ මේ සමුද්‍ර කලාපය පිළිබඳව දැනුවත් වීමේ ගිවිසුම් කඩ කිරීමක් සිද්ධ වෙලා තිබෙනවාය කියන කාරණාව නේද? අපි ගරු ජනාධිපතිතුමාට කියනවා, කරුණාකරලා මෙන්න මේ කාරණාවට උත්තරය ලබා දෙන්න කියලා. ඒ වාගේම එතුමාගේ කථාවේදී එතුමා කියනවා, මේක අපේ මුහුදු කලාපය නොවෙයි, මේක අපේ ආර්ථික කලාපය කියලා. ඒ වාගේම ආර්ථික කලාපය කියන්නේ, ගහ ගන්නත් පුළුවන්, නැව්වලට යන්නත් පුළුවන්, ඕනෑ දෙයක් කරන්නත් පුළුවන්, අපේ මුහුදු සීමාවේ නොවෙයි කියාත් එතුමා කියනවා.

මම කියන්න කැමැතියි, ජනාධිපතිතුමාව මීට වඩා දැනුවත් කරන්නට ඕනෑය කියන එක. මම හිතන්නේ විජිත හේරත් මැතිතුමා නම් UNCLOS ගැන බොහෝ ලෙස කථා කර තිබෙනවා. Territorial sea තිබෙනවා, නාවුක සැතපුම් 12ක්. ඉන් ඔබ්බට තිබෙනවා, අනන්‍ය ආර්ථික කලාපය. මම ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි, අනන්‍ය ආර්ථික කලාපයේ ගිවිසුම පිළිබඳව. එහි කියවන්න Article 56, වෙරළාසන්න රාජ්‍යය වන ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් පිළිබඳව; කියවන්න Article 58, “due regard” කියන සංකල්පය තුළ අපේ රටට තිබෙන අයිතීන්; කියවන්න Article 88, අනන්‍ය ආර්ථික කලාපය ක්‍රියාත්මක කරන්නට පුළුවන් සාමකාමී ක්‍රියාදාමයන්වලට, for “peaceful purposes”. එහෙම නැතුව එය සබ්මැරීන පාවිච්චි කරලා, torpedoes ගහලා, නැව් ගිනිබත් කරන යුද ගිනි ක්‍රියාත්මක වන කලාපයක් නොවෙයි.

එතැනින් එහාට ගිහිල්ලා ජනාධිපතිතුමාව දැනුවත් කරන්නට ඕනෑ, San Remo Manual on International Law එකේ paragraph 34හි තිබෙන “The rights and duties of the coastal state..” පිළිබඳව. ඒ තදාසන්න වෙරළාසන්න අපේ රට, අපේ අනන්‍ය ආර්ථික කලාපය. ඇත්තවශයෙන්ම යුද නීතිය පිළිබඳව අවබෝධයක් තිබෙන්නට ඕනෑ, ඒ කටයුතු කරනකොට. ඒ නිසා පැහැදිලිවම මම කියන්න කැමැතියි, අපේ ආර්ථික කලාපයේ ඕනෑ දෙයක් කරන්න පුළුවන්, නැව් ගිනිබත් කරන්න පුළුවන්, ගහ ගන්නත් පුළුවන් කියලා අද ජනාධිපතිවරයා කරපු ඒ ප්‍රකාශය අපි තරයේම ප්‍රතික්ෂේප කරනවාය කියන එක. ජාත්‍යන්තර නීතියේ ප්‍රතිපාදන පිළිබඳව නොදැනුවත්ව තමයි ඒ වාගේ ප්‍රකාශයක් ජනාධිපතිවරයා කළේ කියන එක මේ අවස්ථාවේදී මට කියන්න සිද්ධ වෙනවා.

ඒ වාගේම ජනාධිපතිවරයා ප්‍රකාශ කළා, ඇමෙරිකානු සම්බාධක රුසියාවට පනවා තිබෙන මොහොතක රුසියාවෙන් තෙල් ගන්නේ කොහොමද, එහෙම කළොත් අපේ අපනයන ක්ෂේත්‍රයට බරපතළ තර්ජනයක් තිබෙනවා කියලා. මමයි ඒ ප්‍රකාශය කළේ මේ පාර්ලිමේන්තුවේදී. දින 30ක රුසියාවට පනවපු ඇමෙරිකානු සම්බාධක ඉවත් කිරීමක් තාවකාලිකව සිදු වුණාය කියන එක මේ රජය දන්නේ නැද්ද, මේ ජනාධිපතිතුමා දන්නේ නැද්ද? දින 30ක විරාමයක් තුළ තමයි අපි එදා විදේශ අමාත්‍යවරයාට කිව්වේ, කරුණාකරලා රුසියාවත් එක්ක කථා කරලා තෙල් ගන්න පළමුවෙනිම රට ශ්‍රී ලංකාව බවට පත් වෙන්න කියලා. දින 7ක් මොනවත් කළේ නැහැ. මෙන්න, හත්වෙනි දවසේ රුසියානු තානාපතිවරයා හමු වෙනවා. එළියට දමන්නේ තෙල් පිළිබඳව සාකච්ඡා කරයි කියලා. හැබැයි, ඉන් පසුව රුසියානු තානාපති කාර්යාලයෙන් නිවේදනයක් එනවා, ඇත්තවශයෙන්ම තෙල් ගනුදෙනු පිළිබඳව, කොහොමද ඒවාට ගෙවන්නේ, logistics පිළිබඳව කිසිම සාකච්ඡාවක් වුණේ නැහැ කියලා. මේ කාවද රවටන්නේ? මේ කාවද අන්දවන්නේ? රුසියාවත් එක්ක ගනුදෙනු කරන්න තිබුණා, දින 30 සම්බාධක

විරාමය - sanctions interval එක - තුළ. ඒක කළේ නැහැ. ඒක පුදුමයක් නොවෙයිනේ. විදේශ ඇමතිවරයාම කිව්වානේ හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීම තුළ අපේ රටට කිසිම බලපෑමක් නැහැයි කියලා. දැන් මොකද්ද වෙලා තිබෙන්නේ? දැන් සිද්ධ වෙලා තිබෙන්නේ බරපතළ ඛේදවාචකයක්.

අපට අහන්න ලැබුණා මේක බාහිර යුද්ධයක්, මේ බාහිර කම්පනයකින් සිදු වෙන දෙයක්, external shock එකක්, අපට resilience තිබෙනවා, අපට දරා ගැනීමේ ශක්තිය තිබෙනවා කියලා. මම දැන් කියන්න කැමැතියි ගරු නියෝජ්‍ය කථානායකතුමාට බාහිර නොවෙයි අභ්‍යන්තර කම්පනයක් තිබෙනවා කියා. අද දවසේත් ලක් විජය ගල්අඟුරු බලාගාරය මෙගාවොට් 165ක් අඩුවෙන් උත්පාදනය කරලා තිබෙන්නේ. දැන් බලන්න 12වෙනි දා මෙගාවොට් 51ක් අඩුයි, 13වෙනි දා 130ක් අඩුයි, 14වෙනි දා 135ක් අඩුයි, 15වෙනි දා 132ක් අඩුයි, 16වෙනි දා 148ක් අඩුයි, 17වෙනි දා 165ක් අඩුයි, 18වෙනි දා 176ක් අඩුයි. ඊයේ දවසේ ගල්අඟුරු බලාගාරයෙන් මෙගාවොට් 165ක් අඩුවෙන් උත්පාදනය කරලා තිබෙන්නේ. මාර්තු 18වෙනි දා 176ක් අඩුයි. බලශක්ති දාමය සුරක්ෂිතයිලු. බාල ගල්අඟුරු භාවිතය තුළ නියමිත විදුලිය උත්පාදනය වෙන්නේ නැහැ, බරපතළ පරිසර විනාශයක් සිද්ධ වෙනවා. කාන්තාවන්ට, දරුවන්ට, වැඩිහිටි අයට, ආබාධිත අයට බරපතළ සෞඛ්‍ය බලපෑමක් සිද්ධ වෙනවා. මෙන්න දේශීය කම්පනය.

ගල්අඟුරු භාවිතයෙන් විදුලිය උත්පාදනය කරන්නට බැරි වෙනකොට ඩීසල් බලාගාරවලින් උත්පාදනය කරන්න සිද්ධ වෙනවා. ඩීසල් බලාගාරවලින් උත්පාදනය කරන්න යනකොට රටේ පාරිභෝගික ජනතාවට අවශ්‍ය ඉන්ධන ටික අහිමි වෙනවා. අපේ රටේ අඛණ්ඩ විදුලි සැපයුමට බරපතළ තර්ජනයක් තිබෙනවා කියන එක පාරිභෝගිකයින් 75 ලක්ෂයක් වෙනුවෙන් කථා කරන අපිත් කියනවා, මහජන උපයෝගීතා කොමිසමත් ඒක කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මතකද QR කේතය ක්‍රියාත්මක කරනකොට ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයේ අය එදා කියපු දේවල්? "මොන විහිළුවක්ද, මොකක්ද මේ ඔත්තේ කියන්නේ? මොකක්ද මේ ඉරට්ටේ කියන්නේ? මොකක්ද වාහන ලියාපදිංචි කරනවා කියන්නේ? QR කේත අවශ්‍යද ආණ්ඩු ක්‍රියාත්මක වෙනකොට?" කියලා ඇහුවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Hon. Speaker will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, கௌரவ சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon DEPUTY SPEAKER left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, එදා ඒ විදියට QR කේතය විහිළුවට ලක් කළා. QR කේත ක්‍රියාත්මක කරන්නේ මොනවාටද කියලා ඇහුවා. QR කේත අවශ්‍ය නම් ආණ්ඩු මොකටද කියලා ඇහුවා. දැන් මොකක්ද කියන්නේ? දැන් කියනවා QR කේත ක්‍රමයට හැමෝටම හැඩ ගැහෙන්න කියලා.

මෙන්න මේ විවේචන සමඟ මම කැමතියි මගේ කථාවෙන් අත්‍යවශ්‍යම විසඳුම් ගණනාවක් ඉදිරිපත් කරන්න. මොකද, රටේ ජනතාව ප්‍රගතිශීලී විපක්ෂයක් හැටියට, විකල්ප ආණ්ඩුව හැටියට අපෙන් විසඳුම් බලාපොරොත්තු වෙනවා. වහාම ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාරයේ තිබෙන අතිරික්ත මුදල් ටික උපයෝගී කරගෙන - මොකද, මුදල් පාවෙනවා කියන එක තමයි කිව්වේ- සංචාරක කර්මාන්තයට වෙනමම වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. සංචාරක ක්ෂේත්‍රය තුළ 2025දී අපේ රටට ඇමෙරිකානු ඩොලර් බිලියන 3.2ක ආදායමක් ලැබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the Opposition, your time is up.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I am taking some more time.

නමුත්, අද වන විට සංචාරක ක්ෂේත්‍රය කඩා වැටීමකට ලක් වී තිබෙනවා. ගිය වසරත් එක්ක සංසන්දනය කළාම සංචාරකයින් ප්‍රමාණය වැඩි වුණත් මේ මොහොත වන විට සංචාරක ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම්වල කඩා වැටීමක් සිද්ධ වෙලා තිබෙනවා.

අද බුද්ධි ගලනය සිද්ධ වෙනවා. පේරාදෙණිය විශ්වවිද්‍යාලය කියනවා රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් නිර්මාණය වෙන graduatesලා සියයට 50ක් ස්ථිර වශයෙන්ම රට අත හැරලා යනවා කියලා. වෛද්‍ය ක්ෂේත්‍රයේ, ඉංජිනේරු ක්ෂේත්‍රයේ, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ස්ථිරවම රට අතහැර යෑම සියයට 80ක්, 90ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. රජයට අපි යෝජනා කරනවා, වහාම බදු බර අඩු කරන්න කටයුතු කරන්න, වහාම මේ වෘත්තියවේදීන්ගේ වේතන ඉහළ දමන වැඩ පිළිවෙළකට යොමු වෙන්න කියලා.

තුන්වැනි යෝජනාව තමයි, මේ මොහොතේ ඉඳලාවත් IMF එකත් එක්ක කථා කරලා අලුත් ගිවිසුමකට එන්න කියන එක. මේ ගිවිසුමත් එක්ක ඉදිරියට යන්නට බැහැ. ප්‍රාථමික ශේෂය - primary balance එක - සියයට 2.3ක තියාගෙන, ඇත්ත වශයෙන්ම Gross Financial Need එක GDP එකෙන් සියයට 13ක තියාගෙන, මේ රටට මේ සිදු වන මහා ඛේදවාචකයට මුහුණ දෙන්න බැහැ.

ඒ වාගේම ඊළඟ යෝජනාව තමයි, වහාම ක්‍රියාත්මක වන පරිදි දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑය කියන එක. ඒ සඳහා විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඊයේ දුප්පත්කම ගැන ප්‍රශ්නයක් අහනකොට ආණ්ඩුවට විස්තර, තොරතුරු සපයන්න බැරි වුණා. හැබැයි, ඒ ක්ෂේත්‍රය භාර ඇමතිවරයා මේ හදිසි අවස්ථාවේ විසඳුම් සපයන්න යොදවා තිබෙනවා. ඒ වාගේම මතක තබා ගන්න, අද අපේ රටේ ජනගහනයෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් දුප්පත් කියන එක. මේ ගෝලීය යුද්ධමය තත්ත්වය තුළ ඒ තත්ත්වය වර්ධනය වෙනවා. මේවාට උත්තර අවශ්‍යයි; විසඳුම් අවශ්‍යයි. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙන පරාටේ නීතිය වහාම අත්හිටුවන්න. CUBA Trade Council, ඒ වාගේම මහාචාර්ය රොහාන් ද සිල්වා මැතිතුමා වැනි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ක්ෂේත්‍ර නියෝජනය කරන කණ්ඩායම්, අපේ රටේ කොඳු නාරටිය බඳු වූ මේ micro, small and medium-sized enterprises රැක ගන්නට පරාටේ නීතිය වහාම නතර කරන්න කියන යෝජනාව ඉදිරිපත් කරනවා. කරුණාකරලා ඒ දේ ක්‍රියාත්මක කරන්න.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ වාගේම, මූලික අධ්‍යයනයක් තුළින් කියනවා, "දිට්වා" සුළි කුණාටුවෙන් අපේ රටට ඇමෙරිකානු ඩොලර් බිලියන 4.1ක හානියක් වෙලා තිබෙනවා කියලා. ඒක දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක්. හැබැයි, තවමත් අර ටකරමක් ගියත් ලබා දෙනවා කියපු රුපියල් ලක්ෂ 10ක සහනාධාරය ලැබිලා නැහැ. අද මන්දපෝෂණය වර්ධනය වෙනවා. ආහාර සුරක්ෂිතභාවය පහළ යනවා. ප්‍රධාන එළවලුවල මිල විශාල ලෙස ඉහළ යෑමක් තිබෙනවා. ඒක සියයට 100 සිට සියයට 350 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. හෙක්ටෙයාර 108,000ක් කුඹුරු වැනසිලා තිබෙනවා. ඒ වාගේම සෙසු ක්ෂේත්‍රවල භෝග වගාවන් හෙක්ටෙයාර 11,000ක් වැනසිලා තිබෙනවා. බඩඉරිඟු වගාවේ හෙක්ටෙයාර 6,600ක් විනාශ වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ උද්ගත වී තිබෙන තත්ත්වය තුළ පොහොරවල මිල ඉහළ යෑමක් සිදු වෙනවා. පොහොරවල සුරක්ෂිතභාවය අඩු වෙනවා. ඒවාට රජය උත්තර සපයන්නට ඕනෑ. කරුණාකරලා විසඳුම් ලබා දෙන්න.

ඒ වාගේම, Brent crude oil බැරලයක මිල මේ වන විට ඇමෙරිකානු ඩොලර් 116 ඉක්මවා ගිහිල්ලා සියයට 60ක වැඩිවීමක් සිද්ධ වෙලා තිබෙනවා. ගෝලීය තෙල් මිල සියයට 60කින් ඉහළ යෑම තුළ ඇත්ත වශයෙන්ම ශ්‍රී ලංකාවේ ආනයන බිල ඩොලර් මිලියන 400ත්, 500ත් අතර ප්‍රමාණයක ඉහළ යෑමක් සිදු වෙනවා. මේවායින් සංචිතවලට බරපතළ බලපෑමක් සිද්ධ වෙනවා. ඒ වාගේම මේ මොහොත වන විට වෙළෙඳ භාණ්ඩවල තිබෙන වෙළෙඳ හිඟය වර්ධනය වීමේ අවදානමක් තිබෙනවා. ජංගම ගිණුමේ අතිරික්තය පහළ යෑමේ තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම පිරිවැය නිසා තල්ලු වෙන උද්ධමනය වර්ධනය වීමක් සිදු වෙනවා. අපේ රටේ තේ වෙළෙඳ පොළ, අපනයන වෙළෙඳ පොළ සියයට 52ක් මැද පෙරදිග බලප්‍රදේශයේ තිබෙන්නේ. කොච්චර කිව්වත් ඇඟලුම් වලට - apparelsවලට, ඇඟලුම් ක්ෂේත්‍රයට, textile ක්ෂේත්‍රයට මරු පහරක් එල්ල වෙලා තිබෙනවා. මේවාට විසඳුම් අවශ්‍යයි. Air freight cost එක දෙගුණ වෙලා තිබෙනවා. Air cargo capacity එක Gulf carriers හරහා පහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම, Cape of Good Hope හරහා ගමන් කිරීම තුළ, re-routing හරහා පිරිවැය වැඩි වෙලා තිබෙනවා, වියදම වැඩි වෙලා තිබෙනවා.

කවුරුවත් ප්‍රේෂණ ගැන කථා කරන්නේ නැහැ. අපේ ලක්ෂ 10කට වැඩි ශ්‍රමික ජනතාවක්; ශ්‍රමික සහෝදර සහෝදරියන් පිරිසක් මැද පෙරදිග රටවල ඉන්නවා. 2025 වසරේදී ඔවුන් ඇමරිකානු ඩොලර් බිලියන 7.8ක් අපේ රටට ලබා දුන්නා. ඒක විනිමය ස්ථායීකරණයට වැදගත්. ඒ වාගේම, ඒකෙන් වාර්ෂික trade deficit එකෙන් සියයට 80ක් cover වුණා. ඒ ලක්ෂ 10ක ශ්‍රමික ප්‍රජාවගේ සුබසාධනය ගැන, ජීවිත සුරක්ෂිතභාවය ගැන කටයුතු කරන්න ඕනෑ. යුද්ධය තවදුරටත් උත්සන්න වුවහොත්, ඒ අය මේ රටට ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් තිබෙනවාද? ඒ අය ගෙන්වන කොට, වන්දි ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවාද? ඒ සම්බන්ධයෙන් හොඳ පාඩම් ටිකක් ඉගෙන ගන්න පුළුවන්, කුවේට් වන්දි ලබා දුන් වැඩ පිළිවෙළ තුළින්. එදා -90 දශකයේ- පළමුවෙනි ගල්ෆ් යුද්ධය පැවැති කාලයේ ක්‍රියාත්මක වුණු වැඩ පිළිවෙළ තුළින් පාඩම් ඉගෙන ගන්න පුළුවන්.

පිරී ඉතිරී යන භාණ්ඩාගාරයේ තිබෙන මුදල් ටික ඉලක්කම් වශයෙන් පෙන්වලා හරියන්නේ නැහැ. මේ රටේ විවිධ ජන කොට්ඨාසවලට සහන පැකේජයක් අවශ්‍යයි. ඒ සහන පැකේජය ක්‍රියාත්මක කරන්න ඕනෑ ගොවි ජනතාව වෙනුවෙන්, ධීවර ජනතාව වෙනුවෙන්, කර්මාන්තකරුවන් වෙනුවෙන්, කම්කරුවන් වෙනුවෙන්, ව්‍යවසායකයින් වෙනුවෙන්, ස්වයංරැකියාලාභීන් වෙනුවෙන්, ප්‍රවාහන ක්ෂේත්‍රය වෙනුවෙන්, ත්‍රි-රෝද රථ රියැදුරන් වෙනුවෙන්. මොකද, ජන සමාජය තුළ ආදායම් උත්පාදනය කරන හැම කොට්ඨාසයක්ම අද කඩා වැටී තිබෙනවා. ඔබතුමන්ලා ප්‍රාථමික ශේෂය 2.3 ප්‍රතිශතයට තබාගෙන ඉතිරි කරපු බිලියන ගණනාවක මුදල් ටික ජනතාවට සහන හැටියට ලබා දෙන්න. මෙතැනට ඇවිල්ලා කියන්න එපා, "දැන් ක්‍රමවේද සකස් කරනවා" කියලා. මොකද, මීට මාස ගණනාවකට පෙර, එනම් 2025 ජූනි මාසයේ තමයි ඊශ්‍රායලය සහ ඇමෙරිකා එක්සත් ජනපදය එකතු වෙලා ඉරානයට ප්‍රථම වතාවට බෝම්බ ගැහුවේ. එහෙම නම් යුද්ධයක් එනවා කියලා මීට මාස ගණනාවකට පෙර පුරෝකථනය කරන්න තිබුණා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ එකම එක කාරණාවයි. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලය මඟින් ගෝලීය සතුටු දර්ශකයට අනුව සතුටුමත් ජීවිතයක් ගත කරන ජනතාව සිටින රට ගැන සමීක්ෂණයක් කර තිබෙනවා. ඒ සමීක්ෂණයට අනුව අපේ රට ඇවිල්ලා තිබෙනවා, 134වැනි ස්ථානයට. මෙක Oxford University එක කරපු සංගණනයක්. ගිය අවුරුද්දේ එම දර්ශකයේ 133වැනි තැන ඉඳලා 134වැනි තැනට අපේ රට බැහැලා තිබෙනවා. අපේ රටට ලැබී තිබෙන්නේ ලකුණු 10න් 4යි. එහි අපට ඉහළින් මියන්මාරය ඉන්නවා; අපට ඉහළින් බංග්ලාදේශය ඉන්නවා; අපට ඉහළින් නේපාලය ඉන්නවා, පාකිස්තානයත් ඉන්නවා. ආසියාවේ සතුට අඩුම රට ලංකාවයි. එය ජාත්‍යන්තර සමීක්ෂණයකින් හෙළිදරව් වෙලා තිබෙනවා.

රටේ ජනතාව සමඟ සමාජ ගිවිසුමකට එළඹුණු මේ රජයට මේ ප්‍රශ්නවලින් පැන යන්න බැහැ; මේ අභියෝගවලින් පැන යන්න බැහැ. මේ රටේ ජනතාව මේ ගැටලුවලට පැහැදිලි විසඳුම් බලාපොරොත්තු වෙනවා. ඒ විසඳුම් ලබා දීම සඳහා විපක්ෂයෙන් කරන්නට ඕනෑ උපරිම බලපෑම මේ රටේ ලක්ෂ 220ක් වන ජනතාව වෙනුවෙන් අපි කරනවා කියන එක මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Namal Karunaratne. You have 12 minutes.

[අ.භා. 1.22]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, විපක්ෂය පැත්තෙන් ඇත්තටම ගැටලු ගොඩක් මතු කරනවා. එතුමන්ලාගේ පාලන කාල තුළ අපේ රටේ නිර්මාණය කරපු ගැටලු තමයි ඒ ඉදිරිපත් කරන්නේ. එදා අපේ රට බංකොලොත් රාජ්‍යයක් බවට ප්‍රකාශයට පත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නඩු තීන්දුවක් දීලා තිබෙනවා, මේ රට ආර්ථික වශයෙන් බංකොලොත් කිරීමට අදාළ වග උත්තරකරුවන් කවුද කියලා. එකම පවුලේ තුන්දෙනෙකුගේ නම් ඒ තුළ තිබෙනවා. ජාත්‍යන්තරය නිවේදනය කළා, ශ්‍රී ලංකාව බංකොලොත් රාජ්‍යයක් කියලා. මෙතෙක් මේ රට පාලනය කළ අය අපේ රට ඒ තැනට ගෙන ආවා. ඒ කතන්දරය තමයි අද විපක්ෂය පැත්තෙන් මේ දිග හැරෙන්නේ. ඒක නිවැරැදි කිරීමේ කටයුත්තට තමයි අප මේ අත ගසා තිබෙන්නේ.

අපට බලය දුන්නේ අවුරුදු 5කට. ඒකෙන් තවම යන්තම් අවුරුද්දයි, මාස කිහිපයයි ගත වී තිබෙන්නේ. පසුගිය කාල පරාසය තුළ ඒගොල්ලන් අපේ රට ඔළුවෙන් හිටවලා තිබුණේ. ඔළුවෙන් හිටවලා තිබුණු මේ රට අපි කකුල් දෙකෙන් හිටුවනවා. අපි මේ රට එතැනට ගෙන එනවා. තිබුණු තත්ත්වයට සාපේක්ෂව ගත්තාම, රටක් විධියට අපි ආර්ථික පැත්තෙන් වාගේම හැම පැත්තකින්ම මේ වන විට ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ වන විට ලෝක යුද තත්ත්වයක් නිර්මාණය වුණු පරිසරයක් තිබෙන්නේ. පසුගිය කාලයේ ලෝකයේ සමහර රටවල් ඇතැම් තීන්දු තීරණ ගනිද්දී අපේ රට බොහෝ දුරට පහු වෙලා තමයි තීරණ ගත්තේ. විශේෂයෙන්ම සමහර ඒවා - සමහර සේවාවන් - හැකිළුවා. අපේ රට ඒ වාගේ තීන්දු තීරණ ගත්තේ පහු වෙලා. කලාපයේ රටවල් ගත්තොත්, ඒ රටවල් අපට කලින් සමහර සීමාවන් පැනෙව්වා. හැබැයි, අපේ රට ඒ සීමාවන් පැනෙව්වේ පහු වෙලා. ඔන්න ඔය තත්ත්වය තමයි එදා තිබුණේ. නමුත්, අද පවතින තත්ත්වයට මුහුණ දෙන්න අවශ්‍ය ශක්තිය, හැකියාව අපට තිබෙනවා.

මෙවන් පරිසරයක් ඇතුළේ වුණත් අප මේ කාරණය කියන්න ඕනෑ. දැන් තෙල් පෝලිම් ගැන, ගෑස් පෝලිම් ගැන කථා කරනවා. මේක ලෝකයේම තිබෙන තත්ත්වයක්. එහෙම නැතුව මේක අපේ රටේ විතරක් තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. කලින් තිබුණු තත්ත්වය අනුව ලෝක වෙළෙඳ පොළේ තෙල් තිබුණා. නමුත්, තෙල් ගන්න අපේ රටට සල්ලි තිබුණේ නැහැ. ඒ කාලයේ තෙල් නැව් ආවා; රට වටේ කැරකී කැරකී ගියා. ඒවා ගන්න සල්ලි තිබුණේ නැහැ; ඩොලර් තිබුණේ නැහැ. එදා ඩොලර් සංචිතය බින්දුවේ තිබුණේ. හැබැයි අද වනකොට අපි ඩොලර් සංචිතය බිලියන 7ක් දක්වා ඉහළ දමාගෙන තිබෙනවා. අද අපට සල්ලි තිබෙනවා. නමුත් තෙල් ගෙන්වීමේ ප්‍රශ්නයක් තිබෙනවා. මේක ලෝක මට්ටමේ ප්‍රශ්නයක්. එදා තිබුණේ ජාතික ප්‍රශ්නයක්. ඒ ජාතික ප්‍රශ්නය නිර්මාණය කළේ අද විපක්ෂය පැත්තේ ඉඳන් කථා කරන කණ්ඩායම් එදා කරගෙන ගිය ආණ්ඩු ක්‍රියාවලිය ඇතුළේයි. ඒ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. හැබැයි මේ පරිසරය ඇතුළේ අපි මේ අර්බුදය මේ වනකොට ඉතාම ලස්සනට කළමනාකරණය කරමින් ඉන්නවා කියන එක මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

මම මෙය විශේෂයෙන්ම අවස්ථාවක් කර ගන්නවා, අපේ රටේ ගොවි ජනතාවට පණිවුඩයක් ලබා දෙන්න. මේ දවස්වල අපට ගොවි ජනතාව සහ ගොවි සංවිධාන දිගටම කථා කරනවා. අපි ගොවීන්ට කියනවා, "ඔබ කඩේට ගිහිල්ලා රුපියල් 13,000ට, 14,000ට පොහොර ගන්න එපා, පෝලිමේ ඉඳලා පොහොර ගන්න යන්න එපා, ඒ කඩවලට ගිහින් පොහොර ගන්න යන්න එපා" කියලා. අපි වගකීමෙන් කියනවා, පොහොර හිඟයක් නැහැ කියලා. TSP ගත්තොත්, අපට යල කන්නයට අවශ්‍ය වන්නේ මෙට්‍රික් ටොන් 19,000යි. හැබැයි කන්න 2ක් වගා කරන්න අවශ්‍ය TSP පොහොර තිබෙනවා. MOP පොහොර ගත්තොත්, කන්න වගා කරලා ඉතිරි වන තරමටම තිබෙනවා. ඒවායේ හිඟයක් නැහැ. අපට යූරියා පොහොරවලත් හිඟයක් නැහැ. පොහොර තිබෙනවා. පළමුවෙන්ම මේක තේරුම් ගන්න. පොහොර හිඟයක් එනවා කියලා අනිසි බියක් ඇති කරගෙන පට්ට ගිනි ගණන්වලට පොහොර ගන්න කඩවල් ගණනේ රස්තියාදු වෙන්න එපා කියලා අපේ ගොවි ජනතාවගෙන් මම මේ වෙලාවේ ආදරණීය ලෙස ඉල්ලා සිටිනවා.

රජයේ සමාගම් සතුව යම් පොහොර ප්‍රමාණයක් තිබෙනවා. පෞද්ගලික සමාගම් සතුව තව පොහොර ප්‍රමාණයක් තිබෙනවා. අපි පසුගිය දවසක තීන්දුවක් ගත්තා, අදාළ සියලු පාර්ශ්ව කැඳවන්න. ලංකාවේ දිස්ත්‍රික්ක 25හිම ගොවි නායකයෝ ඔක්කෝම එතැනට ආවා. ඒ ගොවි නායකයෝ ඔක්කෝම එකඟතාවකට ආවා. ඒ ගොවි නායකයන්ගේ නම් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. අශෝක කරුණාසේන, තක්ෂිල දේශප්‍රිය, සමරකෝන් බණ්ඩා, අනුරාධපුරයේ පුංචිරාල රත්නායක, කස්තුරි ආරච්චි, මල්දෙනිය, අයි. කිත්සිරි, ජාතික ගොවි සංවිධාන බල මණ්ඩලයේ සභාපති තිලක් බණ්ඩාර යන ගොවි නායකයෝ ඔක්කෝම ආවා. ඒ සියලුදෙනාම එකඟතාවකට ආවා. ඒගොල්ලෝ මාධ්‍ය හමුවේදී ආණ්ඩුවට ප්‍රශංසාව පළ කළා; ස්තුති කළා. බය වෙන්න එපා. සමාගම් සතුව තිබෙන පොහොර සියල්ල රජයේ මැදිහත්වීම යටතේ රජයට ගන්නවා; සල්ලි ගෙවලා ගන්නවා. ඒ සඳහා ගොවි සංවිධාන මැදිහත් වෙනවා, අපේ දෙපාර්තමේන්තු මැදිහත් වෙනවා. ඒවාට dealersලා නැහැ, අතරමැදියෝ නැහැ, කොමිස් නැහැ. රුපියල් 9,500 ගණනේ ගෙවලා පොහොර සමාගම්වල පොහොර ටික ගන්නවා. ඒගොල්ලෝ ඊට වඩා ලොකු ගණනක් කිව්වේ; වැඩි ගණනක් කිව්වේ. අපි ඒකට එකඟ වුණේ නැහැ. ප්‍රවාහන වියදම දරා ගන්නවා, අපේ ගොවි සංවිධාන. ඊට පසුව අපේ නිලධාරින්ගේ මැදිහත්වීම යටතේ ගොවි සංවිධානවල අනුදැනුම සහ මඟ පෙන්වීම යටතේ ගොවි සංවිධාන හරහා ගොවියා අතට පොහොර ටික ලැබෙනවා; ඔබේ ගමට, ඔබේ යායට පොහොර ටික ලැබෙනවා. ඒකට අදාළ වැඩ පිළිවෙළ දැන් හදලා තිබෙන්නේ. ඒ නිසා පට්ට ගණන්; ගිනි ගණන් ගෙවලා පෝලිමේ ඉඳලා කළුකඩකාරයන්ගෙන් පොහොර ගන්න ලෑස්ති වෙන්න එපා.

ඒ වාගේම තමයි, මේ වන කොටත් සමාගම් සතුව තිබුණු පොහොර මෙට්‍රික් ටොන් 25,000ක් එළියට ගිහින් තිබෙනවා; යූරියා, TSP පොහොර මෙට්‍රික් ටොන් 5,000ක් එළියට ගිහින් තිබෙනවා, MOP පොහොර මෙට්‍රික් ටොන් 5,000ක් එළියට ගිහින් තිබෙනවා. ඒ පොහොර කාටද ගියේ, කවුද ගත්තේ වැනි සියලු තොරතුරු අපි දැන් ලබා ගනිමින් ඉන්නවා. අන්න ඒ පොහොර තමයි දැන් මේ ගිනි ගණන්වලට විකුණන්නේ. ඒ නිසා මෙන්න මේ මාෆියාවට හසු වෙන්න එපා කියන කාරණය අපි ගොවි ජනතාවට අවධාරණය කරනවා. ඒක, එක කාරණයක්.

ඊළඟ කාරණය, ඉන්ධන පිළිබඳ ප්‍රශ්නය. ගොවි ජනතාවට ඉන්ධන ලබා ගැනීමට අදාළව අපි ක්‍රමයක් සකස් කරලා තිබෙනවා. කලින් තිබුණු ක්‍රමය අපි දැන් සරල කර තිබෙනවා. කලින් තිබුණු ක්‍රමය අනුව, ගොවි සංවිධාන අනුමත කරනවා, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර අනුමත කරනවා, DO අනුමත කරනවා, ප්‍රාදේශීය ලේකම් අනුමත කරනවා, දිස්ත්‍රික් ලේකම් අනුමත කරනවා, පෙට්‍රල් ෂෙඩ් එකට යනවා, තෙල් ගන්නවා. දැන් ඒ ක්‍රමය වෙනස් කරලා තිබෙන්නේ. දැන් ගොවි සංවිධානය අනුමත කරනවා, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර අනුමත කරනවා. ඒක ප්‍රමාණවත්. අපි ගොවි සංවිධානවලට ඒ බලය පවරා තිබෙනවා. යම් ගොවි සංවිධානයක අපි හිතමුකෝ, 50ක් ඉන්නවා කියලා. ඒගොල්ලන්ගේ ඉඩම්වල වපසරිය තිබෙනවා. අක්කරයකට දෙන ඉන්ධන ප්‍රමාණයක් තිබෙනවා. ඒ අනුව ඒ 50දෙනාට අදාළ ඉන්ධන ප්‍රමාණය ගොවි සංවිධානයේ මැදිහත් වීම යටතේ ෂෙඩ් එකට ගිහිල්ලා ගන්නවා. අරගෙන, ඒගොල්ලෝ ඉන්ධන ටික ගමට අරගෙන එනවා. ගමට අරගෙන ආවාට පස්සේ ඒ ඒ ගොවියාට අදාළ ඉන්ධන ටික ගම ඇතුළේ බෙදා ගන්නවා. ඔන්න ඔය ක්‍රමය තමයි අපි හඳුන්වා දීලා තිබෙන්නේ. ඊට අදාළ ක්‍රියාමාර්ග දැන් ගනිමින් තිබෙන්නේ. ඒ නිසා කලබල වෙන්න එපා. ගොවි මහත්වරු තනි තනිව මේ ප්‍රශ්නයට උත්තර හොයන්න යන්න එපා. ඔබ, ඔබේ දිස්ත්‍රික්කයේ, ඔබේ ප්‍රදේශයේ ගොවි නායකයාත් එක්ක සම්බන්ධ වෙන්න. මහවැලි කලාපයේ නම් අදාළ නිලධාරියාත් එක්ක සම්බන්ධ වෙන්න. අනෙක් කලාපවල කෘපනිස එක්ක සම්බන්ධ වෙන්න. එහෙම සම්බන්ධ වෙලා සාමූහිකව මෙන්න මේ කටයුත්තට මැදිහත් වෙන්න.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

ඒ වාගේම ගොඩ භෝග වගා කරන ගොවි ජනතාවටත් වතුර මැෂින්වලට භූමිතෙල් ඕනෑ, ඩීසල් ඕනෑ. අන්න ඒවාත් ඒ ක්‍රියාවලිය ඇතුළේ ගන්න පුළුවන්. කොටින්ම ගත්තොත්, මඩ වගාව, ගොඩ වගාව, අතුරු වගාව ඇතුළු සියලු වගා කටයුතුවලට අවශ්‍ය වන ඉන්ධන ප්‍රමාණය ඔන්න ඔය කියන ක්‍රමය ඇතුළේ අපේ ගොවි ජනතාවට ගන්න පුළුවන් කියන කාරණය මේ වෙලාවේ මම අවධාරණය කරනවා. ඒ නිසා කලබල වෙන්න එපා.

විපක්ෂ නායකතුමා මේ ගරු සභාවට කරුණු කාරණා කිහිපයක් ගෙන හැර දැක්වුවා. හැබැයි, ඔබතුමන්ලා නිර්මාණය කළ ප්‍රශ්නවලට තමයි අපි මේ උත්තර සපයන්නේ. ඔබතුමන්ලාගේ කාලයේ ගොවි ජනතාවගේ වගා හානි වුණා. ඒ හානි වෙනුවෙන් ගොවි ජනතාවට අපි වන්දි ගෙව්වා. වී වගාව ද, එළවලු වගාව ද, පලතුරු වගාව ද, අනෙකුත් වගා සඳහා ද සහ සතුන් නැති වුණා නම් ඒ සතුන් වෙනුවෙන් ද අපි ගොවි ජනතාවට වන්දි ගෙව්වා. වන්දි නොලැබුණු ගොවි මහත්වරු ඉන්නවා නම් ඒගොල්ලන්ටත් මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඉතිහාසයේ කවදාවත් නොගෙවපු විධියට අපි ගොවි ජනතාවට වන්දි ගෙවලා තිබෙනවා. විපක්ෂ නායකතුමෝ, ඔබතුමාත් කැබිනට් මණ්ඩලයේ ඉන්නකොට ඔබතුමන්ලාගේ ආණ්ඩුව ගොවියාට සලකපු විධිය අපට හොඳට කියන්න පුළුවන්. ඔබතුමාත් කැබිනට් මණ්ඩලයේ ඉන්නකොට, වැලිමඩ ගොවි ජනතාවගේ අර්තාපල් ස්ථාන 6කදී මිලදී ගන්න ඔබතුමන්ලා කටයුතු කළා. කිලෝ එකකට රුපියල් 95 ගණනේ ගෙවනවා කියලා අර්තාපල් කිලෝ ග්‍රෑම් 2,044,000ක් ගත්තා. හැබැයි, ශත පහක් ගෙව්වේ නැහැ. විපක්ෂ නායකතුමාත් එදා ඒ කැබිනට් මණ්ඩලයේ හිටියා. ගොවීන්ට ශත පහක් ගෙව්වේ නැහැ. ඒ සල්ලි ගන්න අපට සිද්ධ වුණා, ඔබතුමන්ලාගේ අමාත්‍යාංශ වටලන්න, පෙළපාළි යන්න. එහෙම කරලා සල්ලි ටිකක් ගත්තා. හැබැයි, තව වන කල් ඉතුරු සල්ලි ලැබුණේ නැහැ. ඔබතුමන්ලා ගොවි ජනතාවට රුපියල් කෝටි ගණනක පොලු තිබ්බා.

විපක්ෂ නායකතුමෝ, ඔබතුමාත් කැබිනට් මණ්ඩලයේ ඉන්දැද්දි ඔබතුමන්ලා ගොවි ජනතාවට තවත් හොඳ සැලකිල්ලක් කළා. ඒ තමයි දඹුල්ලේ, විශේෂයෙන්ම සීගිරියේ ලොකු ලූනු වගා කරන ගොවීන්ගෙන් ඔබතුමන්ලාගේ ආණ්ඩුව ලොකු ලූනු බීජ ගත්තා. බීජ කිලෝ එකකට රුපියල් 9,000 ගණනේ ගෙවනවා කිව්වාට, ශත පහක් ගෙව්වේ නැහැ. විපක්ෂ නායකතුමෝ, ඔබතුමන්ලාගේ ආණ්ඩුව එහෙමයි කටයුතු කළේ. ඒ ආණ්ඩුවේ දෙවැනියා ඔබතුමා. ඒ ගොවීන්ට ශත පහක්වත් ගෙව්වේ නැහැ. අන්තිමට අපි පී. හැරිසන් ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කළා, අලුවිහාරේ මැතිතුමා එක්ක සාකච්ඡා කළා. අපි අලුවිහාරේලා දඹුල්ලට ගෙන්නුවා. විදුර වික්‍රමනායකලා එක්ක සාකච්ඡා කළා. පෙළපාළි ගියා. ඒත්, ශත පහක් ගෙව්වේ නැහැ. අන්න ඒ විධියටයි ඔබතුමන්ලා ගොවියාට සැලකුවේ. ගොවියාගේ බඩු ටික ගත්තා. හැබැයි, ගොවියාට සල්ලි ගෙව්වේ නැහැ. ඒ බඩු ටික පෞද්ගලික වෙළෙන්දෙකුට වික්කා නම් ගොවියාට සල්ලි හම්බ වනවා. ගොවියාට වන්දි ගෙවනවා තියා, ගොවියාගේ බඩු ටික අරගෙන සල්ලි නොගෙවපු මිනිස්සු තමයි ගොවියා පිළිබඳව මෙතැනට ඇවිල්ලා අද කිඹුල් කඳුළු හෙළන්නේ.

ඒ විතරක් නොවෙයි. ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා දැන් මගේ ළඟම ඉන්නවා. එතුමා ඒවා දන්නවා. ඊළඟට, අම්පාරේ බඩ ඉරිඟු ගොවියාට විතරක් ඔබතුමන්ලා කෝටි 32ක් පොලු තිබ්බා; ගෙව්වේ නැහැ. අපේ ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. මොනරාගල ගොවියාට කෝටි 16ක් පොලු තිබ්බා; ගෙව්වේ නැහැ. අන්න එහෙම තමයි ඔයගොල්ලන් ගොවියාට සැලකුවේ. ඒ කාලයේ තමයි ගොවි ජනතාව බෙල්ල වැල දා ගත්තේ; සියදිවි නසා ගත්තේ. අන්න එහෙම තත්ත්වයක් තමයි ගොවි ජනතාවට උරුම කළේ. ඒ තත්ත්වය ඇතුළේ දැන් නිකම් මැරිලා ඉපදුණා වාගේ ගොවියා ගැන කිඹුල් කඳුළු හෙළන්න එපා කියන එක විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්න කැමතියි. අන්න ඒ තත්ත්වයත් එක්ක මේ රටේ කෘෂිකර්මාන්තය නඟා සිටුවීමට අපි වැඩසටහන් විශාල ප්‍රමාණයක් මේ වනකොට දියත් කරලා තිබෙනවා. මේ ලෝක යුද තත්ත්වයත් එක්ක අපේ රටේ ආහාර හිඟයක් ඇති නොවන තැනට අපි මේ වනකොට කටයුතු සංවිධානය කරමින් ඉන්නවා. අපි ඊයේත් අපේ භෝග නායකයන් කැඳවලා වැඩ පිළිවෙළ සකස් කළා. විශේෂයෙන්ම මුං ඇට පිටරටින් ගෙනෙන එක අපි නතර කළා. මුං ඇටවලින් අපි ස්වයංපෝෂිතයි. මේ තත්ත්වය අපි දිගටම අල්ලා ගෙන යනවා. ඒ වාගේම අනෙකුත් නිෂ්පාදනත් කලින් තිබුණාට සාපේක්ෂව මේ වන විට වැඩි වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Deputy Minister, your time is over now.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, මම හාල් පිළිබඳවත් කියලා අවසන් කරන්නම්. හාල් පිළිබඳ කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. අපට අතිරික්ත වී ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම අපි යල කන්නය වගා කරනවා; වගා කරන්න සැලසුම් කරලා තිබෙනවා. අපි හෙක්ටෙයාර 550,000ක වගා කරන්න සැලසුම් කරලා තිබෙනවා. ගිය කන්නයේ ගත්ත වීත් තිබෙනවා. මේ කන්නයේත් අස්වැන්න එනවා. ඒ නිසා හාල්වල හිඟයක් එන්නේ නැහැ. ආහාර සුරක්ෂිතතාව ආරක්ෂා කිරීමට අදාළව අපි ආණ්ඩුව විධියට මේ වනකොට සැලසුම්සහගතව වැඩකටයුතු කරගෙන යනවාය කියන කාරණය මේ වෙලාවේ රටේ ජනතාවට ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

සියලු දෙනාටම බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Thurairasa Ravikaran. You have 16 minutes.

[பி.ப. 1.36]

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ சபாநாயகர் அவர்களே, உலகில் தற்போது நிலவும் நிலைமை தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு, உலகின் சமகாலச் சூழல் இலங்கைத் தீவின் சமநிலையில் ஏற்படுத்துகின்ற தாக்கம் தொடர்பில் வாதிடுவதற்கு இன்றும் நாம் கூடியிருக்கின்றோம். உலகமெங்கும் நெருக்கடிநிலை நிலவும் சமகாலத்தில் எம்முன்னுள்ள முதற்கேள்வி, இவ்வரசாங்கம் இந்நெருக்கடி நிலையை நிலைகுலையாது கையாள்கின்றதா? என்பதுதான். இல்லை என்றே எண்ணத் தோன்றுகின்றது. உலகளாவிய பொது நெருக்கடி நிலைக்கு, கொள்கை நிலையிலான திடமான முடிவை அரசாங்கம்

நடைமுறைப்படுத்துமென எதிர்பார்க்கின்றபோது, நிகழ்வுகளுக்கான எதிர்வினையை மட்டுமேதான் அடுக்கடுக்காக ஆற்றுகின்றதோ என்றே கேட்கத் தோன்றுகின்றது. முடிவெடுப்பதில் அடிக்கடி ஏற்படும் இத்தகைய மாற்றங்கள், ஒரு முறையான நீண்டகாலத் திட்டம் அரசிடம் இல்லையோ என எண்ணத் தோன்றுகின்றது. பற்றாக்குறையை முன்கூட்டியே கணித்து கட்டமைக்கப்பட்ட தீர்வுகளை முன்வைப்பதற்குப் பதிலாக, அரசாங்கம் ஒரு தற்காலிக நடவடிக்கையிலிருந்து மற்றொன்றுக்கு மாறிக்கொண்டு இருப்பதாகவே எமக்குப் புலப்படுகின்றது. எரிபொருளுக்கான நெடுவரிசைகளும் பதுக்கல்களும் கடந்த மாதத்தின் கடைசி நாளிலேயே தொடங்கி விட்டன. இரண்டு கிழமைகள் கடந்தே QR முறைமை கொண்டுவரப்பட்டது. ஒன்றரை மாதத்துக்குரிய எரிபொருள் முதல் 10 நாட்களுக்குள் தீர்ந்துவிட்டதாக இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம் தெரிவிக்கின்றது. இப்படியான சடுதியான கேள்வி அதிகரிப்பைக் கட்டுப்படுத்தத் தவறியது ஏன்? இப்போது நிகழ்கின்ற பதுக்கல்களுக்குப் பொறுப்பேற்பது யார்? ஓர் அரசாக, நீங்கள் தானே!

உலகளாவிய நிகழ்தகவுகளை முன்கூட்டியே கணித்து, ஏற்படவல்ல தாக்கங்களை முன்கூட்டியே கருதி, பல படிகளில் சோதித்து, முறைப்படி நடைமுறைப்படுத்துவதையே ஓர் அரசாக நீங்கள் செய்திருக்க வேண்டியது. நடைமுறையிலுள்ள QR முறைமையைக் காலத்துக்கேற்ப இற்றைப்படுத்தாமையே சமகால வாரத்தின் சறுக்கல்களாகின்றன. பிரச்சினை வருகின்றபோது அதற்குரிய தீர்வைக்கண்டு முறைமையை இற்றைப்படுத்துவதென்பது வெள்ளம் வர வர தற்காலிக அடைப்புகளை இடுவதற்கு ஒப்பாகின்றது. வெள்ளம் வருமுன்பு அணை கட்டுவதே ஓர் அரசுக்கு அணி.

கௌரவ சபாநாயகர் அவர்களே, ஒரு முறைமை நடைமுறைப்படுத்தப்பட்ட பிறகு மீண்டும் மீண்டும் மாற்றியமைக்கப்படுவது என்பது திட்டமிடல், சோதனை செய்தல் மற்றும் கள நிலையைப் புரிந்துகொள்வதில் ஏற்படும் தோல்வியையே பிரதிபலிக்கின்றது. பொது நெருக்கடி நிலையை எதிர்கொள்ள தற்பொழுது அரசாங்கம் முன்வைத்துள்ள புதன்கிழமை சிக்கன விடுமுறை தாங்கள் எதிர்பார்த்த அளவிலான பெறுபேற்றைத் தந்துள்ளதா? எனக் கேட்கின்றேன். கிட்டத்தட்ட 20 சதவீத மனித மூலதனத்தை குறித்த நாளில் இழந்து நாம் சேமித்தது என்ன? கடந்த செவ்வாய்க்கிழமையோடு ஒப்பிடுகையில், புதன்கிழமையில் மொத்த மின்சக்தியானது மணிக்கு 1.17 ஜிகாவாட் குறைந்துள்ளது. அதாவது, 2 சதவீதம் குறைந்துள்ளது. பகல்நேர உச்சத் தேவை 113.6 ஜிகாவாட் குறைந்துள்ளது. அதாவது, 3.9 சதவீதம் குறைந்துள்ளது. எரியெண்ணெய் பயன்பாடு மணிக்கு 0.32 ஜிகாவாட் குறைந்துள்ளது. அதாவது, 2.1 சதவீதம் குறைந்துள்ளது. ஒரு கிழமைக்குரிய 20 சதவீத மனித உழைப்பை ஒரு நாளில் இழந்து, 2 சதவீதம் அளவான எரியெண்ணெயை - thermal oilஐ - மிச்சப்படுத்துவது இலாபகரமானதா? திட்டமிட்டதற்குரிய பேறினை தங்களின் இந்தத் திட்ட நடைமுறைமூலம் - புதன்கிழமை சிக்கன விடுமுறை ஊடாக - நீங்கள் எட்டியுள்ளீர்களா?

கௌரவ சபாநாயகர் அவர்களே, உலகளாவிய பொது நெருக்கடி நிலையில், இத்தீவிலே வாழும் ஒவ்வொரு குடிமகனும் எதிர்கொள்ளும் சவால்களைவிடவும், வன்னி மக்கள் குறிப்பாக முல்லைத்தீவின் குடிமக்கள் கூடுதல் இன்னல்களைச் சேர்த்தே சுமக்கத் தலைப்பட்டுள்ளனர். வெந்த புண்ணில் வேல் பாய்ச்சுவதுபோல, எரியும் நெருப்பில் எண்ணெயை ஊற்றுவதுபோல, ஒருபுறம் இந்தப் பொது நெருக்கடியின் மகா வலியை, அதாவது பெரிய வலியை எதிர்கொண்டவாறே மறுபுறம் அரசின் மகாவலியையும் எதிர்கொள்ளவேண்டி உள்ளது. 'தித்வா' புயல் அனர்த்தம் நேர்ந்தபொழுது நாங்கள் எதிர்கொண்டது புயலை மட்டுமல்ல, புயலுக்குள்ளும் எங்கள் காணிகளை ஊடறுத்து வேலி போட்ட உங்கள் மகாவலியையும்தான் என்பதைச் சுட்டிக் காட்டுகின்றேன். இப்போது நெடுவரிசைகளிலும் பதுக்கல்களிலும் நாங்கள் எதிர்கொள்வது மத்திய கிழக்கின் அதிர்வுகளை மட்டுமல்ல. மாறாக, கொக்குத்தொடுவாய் மத்தியில் அடாத்தாக உப்பளம் அமைக்கவிட்ட உங்களது மகாவலியையும்தான். கால்கடுக்க காத்திருந்து எரிபொருள் வாங்கி கடலுக்குச் சென்றாலும் என்ன பயன்? அங்கு நீங்கள் கட்டுப்படுத்தத் தவறிய சட்டவிரோத தொழில்கள் ஒருபுறம்! இறைமை தொலைந்த வட கடலில் உலவும் இழுவைப் படகுகள் மறுபுறம்! வெறும் படகோடு கரைக்கு மீள்வதுதான் உங்கள் அரசு எங்கள் மீனவர்களுக்கு இதுவரை வழங்கியுள்ள நீதி! கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் இருக்கும் இந்த நேரத்தில் கடற்றொழில் சார்ந்த சில குறைபாடுகளைச் சொல்ல விழைகின்றேன். கௌரவ சபாநாயகர் அவர்களே, கடற்கரையோடு அண்டியிருப் பவர்கள் பெரும்பாலும் மீனவர்களே! அவர்களுடைய வாழ்வாதாரம் என்பது மீன்பிடித்தலேயாகும். அந்த வருமானத்தின் மூலமே தங்களுடைய குடும்ப வாழ்க்கையைச் சீராகக் கொண்டுசெல்கின்றனர். முன்னைய காலங்களில் இப்படி மோசமான தடைசெய்யப் பட்ட சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகள் இருக்கவில்லை. அண்மைக்காலமாக மிக மோசமான வகையில் சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகள் அதிகரித்திருப்பதை அவதானிக்க முடிகின்றது.

குறிப்பிட்ட சில சட்டவிரோதிகள் இவ்வாறு பாரிய அளவில் சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளை மேற்கொள்வதால் கடற்றொழிலே கதி என்று இருக்கின்ற பல்லாயிரக்கணக்கான மீனவக் குடும்பங்களின் வாழ்வாதாரம் பாதிக்கப்படுகின்றது. அதேவேளை, இழுவைப் படகுகள் எமது கடற்பரப்புக்குள் அத்துமீறி நுழைந்து தடைசெய்யப்பட்ட சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளை மேற்கொள்வதால், எமது மீனவர்களின் சீரான கடற்றொழில் செயற்பாடுகள் பாதிக்கப்படுவதுடன், கடற்றொழில் உபகரணங்களும் சேதப்படுத்தப்படுகின்றன. குறிப்பாக, முல்லைத்தீவு, மன்னார், கிளிநொச்சி, யாழ்ப்பாணம் உள்ளிட்ட வட பகுதி கடற்பரப்புகள் உள்ளூர் சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளாலும் இழுவைப் படகுகளின் அத்துமீறிய சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளாலும் பலத்த பாதிப்புகளை எதிர்நோக்குகின்றன. அதிலும் குறிப்பாக, தீவுப்பகுதி மிக மோசமாகப் பாதிக்கப்படுகின்றது. வெளிச்சம் பாய்ச்சி மீன்பிடித்தல், சுருக்குவலையைப் பயன்படுத்தி மீன்பிடித்தல், 'டைனமைற்' வெடிவைத்து மீன்பிடித்தல் போன்ற சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளால் எமது மீனவர்கள் நொந்துபோயுள்ளனர். இது கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றாகத் தெரியும். இவ்வாறான சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளைக் கட்டுப்படுத்துவதற்கு, மாவட்ட கடற்றொழில் நீரியல் வளத்துறைத் திணைக்கள அலுவலகங்களில் ஆளணிப் பற்றாக்குறை காணப்படுவதாகச் சொல்லப்படுகின்றது.

அண்மையில் சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளைக் கட்டுப்படுத்துமாறு முல்லைத்தீவு மாவட்ட கடற்றொழில் நீரியல் வளத்துறை உதவிப் பணிப்பாளரிடம் மீனவர்கள் முறையிட்டுள்ளனர். இந்நிலையில், தம்மிடம் போதிய ஆளணி இல்லையெனத் தெரிவித்து, தம்மால்

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளைக் கட்டுப்படுத்த முடியாதென உதவிப் பணிப்பாளரால் தெரிவிக்கப்பட்டுள்ளது. குறிப்பாக, முல்லைத்தீவு மாவட்ட கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களத்தின் 2025.01.17ஆம் திகதிய தரவுகளின்படி, ஏற்றுக்கொள்ளப்பட்ட மொத்த பணியாட்டொகுதியினரில் - 25 பேரில் - வெறும் 10 பேரே கடமையில் இருக்கிறார்கள். அதனடிப்படையில், 15 பேருக்குரிய பற்றாக்குறை காணப்படுவதாக அந்தத் தரவுகள் மேலும் சுட்டிக்காட்டுகின்றன. இவ்வாறாக பாரிய ஆளணிப் பற்றாக்குறை காணப்படுகின்றது. எனவே, இன்னும் எவ்வளவு காலம்தான் "போதிய ஆளணி இல்லை. எம்மால் சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளைக் கட்டுப்படுத்த முடியாது" என கூறிக்கொண்டு இருக்கப் போகின்றீர்கள்?

முல்லைத்தீவு மாவட்ட கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களத்திலுள்ள இந்த ஆளணிப் பற்றாக்குறை தொடர்பில் கடந்த 2025ஆம் ஆண்டு முற்பகுதியிலேயே கடற்றொழில் அமைச்சருடைய கவனத்துக்கு நான் கொண்டுவந்ததோடு, உரிய மகஜரையும் அவரிடம் ஒப்படைத்தேன். எனினும், அந்த ஆளணிப் பற்றாக்குறையைப் பூர்த்திசெய்வதற்கு எவ்வித நடவடிக்கைகளும் இதுவரை மேற்கொள்ளப்படவில்லை. கௌரவ கடற்றொழில் அமைச்சர் அவர்களே, விரைவாக இந்த ஆளணிப் பற்றாக்குறையைப் பூர்த்திசெய்வதோடு, சட்டவிரோத கடற்றொழில் செயற்பாடுகளையும் முற்றாகக் கட்டுப்படுத்துங்கள்! வடக்கு, கிழக்கு கடற்பரப்புகளை சட்டவிரோதிகளின் கைகளில் விட்டுவிடாமல் காப்பாற்றுங்கள் என்று நேர்மையான, உண்மையான மீனவர்களின் சார்பாக இந்த உயரிய சபையைக் கோருகின்றேன்.

" நிலம் என்பது வெறும் சொத்தல்ல. அதனுடன் உறவினர் நம் ஒவ்வொருவருக்கும், பெற்றோர், மூதாதையர்களுக்கும் பிணைக்கப்பட்ட தொடர்பு உள்ளது. அந்த வகையில், நிலத்துடன் ஆழமாக இணைக்கப்பட்ட ஒரு கலாசாரம் எமக்கு உள்ளது" என 27.02.2026 அன்று - கடந்த வெள்ளிக்கிழமை - அநுராதபுரத்தில் நடைபெற்ற 'ஹிமிகம' காணி உரிமைப் பத்திரங்கள் வழங்கும் நிகழ்வில் அரசுத் தலைவர் அவர்கள் உரையாற்றியுள்ளார்; பாராட்டுகின்றேன். இதனைத்தான் நாங்களும் எதிர்பார்க்கின்றோம்.

கடந்த காலங்களில் வடக்கு, கிழக்கில் நிலப்பறிப்பினாலேயேயும்தான் விடுதலைப் போராட்டம் ஆரம்பிக்கப்பட்டது. கடந்த கால ஆட்சியாளர்களால் பறிக்கப்பட்ட காணிகளை மீட்டெடுக்க மக்கள் தொடர்ச்சியாகப் போராடிக்கொண்டிருக்கும் இந்த நேரத்திலும், இப்போதைய சனாதிபதி நியாயமாக நடந்துகொள்வார் என்ற நம்பிக்கையுடன் ஒரு பகுதி மக்கள் இருக்கின்றார்கள். ஆனாலும், வவுனியா வடக்கு, முல்லைத்தீவு, தையிட்டி, வலி. வடக்கு, கேப்பாப்புலவு, முள்ளிக்குளம், திருகோணமலை, அம்பாறை, மட்டக்களப்பு என வடக்கு, கிழக்கு எங்கும் தமது நில மீட்புக்காகத்தான் தமிழ் மக்கள் உரமாகப் போராடிக்கொண்டு இருக்கின்றார்கள். வடக்கு, கிழக்கு தமிழர் தாயகப் பரப்பிலுள்ள தமிழ் மக்களுக்கும் தமது நிலம், தமது உறவுகளின் பின்னிப்பிணைந்த கலாசாரத்துடனான பூர்வீகத் தமிழ் மண்தான் என்பதை மாண்புமிகு அரசுத் தலைவர் அவர்களுக்கு நினைவூட்ட விரும்புகின்றேன்.

மாண்புமிகு சனாதிபதி அவர்கள் உரையாற்றிய அதே தினத்தில் முல்லைத்தீவு, கரைதுறைப்பற்று பிரதேச செயலாளர் பிரிவின் கொக்குத்தொடுவாய் மத்தி கிராம அலுவலர் பிரிவில், குஞ்சுக்கால்வெளி என்னும் இடத்திலுள்ள தமிழ் மக்களுக்குச் சொந்தமான பூர்வீக விவசாயக் காணிகளை மகாவலி அதிகாரசபை ஆக்கிரமிக்க முயற்சிகளை மேற்கொண்டிருந்தது. அந்தக் காணிகள் தமிழ் மக்களுடைய பூர்வீக, தனியார் அறுதி உறுதிக் காணிகளாகும். நில அளவையாளர் நாயகம் அவர்களால் அளந்து வரையப்பட்டு, பேணப்பட்டு வரும் Topo. PP 70 இலக்க வரைபடத் தொகுதியில், தனியார் காணியாகவும் மேய்ச்சல் தரை நிலங்களாகவும் அந்த இடங்கள் உள்ளன. எனவே, மகாவலி அதிகாரசபைக்கு அந்த நிலங்களை நிருவகிக்கும் அதிகாரம் கிடையாது. ஆனால், மகாவலி அதிகாரசபை கரைதுறைப்பற்று பிரதேச செயலாளர் பிரிவின் அதிகார எல்லைக்குட்பட்ட இந்தத் தமிழ் மக்களின் அறுதி உறுதிக் காணிகளைத் திருடி, சிங்கள வர்த்தகருக்கு குத்தகைக்கு வழங்கும் சட்டவிரோத நடவடிக்கையை மேற்கொண்டுள்ளது.

மகாவலி அதிகாரசபையிடமிருந்து தமிழ் மக்களின் அறுதி உறுதிக் கணிகளைச் சட்டவிரோதமாக குத்தகைக்குப் பெற்றுள்ள அந்த நபர், அந்தக் காணியில் உப்பளம் அமைக்கும் வேலையைத் தொடங்கியதால் அங்கு அமைதிக்குலைவு ஏற்பட்டு, பதற்றமான சூழ்நிலையொன்று உருவாகியிருந்தது. இவ்வாறான இனவிரோதச் செயற்பாட்டைச் செய்தது மகாவலி அதிகாரசபையே என்பதைக் கூறிக்கொள்வதோடு, அதற்கு எனது வன்மையான கண்டனத்தையும் இந்த உயரிய சபையில் பதிவுசெய்து கொள்கின்றேன். இவ்வாறான இனவிரோத செயற்பாடு தொடர்பாக உரிய விசாரணையை முன்னெடுத்து, நடவடிக்கை மேற்கொள்ள வேண்டுமென இந்த உயரிய சபையைக் கோருகின்றேன்.

1988ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை அரசாங்கங்களின் அனுசரணையுடன் வடக்கு மாகாணத்தில் மகாவலி அதிகாரசபையானது, 'வடக்குக்கான அபிவிருத்தி' என்னும் பெயரில் அப்பகுதி தமிழ் மக்களின் பூர்வீகக் காணிகளை ஆக்கிரமித்தல், தமிழ்க் கிராமங்களின் பெயர்களைச் சிங்களப் பெயர்களாக மாற்றி, அங்கு சிங்கள மக்களைக் குடியேற்றம் செய்தல் உள்ளிட்ட கட்டமைக்கப்பட்ட தமிழ் இனவழிப்புச் செயற்பாடுகளை மேற்கொள்கின்றது. மகாவலி அதிகாரசபையின் இத்தகைய அத்துமீறிய அடாவடித்தனமான செயற்பாடுகளால் நாட்டில் இனங்களுக்கிடையில் முறுகல் நிலையும் சமாதானக் குலைவும் ஏற்படுகின்றன. மகாவலி அதிகாரசபையானது 'அபிவிருத்தி' என்னும் சொல்லாடலைக் கையாண்டு, தீய எண்ணத்துடன் தமிழர்களின் நிலங்களைத் திட்டமிட்டு அபகரித்து, தமிழர்களது பூர்வீக ஊர்களின் பெயர்களை இலங்கை வரைபடத்திலிருந்து நீக்குவதுடன், அந்த இடங்களுக்கு சிங்களப் பெயர்களைச் சூட்டி தமிழ் இனத்தின் தேச அடையாளத்தையும் அழிக்கின்றது.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

ගරු තුරෛරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, please give me one more minute.

அத்தோடு, தமிழர் பகுதிகளில் திட்டமிட்டு அதிகளவில் சிங்களக் குடியேற்றங்களையும் மேற்கொண்டு, தமிழ் மக்களை அவர்களின் தாயகப் பரப்பிலேயே சிறுபான்மையினராக்கும்

இனப்பரம்பல் கோலத்தை மாற்றுகின்ற விதமான மிக மோசமான செயற்பாட்டையும் மகாவலி அதிகாரசபை மேற்கொண்டு வருகின்றது. எனவே, மகாவலி நீர் வராத வடக்குக்கு மகாவலி அதிகாரசபை தேவையில்லை. எமது தமிழ் மக்களுக்கு மரணத்தை ஏற்படுத்துகின்ற வலியாகவுள்ள இந்த மகாவலி அதிகாரசபையை எமது பகுதிகளிலிருந்து உடனடியாக வெளியேற்றுமாறு இந்த உயரிய சபையைக் கோருகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Rizvie Salih. You have ten minutes.

[1.53 p.m.]

**ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. (Dr.) Rizvie Salih - Deputy Speaker and Chair of Committees)

Hon. Speaker, thank you for the opportunity afforded to me to speak on the subject before this House - the current situation in the world.

Sir, the current situation is not only vast, but deeply consequential. Across the continents and oceans, uncertainty is no longer occasional; it is becoming the norm. And, the norms which once guided international conduct are increasingly being tested.

Sri Lanka has long approached global affairs with prudence, balance and moral clarity. We were a principled voice within the Non-Aligned Movement and not passive observers, but advocates of independent justice. To this day, we still maintain that stand. Non-alignment was never indifference; it gave the courage to uphold principle without becoming entangled in great power rivalries. Today, as global polarization deepens, once again that principle remains not only relevant, but necessary.

Sri Lanka has also consistently advanced a vision of enduring importance, the Indian Ocean as a "Zone of Peace". For us, the Indian Ocean is not merely geography, but also our lifeline, our security environment and a shared space connecting nations and civilizations. Recent events in our surrounding waters have brought these principles into sharp focus. Following the tragic attack on an unarmed Iranian naval vessel carrying cadets returning home after a naval exercise in Visakhapatnam, a humanitarian emergency arose within Sri Lanka's Exclusive Economic Zone. Our authorities moved swiftly to rescue those in distress. Lives were saved and those who perished were treated with dignity and respect. The survivors, together with the mortal remains of the deceased, were repatriated with due care. That decision was taken despite external pressures. Yet, Sri Lanka remained guided by a principle that must never be compromised - when human life is at stake, compassion must prevail over politics. The action we took was a statement of our values in practise. Furthermore, another vessel returning from the same exercise was granted access to a Sri Lankan port, where necessary steps were taken to ensure the safety of the vessel and well-being of its cadets. In doing so, Sri Lanka demonstrated that responsible conduct in international waters is an obligation, not a choice.

Sir, the oceans that connect our nations must never become spaces where humanity is forgotten. Ships may carry different flags, their crews may come from different lands, but distress at sea is universal. So, too, must be our response. Sri Lanka's actions reflect principles that remain fundamental to a stable international order.

Sri Lanka, though modest in size, has consistently shown that principled action carries influence. Situated at the crossroads of civilizations, we have every reason to advocate dialogue over division and cooperation over conflict.

The Indian Ocean carries the aspirations of nearly half the world's population. It must remain a region of stability, not rivalry. The vision of a "Zone of Peace" is not a relic of the past, but it is a necessity for the future and the present.

Sir, we must never lose sight of a fundamental truth: behind every global decision are human lives. Too often, it is ordinary people with no part in these decisions who bear the greatest cost of conflict. In Sri Lanka, recent actions reaffirm an enduring belief that even in uncertain times, nations are defined by their commitment to humanity. Sir, if we remain guided by compassion, restraint and responsibility, we will not only safeguard our region, but also contribute to a more just and peaceful world.

Sir, whilst I stand on the Floor of this August House, I wish to address a matter of paramount importance which the world can no longer afford to treat with cautionary silence. At this very moment in history, humanity has placed in the hands of a very few individuals the authority to command armed forces and in some cases, to unleash weapons capable of irreversible and catastrophic destruction. The consequences of a single misjudgement, a moment of emotional disability or instability or a failure of restraint are no longer confined within borders. They are global, immediate and permanent and most often, irreversible for a very long time. Therefore, on behalf of the peace-loving citizens everywhere, I make a sincere, yet urgent appeal to the parliaments, congresses and peoples' assemblies of the world that the time has come to move beyond convention and institutionalize stronger safeguards around the exercise of such extraordinary power. It is both reasonable and responsible for nations to ensure that those entrusted with command authority are subject to rigorous, independent and internationally benchmarked assessments of their mental and emotional fitness conduced with dignity, transparency and at regular intervals during their tenure. This is not an affront to leadership, but it is a reinforcement of trust.

[ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා]

Sir, power of unimaginable, destructive magnitude must never rest solely on assumption. It must be supported by systems that reassure citizens and indeed, the world that decisions of such consequence are made with sound judgement and clarity of mind. History has taught us, often at great cost, that unchecked authority combined with human vulnerability could lead to irreversible tragedy. So, let us not wait for such lessons to repeat themselves in an age where the stakes are infinitely higher. I trust that this call would resonate across the legislative institutions of the world and inspire serious, sovereign reflection because when the safety of humanity is at stake, precaution is not excessive, it is essential. And, when the power to destroy the world exists, the responsibility to safeguard judgement must be beyond question. Sir, it is the sad yet profound truth that those who call for war are often neither those who fight in it, nor those who suffer its consequences, but it is the soldier and the innocent who bear the true cost of it.

Sir, when humanity entrusts a few with the power to command destruction, it also imposes upon all of us the duty to ensure that such power is exercised with unwavering judgement, restraint and accountability. Let history not list us among those who recognized the danger, yet chose silence over responsibility.

Sir, I thank you for the time and the opportunity given to speak on this very important Motion, one that carries consequences for all mankind and for generations to come.

Thank you very much.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Dayasiri Jayasekara. You have nine minutes.

Before he starts, the Hon. Deputy Speaker will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.

[අ.භා. 2.03]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා, ඔබතුමා ඉතාම වැදගත් කථාවක් කරලා මූලාසනයට පැමිණීම ගැන. මොකද, පසුගිය කාල වකවානුව ගත්තාම මේ ආණ්ඩුවේ කෙනෙක් මේ වාගේ කථාවක් කරපු පළමුවැනි වතාව මේකයි.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මේ කාරණය කියන්න කැමැතියි. මේ අර්බුදය සම්බන්ධව ගත්තාම, මේ ආණ්ඩුවට තිබෙන බරපතළම චෝදනාව තමයි, කිසිම විදේශ ප්‍රතිපත්තියක් නැහැ කියන එක. අපි දන්නවා, අවුරුදු ගණනාවක් අමාරු අවස්ථා තිබුණු බව. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1951දී සැන් ෆ්‍රැන්සිස්කෝවලට ගිහිල්ලා බොහොම පැහැදිලි ප්‍රකාශ ගණනාවක් කළා. එතුමා කිව්වා, "Hatred does not cease by hatred, but only by love" කියලා. ඒ වාගේ ප්‍රකාශයක් කිරීම තුළ එතුමා ලෝකයේ ගෞරවාදරයට පාත්‍ර වුණා. අපි ලෝකය සම්බන්ධයෙන් හිටියේ ඉතාම නිශ්චල, නොබැඳි පිළිවෙතක. ඒ නිසාම තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1971දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසි වාරයේදී "Declaration of the Indian Ocean as a Zone of Peace" කියලා ඉන්දියානු සාගරය සාම කලාපයක් කරන්න කියන යෝජනාව ගෙනාවේ. ඒකෙදි බොහොම පැහැදිලිව එතුමිය කාරණා ගණනාවක් මතු කළා: "Remove or reduce foreign military base and nuclear weapons, prevent superpower rivalries in the region and free navigation and trade."

අද වනකොට ලංකාව තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. මොකක්ද ඒකට හේතුව? ඇමෙරිකාව, චීනය, ඉන්දියාව මේ කලාපයේ මිලිටරිමය බලය පිළිබඳව සීතල යුද්ධයක යෙදෙන වෙලාවක් අපි මේ දකින්නේ. මේකේ විශාල අර්බුදයක් අපි දකිනවා. එක කෙනෙකුට වැඩ කරන්න ගියාම එහි ප්‍රතිඵලය වශයෙන් අනෙක් කෙනාගෙන් ගුටි කන්නයි වෙන්නේ. ඒක තමයි අද මේ ආණ්ඩුවට ඇති වෙලා තිබෙන තත්ත්වය.

ජනාධිපතිතුමා මේ සභාවේදී කිව්වා, එතුමා කටාර්වලට, සවුදි අරාබියට කථා කළා කියලා. හැබැයි, එතුමා ඉරානයට කථා කරන්නේ නැහැ. ඉරානයට කථා කරලා ඔවුන්ට අපේ solidarity එක පෙන්වන්න ඕනෑ. මොකද, ඉරානයේ ලක්ෂ ගණනක් මිනිස්සු අනාථ වෙලා, නන්නත්තාර වෙලා ඉන්නේ. ඒ වාගේම දහස් ගණනක් මිනිස්සු මිය ගිහිල්ලා. ලෝකයේ රටවල් කවදාවත් energy sourcesවලට පහර දුන්නේ නැහැ. අද වනකොට ඊශ්‍රායලය හරහා ඒ පහර දීම සිදු වෙලා තිබෙනවා. South Pars gas නිධියට සම්පූර්ණයෙන් පහර දීලා තිබෙනවා. ඊට සමගාමීව ඉරානයත් අනෙක් පැත්තෙන් කටාර්වල වාගේම අනෙක් රටවල තිබෙන බලශක්ති මධ්‍යස්ථානවලට පහර දෙමින් ඉන්නවා. මේ සියලු දේවල් එක්ක අද වනකොට විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. ගෑස් අර්බුදය, ඉන්ධන අර්බුදය කියන මේ සියල්ල ලෝකයම වෙළා ගත් විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. මේ ගැන අපි කථා කළ යුතුයි.

මේ යුද්ධය ඇමෙරිකාව විසින් මේ ලෝකයට බලහත්කාරයෙන් පටවන ලද යුද්ධයක්. ඒ නිසා ලෝකයේ හැම රටකම සිටින ජනතාව දුක් විඳින තැනකට පත් වෙලා තිබෙනවා. ඒක ඇමෙරිකානු ජනතාව පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඇමෙරිකානු ජනාධිපතිවරයාගේ අත්තනෝමතික ක්‍රියා කලාපය තුළ තමයි මේ ක්‍රියාවලිය අද වනකොට ඇති වෙලා තිබෙන්නේ. ලෝක සාමයට ඔහු විසින් එල්ල කරලා තිබෙන බලවත් ප්‍රහාරය පිළිබඳව අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන් විධියට අපේ විරෝධය පළ කරනවා. මෙවැනි තත්ත්වයක් ලෝකයේ ඇති නොවිය යුතු වාතාවරණයක තමයි අද ඒ ක්‍රියාදාමය ඇති වෙන්නේ. මේ ක්‍රියාදාමය පවත්වාගෙන යනකොට තමයි අපේ ආණ්ඩුවට මේ දේවල් කරන්න මතක් වුණේ. ලෝකයේ රටවල news හරියට බැලුවා නම් අපට හොයා ගන්න තිබුණා, මේ දේවල්. ජනවාරි 14වැනි දා ඉඳලා අපට precautions ගන්න තිබුණා, මේ යුද්ධයෙන් ඇති වෙන්න තිබුණු හානිය පිළිබඳව. හැබැයි, අවසානයේදී ඊයේත් හදිසියේ spot tender එකකට තමයි ආණ්ඩුවට යන්න සිදු වුණේ. Term tendersවලට ගිහිල්ලා තෙල්

ටික ගෙන්වා ගන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් හැදුවේ නැහැ. මේ සභාවේ මුලින් කථා කරපු කථිකයන් ගණනාවක් කිව්වා, ටැංකි හදලා නැහැ, අපට ටැංකිවලට තෙල් පුරවා ගන්න විධියක් නැහැ කියලා. ටැංකි තිබෙනවා; තෙල් මෙට්‍රික් ටොන් 460,000ක් පුරවා ගන්න පුළුවන් ටැංකි ලංකාවේ තිබෙනවා. හැබැයි, දැන් තිබෙන්නේ කොච්චරද? මෙට්‍රික් ටොන් 37,000 දැන් තිබෙන්නේ. ඒ නිසා ලබන 12වැනි දා නැව එනකල් මේ ටික තියාගෙන අපි බලාගෙන ඉන්න ඕනෑ. මේක තමයි ඇති වෙලා තිබෙන තත්ත්වය. ඒ නිසා මම මේ කාරණයත් කියන්න කැමැතියි. තමුන්නාන්සේලා පසුගිය කාලයේ පෙට්‍රල් පෝලිම්වලට ගිහිල්ලා, ඒ මිනිස්සු අවුස්සලා, ඒගොල්ලන්ට කෑ ගහලා, මේ රටම ගිනි තියන තැනකට තල්ලු කළා. අපි කිසි විටෙකත් මේ රට එවැනි වාතාවරණයකට යන්න දෙන්නේ නැහැ. මොකද, ආණ්ඩුව තමයි රට පාලනය කරන්න ඕනෑ. ඒක වෙනම කාරණයක්. පාර්ලිමේන්තුව තුළදීත්, පිටතදීත් අපි ප්‍රශ්න ගැන කථා කරනවා. හැබැයි, මේ රට නැවත ගිනි ජාලාවකට අරගෙන යන්න අපි කිසි විටෙක කථා කරන්නේ නැහැ.

බලන්න, අද ලංකාවේ එක උද්ඝෝෂණයක්වත් තිබෙනවාද කියලා. තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට මේ තත්ත්වය ඇති වුණා නම් අද වනකොට මේ රට ගිනි තියලා ඉවරයි. මේ අවුරුදු එකහමාර තුළ එක වතාවක්වත් උද්ඝෝෂණ ඇති වුණේ නැහැ. ඒ, බැරිකම නොවෙයි. හොඳට මතක තබා ගන්න, අපි තමුන්නාන්සේලා වාගේ උද්ඝෝෂණකාරයෝ නොවෙයි කියන එක. වැඩ පිළිවෙළක් එක්කයි අපි කථා කරන්නේ. අදත් අපි ගිහිල්ලා ජනාධිපතිතුමාට කිව්වේ, තිබෙන ප්‍රශ්න ටික විසඳන්න කටයුතු කරන්න කියායි. තමුන්නාන්සේලා මොකක්ද කරන්නේ? කිසිම රැස්වීමකට එන්නේ නැහැ. පසුගිය අවුරුදු ගණනාව තුළ කිසිම පොදු සාකච්ඡාවකට තමුන්නාන්සේලා ආවේ නැහැ. හැබැයි, මේ රටේ තිබෙන අර්බුදය පිළිබඳව අද අපි ජනාධිපතිතුමාත් එක්ක කථා කරලා ආවා. විශේෂයෙන්ම ලංකාවේ අපනයන සම්බන්ධයෙන් අර්බුද ගණනාවක් මතු වෙලා තිබෙනවා. මම ඒ පිළිබඳව විශේෂයෙන් කියන්න ඕනෑ. මම ජනාධිපතිතුමාට පෞද්ගලිකව කිව්වා, අපනයන කටයුතුවල නිරත සමාගම්වලට තෙල් රඳවා ගැනීම සඳහා වන යෝජනාව CPC එකට දාලා තිබෙනවා, ඒ සඳහා මේ වනතුරුත් ඔවුන්ට අනුමැතිය ලබා දීලා නැහැ කියලා. මේක තමයි තිබෙන තත්ත්වය.

ඒ විතරක් නොවෙයි, අපි මේ තත්ත්වයෙන් ප්‍රයෝජන ගත හැකි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. විශේෂයෙන්ම ඩුබායි රාජ්‍යයෙන් අද මිනිස්සු පලා යනවා. ඩුබායි රාජ්‍යයේ සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා, හෝටල් වහන තැනට තල්ලු වෙලා. ඒ ආයෝජකයෝ ලංකාවට ගෙන්වා ගැනීම සඳහා වැඩ පිළිවෙළක් තමුන්නාන්සේලා හදන්න ඕනෑ. ඊට අමතරව, ලංකාව ඉන්දියන් සාගරයේ ඉතාම සුරක්ෂිත ස්ථානයක් බවට පත් වෙලා තිබෙන තත්ත්වය තුළ අපට ඒ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යන්න පුළුවන්. එම නිසා ඒ opportunity එක හදා ගන්න වැඩ පිළිවෙළක් අපි සූදානම් කර ගත යුතුයි. විශේෂයෙන්ම මේ රට logistics hub එකක් බවට පත් කරන්නේ කොහොමද කියලා අපි කල්පනා කළ යුතුයි. අද නැව්වලට ඇති වී තිබෙන අර්බුදයත් එක්ක අපේ වරාය අපි ශක්තිමත් කර ගන්නේ කොහොමද? ඊළඟට, අපේ සංචාරක ව්‍යාපාරය ශක්තිමත් කර ගන්නේ කොහොමද? පොල් ආශ්‍රිත අපනයන විශාල ප්‍රමාණයක් අපට තිබෙනවා. සමන්ත විද්‍යාරත්න මැතිතුමා මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. විශේෂයෙන්ම අපි ඔබතුමන්ලාට කියන්න කැමැතියි, Ceylon Chamber of Coconut Industries පටන් ගන්න කියලා. ඒ ගැන මම දැනුත් ජනාධිපතිතුමාට කිව්වා. ඒ සඳහා ලිපි යවලා ඔබතුමන්ලාට මාස ගණනක් ඒ සම්බන්ධයෙන් කථා කරලා තිබෙනවා. ඒ Ceylon Chamber of Coconut Industries ගැන අදටත් කථා කරන්නේ නැහැ. කරුණාකර ඔබතුමා හෝ මැදිහත් වෙලා ජනාධිපතිතුමාට කියලා Ceylon Chamber of Coconut Industries ඇති කරන්න. මොකද, අද මේ තිබෙන යුද්ධය අවසන් වුණාට පස්සේ ඒ සඳහා ඉරානයෙන් විශාල ඉල්ලුමක් ඇති වෙනවා. එම නිසා මේ අපි ආණ්ඩුවට බල කරලා කියා සිටින්නේ, මේ ඇති වුණු තත්ත්වය ප්‍රයෝජනයට අරගෙන රට ආර්ථිකමය වශයෙන් දියුණු කරන්න අවශ්‍ය කටයුතු ටික කරන්න කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය රැඳී තිබෙන්නේ විනිවිදභාවයයි, අධිකරණයේ ස්වාධීනත්වයයි, සාධාරණ නීති ක්‍රමයයි කියන කාරණා මත. අද ඒ සියල්ලම කඩා වැටෙමින් තිබෙන තත්ත්වයක් තිබෙන්නේ. අද වනකොට විනිසුරුවරුන්ගේ පත්වීම්, මාරුවීම්, උසස්වීම් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන කතිකාව විශාල අර්බුදයක් බවට පත් වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, නීතියේ ක්‍රියාකාරිත්වය සම්පූර්ණයෙන්ම දේශපාලනීකරණයට යට වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා ශානි අබේසේකර මහත්මයාව පත් කළා. තමුන්නාන්සේලාත් එක්ක දේශපාලනය කරපු, දේශපාලන වේදිකාවේ හිටපු කෙනෙක් ගෙනැල්ලා දාලා, ඔහුට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර දෙන්න ජාතික පොලිස් කොමිසමට දන්වා තිබුණා. ඒක කරන්න ජාතික පොලිස් කොමිසම බැහැයි කිව්වාම ආපහු ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ජාතික පොලිස් කොමිසම ඒක ආපහු පොලිස්පතිතුමාට යොමු කර තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තමයි දැන් ඇති වෙලා තිබෙන්නේ.

අද වනකොට ශ්‍රේෂ්ඨාධිකරණය මානව හිමිකම් නඩු විශාල ප්‍රමාණයක් අහක දමන තත්ත්වයට තල්ලු වෙලා තිබෙනවා. ඒ වාගේම මහජන නඩුකර විශාල ප්‍රමාණයක් අහකට දමන තැනට තල්ලු වෙලා තිබෙනවා. UDA එක සම්බන්ධව කථා කළොත්, ක්‍රිෂ් ගනුදෙනුවට සම්බන්ධ සමාගමට ඩොලර් මිලියන 712ක් වාගේ අඩු ගණනකට දෙන්න, ඒ කියන්නේ 2014දී තිබුණු ගණනටම දෙන්න තමුන්නාන්සේලා කටයුතු කළාම, අපේ ස්වාමීන්දුයන් වහන්සේ නමක් ගිහිල්ලා නඩුවක් දාලා තිබෙනවා. මේකට පෙනී සිටින්න නීතිපති දෙපාර්තමේන්තුව බැහැ කියනකොට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඒක එළියට වීසි කළා. ඒ වාගේ තත්ත්වයක් තමයි අද වනකොට ඇති වෙලා තිබෙන්නේ. ඒ වාගේම දූෂණ මර්දන ක්‍රියාවලිය පිළිබඳව ගත්තොත්, ඒ සම්බන්ධයෙනුත් අර්බුද ගණනාවක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, your time is up.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
*ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.*

අද මෙවැනි තත්ත්වයක් ඇති වෙයි කියලා අපි හිතුවේ නැහැ. අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සම්බන්ධව ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න. විශේෂයෙන්ම කපිල චන්ද්‍රසේන මහත්තයා දීලා තිබෙන දිවුරුම් ප්‍රකාශය ගැන දැඩි විධියට අපි කල්පනා කරන්න ඕනෑ. එතුමාගේ එම ප්‍රකාශයේ තිබෙනවා, "මීට සති දෙක තුනකට කලින් මේ වාගේම කෙනෙක් ආවා. තමනුත් දන්නවා ඇති නේ කවුද කියලා. දන්නේ නැත්නම් මම කියන්නම්. ඒ කෙහෙලියගේ නඩුවේ කෙනෙක්. මිනිහාට මම chances දෙකක් දුන්නා. ගත්තේ නැහැ. මිනිහාට indictment දෙන දවසට කලින් මිනිහා එල්ලිලා

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

මැරුණා. තමුන්ගේ එකේ ඉන්න අය මම දන්නවා. මහ එකාගේ නමයි, පොඩි එකාගේ නමයි කියනවා" යනුවෙන් කියපු බව. කවුද, මේ මහ එකාගේ නමයි, පොඩි එකාගේ නමයි කියන්නේ? දැන් ඒ නම් දෙක අනුව ඔහු දිවුරුම් ප්‍රකාශයක් දීලා තිබෙනවා, "මෙන්න මේ දෙන්නාට සල්ලි දුන්නා" කියලා. ඒක තමයි අද පත්තරේ headline එක. වෙන එකක් නොවෙයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ඔක්කෝම පත්තරවල headline එක මහින්ද රාජපක්ෂට කෝටි 6ක් දුන්නාය කියන එක. ඒකයි, ඉතිරි ඒවා ටිකයි තමයි දාලා තිබෙන්නේ. හැබැයි, අද උසාවියේදී දිවුරුම් පෙත්සමක් දීලා තිබෙනවා, ඔහුට මේ සම්බන්ධව විශාල බලපෑමක් කළාය, ඔහු ක්‍රියා කළේ ඒ බලපෑම් මතයි කියලා. එතකොට, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මොකක්ද වෙන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, your time is up.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව පොඩි වෙලාවක් දෙන්න.

මීට කලින් බෙල්ල වැල ලාගෙන මැරුණා, ගබ්බෙල මොහොට්ටාලගේ නිහාල් සිසිර කුමාර මහත්මයා. ඔහු හොඳට බිස්නස් කරමින් සිටි කෙනෙක්. හොරෙක්, මංකොල්ලකාරයෙක් නොවෙයි. හැබැයි, ඔහුටත් මේ වාගේම තර්ජනයක් ඇවිල්ලා කියලා මේ කටඋත්තරයෙන් බොහොම පැහැදිලිව තේරෙනවා. "එක මිනිහෙක් එල්ලිලා මැරුණා" කියන්නේ, ඒ පුද්ගලයා ගැනයි. ඔහුට මුහුණ දෙන්න බැරිව ඔහු බෙල්ල වැල ලාගෙන මිය ගියා. අද මේ රටේ යුක්තිය සාධාරණත්වය මේකද කියලා මම අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මේ සියලු ක්‍රියාකාරකම් අතරේ තමුන්නාන්සේලා මේ වැඩ පිළිවෙළ ඉස්සරහට අරගෙන යනවා. දැන් තමුන්නාන්සේලාගේ කාල වකවානුවේ තිබෙන දේ තමයි, ජේවීපී සහෝදරයන්ට කොතරම් බරපතළ චෝදනා එල්ල වුවත් ඔප්පු වනතුරු ඔවුන් පාරිශුද්ධ වන අතර, අනෙකුත් පක්ෂවල සාමාජිකයන්ට චෝදනාවක් එල්ල වූ සැණින් ඔවුන් වරදකරුවන් බවට පත් වීම. ඒක තමයි දැනට ඔප්පු වෙලා තිබෙන්නේ; තමුන්නාන්සේලා ඔප්පු කරමින් ඉන්නේ. තමුන්නාන්සේලාගේ නීති හදලා තිබෙන්නේ ඒකට. එක පැත්තකින් මේ රට විශාල අවුලකට තල්ලු වෙමින් තිබෙනවා, මේ ලෝක යුද්ධයත් එක්ක. ඒ වාගේම අනෙක් පැත්තෙන් තමුන්නාන්සේලා මේ රට විශාල අවුල් ජාලාවකට ගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න කාලය දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Arun Hemachandra. You have 12 minutes.

[2.14 p.m.]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)
Hon. Deputy Speaker, a good foreign policy is not measured by how loudly a nation speaks, but how wisely it protects the nations' people, its sovereignty and its long -term national interests. In times of global uncertainty, responsible nations must act with strategic neutrality, guided not by emotions, but by their duty to protect their people, their economy and their future.

Sir, at a time like this when the world is passing through uncertainty, when global conflicts are affecting the energy supply, maritime transport, trade and economic stability, the duty of a responsible government is clear: it must protect the country's sovereignty, ensure economic stability and must guarantee safety of its people, both at home and overseas.

Sir, at such a moment, the duty of a responsible Opposition is also clear. In a democracy, the Opposition has the right to question, to criticize and to demand for accountability. That is the strength of a democracy. But, the Opposition does not have the right to weaken the country. When the nation is facing external pressure, when global conflicts are affecting its energy supply routes, international negotiations are ongoing and economic recovery is still in progress, it is not the time to create fear among the people; this is not the time to misrepresent facts for short-term political advantage. A responsible Opposition must ask themselves, "Will our words strengthen the country? Will our actions protect the people? Will our criticism help the nation or harm it?"

Sir, we meet today at a serious moment in the life of our nation. Sri Lanka had recently passed through bankruptcy and even today, we are still in the process of rebuilding our economy, restoring stability and regaining the confidence of our people as well as of the international community. When this Government assumed office under the leadership of the Hon. President Anura Kumara Dissanayake, we did not inherit a stable country. We inherited a country burdened by debt, weakened by years of financial indiscipline and shaken by loss of public trust. Public trust is the most important thing. People were not asking for promises; they were asking for stability. The responsibility before the National People’s Power Government was, therefore, clear. It was not to proceed recklessly and to make popular announcements, but to stabilize the nation. We were very successful in that. We had to restore discipline in public finance, rebuild confidence in the financial system, ensure that fuel, electricity, LP gas, medicine and all other essential goods are available and to regain confidence of international institutions and friendly nations. So, these were not easy decisions, but necessary decisions.

Sir, even as we began this difficult recovery, the country faced further challenges. Sri Lanka was struck by the disaster of Cyclone "Ditwah", one of the worst natural disasters in the history of our nation, at a time when our economy was still fragile. We had to protect lives, rebuild infrastructure, assist the affected communities and continue economic recovery at the same time. Managing bankruptcy was difficult, but managing a disaster during recovery was even more difficult. Yet, the country remained stable, essential services continued, institutions functioned and relief was delivered. All that was possible because discipline was maintained.

Sir, today, the world itself is passing through a period of serious uncertainty. The conflict in the Middle East is not a distant event for Sri Lanka. Energy prices have been affected; shipping routes have been affected; air travel has been affected and tourism is also affected. Global markets have became unstable than ever before. Most importantly, thousands of Sri Lankans working overseas have been directly affected. Foreign employment is one of the strongest pillars of our economy. Remittances from our migrant workers have helped this country survive during the most difficult times.

From the first signs of escalation of conflict, the Government gave priority to the safety of the Sri Lankan citizens overseas. Our Embassies and Missions were instructed to register Sri Lankans, maintain direct contact with them and to provide assistance whenever required. Officials have been in communications with the affected individuals personally and necessary arrangements have been made in coordination with host governments. I must place on record our sincere appreciation of our diplomats, embassy staff, labour officers, all officials serving abroad and those in our Ministry, who have worked tirelessly to protect Sri Lankan citizens. We also thank the governments of host countries, international organizations, airline companies and all stakeholders who have extended cooperation during this difficult period. We also appreciate the tourism sector and the aviation sector, which continue to maintain connectivity with Sri Lanka even in uncertain global conditions. Sir, at a time like this, Sri Lanka calls upon all parties involved in this present conflict to act with restraint, to respect international law and to give priority to dialogue and peaceful resolution. Escalation of conflict does not benefit small nations. When wars expand, it is the developing countries which suffer first. Therefore, Sri Lanka urges all parties concerned to avoid actions that threaten regional stability, endanger civilian lives or disrupt global trade and maritime transportation.

Sir, Sri Lanka, as a maritime nation, is located close to one of the most important sea lanes in the world. A large portion of global trade passes through close to our shores. Because of that, any conflict in the region affects our economy directly. I repeat, because of that, any conflicts in the region affect our economy directly.

Under international law, including the law of the sea, Sri Lanka has sovereign rights within its maritime zones, but we also have a responsibility to support the safety of international sea lanes, on which our economy depends. As a country located near major energy and shipping routes, any instability in those waters could directly affect our fuel supply, trade and economic stability. For that reason, Sri Lanka supports the freedom of navigation, the security of maritime transport and peaceful use of oceans in accordance with the international laws. For small nations, these rules are not theoretical, but are essential for their survival.

Sir, despite global uncertainty, Sri Lanka has remained stable. The Budget deficit has been reduced; public finance is under control; the Current Account is positive; foreign reserves have improved; inflation has come down during the last couple of months and the exchange rate has stabilized during the last couple of weeks. We remember the time when fuel was not available, when electricity was cut off and when people stood in queues. Today, the situation is different and fuel is available even with some restrictions. Electricity is available without interruption; gas is also available. Even those who criticize the Government are living normally today because stability has been restored. This Government keeps the lights on not for one party, but for the whole nation.

Sir, in this challenging global environment, we must not only face challenges, but also explore opportunities. Sri Lanka's location, its ports, airports and maritime position would give us advantage, if they are used wisely. We are working to strengthen tourism, aviation, maritime transport, logistics and energy security. In the past, some opportunities were lost due to poor planning, but, today, the approach is different. We plan carefully, act responsibly and protect national assets. Sir, the duty of a responsible government is to protect the country and the duty of a responsible opposition is not to weaken the country during time of crisis. Democracy allows criticism, but it also requires responsibility.

Sir, we love this country. Because we love this country, we cannot allow it to fall into instability, have divisions or suffer due to irresponsible decisions again. Patriotism is not shown by speaking as loudest as possible, but by protecting the nation when it is still under pressure and by putting Sri Lanka before politics.

Sir, if we remain disciplined and united and if we continue on the path of responsibility, Sri Lanka would overcome every challenge before it, and this Government will take all necessary measures to ensure that the country is stable and strong.

Thank you very much.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. R.M. Ranjith Madduma Bandara. You have nine minutes.

ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

I have 10 minutes, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, nine minutes.

[අ.භා. 2.27]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යුද්ධය නිසා අද අපේ රට ද ඇතුළුව ලෝකයම බලශක්ති අර්බුදයකට මුහුණ පා තිබෙනවා. "බලශක්තිය" කිව්වාම ලංකාවේ අපට කල්පනා කරන්න වෙනවා, ඛනිජ තෙල්, විදුලිය සහ ගෑස් පිළිබඳව. අපට ගෑස් අර්බුදය ආවේ යුද්ධය පටන් ගත්තාට පසුව නොවෙයි; යුද්ධයට ඉස්සෙල්ලායි. පසුගිය දෙසැම්බර්, ජනවාරි වනකොට මේ රටේ ජනතාවට ගෑස් පෝලිම්වල ඉන්න සිද්ධ වුණා. ජනාධිපතිතුමා කථා කරමින් කිව්වා, තමන් මේ රටේ තිබෙන ගෑස් මාෆියාව, තෙල් මාෆියාව කැඩුවා කියලා. එතුමා කිව්වා, පෙර පැවැති ආණ්ඩු අවුරුදු 20ක්, 30ක් ගෑස් ගෙන්වන්න එක් අයෙකුටම අවස්ථාව දීලා තිබුණා කියලා. හැබැයි, එතුමා ගෑස් මාෆියාව කඩන කොට ගෑස් මිල වැඩි වෙලා තිබෙනවා. මේක අලුත් මාෆියාවක්. 2025 ගෑස් මිල තිබිලා තියෙන්නේ රුපියල් 3,690ට. දැන් රුපියල් 4,250 වනකල් ගෑස් මිල ඉහළ ගිහින් තිබෙනවා. ඒ කියන්නේ, මේ තෙල් අර්බුදයට, මේ යුද්ධයට ඉස්සෙල්ලායි. අපි දන්නවා, මේ තිබෙන ගෑස් මාෆියාව නිසා, මේ ආණ්ඩුවේ කළමනාකරණයේ තිබෙන වැරැද්ද නිසා මේ රටේ ජනතාවට ගෑස් පෝලිම්වල ඉන්න සිද්ධ වුණු බව. හැබැයි ආණ්ඩුව නම් කිව්වේ, ගෑස් මාෆියාව කැඩුවා කියලායි.

ගල් අඟුරු ප්‍රශ්නය ආවේත් මේ යුද්ධයට ඉස්සෙල්ලායි. බාල ගල් අඟුරු ගෙනැල්ලා රටට දවසකට කෝටි ගණනක් පාඩු කරවන්න මේ ආණ්ඩුව කටයුතු කළා. අපි ජනාධිපතිතුමාගෙන් අහනවා, ගල් අඟුරු ගෙනෙන මාෆියාව, අවුරුදු 15ක්, 20ක් තිබුණු මාෆියාව කැඩුවාම මේ රටට බාල ගල් අඟුරු ගේන්න පටන් ගත්තා නේද කියලා. ඒ ටෙන්ඩර්වල කාල සීමාව, ටෙන්ඩර්වල ප්‍රමාණය - quantity එක - අඩු කරලා දුන්නා, තමන්ගේ යාළුවන්ට.

මා හිතන විධියට, අද මේ රටේ බලශක්ති ඇමතිවරයාට විශාල චෝදනාවක් තිබෙනවා, මේ ගල් අඟුරු ඩීල් එක ගැන. එතුමාට ඒ චෝදනාව විතරක් නොවෙයි තිබෙන්නේ. එතුමා පොහොර සංස්ථාවේ වැඩ කරද්දී එතුමාට රුපියල් මිලියන 8කට අදාළවත් චෝදනාවක් කර තිබෙනවා; නඩුවක් දාලා තිබෙනවා. එදා එතුමාගේ ඇමතිවරයා - කෘෂිකර්ම ඇමතිවරයා - වශයෙන් හිටියේ වත්මන් ජනාධිපතිවරයායි. ජනාධිපතිවරයා කියනවා, මේවා ඇමති කාලයේ ඒවා නොවෙයි, මේවා පොහොර සංස්ථාවේ වැඩ කරපු කාලයේ ඒවායි කියලා. අපි ජනාධිපතිවරයාගෙන් අහනවා, වැරැද්ද කරපු මිනිහා ඇමති වුණා කියලා වැරැද්ද නැති වෙනවාද කියලා. සාමාන්‍යයෙන් මේ රටේ සම්ප්‍රදායක්, පුරුද්දක් තිබුණා, ඇමතිවරයෙකුට විරුද්ධව නඩුවක් වැටුණොත්, ඒ ඇමතිවරයා අයින් කරන. අපි ජනාධිපතිවරයාගෙන් අහනවා, තමාගේ මිත්‍රයා නිසාද, එතුමා මේ ඇමති ධුරයේ තවම තියාගෙන ඉන්නේ කියලා.

අද මේ රටේ තෙල් අර්බුදයක් තිබෙනවා. ජනාධිපතිතුමාම කියනවා, තෙල් නැව් දෙකක් ආපසු යැව්වා කියලා. හැබැයි, මේ චෝදනා පිට චෝදනා තිබෙන ඇමතිවරයාට පොහොර සංස්ථාවේ සිටියදී සිදු වූ වංචාවක් සම්බන්ධව නඩු පැවරීමට ලක් වෙච්ච ඇමතිවරයාට, ගල් අඟුරු වංචාව සම්බන්ධව නඩු පැවරීමට ලක් වෙච්ච ඇමතිවරයාට තමයි අද තෙල් අර්බුදය විසඳන්නත් දීලා තිබෙන්නේ.

ජනාධිපතිවරයා ජාතිය අමතා කථා කරද්දී කියනවා අප අහගෙනයි, "Black market එකෙන් හරි, ඔය කොහේ හෝ පාවෙන වැඩි මිල ඉන්ධන සහිත නැව්වලින් හරි ඉන්ධන ගන්න කටයුතු කරනවා" කියලා. අපි අහනවා, ඒ කටයුත්තත් කරන්න දීලා තිබෙන්නේ චෝදනා පිට චෝදනා තිබෙන මේ ඇමතිවරයාටමද කියලා.

අපි දන්නවා, ගල් අඟුරු වංචාවෙන් අහිමි වෙච්ච විදුලිය නිෂ්පාදනය වෙනුවෙන් දැන් දවසකට ඩීසල් ලීටර් ලක්ෂ 5ක්, 6ක් වැය කරන්න සිද්ධ වෙලා තිබෙන බව. ඒ ඩීසල් ලීටර් ලක්ෂ 5, 6 තිබුණා නම්, ඔය පෝලිම්වල ඉන්න පිරිස අඩු වෙනවා. තමුන්නාන්සේලා ඩීසල් භාවිතය අඩු කරන්න කියලා බදාදා නිවාඩු දුන්නා. බදාදා දවසේ ඉතිරි වෙන්නේ ඩීසල් ලීටර් ලක්ෂ 5ක, 6ක, 7ක විතර ප්‍රමාණයක්. තෙල් විෂය භාර ඇමතිවරයා ගල් අඟුරුවලින් කරපු වංචාව වාගේ හතෙන් එකක් තමයි එතැන තිබෙන්නේ.

අපි ජනාධිපතිතුමාටත් කිව්වා, පාර්ලිමේන්තු පක්ෂ නායක කණ්ඩායම් රැස්වීමේදීත් කිව්වා, රටක අර්බුදයක් තිබෙන වෙලාවක පාර්ලිමේන්තුව රැස් කරන්න දෙන්න කියලා. අද මොනවාද වෙලා තිබෙන්නේ? පාර්ලිමේන්තුව බදාදා වහලා. අපි කිව්වා, සඳුදාට ඒකට අවසර දෙන්න කියලා. නමුත් පාර්ලිමේන්තුවේත් කට වහලා, දවසක්. මේ අර්බුදයේ කුණු, හොරකම් කරපු ඒවා එළියට එනවාට අද පාර්ලිමේන්තුව වහලා තිබෙනවා.

අද තෙල් විතරක් නොවෙයි ප්‍රශ්නය. මේ රටේ සියයට 27ක් 28ක් ඉන්නේ ගොවියෝ. දැන් වෙළෙඳ පොළේ පොහොර මිල රුපියල් 3,000කින් විතර වැඩි වෙලා. ගොවියාට පොහොර ගන්න නැහැ. වැවිලි කර්මාන්ත ඇමතිවරයාත් සභාවේ ඉන්නවා. මේ ආණ්ඩුව පොහොරවලට දෙන විසඳුම මොකක්ද කියලා අපි ආණ්ඩුවෙන් අහනවා.

ඒ විතරක් නොවෙයි. සති දෙකකට ඉස්සර වෙලා ජනාධිපතිතුමාත්, විදේශ ඇමතිතුමාත් කිව්වා, "තෙල් අර්බුදයක් නැහැ, ප්‍රශ්නයක් නැහැ" කියලා. අපේ විපක්ෂ නායකතුමා කිව්වා, හෝමුස් සමුද්‍ර සන්ධිය බ්ලොක් වෙනවා, ඒකට විකල්ප මාර්ගයක් ගන්න කියලා. මොනවාද විදේශ ඇමති කිව්වේ? "ඒ ගැන බය වෙන්න දෙයක් නැහැ" කිව්වා. එහෙම නම් ජනාධිපතිවරයා අද කියපු ඒවාත් අපට විශ්වාස කරන්න අමාරුයි. කිව්වා, මේ මාසයේ තෙල් නැව් දෙකක් ආපහු ඇරියා, ලබන මාසයට ඕනෑ තෙල් එනවාලු. ඒ දිනත් එක්ක තොරතුරු දුන්නා. මේ මාසයේ ආපහු ඇරපු තෙල් නැව් තිබෙනවා නම්, ඒවාත් මේ ආණ්ඩුවෙන්ම ඇණවුම් කරපු ඒවා තමයි. අපට පුළුවන් වෙයිද ලබන මාසයේ ජනාධිපතිතුමා කියන තෙල් නැව් ටික ගෙනෙන්න? මට මතකයි, අපේ විපක්ෂ නායකතුමා නිතර නිතර කිව්වා, හැම අවස්ථාවකදීම කිව්වා මේ තෙල් අර්බුදය එනවා කියලා. ආණ්ඩුව ගණන් ගත්තේ නැහැ. මට මතකයි, එතුමා "දිට්වා" සුළි කුණාටුව වෙලාවේ කිව්වා, පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න කියලා. ආණ්ඩුව "බැහැ" කිව්වා. සති දෙකකට පස්සේ ඉදිරිපත් කළා. එතුමා ඒ වෙලාවේම කිව්වා, "හදිසි නීතිය පනවන්න" කියලා. ආණ්ඩුව "බැහැ" කිව්වා.

ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා කිව්වා, ධාරිතාව නැහැ කියලා. අද ලංකාවේ මුතුරාජවෙලත්, කොළොන්නාවේත් තෙල් මෙට්‍රික් ටොන් ලක්ෂ හතරහමාරක ධාරිතාවක් රැස් කරන්න පුළුවන්කම තිබෙනවා. මේ ප්‍රශ්නය එනකොට තිබ්බේ, ලක්ෂ දෙකකට අඩු ගණනක්. ලක්ෂ හතරහමාරක් තිබුණා නම්, දවසකට මෙට්‍රික් ටොන් හත් අටදාහක් යන්නේ, මාස දෙකකට අවශ්‍ය තෙල් තිබෙනවා. ඒ වාගේම දැනට පෙට්‍රල් ලීටරයකට රුපියල් 145ක් බදු ගන්නවා. ඩීසල් ලීටරයකට රුපියල් 100ක් බදු ගන්නවා. අපි ආණ්ඩුවෙන් ඉල්ලුවා දිගින් දිගටම, තෙල් මිල වැඩි කරන්නේ නැතුව, මේ ආණ්ඩුව ගන්න බද්ද අඩු කරන්න කියලා. මට මතකයි, ආණ්ඩුවේ මේ ඇමතිවරු ඡන්දයට ඉස්සර වෙලා කිව්වා, වරායේ බාන ගණනට තෙල් දෙනවා කියලා. එහෙම නම් රුපියල් 180කට විතර, 170කට විතර දෙන්න පුළුවන්, පෙට්‍රල්. ඩීසල් දෙන්න පුළුවන් රුපියල් 180කට විතර. ඒ නිසා අපි කියනවා, තෙල් මිල වැඩි කරන්නේ නැතුව කරුණාකරලා ඒ බද්ද අඩු කරලා, එදා පොරොන්දු වෙච්ච ආකාරයට තෙල් ලබා දෙන්න කියලා. ඒ විතරක් නොවෙයි. ජනාධිපතිතුමා උදේ ඇවිල්ලා කිව්වා, අපි බොහොම ස්වාධීනයි, අපට මධ්‍යම ප්‍රතිපත්තියක්, නොබැඳි පිළිවෙතක් තිබෙන්නේ, අපි එක පැත්තක් ගන්නේ නැහැ කියලා. එතුමාම කිව්වා, ඉරාන නැවට අපේ මුහුදු සීමාවට ඇතුළු වෙන්න ඉඩ දෙන්න කියලා ඉල්ලුවා, හෙලිකොප්ටර් දෙකක් බාන්න ඉඩ දෙන්න කියලා ඇමෙරිකාවෙන් ඉල්ලුවා කියලා. නමුත් ඒ පළමුවැනි නැවට ඇතුළු වෙන්න ඉඩ දුන්නේ නැහැ. මම අහනවා ජනාධිපතිතුමාගෙන්, එහෙම නම් දෙවැනි නැව ඒ ප්‍රතිපත්තිය කඩලා ඇතුළට ගෙනාවේ කොහොමද කියලා. දෙවැනි නැව ඇතුළට ගෙනාවේ කාගේ කීමටද, කාගෙන් අවසර අරගෙනද කියලා අපි අහනවා. තමුන්නාන්සේලා කිව්වා, නොබැඳි ප්‍රතිපත්තියක් තිබෙන්නේ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මේ දවස්වල තිබෙනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉෆ්තාර් උත්සවය. ජනාධිපති කාර්යාලයේත් තිබුණා, ඉෆ්තාර් උත්සවය. ඒකට ඔබතුමාත් යන්න ඇති. මැද පෙරදිග එක රටක තානාපතිවරයෙක් සම්බන්ධ වුණේ නැහැ ඒකට. ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ගැන මැද පෙරදිග රටවල් ප්‍රතිචාර දක්වන්නේ මෙහෙමයි.

මේ රටේ ඉතිහාසය ගත්තොත්, කබීර් හෂීම් මැතිතුමා කිව්වා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ වැඩ පිළිවෙළ, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නොබැඳි වැඩ පිළිවෙළ පිළිබඳව. අද ලෝකයේ වෙනත් රටවල් මේ ආණ්ඩුව ගැන තක්සේරු කරන විදිය, එතුමා ගැන හිතන විදිය, රජයේ ප්‍රතිපත්තිය ගැන කල්පනා කරන විදිය තමයි ඉෆ්තාර් උත්සවයට එකම එක මැද පෙරදිග රටක නියෝජිතයෙක්වත් ආවේ නැති එකෙන් පෙනෙන්නේ. එහෙනම් අද අපි ජනාධිපතිතුමාට කියනවා, මේ අර්බුදය විසඳන්න ඉස්සර වෙලා තමුන්නාන්සේගේ විදේශ ප්‍රතිපත්තිය හදාගන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. S.M. Marikkar. You have nine minutes.

[අ.භා. 2.38]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම දැන් මැද පෙරදිග තිබෙන තත්ත්වයත් එක්ක ලෝකයේ තෙල් අර්බුදයක් - බලශක්ති අර්බුදයක්- ඇවිල්ලා තිබෙන බව හැබෑව. ඒ තුළ මේ රටේ පරිභෝගිකයන්ගේ පරිභෝජනය සීමා කිරීම සඳහා ආණ්ඩුව රුපියල් 24කින් තෙල් මිල ඉහළ දමා තිබෙනවා. නමුත් පෙර සිටම වරායෙන් බාන ගාණට තෙල් දෙනවා කියපු මේ "කටින් බාස්ලා" දැන් තෙල් ලීටරයකට රුපියල් 128කට වඩා බදු ගහනවා. මේ රටේ ජනතාව ගැන ආණ්ඩුවට අබමල් රේණුවක හෝ සංවේදීභාවයක් තිබෙනවා නම් මේ වෙලාවේ තෙල් මිල වැඩිවීම නිසා බස් ගාස්තුවේ ඉඳලා, පරාටා එකේ ඉඳලා, කොත්තු රොටියේ ඉඳලා, බෙහෙත්වල ඉඳලා, පෙළ පොත්වල ඉඳලා මිල ඉහළ යන එක පාලනය කරන්න රුපියල් 70කින් විතරවත් බදු අඩු කරන්න පුළුවන්කම තිබුණා. අන්තිම දවස් හතරේ social mediaවල fake profilesවලින් ගෙන යන campaign එකේ තිබෙන්නේ මොකක්ද? "අනුර කුමාර අපේ එකා" කියනවා. අපේ එකා සහන දෙන විදිය තමයි මේක! අමාරුම වෙලාවේ රුපියල් 128ක් බදු වශයෙන් ගහලා, ඊට අමතරව තව රුපියල් 24කින් වැඩි කරලා තමයි අපේ එකා සහන දෙන්නේ. ඇත ගම් දනව්වල ඉන්න මිනිස්සුන්ට, ජීවිකාව කරගන්න බැරි මිනිස්සුන්ට සහනයක් ලබා දෙන්න තරම් තෙතමනයක් තිබෙනවා නම්, මේ මිල රුපියල් 70කින්වත් අඩු කර ගැනීමේ ක්‍රමයක් හදන්න තිබුණා. ඒ දවස්වල කිව්වේ කංචන කොමිස් ගහනවා, මහින්ද හොරා කනවා, අරයා හොරා කනවා, මෙයා හොරා කනවා කියලා. නේද? අරු හොර, මූ හොරා කියපු කට්ටිය, 225දෙනාම හොරු කියපු කට්ටිය දැන් 225දෙනාම හොරුද බලන්න කණ්ණාඩියක් ඉස්සරහට ගිහිල්ලා බලන්න කියලා අපි ආරාධනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැද පෙරදිග තමයි අර්බුදය තිබෙන්නේ, ඉරානයේ, ඩුබායිවල, කටාර්වල සහ ඊශ්‍රායලයේ. හැබැයි, යුද්ධයට කලින් ඉඳලා බාල ගල් අඟුරු ගෙනාවේ කොහේ ඉඳලාද? දකුණු අප්‍රිකාවේ ඉඳලා. ඒවා එන්නේ ඉන්දියන් සාගරය දිගේ. මැද පෙරදිග තිබෙන එක අවදානමක්වත් මේ බාල ගල් අඟුරු ගේන එකට නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොන්ත්‍රාත් එක අනුව මේ ගල් අඟුරු නැව් 25 අප්‍රේල් මාසයේ 22වැනි දාට එන්න නියමිතව තිබුණා. හැබැයි, 22වැනි දාට එන්නේ නැති නිසා දැනට නැව් 12ක් පරක්කු වෙලා තිබෙනවා. ආපු නැව් 12ම පරක්කුයි. එහෙම පරක්කු වුණත්, ඒ කොම්පැනියට තිබෙන අප්‍රමාණ සෙනෙහස නිසා, තව සතියක් වැඩි කරලා reschedule කරලා දුන්නා. අප්‍රේල් මාසයේ 30වැනි දා වෙනකොටත් මේ ගල් අඟුරු නැව් 25 ගෙනෙන්න බැරි වෙනවා. ගෙනෙන්න බැරි වෙන නිසාම නැව් 5කට හදිසි මිලදී ගැනීමක් දැම්මා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ හදිසි මිලදී ගැනීම් ටෙන්ඩර් එකේ දෙවැනියට ආපු සමාගමට ටොන් එකක් ඩොලර් 142ට ලබාගන්න ටෙන්ඩර් එක දෙනවා. මේ සමාගමට මේ ටෙන්ඩරය ලබා දීම නිසා ටොන් එකකට ඩොලර් 30ක් බැගින් වැඩිපුර ගෙවන්න ඕනෑ. ඩොලර් 30න් වැඩි කළාම නැව් 5ට ඩොලර් මිලියන 9ක් ගෙවන්න ඕනෑ, වැඩිපුර. ඒක පුණ්‍ය ශ්‍රී කුමාර ජයකොඩිගේ ගෙදරින්වත්, අනුර කුමාර දිසානායකගේ ගෙදරින්වත්, පැලවත්තේ කැට මුදලින්වත් නොවෙයි ගෙවන්නේ. ඒක ගෙවන්න වෙලා තිබෙන්නේ මේ රටේ ජනතාවගේ බදු

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මුදල්වලින්. මේවා මම කියන ඒවා නොවෙයි. මේවා අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවට ඇවිල්ලා නිලධාරින් දුන්න උත්තර. නැත්නම් කියයි මේවා අපි කියන ඒවා කියලා. මේ ඩොලර් මිලියන 9 ඒ කාගේවත් accountsවලින් යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ගොවියා, කම්කරුවා, ධීවරයා තෙල් පෝලිමේ ඉන්නවා. ත්‍රීවිල් රථ රියැදුරු මහත්වරු ස්ටිකර් ගහගෙන ගියේ "මේ පාර අපි මාලිමාවට" කියලා. දැන් ඒ මහත්වරු ස්ටිකර් ටික ගලවාගෙන පෝලිමේ ඉන්නවා. අපට කනගාටුයි, ඒ ගැන. Uber, ව්‍යාපාර කරගන්න බැරිව පෝලිමේ ඉන්නවා. සංචාරක කර්මාන්තය කඩා වැටිලා තිබෙනවා මේ තෙල් අර්බුදය නිසා. සාමාන්‍යයෙන් විදුලි බලය උත්පාදනය කරන්න මාසයකට මෙට්‍රික් ටොන් 1,500ක් තමයි ඩීසල් ලබා දුන්නේ. මේ වංචාව නිසා, මේ අර්බුදය වෙලාවේ තෙල් ලබා ගැනීම සඳහා මිනිස්සු පෝලිමේ සිටින වෙලාවක ඩීසල් මෙට්‍රික් ටොන් 1,500 සිට මෙට්‍රික් ටොන් 5,000 දක්වා ඩීසල් මෙට්‍රික් ටොන් 3,500ක් විදුලිය ලබාදීම සඳහා වැඩිපුර වැය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේවා මම කියන දේවල් නොවෙයි. මේවා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ඊයේ කමිටුවේදී කියපු දේවල්, ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දූෂණයක් නැහැ, වංචාවක් නැහැ, රුපියලක්වත් හොරකම් කරන්නේ නැහැ කියන ආණ්ඩුවට මේ නැව් 12න්, පළමුවැනි නැව් 9ක විතරක් පාඩුව රුපියල් මිලියන 8,497යි. ඒකත්, පෙර ඩීසල් rate එක අනුව. එතකොට මේ මිලියන 8,497ක පාවිච්චි කරන ඩීසල් ප්‍රමාණයත් එක්ක, ඒක තව වැඩි කළාම නැව් 9න් රුපියල් මිලියන 10,000කට වැඩිය පාඩුයි. එතකොට නැව් 12ක පාඩුව මිලියන 12,000කට කිට්ටු ප්‍රමාණයක් වෙනවා. මේවාට උත්තර දෙන්නේ නැහැ. මේ ඇමතිවරයා ඇවිල්ලා සම්පූර්ණයෙන්ම මේ මන්ත්‍රීවරු 159දෙනාගේම මුහුණේ දැලි ගාන්න තමයි කටයුතු කර තිබෙන්නේ. අනේ මම දන්නේ නැහැ, ජනාධිපතිතුමාත් මොකක් නිසාදෝ මන්දා තමන්ගේ මිත්‍රයාව රකින්න යනවා. පැලවත්තේ විරෝධතාව මත එතුමා තමන්ගේ මිත්‍රයාව රකින්න යනවා කියලා තමයි අපට ආරංචි. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නැව් 12ම ප්‍රමාදයි. මේ නැව්වලින් ප්‍රමාද ගාස්තු අය කරන්න ඕනෑ. අර සමාගමට කොච්චර සෙනෙහසක් තිබෙනවා ද කියනවා නම්, අද වෙනකම් ප්‍රමාද ගාස්තු විදියට රුපියලක් අය කරලා නැහැ. මේවා මම කියන ඒවා නොවෙයි, අපේ කාරක සභාවට එන ගල් අඟුරු සමාගමේ අය කියපු ඒවා. පළමුවැනි නැව් 5ට විතරක් ඩොලර් 445,000ක් දඩ ගහන්න ඕනෑ. තවම ඒකත් අරගෙන නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කටින් බතල කොළ හිටවලා, Facebook profileවල විවිධ updates කළාට මේක තමයි ඇත්ත තත්ත්වය. මොකද, මේ ඇමතිවරයා තමයි A5 නාළිකාව ආරම්භ කරන්න මුදල් ලබා දුන්නේ කියලා කථාවක් තිබෙනවා. ඒකේ ඇත්ත, නැත්ත මම දන්නේ නැහැ. ඉතින් ඕවා තියාගෙන ඉන්න පුළුවන්. හැබැයි, මහ පොළොවේ යථාර්ථය මොකක්ද? මොකද, රුපියල් 50ට comments දමන team හිටියාට, ඡන්දය දමන්න ඒගොල්ලන්ට බැහැ. රුපියල් 50ට comments දමන team එකට පුළුවන්, එක ඡන්දයක් දමන්න. දවසකට comments 200ක් දමනවා වාගේ ඡන්ද 200ක් දමන්න බැහැ. ඒ නිසා මහ පොළොවේ මේ යථාර්ථයත් එක්ක දැන් දෙවියයේ සරදමට මුහුණ දීලා තිබෙනවා.

අද ජනාධිපතිතුමා කිව්වා, බලශක්ති මාෆියාවක් තිබුණා කියලා. ජනාධිපතිතුමා කියපු කථාව ඇත්ත. ගෑස්වල මාෆියාවක් තිබුණා, අවුරුදු ගණනක්. තෙල් ගෙනෙන එකේ මාෆියාවක් තිබුණා. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? ඒ මාෆියා එක කඩද්දී තව මාෆියා එකක් නිර්මාණය වෙන විධියට තමයි මේ කතන්දරය සිද්ධ වෙලා තිබෙන්නේ. දැන් ලොකුවට කිව්වා, "අහවල් දවස් වෙනකම් තෙල් තිබෙනවා, අහවල් දවස් වෙනකම් තෙල් තිබෙනවා, මේ දවස්වල නැව් එනවා" කියලා. ඇත්ත වශයෙන්ම මේ මාසයේ එන්න තිබුණු crude oil නැවක් cancel වුණා. ඒ නිසා තමයි 17වැනි දා ටෙන්ඩර් එකක් දාන්න වුණේ. ඒකත් ඉන්දියාවෙන් සහ සිංගප්පූරුවෙන් ගන්න සිද්ධ වෙලා තිබෙනවා. මැලේසියාවේ ත් තෙල් තිබෙනවා. නමුත්, ඔවුන් දෙන්නේ නැහැ. රුසියාවත් බැහැ කියලා තිබෙනවා.

විජිත හේරත් ඇමතිතුමා රුසියාව එක්ක කොච්චර සාකච්ඡා කළත්, ඇමෙරිකාව පස්සෙන් ගිහිල්ලා ලෙවකාපු හින්දා රුසියාව දැන් කණකොකා පෙන්නලා, අපට තෙල් දෙන්න බැහැ කියලා කියනවා. ඒ නිසා දැන් ඇල්ජීරියාවෙනුයි, ඇමෙරිකාවෙනුයි තෙල් ගේන්න try කරනවා. මේවා අපි කියන දේවල් නොවෙයි. මේවා නිල තොරතුරු. ඇල්ජීරියාවෙනුයි, ඇමෙරිකාවෙනුයි තෙල් එනකොට ගාණ කොහොම වැඩි වෙයි ද කියලා අපි දන්නේ නැහැ. ඉතින්, මේ සා විශාල පාඩුවක් වෙලා තිබියදී, හදිසි මිලදී ගැනීම් නිසා ඩොලර් මිලියන 9ක් වැඩිපුර ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම, පළමුවැනි නැව් 5න් ප්‍රමාද ගාස්තුව වන ඩොලර් 445,000ක් තවම අය කරගෙන නැහැ. ඒ වාගේම නැව් 12ක තිබුණු බාල ගල් අඟුරු නිසා රුපියල් මිලියන 12,000කට වඩා වංචාවක් වෙලා තිබෙනවා. ඒ එකක්වත් අරගෙන නැහැ. හැබැයි, මම දන්නේ නැහැ, වල් පැළ අයින් කරලා මල් පැළ ගෙනැල්ලා, මේ වාගේ වංචාවකදී මල් පැළවලට කඩේ යන්න සිද්ධ වීම ගැන. ඒ ගැන මට නම් තේරෙන්නේ නැහැ.

ඊළඟට මේ කාරණයත් පැහැදිලි කරමින් මගේ කථාව අවසන් කරන්නම්. කෙහෙළිය රඹුක්වැල්ල හිටපු ඇමතිවරයා බාල බෙහෙත් ගෙනැල්ලා මිනී මරපු කාලයේ ඔහුට විරුද්ධව සමගි ජන බලවේගය විශ්වාස භංගයක් ගෙනාවා. JVP එක නොවෙයි, අපි තමයි එය ගෙනාවේ. වර්තමාන අගමැති ගරු ආචාර්ය හරිනි අමරසූරිය මෙනෙවිය එදා මේ පාර්ලිමේන්තුවේදී කළ කථාව ඇතුළත් හැන්සාඩ් වාර්තාවෙන් එය උපුටා දක්වමින් මගේ කථාව අවසන් කරනවා.

"මට කියන්න තිබෙන්නේ අමාත්‍යතුමා ඇතුළු මේ ආණ්ඩුව තුළ තවදුරටත් චුට්ටක් හරි හෘදය සාක්ෂිය කියලා දෙයක් තිබෙනවා නම් මීට වඩා ජනතාවගේ පැත්තේ හිටගෙන තීන්දු තීරණ ගත යුතු බවයි. මේක දේශපාලන වශයෙන් ගන්න හෝ ආණ්ඩුවක් රැක ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මේක මේ රටේ මිනිසුන්ගේ ජීවිත පිළිබඳ ප්‍රශ්නයක්. චුට්ටක් හරි හෘදය සාක්ෂියක් ඉතිරි වෙලා තිබෙනවා නම් ජනතාවගේ පැත්තේ හිටගෙන තීන්දු තීරණ ගන්න කියන ඉල්ලීම කරමින් මම නතර වෙනවා."

මට කියන්න තිබෙන්නෙත් මෙතුමාට විරුද්ධව මේ වංචාව සම්බන්ධව තීරණ ගන්න තිබෙන්නේ ඒ විධියට කියන එකයි. මොකද, අර්ජුන රණතුංග ඇමතිවරයාටත්, ධම්මික රණතුංග සභාපතිවරයාටත් නඩු වැටුණේ හොරකම් කළා කියලා නොවෙයි, රජයට මිලියන 800ක මූල්‍ය අලාභයක් කළා කියලා. ඒ වාගේ දහ පහළොස් ගුණයක මූල්‍ය අලාභයක් මේ රටේ පාරිභෝගිකයන්ට කරපු මේ ඇමතිවරයාව රකින්න මේ වල් පැළ අයින් කරලා ආපු මල් පැළවලට හෘදය සාක්ෂියක් තිබෙනවාද කියන එක තමයි මට අහන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. K.V. Samantha Viddyarathna. You have 12 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Mrs.) Thushari Jayasingha to the Chair?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

Sir, I propose that the Hon. (Mrs.) Thushari Jayasingha do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.*

[අ.භා. 2.48]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගෝලීය වශයෙන් ඇති වෙච්ච බල දේශපාලනයේ අර්බුදයකට ගිය මොහොතක, ලෝකයේ යුද තත්ත්වයක් වර්ධනය වෙලා තිබෙන මොහොතක අපි වාගේ රටවල් විතරක් නොවෙයි, ලෝකයේ ආර්ථික වශයෙන් ශක්තිමත්, දැවැන්ත රටවල් පවා අර්බුදවලට මුහුණ දීලා තිබෙනවා කියන එක අපි කවුරුත් දන්නවා. එවන් මොහොතක, අපේ රටේත් ජාතික දේශපාලනයේ පසුගිය කාලයේ ඇති වෙච්ච කම්පනයන් එක්ක, අර්බුද එක්ක, ඒ අර්බුදයට ලක් වෙච්ච සමහර විපක්ෂ කණ්ඩායම් පත් වෙලා තිබෙන අර්බුදය අපි මෙතැන බලාගෙන හිටියා. මොකද, විපක්ෂයෙන් ඒ නගපු තර්ක දිහා බැලුවාම ඔවුන් ඇද වැටිච්ච තැන අපට පෙන්නුම් කළා. සමහර තර්ක ගත්තාම, අර ගම්වල කියන විධියට ඒවා මරි මෝඩ තර්ක. එවැනි තර්ක පැන නැඟෙන ආකාරයක් අපට පෙනෙනවා. නමුත්, රටේ බුද්ධිමත් ජනතාවට මේක තේරෙනවා ඇති කියලා මම හිතනවා.

එක පැත්තකින්, ලෝකයේ ඛනිජ තෙල් අර්බුදය ගත්තොත්, මේ යුද තත්ත්වය නිසා බහුතරයක් රටවල් මේ තත්ත්වය කළමනාකරණය කර ගන්නට ඛනිජ තෙල් මිල ඉහළ දමා තිබෙනවා කියන කාරණය ඊයේ පෙරේදා පුවත්පත්වල පළ වුණා, අපි දැක්කා. ආසියානු කලාපයේ රටවල් කිහිපයක් ගැන මතක් කළොත්, කාම්බෝජය සියයට 68කින් තෙල් මිල ඉහළ නංවා තිබෙනවා. වියට්නාමය සියයට 50කින් මිල ඉහළ නංවා තිබෙනවා. ලාඕසය සියයට 33කින් තෙල් මිල ඉහළ නංවා තිබෙනවා. පාකිස්ථානය සියයට 18කින් මිල ඉහළ නංවා තිබෙනවා. පිලිපීනය සියයට 12කින් මිල ඉහළ නංවා තිබෙනවා. දකුණු කොරියාව සියයට 10කින් මිල ඉහළ නංවා තිබෙනවා. ඉන්දුනීසියාව සියයට 9කින් මිල ඉහළ නංවා තිබෙනවා. අපි සියයට 8කින් මිල ඉහළ නංවා තිබෙනවා. ඒ වාගේම ලෝකයේ දියුණු රටවල් ගත්තොත්, කැනඩාව සියයට 28කින් මිල ඉහළ නංවා තිබෙනවා. ඇමෙරිකාව සියයට 20කින් මිල ඉහළ නංවා තිබෙනවා. ඕස්ට්‍රේලියාව සියයට 25කින් මිල ඉහළ නංවා තිබෙනවා. නවසීලන්තය සියයට 20කින් මිල ඉහළ නංවා තිබෙනවා. මේ රටේ බුද්ධිමත් ජනතාව තේරුම් ගනියි කියලා මම හිතනවා, අපේ ශ්‍රී ලංකාව මිල ඉහළ නංවා තිබෙන්නේ සියයට 8යි කියන එක. නමුත් දැන් මේ විපක්ෂයට වෙලා තිබෙන විපත්තිය රටේ ජනතාව දන්නවා. මේක රටේ ජනතාවට තේරෙනවා. රටේ ජනතාවට බර පටවන්නේ නැතුව පුළුවන් තරම් ඔවුන්ට වෙන්න පුළුවන් පීඩාව අවම කරමින් කටයුතු කරන දේශපාලන ව්‍යාපාරයක් බලයට පත් වෙලා තිබෙනවා කියන එක ඔවුන් දන්නවා. මේ තත්ත්වය තුළ ජනතාවට ප්‍රශ්නයක් නොවුණා කියලා අපි කියන්නේ නැහැ. ජනතාවටත් මේක විඳ දරා ගන්න සිද්ධ වෙන අවස්ථා තිබෙනවා. මුහුණ දෙන්න වෙන අවස්ථා තිබෙනවා. ඒක අපි කාටත් පොදුයි.

අපට මේ කාලයේ යම් කෙටි කාලීන දුෂ්කරතාවලට මුහුණ දෙන්න වෙනවා. කෙටි කාලීන දුෂ්කරතාවලට මුහුණ දෙමින් අපි දීර්ඝ කාලීන ජයග්‍රහණ බලාපොරොත්තුවෙන් අදාළ සැලසුම් නිර්මාණය කර තිබෙනවා. නව රජය හැටියට - ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට - මේ රජය බලයට පත් වෙන මොහොතේ සිට මුහුණ දුන් ප්‍රධාන අභියෝග අතරින් තුන්වන අභියෝගයට තමයි දැන් මේ මුහුණ දෙන්නේ. මොකද, අපට භාර දෙනකොටම අභියෝගයක් තිබුණා. ආර්ථික වශයෙන් බිඳ වැටිච්ච, සමාජීය වශයෙන් බිඳ වැටිච්ච, ජාතිවාදය, ආගම්වාදය ඇවිස්සුණු රටක් තමයි අපට භාර දුන්නේ. ඒවා සියයට 100ක් සමනය කළා කියලා අපි කියන්නේ නැහැ. සැලකිය යුතු විධියට කළමනාකරණය කරලා, සැලකිය යුතු ජයග්‍රහණ ප්‍රමාණයක් අරන් දීපු බව ජනාධිපතිතුමා අදත් හොඳින්ම පැහැදිලි කරලා දුන්නා. රටේ ආර්ථිකය ගෙනැල්ලා තිබෙන්නේ කොතැනටද, අපේ රටේ අය වැය හිඟයක් තිබුණු එක කොච්චර සමනය කරගෙන තිබෙනවාද, අපි ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් කොච්චර ජයග්‍රහණ ලබාගෙන තිබෙනවාද කියන එක එතුමා පැහැදිලි කළා.

ඒ පළමු අර්බුදය අපි සැලකිය යුතු ප්‍රමාණයකට සමනය කරගෙන එනකොට, අපට දෙවැනියට මුහුණ දෙන්න වුණා, ඔබතුමන්ලා ආණ්ඩු කරපු කාලවල කවදාවත් නොවුණු ආකාරයේ ස්වාභාවික ආපදාවකට. ඒ, "දිට්වා" සුළි කුණාටුවට. විපක්ෂය එදාත් මේ වාගේ විවිධ චෝදනා නැඟුවා. ඔවුන් බලාපොරොත්තු වුණා, අපට ඒක කළමනාකරණය කරගන්න බැරි වෙයි කියලා. මම තවම කියන්නේ නැහැ, ඒ ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳුණා කියලා. හැබැයි, අපි ඒක සාර්ථක ලෙස කළමනාකරණය කර ගත්තා. මම මේ රටේ ජනතාවට කියනවා, ජාත්‍යන්තර මට්ටමේ, ගෝලීය මට්ටමේ ඇති වෙච්ච මේ යුදමය තත්ත්වය නිසා බලශක්ති ක්ෂේත්‍රය ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවල ඇති වන ගැටලු අපි සාර්ථක ලෙස කළමනාකරණය කර ගනිමින් තිබෙන බව. ඒක රටේ ජනතාවට තේරෙනවා. මට මතකයි, ඔබතුමන්ලා ආණ්ඩු කරන කාලයේ ඇති වුණු තෙල් අර්බුදයේදී සති ගණන් පෝලිම්වල ගෑස් ටැංකි දම්වැල් දාලා බැඳලා තිබුණා, ඒ වාගේම පෝලිම්වල මිනිස්සු මැරුණා. QR code එක හදාගන්නත් එදා මාසයක් ගියා. මාසයක් තිස්සේ හදපු QR Code එකේ ගැටලු විසඳාගන්න තවත් සති දෙකකට වැඩිය ගියා. නමුත්, මේ වාගේ සංකීර්ණ තත්ත්වයක් තුළදීවත් ඒ සඳහා අපට එහෙම කාලයක් ගිහින් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉරානයට ඊශ්‍රායලයයි, ඇමෙරිකාවයි මිසයිල ගහනවා. ඉරානයත් මිසයිල ගහනවා. විපක්ෂයත් මේ රටට මිසයිල ගහනවා. හැබැයි, ඒ මිසයිල පුස් මිසයිල. ජාතික ජන බලවේගය නැමැති Iron Dome එක හොඳටම

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

ක්‍රියාත්මක වනවා. ඒ හින්දා ඒවා එච්චර සාර්ථක වෙන්නේ නැහැ. "දිට්වා" සුළි කුණාටුව ඇති වූ වෙලාවේත්, අනෙකුත් වෙලාවලත් ඇති වුණු ඒවාත් අපි පැරැද්දුවා වාගේම මේ රටේ ජනතාවට අපි කියනවා, අපි මේ තත්ත්වයටත් සාර්ථකව මුහුණ දෙන බව. යම් අපහසුතාවක් තිබෙනවා, අපි ඒ ගැන කනගාටු වනවා. නමුත්, රටේ ජනතාව බුද්ධිමත් ලෙස තේරුම් ගත්තොත්, මේක රට අභ්‍යන්තරයේ පැන නැඟුණු ප්‍රශ්නයක් නොවෙයි කියලා පෙනෙනවා.

ඔබතුමන්ලාගේ වෙලාවේ පෝලිම් නිර්මාණය වුණේ ජාත්‍යන්තර ප්‍රශ්නයක් හින්දා නොවෙයි, පැවති ආණ්ඩුවල තිබුණු කළමනාකරණයේ දුර්වලතාවක් නිසා. දැන් තිබෙන ප්‍රශ්නය එහෙම ප්‍රශ්නයක් නොවෙයි. එදා තිබුණේ තෙල් ගේන්න ඩොලර් නැතිකම. එදා තිබුණේ ගෑස් ගේන්න ඩොලර් නැතිකම. අද ඩොලර් තිබෙනවා. හැබැයි, තෙල් ටික ගේන්න, ගෑස් ටික ගේන්න ගියාම ප්‍රශ්න තිබෙනවා. මොකද, ඒ රටවල සැපයුම්ජාල දුර්වල වෙලා තිබෙනවා. නැව් සමාගම් ගාස්තු ඉහළ නංවා තිබෙනවා. නැව් සමාගම් සමහර නැව් එවන්නේත් නැහැ. රක්ෂණ වාරිකත් ඉහළ ගිහිල්ලා තිබෙනවා. එම නිසා දැන් ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතනවා, ඔබතුමන්ලාට ඒක නොතේරෙනවා නොවෙයි කියලා. නමුත්, මේ රටේ ජනතාවට ඒක තේරෙනවා. ඒ හින්දා මේ තත්ත්වය අපි සියලුදෙනා තේරුම් ගන්න ඕනෑ.

අපි මේ තත්ත්වයට පත් වුණාට පස්සේ විපක්ෂය නඟන තර්ක ගැනයි මම මේ කියන්නේ. විපක්ෂයත් මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ. විපක්ෂ නායකතුමාටත් දැන් කියන්න වෙන්නේ, විපක්ෂ නායක නොවෙයි, "විපත්ති නායක" කියලායි. පසුගිය දවස්වල එතුමා කරපු කථා ටික හොඳට අධ්‍යයනය කරලා බලන්න. එතුමා කියන්නේ එකම කථා ටිකක්. භාණ්ඩාගාරය පිරී ඉතිරී ගිහිල්ලා. මේක බෙදන්න, මේක බෙදන්න, මේක බෙදන්න කියනවා. විපක්ෂ නායකතුමා ඒක කියන්න අවශ්‍ය නැහැ. ජනාධිපතිතුමා ඇතුළු වර්තමාන රජය මේ බෙදීම් සාධාරණ ලෙස කරමින් ඉන්නේ. අපි භාණ්ඩාගාරයේ අතිරික්ත ධනයක් පුරවාගත්තා තමයි. ඔබතුමන්ලාගේ කාලයේදී කර ගන්න බැරි වෙච්ච එක අපි කළා, අපි මහා භාණ්ඩාගාරය පිරෙව්වා. දැන් ඒවා මොකටද තිබෙන්නේ? ඒවා පුරවාගෙන අපි නිකම් තියාගෙන ඉන්නේ නැහැ. මේ රටේ පීඩාවට පත් වෙච්ච ජනතාවට අපි ඒවා බෙදනවා.

ඊළඟට, "දිට්වා" සුළි කුණාටුව ආවා. අපි ලෝකයෙන් ණය ගත්තේත් නැහැ. රටේ ආයතනවලින් ණය ගත්තේත් නැහැ. අපි පරිපූරක ඇස්තමේන්තුවක් දාලා රුපියල් බිලියන 500ක් වෙන් කළා, "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වෙච්ච ජනතාවට බෙදන්න. ඉතිහාසයේ කවදාවත් වුණේ නැති විධියට ඒ වෙලාවේ අපි ජනතාවට සහන ලබා දුන්නා. ගෙයක් අපවිත්‍ර වුණා නම් ඒක සුද්ද කර ගන්න රුපියල් 25,000ක් දුන්නා. කුස්සියේ - මුළුතැන්ගෙයි - බඩුවලට හානියක් වුණා නම් රුපියල් 50,000ක් දුන්නා. ගෙයක් විනාශ වුණා නම් - පූර්ණ හානි වුණා නම් - රුපියල් ලක්ෂ 50ක් දුන්නා. එහෙම මුදල් බෙදුවේ කවදාද? ඒවා බෙදුවේ භාණ්ඩාගාරයෙන් තමයි. ඉස්සර භාණ්ඩාගාරයේ තිබුණු මුදල් බෙදා ගත්තේ ඔබතුමන්ලා. ජනාධිපති අරමුදලේ මුදල් බෙදා ගත්තේ ඔබතුමන්ලා. දැන් මේ රටේ ජනතාවට ඒ මුදල් බෙදන බව විපක්ෂ නායකතුමා නොදන්නවා නොවෙයි කියලා මම කියන්න කැමැතියි.

භාණ්ඩාගාරය පුරවපු ඒවායෙන් තමයි අපි වතු කම්කරුවාගේ වැටුප වැඩි කළේ. මේ රටේ පීඩාවට පත් වෙච්ච වතු කම්කරුවාගේ වැටුප වැඩි කරන්න අපි ඒ මුදල් දුන්නා, ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා. මේ රටේ තේ කර්මාන්තයට ශක්තියක් වෙන්න අපි ඒ මුදල් දුන්නා. මේ රටේ රාජ්‍ය සේවකයාගේ පඩිය අපි වැඩි කරලා දුන්නා, භාණ්ඩාගාරයේ මුදල්වලින්. ඔබතුමන්ලාගේ කාලයේ අවුරුදු 5ක් රාජ්‍ය සේවයට නිලධාරින් බඳවා ගත්තේ නැහැ. අපි නව රැකියා ලක්ෂයකට වැඩිය අනුමත කරලා, දැන් එම පත්වීම් දෙමින් තිබෙනවා. ඔබතුමන්ලා ඉස්සර භාණ්ඩාගාරය පුරවාගෙන ඒකට ෂොට් එක දුන්නා වාගේ මෙතැන එහෙම එකක් වෙන්නේ නැහැ. ඒ හින්දා මේවා තේරුම් ගන්න කියලා මම කියන්න කැමැතියි.

ඊළඟට, මෙතුමන්ලා තව අපූරු කථාවක් කියනවා. මේ වාගේ යුද්ධයක් ලෝකයේ ඇති වනවා කියලා පසුගිය අවුරුද්දේ ජුනි, ජූලි මාසවල ඉඳලා දැනගෙන තිබුණා, වර්තමාන රජය ඒකට සූදානම් වුණේ නැහැ කියනවා. මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. මේ අයට තිබුණු විශේෂඥ ඥානය ඇමෙරිකාවට දෙන්න තිබුණා, ඉරානයට දෙන්න තිබුණා, "මේ වාගේ යුද්ධයක් එනවා, සූදානම් වෙන්න" කියලා. ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා මේ ඥානය දෙන්න තිබුණා. දැන් ඒ රටවල් පවා අපට වැඩිය තෙල් මිල වැඩි කරලා තිබෙනවා. දැන් ඒ රටවලත් අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුනුත්, මහ ලේකම් වන අපේ මද්දුම බණ්ඩාර මහත්තයාත් කියනවා, මාස ගාණකට ඉස්සෙල්ලා මේ ගැන දැනගෙන හිටියාලු. ඒ රටවලට ගිහින් මේ අයගේ ඥානය ලබා දෙන්න තිබුණේ. එච්චර ඥානවන්ත නායකයින්ගෙන් මම අහන්න කැමැතියි, ඔබතුමන්ලාට වෙන වැඩේ දැනගෙන හිටියේ නැද්ද, මැතිවරණ කාලයේදී විපක්ෂයට වෙන වැඩේ දැනගෙන හිටියේ නැද්ද, පක්ෂයේ අභ්‍යන්තරව තිබෙන ආරවුල් ගැන දැනගෙන හිටියේ නැද්ද කියලා. මම විපක්ෂ නායකතුමාව දැනුවත් කරන්න කැමැතියි, ඔබතුමාට ලෝකයේ ම ඒවා තේරෙනවා, හැබැයි ඔබතුමාගේ පක්ෂයට වෙන වැඩේ තේරෙන්නේ නැහැ කියන එක ගැන. ඔබතුමාගේ පක්ෂයේ අභ්‍යන්තර කල්ලි, කණ්ඩායම් නිර්මාණය වෙලා තිබෙනවා කියලා ඔබතුමාට තේරෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඕකට කරන්න යන වැඩේ තේරෙන්නේ නැහැ. දැන් ගැටගහන ඒවා තේරෙන්නේත් නැහැ. *[බාධා කිරීම්]* මේවා කියනකොට වේදනායි. ඒක ඇත්ත. හැබැයි, ඒක තමයි ඇත්ත කතන්දරය. ලෝකයේම වෙන දේවල් තේරෙන, තමන්ට වෙන දේවල් නොතේරෙන විපත්ති නායක කෙනෙක් ඉන්නේ. ඒ ගැන කියන්න කනගාටුයි. එතුමා හරි කථා තමයි මෙතැන කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපට ඉන්ධන අර්බුදය විසඳාගන්න පුළුවන්. ඒකට අපට පොඩි කාලයක් දෙන්න. දැනට අපි ඒක කළමනාකරණය කරලා තිබෙනවා. මේක විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් පිළිගනීවි. අපේ ගෙවල්වලට යම් අර්බුදයක් ආවාම අරපරිස්සම කියලා දෙයක් කරනවා. ඒ නිසා අපිත් QR code එකක් දමලා යම් විධියකට අරපරිස්සමක් කරනවා. මොකද, අපි මේ පද්ධතිය අඛණ්ඩව පවත්වාගෙන යන්න ඕනෑ. මේක කඩාගෙන වැටෙන්න දෙන්න බැහැ. ආර්ථිකය වෙන්න පුළුවන්, අධ්‍යාපනය වෙන්න පුළුවන්, වැවිලි වෙන්න පුළුවන්, මොනයම් හෝ ක්ෂේත්‍රයක් වෙන්න පුළුවන්, කඩාගෙන වැටෙන්න දෙන්න බැහැ. ඒ කළමනාකරණය අපි ලස්සනට කරනවා. කැබිනට් මණ්ඩලය ඊට අදාළ අදාළ තීන්දු ගත්තා. අනුකමිටු ටික පත් කරලා අවශ්‍ය තීන්දු අරගෙන වේගයෙන් දැන් ඒ දේවල් ක්‍රියාත්මක වනවා. ඒ නිසා මම මතක් කරන්න කැමැතියි, අපට ඉන්ධනවලට විසඳුම් සොයන්න පුළුවන්, "දිට්වා" සුළි කුණාටුවෙන් පසු ඇති වූ තත්ත්වයන්ට විසඳුම් සොයන්න පුළුවන්, හැබැයි විපක්ෂයට වෙච්ච වැඩේට නම් විසඳුම් සොයලා දෙන්න බැහැ කියන එක. ඒක, ඔබතුමන්ලාම සොයාගන්න.

මා නියෝජනය කරන ක්ෂේත්‍රය ගැන කථා කරන්නත් විනාඩි දෙක තුනක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අපේ අමාත්‍යාංශයට අදාළ කාරණා ටිකක් කියන්නත් ඕනෑ. තේ කර්මාන්තයට යම් ගැටලුවක් නැතිවම නොවෙයි. හැබැයි, අපි ඒ

ගැටලුවලට පූර්ව සූදානමින් ඉන්නවා. මේ ප්‍රශ්න මතුවනකොටම අමාත්‍යාංශය හැටියට අපි මේ ගැන සාකච්ඡා කළා. ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් තේ අපනයනකරුවන්ගේ සහ කර්මාන්තකරුවන්ගේ ප්‍රශ්න ගැන සාකච්ඡා කළා. ඒ වාගේම කර්මාන්ත අමාත්‍යාංශය එක්කත් සාකච්ඡා කරලා මේ ප්‍රශ්නවලට අපි විසඳුම් අරගෙන තිබෙනවා. අපි දන්නවා, අපි නිෂ්පාදනය කරන තේවලට ගැනුම්කරුවෙකු නොහිටියොත් කුඩා තේවතු හිමියන්ගේ දලුවලට මිලක් ගන්න බැහැ, විකුණාගන්න බැහැ කියලා. ඒ සම්බන්ධයෙන් අපට දැනට ලොකු ප්‍රශ්නයක් නැහැ. අපට මුල් දවස්වල තේ අපනයන වෙළෙඳ පොළේ ප්‍රශ්න කිහිපයක් මතු වුණා. නමුත් දැන් සාමාන්‍ය පරිදි තේ දලු ටික අළෙවි වනවා. තේ දළුවල මිල සම්බන්ධයෙනුත් පසුගිය දවස්වල යම් යම් ප්‍රශ්න තිබුණා. අපි දැන් ඒ ප්‍රශ්නයත් යම් මට්ටමකට විසඳා තිබෙනවා.

ජනවාරි මාසයේදී පහතරට තේ දලු කිලෝ එකක් රුපියල් 180යි, 200යි. ඒක පෙබරවාරි මාසය වනකොටත් රුපියල් 180යි, 200යි. ජනවාරි මාසයේදී මැදරට තේ දලු කිලෝවක මිල රුපියල් 150යි, 160යි. පෙබරවාරි මාසයේදී ඒවායේ මිල ටිකක් අඩුවෙලා තිබෙනවා, රුපියල් 150, රුපියල් 155 හැටියට. උඩරට තේ දලුවල මිල ටිකක් වැඩිවෙලා තිබෙනවා. ජනවාරි මාසයේදී රුපියල් 140යි, 150යි. එය පෙබරවාරි මාසය වනකොට රුපියල් 165ක් වෙලා තිබෙනවා. මම මාර්තු මාසයේ මිල කිව්වේ නැහැ. ඒක කියන්න වෙන්නේ මාර්තු මාසය අවසානයේදීයි. ඒකේ ලොකු ප්‍රශ්නයක් නැහැ.

පොල් ක්ෂේත්‍රය ගත්තත්, රබර් ක්ෂේත්‍රය ගත්තත් අපට ලොකු ප්‍රශ්නයක් නැහැ. රබර් අපනයනය කරන මුල් රටවල් 10 ගත්තොත්, ඒ අතර ගල්ෆ් කලාපයේ රටවල් නැහැ. ඒවාට යන්නේ පුංචි ප්‍රමාණයක් නිසා බරපතළ ප්‍රශ්නයක් නැහැ. පොල් අපනයනයේදී ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්. එය කළමනාකරණය කර ගැනීම සඳහාත් අපි දැන් සාකච්ඡා පවත්වා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
භාණ්ඩාගාරය දැන් සූදානමින් ඉන්නවා, මේ තත්ත්වයේ යම් වර්ධනයක් ආවොත් ඒකට මුහුණ දෙන්න. අපට දෙන්න පුළුවන් සහන ලබා දෙනවා. කර්මාන්තකරුවා වෙනුවෙන්, ගොවියා වෙනුවෙන් අපි දැනට යමක් දීලා තිබෙනවා. ඒ වාගේම අපි ඉදිරියටත් සහන ලබා දෙන්න සූදානමින් ඉන්නවා. ඒ නිසා මම මේ කණ්ඩායමට මතක් කරන්න කැමැතියි, ඔබේ ගැටලුවලට අපට උත්තර නැහැ, හැබැයි මේ වාගේ ගැටලුවලට නම් ආණ්ඩුවට උත්තර හොයන්න පුළුවන් කියලා.

ඒ වාගේම මේ රටේ ජනතාවටත් යම් පණිවුඩයක් ලබා දෙන්න මම කැමැතියි. ඕනෑම අර්බුදයකට මුහුණ දෙන්න පුළුවන් රජයක් අපි සකස් කරලා තිබෙනවා. පසුගිය දවස්වල දැවැන්ත අර්බුද ආවත්, මීට කලින් මම පැහැදිලි කළා වාගේ අපි ඒවාට මුහුණ දුන්නා. අපට මේ ඉන්ධන අර්බුදයටත් විසඳුම් හොයාගන්න පුළුවන්. ඒ නිසා තමුන්නාන්සේලා තේරුම් ගන්න, මොන අර්බුදය ආවත් මේ රටේ ජනතාව නැමැති ඉන්ධනය අපි ළඟ ඉන්නකම්, ජනතාව මේක තේරුම් ගන්නකම් ඔබතුමන්ලා දැඟලුවාට වැඩක් වෙන්නේ නැති බව. ඔබතුමන්ලා ප්‍රතික්ෂේප ගණයට වැටිලා ඉන්නේ. අපි මේ රටේ ජනතාවට විශ්වාසයක් හදනවා. මේ රටේ ජනතාවට සිදුවෙලා තිබෙන දෙය, වෙච්ච දේවල්, ගත්ත තීන්දු, කරන්න බැරිවෙච්ච දේවල්, ඒවාට ගත් විකල්ප හා තීන්දු පිළිබඳව ජනාධිපතිතුමා අදත් හොඳින් පැහැදිලි කළා. ඒ නිසා ජනතාවට අප ගැන විශ්වාසයක් තිබෙනවා. මේ රජය පිළිබඳව ඔබතුමන්ලා තුළ විශ්වාසයක් හැදීමේ අවශ්‍යතාවක් අපට නැහැ. අපි මේ රටට විශ්වාසයක් හදලා තිබෙනවා. රජය හැටියට අපි මේ තත්ත්වය කළමනාකරණය කර ගන්නවා විතරක් නොවෙයි, මේ රටේ ජනතාවට වෙච්ච පොරොන්දු එකින් එක ඉෂ්ට කරන්න සූදානම් කියන පණිවුඩයත් මේ මොහොතේ මා ලබා දෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.02]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற உலகின் தற்போதைய நிலை தொடர்பான ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு எனக்கு நேரத்தை ஒதுக்கித் தந்தமைக்கு நன்றியைக் கூறிக்கொள்கின்றேன்.

இன்று உலகில் இவ்வாறான நிலைமைகள் ஏற்படுவதற்கு காரணகர்த்தாக்களான காலனித்துவவாதிகளின் இன வெறியின் வெளிப்பாடாகவே, இஸ்ரேல் எனும் புற்றுநோய் மத்திய கிழக்குப் புனித மண்ணில் உருவாக்கப்பட்டு, இன்றும் ஆயிரக்கணக்கான அப்பாவி பலஸ்தீன மக்கள் நாளாந்தம் கொன்று குவிக்கப்படுகின்றார்கள். இதில் இஸ்ரேலின் இனப்படுகொலையின் அடுத்த நகர்வாக, இன்று மத்திய கிழக்கு யுத்த களமாக மாறிவருகின்றது. கிட்டத்தட்ட 92 சதவீத அமெரிக்க மக்கள் ஈரான் மீதான தாக்குதலை எதிர்த்த நிலையிலும், அமெரிக்க பாதுகாப்புப் பிரிவின் பிரதானிகள் டிரம்பின் முடிவு பிழையான தகவல்களை அடிப்படையாகக் கொண்டது என்று பதவி விலகிய நிலையிலும், அமெரிக்க சனாதிபதி கொடுங்கோலன் டிரம்பின் ஏகாதிபத்திய கொள்கையால் உலக அமைதிக்குப் பாரிய சவாலாக இந்த யுத்தம் மாறியிருக்கின்றது என்பது இங்கு குறிப்பிடத்தக்கது.

ஈரானிய மக்களைக் கொன்றுகுவிக்கும் கொலைவெறித் தாக்குதல்களுக்கும் ஈரானிய பொருளாதார மையங்கள் மீதான தாக்குதல்களுக்கும் அமெரிக்க நேச நாடுகள் கடும் கண்டனத்தைத் தெரிவித்துள்ளன. போலியான சில அனுமானங்களையும் வள ஆக்கிரமிப்பையும் அடிப்படையாகக்கொண்ட இந்த யுத்த மோகமானது, இன்று உலகளாவிய மக்களின் நாளாந்த வாழ்வைச் சீர்குலைத்து, அவர்களைப் பாரிய நெருக்கடிக்குள் தள்ளியிருக்கிறது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இவ்வாறான நிலைமைகள் காரணமாக இன்று எமது நாட்டிலும் மக்கள் மீண்டும் எரிபொருள் நிரப்பு நிலையங்களில் வரிசையில் நிற்கவேண்டிய சூழ்நிலை உருவாகியுள்ளது. அது மட்டுமல்ல, இலட்சக்கணக்கான குடும்பங்கள் ஒரு வேளை சாப்பாட்டுக்கு வழியில்லாமல் கஷ்டப்படுகின்றன. அவர்களது கஷ்டத்திலும் இந்த யுத்தம் கைவைத்துள்ளது என்பதுதான் உண்மை! இந்த யுத்தத்தை ஆரம்பித்த அமெரிக்காவும் இஸ்ரேலும் உடனடியாக யுத்தத்தை நிறுத்துவதற்குரிய

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

ஏற்பாடுகளைச் செய்ய வேண்டும். இல்லாவிட்டால், இந்த உலகின் நிலைமை எவ்வாறு அமையும் என்பதை நாங்கள் பொறுத்திருந்துதான் பார்க்க வேண்டும்.

பதில் தாக்குதல் நடாத்தும் ஈரான் சரியான எதிரிகளையே தாக்க வேண்டும். தமது நாட்டைத் தாக்குவதற்கு உதவினார்கள் அல்லது எதிர் தாக்குதல்களுக்கு உடந்தையாக இருக்கவில்லை என்ற நிலைப்பாட்டிலிருந்துகொண்டு தமது அண்டைய சகோதர நாடுகளான சவூதி அரேபியா, குவைத், கத்தார், UAE, துருக்கி, ஈராக், ஓமான் போன்ற நாடுகளைத் தாக்குவதை எந்த வகையிலும் ஏற்றுக்கொள்ள முடியாது என்பதுடன், அது பாரிய கண்டனத்துக்கும் உரியது. அதேபோல், மேற்குறித்த மத்திய கிழக்கு நாடுகளிலுள்ள எண்ணெய் வயல்கள் உட்பட ஏனைய நிலங்களைத் தாக்குவதையும் ஏற்றுக்கொள்ள முடியாது. அதாவது, ஏகாதிபத்திய அமெரிக்காவும் இஸ்ரேலும் நடத்துகின்ற ஆக்கிரமிப்புத் தாக்குதலை எவ்வாறு ஏற்றுக்கொள்ள முடியாதோ, அதேபோல்தான் ஈரான் செய்தாலும். எனவே, இவ்வாறான ஆக்கிரமிப்பு வேலைகளை மத்திய கிழக்கு நாடுகளில் மேற்கொள்வதை ஈரானும் உடனடியாக நிறுத்த வேண்டும்.

மத்திய கிழக்கு நாடுகள் எமது நாட்டுக்கும் பல உதவிகளைச் செய்திருக்கின்றன. அதுமாத்திரமல்ல, அங்கு எமது நாட்டைச் சேர்ந்த பலர் தொழில் புரிகின்றார்கள். இன்று அவர்கள் பயந்த நிலையில் இருக்கின்றார்கள். எனவே, யார் தாக்குகின்றார்களோ, அவர்களைத் தாக்குங்கள்! அதை விடுத்து, அயல் நாடுகளைத் தாக்கி அங்கும் யுத்த சூழ்நிலையை ஏற்படுத்த வேண்டாமென ஈரான் அரசாங்கத்திடம் கேட்டுக் கொள்கின்றேன்.

ஈரான் அரசாங்கமானது மிகவும் நுணுக்கமாக தமது இராஜதந்திர உறவுகளை வலுப்படுத்தும் வகையில், அனைத்து மத்திய கிழக்கு மற்றும் ஐரோப்பிய நாடுகளுடன் பேச்சுவார்த்தைகளை ஆரம்பித்து, சுமுகமான நிலையை ஏற்படுத்துவதற்கு முன்வர வேண்டும். உலக எரிசக்தி தேவையில் மூன்றில் இரண்டு பங்களிப்பை வழங்கக்கூடிய நாடுகளாக மத்திய கிழக்கு நாடுகள் காணப்படுகின்றன. அங்கு பல இலட்சக்கணக்கான தொழிலாளர்கள் பணிபுரிகின்றார்கள். எனவே, ஐக்கிய நாடுகள் பொதுச் சபை தலையிட்டு, இந்த யுத்தத்தை விரைவாக முடிவுக்குக் கொண்டுவந்து, உலகில் சமாதானத்தை ஏற்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ஈரான் மற்றும் உலக ஷீயா மக்களது ஆன்மீகத் தலைவரையும் 12,000 சிவில் இலக்குகளையும் குறிவைத்து இஸ்ரேல், அமெரிக்கா முன்னெடுத்த கூட்டு யுத்த முயற்சிகளை இலங்கை அரசாங்கம் உள்ளிட்ட அனைத்து உலக நாடுகளும் வன்மையாகக் கண்டிக்க வேண்டும். அதேபோல், ஈரானானது, சவூதி அரோபியா, குவைட், UAE, துருக்கி, கட்டார், ஓமான், ஈராக் போன்ற நாடுகளைத் தாக்குவதையும் வன்மையாகக் கண்டிக்க வேண்டும் என்பதோடு, இந்த யுத்தத்தை முடிவுக்குக் கொண்டுவரும் வகையில் விரைவான நடவடிக்கைகளையும் எடுக்க வேண்டுமென இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
මට තව one minute දෙන්න.

இலங்கைக் கடற்பரப்புக்கு அண்மித்த பகுதியில் ஈரானிய கப்பலான "IRIS Dena" மூழ்கடிக்கப்பட்டு, 87 கடற்படை வீரர்கள் கொலை செய்யப்பட்டனர். சுமார் 30 வீரர்கள் காயங்களுடன் இலங்கைக் கடற்படையினரால் மீட்கப்பட்டனர். இந்தத் தாக்குதலுக்கு அமெரிக்கா உரிமை கோரியுள்ளது. எனவே, இந்தத் தாக்குதல் தொடர்பில் இந்த அரசாங்கம் சுயாதீன ஆணைக்குழு ஒன்றை நியமித்து, நியாயத்தையும் நீதியையும் நிலைநிறுத்த வேண்டுமெனவும் கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.10]

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද මේ රටේ ඇති වෙච්ච ඉන්ධන අර්බුදය සෑම ක්ෂේත්‍රයකටම බලපා තිබෙනවා. මහා පරිමාණ ව්‍යාපාරිකයන් සහ සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට වාගේම ප්‍රවාහන ක්ෂේත්‍රයට, ධීවර කර්මාන්තයට, කෘෂිකර්මාන්තයට, ත්‍රිරෝද රථ හිමියන්ට විශාල ලෙස බලපාන ප්‍රශ්නයක් තමයි ඉන්ධන ප්‍රශ්නය. මේ ප්‍රශ්නය ඇති වෙන්න ප්‍රධාන හේතුව තමයි - යුද්ධය තිබුණත් - මේ රටේ සිදු වුණු ගල් අඟුරු වංචාව. ඒ නිසා අද අපේ රටේ ඉන්ධන ප්‍රශ්නය උග්‍ර වෙලා තිබෙනවා. ගල් අඟුරු බලාගාරයේ විදුලි උත්පාදනය දිනෙන් දින ක්‍රම ක්‍රමයෙන් අඩු වෙන හැටි අපේ නායකතුමා අද උදේ වරුවේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා. *[බාධා කිරීමක්]* කට වහගෙන ඉන්නවාද? එහෙම අඩු වෙනකොට දිනකට තෙල් ලීටර් ලක්ෂ 60ක් ඒ විදුලි බලාගාරය ක්‍රියාත්මක කරන්න දෙන්න සිද්ධ වෙනවා. මේ වංචාව, හොරකම නිසා අපේ රටට ගෙන්වන තෙල්වලින් ලීටර් ලක්ෂ 60ක් දෙන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් අපේ රටේ විදුලිය නැති වෙනවා. අන්න ඒ ගැන අපේ නායකතුමා කරුණු කාරණා ඇතිව පැහැදිලි කර දුන්නා.

අපේ රටේ තිබෙන ප්‍රධාන කර්මාන්තයක් තමයි ධීවර කර්මාන්තය. බහුදින යාත්‍රා, එක්දින යාත්‍රා 7,000ක් විතර ඒ කර්මාන්තය තුළ ක්‍රියාත්මක වෙනවා. ඔවුන්ට මාසයකට, trip එකකට තෙල් ලීටර් 9,000කට, 10,000කට ආසන්න ප්‍රමාණයක් වැය වෙනවා. සමීක්ෂණ අනුව ඒ බෝට්ටු 7,000ට මාසයකට තෙල් ලීටර් ලක්ෂ 65,000ක් හෝ 70,000ක් යනවා. අපේ රටට ගෙන්වන තෙල්වලින් අපේ ධීවර කර්මාන්තය හොඳට කරගන්න පුළුවන්. හැබැයි, මේ බලාගාරවලට තෙල් ලීටර් ලක්ෂ 60ක් දවසකට දෙන නිසා තමයි පෙට්‍රල් ෂෙඩ්වල පෝලිම් තිබෙන්නේ. ඒ වාගේම තමයි බෝට්ටුවලට තෙල් ගහන්න කුඩාවැල්ල, ත්‍රිකුණාමලය, තංගල්ල ඇතුළු හැම ධීවර වරායකම දින හතර, පහ තිස්සේ පෝලිම් තිබෙනවා. ඒ පෝලිම් එන්න එන්න වැඩි වෙනවා මිසක් අඩු වෙන්නේ නැහැ. අන්න ඒ නිසා තමයි මම කියන්නේ මේ සඳහා නිසි කළමනාකරණයක් කර තෙල් ලබාදීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා.

දිනකට ලීටර් 25ක් බැගින් දින 5කට වරක් කුඩා බෝට්ටු හිමියන්ට ලාම්පුතෙල් ලබා දෙනවා කියලා ප්‍රකාශයක් කර තිබුණා. දින 5කට වරක් ලීටර් 25යි දෙන්නේ. ඒ වාගේම ප්‍රකාශ

කර තිබෙනවා, ධීවර වරාය නීතිගත සංස්ථාවේ ලියාපදිංචි කරපු වරායවල් 100ක් තිබෙනවා කියලා. වරායවල් 22යි තිබෙන්නේ. ලාම්පුතෙල් pump කරන වරායවල් 22යි තිබෙන්නේ. පෙට්‍රල් ෂෙඩ්වලින් ලාම්පු තෙල් දෙන්නේ නැහැ. වැඩි මිලට බස්වලට ලාම්පු තෙල් ගහනවා. එන්ජින් ඔරු, වල්ලම්, තෙප්පම් ඇතුළු Outboard මෝටර් බෝට්ටු 50,000ක් තිබෙනවා. ඒ 50,000ට ලාම්පු තෙල් විතරක් නොවෙයි පෙට්‍රල්පුත් දෙන්න ඕනෑ. පෙට්‍රල් අවශ්‍යයි. ඒවා ලබා ගන්නේ කොහොමද? මොන ක්‍රමවේදයකටද ලබා දෙන්නේ? ජනාධිපතිතුමා ඇවිල්ලා මෙතැන කියලා කියලා යනවා. හැබැයි, ඒ කිසි රාජකාරියක් කෙරෙන්නේ නැහැ. ජනාධිපතිතුමාම කියනවා නේ "මම පාර්ලිමේන්තුවට එන්නේ බොරු කියන්න" කියලා. ඉතින්, බොරු කියලා තමයි යන්නේ. ධීවර කර්මාන්තය කඩා වැටුණොත් රටේ මිනිස්සුන්ට කන්න මාළු නැති වෙනවා. අපේ රටට විදේශ විනිමය නැති වෙනවා. ඒ නිසා ධීවර ඇමතිතුමන්ලා, ජනාධිපතිතුමා හොඳට කල්පනා කර, මේ කමිටු හදනකොට ඒ ඒ වරායවල නිලධාරින් අරගෙන ඒ කමිටු හදලා මේ තෙල් ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඊළඟ එක තමයි, ගොවියාගේ ප්‍රශ්නය. ඊයේ සාකච්ඡා කර තිබෙනවා, ගොවියා අස්වනු නෙළනකොට අක්කරයකට තෙල් ලීටර 15ක් ලබා දෙන්න. "බූතයා" කියන යන්ත්‍රය පෙට්‍රල් ෂෙඩ් එකට ගෙනියන්නත් බැහැ, අංකයකුත් නැහැ, QR code එකකුත් නැහැ. එතකොට කොහොමද ඒ මිනිස්සු තෙල් ගහන්නේ? ඒ යන්ත්‍රය start කරන්න විතරක් තෙල් ලීටර 15ක් විතර යනවා. එතකොට අස්වනු නෙළන්න තෙල් ලීටර 15ක් දෙන්න කියලා මොන මිනිහාද තීරණය කරන්නේ? කවුද මේ තීරණ ගන්නේ? ඊළඟට, සී සාන්න අක්කරයකට ලීටර 20යි දෙන්නේ. ගෙදර ඉඳලා කුඹුරට ට්‍රැක්ටරය ගෙනැල්ලා අක්කරයක් සී සාන්න තෙල් ලීටර 20යි දෙන්නේ. කවුද මේවා කරන්නේ? මොළයක් තියාගෙන ද මේවා කරන්නේ? එදා ගොවීන්ගේ කුඹුරුවලට ගිහිල්ලා තණකොළ කාලා, වී කාලා, දැන් මේ ගොවීන්ට ඉටු කරන්නේ සාධාරණයද? ගොවීන් වී ටික ගෙනියන්නේ කොහොමද? වී අස්වැන්න නෙළා ගන්නේ කොහොමද? කුඹුරු වැඩ කර ගන්නේ කොහොමද? එදා වාගේ ගොවීන් එක්ක කුඹුරට බැහැලා, මේවා පිළිබඳව හරියාකාරව සාකච්ඡා කරලා, මේවාට තීරණ ගන්න කියා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම තමයි සංචාරක ව්‍යාපාරය. සංචාරක ව්‍යාපාරයට තෙල් quota එකක් දීලා තිබෙනවාලු. බස්වලින් සංචාරකයන් ප්‍රවාහනය කරන මහා පරිමාණයේ හෝටල්වලට තමයි තෙල් ලබා ගන්න quota එක ලබා දීලා තිබෙන්නේ. අද හපුතලේ පැත්තේ, නුවරඑළිය, මහනුවර, හම්බන්තොට දිස්ත්‍රික්කවල කුඩා වාහනවලින් සංචාරකයන් අරගෙන යන අය පැය 3, 4 තෙල් පෝලිම්වල ඉන්නවා. ඒගොල්ලන් Airport එකට යන්න ඕනෑ. ඒගොල්ලන් හපුතලේ ඉඳලා මහනුවර දළදා මාළිගාව වඳින්න යන්න ඕනෑ. නමුත්, ඒ time එකට යන්න විධියක් නැහැ, තෙල් පෝලිම්වල ඉන්න වෙලා තිබෙන නිසා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, සංචාරකයෙකු ඉන්න වාහනයක් තෙල් පෝලිමක තිබෙනවා නම්, ප්‍රමුඛස්ථානය ලබා දෙන්න කියලා. සංචාරකයන් අපේ ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන අය. ඒ නිසා සංචාරකයකු ඉන්න වාහනයක් තෙල් පෝලිමක තිබෙනවා නම්, ඒ වාහනයට ප්‍රමුඛස්ථානය ලබා දීලා තෙල් ලබා දෙන්න කියලා දැන් පෙට්‍රල් ෂෙඩ් භාරව ඉන්න පොලීසියට නියෝගයක් දෙන්න කියලා මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මම එහෙම ඉල්ලීමක් කරන්නේ, සංචාරකයන් අපේ රටේ ආර්ථිකයට දායකත්වයක් ලබා දෙන නිසායි.

අපේ ධීවර කර්මාන්තය කඩා වැටිලා, කෘෂි කර්මාන්තය කඩා වැටිලා, සංචාරක කර්මාන්තය කඩා වැටිලා, උඩරට ගොවීන්ගේ කර්මාන්ත කඩා වැටිලා. මේ සැම දෙයක්ම කඩා වැටිලා තිබෙද්දී ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා බොරු කියනවා. මීට දවස් 6කට උඩදී කිව්වා, අවුරුද්ද වනකල්ම තෙල් තිබෙනවා කියලා. මාස එකහමාරක් අපේ සංචිතයේ තෙල් තිබෙනවා කිව්වා. දවස් 6ක් ගියේ නැහැ, තෙල් ලීටරය රුපියල් 20කින්, 24කින් වැඩි කළා. මේ බොරු නේ කියන්නේ. Map එකක් දෙනවා කිව්වා, මාළු ඉන්න තැන හොයා ගන්න. රුපියල් 50ක් අඩු කරනවා කිව්වා, කංචනගේ සාක්කුවට යන; රුපියල් 50ක් අඩු කරනවා, මහා භාණ්ඩාගාරයට යන; රුපියල් 50ක් අඩු කරනවා, තව බද්දක්. ඒ තුනම අඩු කරලා තෙල් සහනාධාරය දෙනවා කිව්වා. මිනිස්සුන්ගෙන් බදු ගහලා, බදු ගහලා සල්ලි එකතු කරගෙන මහා භාණ්ඩාගාරයේ තියාගෙන ඉන්නවා. අපේ නායකතුමා කිව්වා වාගේ අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්න මේ වෙලාවේ මිනිස්සුන්ට කන්න බොන්න විධියක් නැහැ, මිනිස්සුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ, මිනිස්සුන්ට මුහුදු යන්න විධියක් නැහැ, මිනිස්සුන්ට ඇඳුම් පැළඳුම් ගන්න විධියක් නැහැ. මොකක්ද මේ කරන්නේ? අවුරුදු එකහමාරක් වෙනවා, රට භාර දීලා. අපට දොස් කියලා වැඩක් නැහැ; අපේ පක්ෂයට දොස් කියලා වැඩක් නැහැ; විපක්ෂයට දොස් කියලා වැඩක් නැහැ. රට භාර ගත්තා නම් ඒ වැඩ ටික කරන්න. අර තෙල් බෙදන වෙද මහත්තයා වාගේ දැන් කියලා ගියා-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඔබතුමන්ලා රට ගැන හිතන්න. මම තව ඉල්ලීමක් කරනවා. ආසියාවේ අපේ රට වටිනා කියන රටක්. මේ මුහුදු තීරය අපේ වටිනා කියන සම්පතක්.

මේ මුහුදු තීරයේ යම් සිද්ධියක් සිද්ධ වුණා, පසුගිය දිනෙක. විදේශිකයන්ගේ මෘත දේහ අසූ ගණනක් අපේ කරාපිටිය රෝහලට ගෙනාවා. දැන් එන්න එන්න යුද්ධය වැඩි වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට පොඩි වෙලාවක් දෙන්න.

යුද්ධය වැඩි වනකොට මැරෙන සංඛ්‍යාව වැඩි වෙනවා. මම ඉල්ලීමක් කරනවා, ලංකාව වටේ මුහුද ආසන්නයේ තිබෙන හැම රෝහලකම mortuaries - මිනී දමන cool rooms - හරිගස්වන්න කියලා. අයිස් දමලා මාළු තියනවා වාගේ අයිස් දාලා මිනී තියන්න තංගල්ල රෝහලට සිද්ධ වුණා. ඒ නිසා හදිසියක් වුණොත්, පිට රට ප්‍රශ්නයක් ඇති වුණොත් විදේශිකයන්ගේ මෘත දේහ තැන්පත් කරන්න mortuaries හරිගස්වන්න. හම්බන්තොට, ගාල්ල, කරාපිටිය රෝහල්වල mortuaries හරිගස්වලා තියන්න කියලා මම රජයෙන් ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කුමාර ජයකොඩි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.19]

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය දා ඊශ්‍රායලය සහ ඇමෙරිකාව විසින් ඉරානයට ප්‍රහාර එල්ල කිරීමෙන් ආරම්භ වූ යුද්ධයේ බලපෑම දැන් මුළු ලෝකය පුරා ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එය අපේ කලාපයටත්, රටටත් දැවැන්ත බලපෑමක් කරමින් තිබෙන බව හැමෝම දන්නවා. ඇත්තටම ඒ තත්ත්වයට මුහුණ දීමේ කාර්යයන්වල තමයි අපට මේ වෙලාවේ ගොඩක්ම නිරත වෙන්න සිදු වෙලා තිබෙන්නේ. මැද පෙරදිග ඛනිජ තෙල් නිෂ්පාදනය කරන ප්‍රමුඛ පෙළේ රටවල් ගැටුමට මැදි වී ඇති තත්ත්වය තුළ මුළු ලෝකයම දැවැන්ත බලශක්ති අර්බුදයකට, ගැටලුවකට මුහුණ පා තිබෙනවා. ගැටුම්කාරී කලාපයට ඔබ්බෙන් තිබෙන රටවල් පවා - පළමු පෙළේ රටවල්, පොහොසත් රටවල්, දැවැන්ත රටවල්, දුබල රටවල්, ප්‍රබල රටවල් ඇතුළු හැම රටක්ම - භේදයක් නැතිව දැන් මෙම බලපෑමට ලක් වෙලා තිබෙනවා. මේ තත්ත්වය මේ වනකොට ගෝලීය ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙන බව හැමෝම දන්නවා. ඉතින් අපේ රටට විතරක් මේ බලපෑමෙන් මිදෙන්න බැහැ.

විශේෂයෙන් බංකොලොත් වෙච්ච ආර්ථිකයක් තිබුණු මේ රටේ ආර්ථික ස්ථායීතාව යළි ගොඩ නඟමින් එන වෙලාවක, අනෙක් පැත්තෙන් අපේ රට මෙතෙක් මුහුණ දුන් දැවැන්තම ස්වාභාවික ව්‍යසනය - අපේ ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා කිව්වා වාගේම - බවට ප්‍රකාශිත "දිට්වා" සුළි කුණාටුව නිසා අපේ රටේ ආර්ථිකයේ යටිතල පහසුකම්වලට සිදු වූ අතිවිශාල බලපෑම ඉතා සාර්ථකව කළමනාකරණය කරමින් රට යළි ගොඩ නැඟෙමින් තිබෙන වෙලාවක එල්ල වූ මේ අභියෝගය සුළුපටු එකක් නොවන බව අපි හැමෝම දන්නවා. දැන් විපක්ෂයට වෙලා කෑ ගහන, හොඳටම කරන හැටි අපට කියා දෙන්න, උපදෙස් දෙන්න එන ඔය විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ පාලන කාලවල මේ රටේ අනාගතය ගැන හිතලා ස්වාභාවික විපත් සහ මේ වාගේ විපත්තිදායක අවස්ථාවලදී රට පවත්වාගෙන යන්න ඕනෑ කරන ක්‍රමවේද හදලා තිබුණා නම්, ඉන්ධන හා බලශක්තිය ගබඩා කරන පහසුකම් වැඩි දියුණු කරලා තිබුණා නම්, ඒ සඳහා වන අවම පියවර ටිකක්වත් ගෙන තිබුණා නම් අපට පොඩි හෝ පහසුවක් වෙන්න තිබුණා. යටත්විජිතයක් හැටියට ඉඳලා නිදහස් වනකොට රටට ඉතිරි වෙච්ච ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි කිහිපයවත් සංවර්ධනය කරලා භාවිත කරන්න පුළුවන් තත්ත්වයකට ගෙනැල්ලා තිබුණා නම්, අපට විතරක් නොවෙයි මේ අමාරු වෙලාවේ කලාපයේ අනෙකුත් අසල්වාසී රටවලටත් පුංචි හරි උදව්වක් කරන්න අපට හැකියාවක් තිබුණා. සූර්ය බලය ඇතුළු පුනර්ජනනීය බලශක්ති නිපැයුම් ගබඩාකරණයට ශක්තිමත් බැටරි ගබඩාකරණ පද්ධතියක් සකස් කර තිබුණා නම් විදුලි බලය සැපයීම ගැන ප්‍රශ්නයක් මතු නොවෙන්න තිබුණා. ඒ මොහොතේ ඒ මොකක්වත් කරන්නේ නැතිව අසාර්ථක රටක්, බංකොලොත් රටක් ඇති කරපු කට්ටිය දැන් බොහොම බරට කියන්නේ මොකක්ද? කරන්න තිබෙන්නේ එහෙමලු, මෙහෙමලු; අපි කරන විදිය වැරදියිලු; ජනතාවට අමාරුයිලු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ජනතාවගේ අමාරුකම්, කම්කටුලු හොඳට දැනෙන, හොඳට දන්නා රජයක් හැටියට අපට ජනතාවගේ ගැටලු තේරෙනවා. ඒ වාගේම, අපේ රටේ මහ ජනතාවත් ඒ බව දන්නවා. දැවැන්ත අභියෝගයක්, දැවැන්ත ව්‍යසනයක් හමුවේ රජයක් හැටියට අපි ජනතාවගේ පැත්තේ ඉඳන්, ජනතාවගේ අමාරුකම් තේරුම් අරගෙන, ජනතාවගේ ගැටලු අවම කරන්න, ජනතාව පීඩනයෙන් මුදාගන්න කළ හැකි සියලු දේ කරන බව මේ රටේ ජනතාව බොහොම හොඳින් දන්නවා. සමහර ජනමාධ්‍ය පෝලිම් ගාණේ ගිහිල්ලා ජනතාව අවුස්සලා voice-cuts ගනිද්දී ජනතාව දෙන උත්තරවලින් නයින්ගේ හැව ගැලවෙන්නේත්, කුඩු සල්ලිවලින් හැදුණු නාළිකාවල රෙදි ගැලවෙන්නේත් ඒ මිනිසුන්ට, රටේ ජනතාවට මේ රජය විශ්වාස නිසායි. මුළු ලෝකයම මුහුණ දෙන දැවැන්ත ගැටලුවක් හින්දා නොවෙයිද, මේ ගැටලුව, මේ පීඩාව, මේ අමාරුව තිබෙන්නේ අපේ රටට විතරක් නොවන බව දන්නා හින්දා නොවෙයිද ඒ මිනිස්සු එහෙම කථා කරන්නේ? ජනතාව පෝලිම්වල ඉන්න ගමනුත් ඒ විදියට උත්තර දෙන්නේ තමන්ට සහනයක් වෙන්න, තමන් පීඩනයෙන් මුදාගන්න මේ ජනතාවාදී රජය ඕනෑම පියවරක් ගන්නා බව දන්නා හින්දා සහ තමන්ට මේ රජය ඒ තරමටම විශ්වාස හින්දායි කියන එක මම සන්තෝෂයෙන් කියනවා.

මේ ගැටලුව ආරම්භ වුණාම රජයක් හැටියට අප ක්‍රියාත්මක වුණු හැටි ජනතාව දන්නවා. ගරු ජනාධිපතිතුමාත් උදේ වරුවේ ඒ ගැන පැහැදිලිව ප්‍රකාශ කළා. අපි ඒ වෙලාවේ ගත්තු පියවර ගැන යමක් කියන්න ඕනෑ. ඉරානයට පහර දුන් බව ආරංචි වුණු හැටියේම මේ රටේ තෙල් පෝලිම් හැදුණා. ජනතාව තම වාහන full tank කර ගන්නත්, තෙල් ගබඩා කර ගන්නත් උත්සාහ ගත්තා. රජය හැටියට අපි ජනතාවට කිව්වා ඇති තරම් තෙල් තොග තිබෙන බව. ජනතාව අපව විශ්වාස කළා. එවිට ඒ පෝලිම් අර්බුදය සමනය කරලා රට සාමාන්‍ය තත්ත්වයට පත් කරන්න පුළුවන් වුණා.

අප හිටියේ පවතින තත්ත්වය ගැන දැඩි සැලකිල්ලෙන්. ඊශ්‍රායලය මීට කලිනුත් ඉරානයට පහර දීලා තිබෙනවා, දින 12ක් තිස්සේ. ඒ ගැටුම පසුව එක්තරා විදියකට සමථයකට පත් වුණා. ඒ වාගේම මේ යුද්ධය ආරම්භ කරපු විදිය බැලුවාම, දිගින් දිගටම යුද්ධයක් ගෙන යන්න අපේක්ෂා නොකළ බවක් සහ තත්ත්වය මේ තරම් උග්‍ර වෙයි කියලා අපේක්ෂා නොකරපු බවක් තමයි පෙනෙන්නට තිබෙන්නේ. කොහොම වුණත්, මේ ගැටුම උග්‍ර වන බව දැනුණාම, ඒක අපේ රටේ බලශක්ති සැපයුමට ගැටලු මතු කරන බව දැනුණාම අපි ඊළඟට ගත යුතු ක්‍රියාමාර්ගය ගත්තා. මුලින්ම කළේ QR ක්‍රමය හරහා ඉන්ධන සැපයුම යම් පාලනයකට ගෙන එන්න කටයුතු කරපු එකයි. සමහරුන් යුද්ධය ආරම්භ වුණු දවසේම QR කේතය ගේන්න කියලා යෝජනා කළා. රටේ ආර්ථිකයට, එදිනෙදා ජන ජීවිතයට සිදු වන බලපෑම අවම කිරීමට ඒ වෙලාවේ ඒක ක්‍රියාත්මක නොකර ඉඳලා නියමිත මොහොතේ, අත්‍යවශ්‍ය මොහොතේ එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික සැලසුම් හා ක්‍රියාමාර්ග අපි ගනිමින් සිටියා.

මේ QR ක්‍රමය ගැනත්, ඒකේ බලපෑම ගැනත් කියන්න ඕනෑ. සියලුදෙනා දන්නා විදියට ඒ ක්‍රමය කලින් වතාවලදීත් ක්‍රියාත්මක වුණා. හැබැයි, ඒ වෙලාවේ ඒක ක්‍රියාත්මක වුණේ, ඉන්ධන සැපයුම ඇන හිටලා මිනිසුන් පෝලිම්වල හෙම්බත් වෙලා හිටපු වෙලාවක. ලොකු පීඩනයක හිර වෙලා, එපා වෙලා සිටිද්දී QR ක්‍රමය පහසුවක්, සහනයක් ගෙන ආවා. තවත් විදියකින් කිව්වොත්, පීඩනයක ඉඳලා පහසුවකට එන්න QR ක්‍රමය උපයෝගී වුණා. හැබැයි, ඇත්තටම මේ මොහොතේ තිබෙන්නේ ඒ තත්ත්වය නොවෙයි. මේ මොහොතේ තෙල් සුලභව තිබෙන කොට, ජනතාව පහසුවෙන් ඉන්න අවස්ථාවක QR කේතය ගෙන ඒම නිසා තමයි හිර වීමකට, සීමා වීමකට ලක් වෙන්නේ. ඒ නිසා විවේචන, චෝදනා එල්ල වීම ස්වාභාවිකයි. මොකද, අපි පාලනයක් කිරීම කළ යුතුයි.

ඒ වාගේම මෑත කාලයේ තෙල් නිකුත් කිරීම ගැන ගත්තොත්, මාර්තු 01වන දා සිට මාර්තු 19වන දා -ඊයේ- දක්වා ඔක්ටේන් 92 පෙට්‍රල් සාමාන්‍ය පාවිච්චියට වඩා සියයට 133ක් වැඩියෙන් නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ, වෙනදාට නිකුත් කරන ප්‍රමාණයට වඩා සියයට 133ක් වැඩියි. Lanka Auto Diesel සියයට 151ක්, Lanka Super Diesel සියයට 181ක්, Lanka Petrol 95 Octane සියයට 161ක්, භූමිතෙල් - Lanka Kerosene - සියයට 172ක් වැඩියෙන් නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ, හැම ඉන්ධන වර්ගයක්ම සාමාන්‍ය පරිභෝජනයට වඩා සියයට 50කට වැඩියෙන් ජනතාව ලබා ගෙන තිබෙනවා. අපි ඒ අවශ්‍යතාත් නොපිරිහෙළා ඉටු කරමින් පවතිනවා. රට තුළ ඇති තෙල් තොග සහ අප ගෙන ඇති පියවර ගැන කියන්න අවශ්‍ය නැහැ. මොකද, ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන ගැන යළි යළිත් කියැවෙනවා.

මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. මාර්තු මාසය තුළ ලෝක වෙළෙඳ පොළේ ඔක්ටේන් 92 වර්ගයේ පෙට්‍රල්වල මිල සියයට 55කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඔක්ටේන් 95 පෙට්‍රල්වල මිල සියයට 65කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඩීසල්වල මිල සියයට 74කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඊට අමතරව, බොරතෙල්වල මිල සියයට 40කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම බොරතොල් අපට ලැබෙන කලාපයත් එක්ක ගත්තාම, බොරතෙල් ප්‍රවාහනය පිළිබඳ ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒකට අමතරව නාවික රක්ෂණය - marine insurance - ඉහළ ගිහින් තිබෙනවා. ඇත්තටම ඒවා තමයි දැන් මේ මිල වැඩි වීමට බලපාන ප්‍රධාන හේතු.

ඒ වාගේම මා සඳහන් කරන්න කැමැතියි, ලංකාවට ජනවාරි මාසය දක්වා ගෑස් සපයපු කාටලය ගැන. ඒ ගැන කියපු මන්ත්‍රීතුමා දැන් මෙතැන නැහැ. එතුමා බොහොම දුකින් කිව්වා, කලින් ගෑස් සපයපු කෙනා නැති වුණාම දෙසැම්බර්, නොවැම්බර් මාසවලත් ගෑස් නැති වුණා කියලා. ඔව්, ඒ සමාගම තමයි සැපයුම කළේ; ඒ කාටලය තමයි සැපයුම කළේ. අන්තිමට ඒගොල්ලන්ම තමයි වෙලාවට ගෑස් නොදුන්නේ. ජනවාරියේ ඉඳන් ඒ කාටලය වෙනස් වීමේ දුක තමයි මේ තිබෙන්නේ. හැබැයි, ඒ කාටලය වෙනස්වීම නොවුණා නම්, අද ලංකාවේ ගෑස් නැහැ. මොකද, ඒක ඕමාන් සමාගමක්. ඕමාන්වලින් දැන් ගෑස් ගේන්න බැහැ. එහෙම නම් අද කන්න වෙන්නේත් නැහැ. එහෙම වුණා නම් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු මීට වඩා තොවිලයක් නටනවා. ඒ කාටලය වෙනස් වීමේ සුබදායක බව දැන්වත් තේරුම් ගන්න ඕනෑ. මොකද, ඒ කලාපයෙන් නොවෙයි දැන් ගෑස් එන්නේ. ඉන්දියාවේ ආපණ ශාලාවලට පවා ගෑස් නිකුත් කිරීම සියයට 20ක් දක්වා අඩු කරලා තිබෙනවා. එහේ සියයට 20යි ගෑස් නිකුත් කරන්නේ. අපි ඒ අතින් හොඳයි. මොකද, අපට ගෑස් තිබෙනවා. අපේ පෞද්ගලික සැපයුම්කරුවාගේ දුර්වලතාව තමයි ඇත්තටම මෙතැනදී බලපා තිබෙන්නේ. ඔහුගේ සියයට 20ක විතර සැපයුම් ප්‍රමාණය නොලැබීම නිසා ඒකත් cover කරන්න දැන් අපටම සිදු වෙලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු ඒවා ගැන බොහොම දුක් වෙලා මෙතැනට ඇවිල්ලා අඬනවා, "අරයා නැති වුණා, ඒක හින්දා තමයි ගෑස් නැත්තේ" කියලා. නැහැ, ඒ ප්‍රශ්නය තමයි ප්‍රධාන වශයෙන්ම තිබෙන්නේ. ඒ supplier එක්ක සිටියා නම් අද අපට ගෑස් ස්වල්පයක්වත් නැති වෙනවා.

ඒ මන්ත්‍රීතුමා තව කාරණයක් කිව්වා. මෙට්‍රික් ටොන් 450,000ක capacity එකක් තිබෙනවා කිව්වා. ඔව්, ඇත්ත. ඩීසල්වලට 210,000ක, ඔක්ටේන් 92වලට 161,000ක යනාදි වශයෙන් මෙට්‍රික් ටොන් 450,000ක capacity එකක් තිබෙනවා, මුතුරාජවෙල සහ කොළොන්නාවේ. හැබැයි, ඒ ඔක්කෝම full කරගෙන බැහැ. ඒවායේ maintenance කරන්න ඉඩ තිබෙන්න ඕනෑ, empty කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ වාගේම එන නැව් භාර ගන්න ඉඩ හදා ගන්නත් ඕනෑ. එක නැවක මෙට්‍රික් ටොන් 35,000ක, 40,000ක පමණ ප්‍රමාණයක් එනවා. ඒවාටත් ඉඩ තියා ගන්න ඕනෑ. මොකද, වර්ග කිහිපයකින් තෙල් එනවා. ඩීසල් එනවා; පෙට්‍රල් එනවා. ඒ හැම දේකටම ඉඩ තියා ගන්න ඕනෑ. නමුත් කොහෙන් හරි ඉලක්කමක් අරගෙන මේක තේරුම් කරන්න බැහැ. 450,000න්, 100,000කට වැඩි ප්‍රමාණයක් අපට මෙහෙයුම් - operations - සඳහා වෙන් කරන්න වෙනවා. ඒවාටත් ඉඩ වෙන් කර ගෙන තමයි උපරිමයෙන් ගබඩා කරගෙන තිබුණේ. දැනුත් එහෙම කරනවා. ඉදිරියටත් එහෙමයි. ඒ නිසා ඒක පැහැදිලි කරගන්නා එක බොහොම වැදගත් වෙයි කියා මා හිතනවා.

ඇත්තටම යම් පාලන තත්ත්වයක් ඉදිරියේ පැවතිය යුතුයි. ඒ වාගේම සිංහල අවුරුදු කාලය තුළත් අවශ්‍ය බලශක්තිය - ඉන්ධන, විදුලි බලය - අඛණ්ඩව ලබා දීමට හැකි බව අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ. විදුලිබල උත්පාදනයට, රටේ ගමනාගමනයට සහ රටේ අනෙකුත් අවශ්‍යතාවලට අවශ්‍ය තරමට, ප්‍රමාණවත් පරිදි ඛනිජ තෙල් ඇති බව සහ සැපයීම සහතික බව මම යළිත් අවධාරණය කරනවා. තවත් එක කාරණයක් මම විශේෂයෙන්ම පැහැදිලි කරන්න ඕනෑ. පසුගිය කාලයේ පැවැති ආණ්ඩුව ප්‍රචාරයක් යැව්වා, ඒ වාගේම ඒගොල්ලන් policy එකක් විධියට ගෙනාවා, පෞද්ගලික සැපයුම්කරුවන් හරහා තරගකාරිත්වය ඇති කරන්න පුළුවන් කියලා. පෞද්ගලික ඛනිජ තෙල් සැපයුම්කරුවන් bulk purchasing කරන අයට මේ දවස්වල තෙල් දෙන්නේ නැහැ. ඒ හැම එකකටම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් තෙල් දෙන්නේ. අපි මේ දවස් 3-4 ඇතුළත ඒ කර්මාන්තවලට බවුසර් 300කට ආසන්න ප්‍රමාණයක් බෙදා හැර තිබෙනවා. ඒ ඔක්කෝම පෞද්ගලික සැපයුම්කරුවන් විසින් සපයපු ඒවා.

ඒ වාගේම අපි හැම දේකටම - අර මුලින් කිව්වා වාගේ tourism, agriculture වාගේ හැම එකකටම - ක්‍රම හදලා තිබෙනවා. ඒවා කරගෙන යනවා. ඒ නිසා කිසිම විධියකින් රටේ ආර්ථිකයට දැඩි බලපෑමක් වෙයි කියලා මම හිතන්නේ නැහැ. ඒ තත්ත්වය අපි නවත්වා ගෙන තිබෙනවා. මේ අවස්ථාවේදී අපි හැමෝම සහයෝගයෙන් ඉස්සරහට යමු. මොකද, මෙතැනදී අපට විතරක් ඉස්සරහට යන්න බැහැ. හැමෝම සහයෝගය දිය යුතුයි. මම විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා මේ තත්ත්වය තේරුම් ගන්න කියලා. මේක අපේ අඩුපාඩුවක් නොවෙයි, මේක ගෝලීය ප්‍රශ්නයක්. ඒ නිසා මේ තත්ත්වය තේරුම් ගන්න පුළුවන් අය හෝ - කුහකකමට හැම එකටම උදැල්ල දමන අය නොවෙයි - එකතු වෙලා අපි සියලුදෙනා ඉස්සරහට යමු කියා ආරාධනා කරමින් මා නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.32]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ කථා කරන මොහොතේ ලෝකය අවිනිශ්චිතභාවයක් තුළ ගමන් කරන්නේ. ඒ තත්ත්වයට ලංකාවෙන් උත්තරයක් සපයන්න පුළුවන් කොහොමද කියන එක ගැන තමයි අපට කථා කරන්න තිබෙන්නේ. මේ යුද්ධය කොතරම් කාලයක් තිබෙනවාද කියන

[ගරු රවී කරුණානායක මහතා]

එක මම හිතන විධියට මේ යුද්ධය ආරම්භ කරපු කට්ටියවත් තවම දන්නේ නැතුව ඇති කියන එක තමයි මගේ ඒකාන්ත මතය වන්නේ. මේ අවස්ථාවේ අපි කොයි ආකාරයෙන් හෝ මේ රටවල් ඒක රාශි කර ඉදිරියට යනවාද, එහෙම නැත්නම් අපේ පුංචි ලංකාව සුරක්ෂිත කරගෙන අපේ වැඩ ටික කරගෙන ඉදිරියට යනවාද? ඒ ගැන තමයි අපට ඉදිරියේදී හිතන්න තිබෙන්නේ.

ඉංග්‍රීසි කියමනක් තිබෙනවා, "every dark cloud has a silver lining" කියලා. අන්න ඒ කියමන අනුව තමයි අපි කටයුතු කළ යුතුව තිබෙන්නේ. මේ ආණ්ඩුවේ ඉන්න අය මීට පෙර කථා කළේ නම් සියලු දේ තනියෙන් කරන්න පුළුවන් වාගේයි. හැබැයි, දැන් ඒ අය "අපි ඔක්කෝම එකට වැඩ කරන්න ඕනෑ"ය කියන සංකල්පයේ ඉන්න එක ගැන, අපි එදා මතක් කළ ඒ කාරණය ගැන එවැනි තීරණයක් ගත්ත එක වෙනුවෙන් මම බොහොම සතුටු වෙනවා. මීට පෙර කථා කළ කුමාර ජයකොඩි ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කළා.

මෙතැනදී වෙලා තිබෙන්නේ මේකයි. විපක්ෂයේ ඉන්නකොට ඕනෑම දෙයක් ගැන ලේසියෙන් කථා කරන්න පුළුවන් වුණාට, ආණ්ඩු බලය ගත්තාම ඒ හැම දෙයක්ම වෙනස් වන ස්වරූපයක් තමයි තිබෙන්නේ. රටක් වශයෙන් අපි එකට වැඩ කරන්න ඕනෑය කියන කාරණය අපි එදාත් කිව්වා. ඒ වාගේම අද විපක්ෂය වශයෙනුත් අපි ඒ මතයේම සිටිනවා. හැබැයි, ඒ කුහකකමින් නොවෙයි. මේ අවස්ථාවේදී ප්‍රශ්නයක් තිබෙන නිසා නොවෙයි, අපි ඔක්කෝම එකට වැඩ කරන්න ඕනෑය කියන සංකල්පයෙන් තමයි අපි ඉදිරියට යා යුත්තේ.

මොකක්ද මේ තුළ තිබෙන්නේ? දේශීය වශයෙන් සහ විදේශීය වශයෙන් කොටස් දෙකක් තිබෙනවා. එකක්, controllable factors; අනෙක් එක uncontrollable factors. අප විසින්ම පාලනය කරන්න පුළුවන් දේවල් දෙස බලමු. අපි කොහොමද ඒ දේවල් ගැන කථා කළ යුත්තේ කියන එක තමයි අපි ඉස්සෙල්ලාම බලන්න අවශ්‍ය වන්නේ. එහිදී අපි මූලිකවම බැලිය යුත්තේ energy security සම්බන්ධවයි.

අපි ඒක සුරක්ෂිත කරගන්න අවශ්‍යයි. අපේ energy security එක ගත්තොත්, විදුලිය නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම තමයි වැදගත්ම කරුණු දෙක. ඒ දෙක කොහොමද අපට බලපාන්නේ? අපි කොහොමද ඒ දෙක ආරක්ෂා කරන්නේ? අද දවල් 1.00ට අපේ රටේ ජනාධිපති පක්ෂ නායකයන් හමු වෙලා පැවති සාකච්ඡාවේදී අදහස් වගයක් ආවා. ඒ අවස්ථාවේ ඇහුවා, ඒක පාර්ලිමේන්තුවේ කියන්න බැරි ඇයි කියලා. ඒකත් උපුටාගෙන තමයි මම මේක කියන්න හදන්නේ.

2022 මැයි මාසයේ මෙවැනි ප්‍රශ්නයක් ඇති වෙනකොට, ඒ තත්ත්වයත් එක්ක රට සුරක්ෂිත කරන්නේ කොහොමද කියලා නොයෙක් ප්‍රශ්න ආවා. එවකට රට පාලනය කරපු රනිල් වික්‍රමසිංහට මේ ප්‍රශ්නය විසඳන එක ලේසි කාර්යභාරයක් වුණේ නැහැ. එදා ඩොලර් තිබුණේ නැහැ. එදා තිබුණේ සම්පූර්ණයෙන්ම කඩා වැටිච්ච ආර්ථිකයක්. මේ දේවල් සඳහා එදා පාර්ලිමේන්තුවෙන් අවසර ලබා දුන්නේ නැහැ. ඒ අවස්ථාවේ එකපාරට ණය ගෙවන්න බැහැ කියලා මහ බැංකුව debt standstill එකක් ගේන්න කථා කළා. හැබැයි, මම නැවත නැවත මතක් කරන්නේ, ඒකට පාර්ලිමේන්තුවේ අවසරයක් ලැබුණේ නැහැ කියන එක. එවැනි තත්ත්වයක් තුළ තමයි එදා කටයුතු කළේ. රනිල් වික්‍රමසිංහට ඩොලර් මිලියන 25යි තිබුණේ. නමුත් ඒ පටන් ගත්ත ගමන තුළ හිතුවා අපි මේක එකින් එක හදමු කියලා. ඒ ගමන තුළ තෙල් පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. අපි කිව්වා, අපි තෙල් සැපයුම විවෘත කරමු කියලා. ඒ විවෘත කිරීම නිසා එදා තිබුණු CPC එකටයි, IOC එකටයි අමතරව අද තිබෙන RM Parks, Shell PLC, Sinopec වැනි කොම්පැනි ගණනාවක් ආවා.

ජනාධිපතිතුමා අද උදේ කථා කරනකොට කිව්වා, මේ වාගේ කොම්පැනි 4ක්, 5ක් තිබෙනවා, නමුත් ප්‍රශ්නය තමයි ඒවා විවෘත කළොත් සමහර වෙලාවට හැමදෙනාටම එක හා සමානම පිළිගන්න පුළුවන් තෙල් මිලක් ඇති වන්නේ නැහැ කියලා. මම හිතන විධියට ඒක තමයි කරන්න අවශ්‍ය වන්නේ. කොම්පැනි 4, 5ක් තිබෙනවා. ආණ්ඩුවම මේකේ බර අදින්න අවශ්‍යතාවක් නැහැ. මේක විවෘත කළාම ඒගොල්ලන්ගේ ප්‍රමාණය අරගෙන ඒගොල්ලෝ විකුණන්න පටන් ගනීවි. එතකොට එක කොම්පැනියක් අනෙක් කොම්පැනියත් එක්ක තරග කරන නිසා කාටවත් කළුකඩ ව්‍යාපාරයක් ඇති කරන්න බැහැ. මේකෙන් වැඩියෙන්ම වාසිය වෙන්නේ පාරිභෝගිකයාට. මේ අවස්ථාවේදී තෙල් මිල ඉහළ තත්ත්වයක තිබුණත්, CPC එක රජයට අයිති නිසා තමයි තෙල් මිල මේ මට්ටමේ තිබෙන්නේ කියලා මම හිතනවා. නමුත් එහෙම නැහැ. මම හිතන විධියට, CPC එකේ පරිපාලන වියදම අනිසි ලෙස වැඩි වීම නිසා තෙල් මිල අධික වන්නත් පුළුවන්. තෙල් සැපයුම විවෘත කළොත් අනිවාර්යයෙන්ම මීට වැඩිය අඩු මිලක් ලැබෙනවා කියන විශ්වාසය තමයි මා තුළ තිබෙන්නේ. IOC එකයි, CPC එකයි ගත්තොත්, IOC එකේ තිබෙන ඉන්ධන ප්‍රමාණයත් එක්ක අධික ලාභයක් ලබන්නේ ඒ ගොල්ලන්ගේ පරිපාලන වියදම අඩු වෙලා තිබෙන නිසා. මේක විවෘත කළොත් Shell PLC එක වෙන්න පුළුවන්, Sinopec එක වෙන්න පුළුවන්, IOC එක වෙන්න පුළුවන්, ඒගොල්ලන්ගේ ශක්ති ප්‍රමාණය පාවිච්චි කරලා තෙල් ආනයනය කරනවා. ඒගොල්ලොත් තෙල් විකුණනවා. හැබැයි තරගකාරී තත්ත්වය තුළ ඉබේම මිලේ සම තත්ත්වයකට එන්න ඉඩ තිබෙනවා කියන එක තමයි මගේ විශ්වාසය. ඒ නිසා තෙල් සැපයුම විවෘත කරන්න. තෙල් ආනයනය කරන එක විවෘත කරලා ඉන්ධන විකුණන්න ගියාම මේ ප්‍රශ්නය ඉබේම එතැනින් නිවැරදි වෙන ස්වරූපයක් තමයි ඇතිවන්නේ.

ඒ වාගේම තමයි, විදුලි බලය සම්බන්ධ ප්‍රශ්නය. කුමාර ජයකොඩි ඇමතිතුමා මෙතැන සිටිනවා. මොන ප්‍රශ්න තිබුණත්, ඉදිරි දැක්මක් සහිතව යනවා කියලා මට පෙනෙනවා. මම හැම වෙලාවේම කියන විධියට රජයේ නිලධාරීන් තමයි, සියයට 90ක් ප්‍රශ්න ඇති කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ bad brief එක ඉදිරියට අරගෙන යන එක තමයි කරන්න තිබෙන්නේ. හැබැයි මම මීට පෙර එහෙම කිව්වාම ඒක විශ්වාස කළේ නැහැ. දැන් ඒ තත්ත්වය පිළිගෙන තිබෙනවා. ඒක නිසා කරන්න තිබෙන්නේ විදුලි සැපයුම පුළුවන් තරම් පෞද්ගලික අංශයට දෙන එක. පෞද්ගලික අංශයට විදුලිය ජනනය කරන්න දුන්නාම ඇතිවන තරගකාරී තත්ත්වය තුළ ඉබේම සමතුලිතතාවක් එනවා. නැත්නම් ඒක රජයෙන්ම කරන්න ගියාම අනිවාර්යයෙන්ම ප්‍රශ්න ඇති වෙනවා. මොකද, තවම ඔතැන තෙල් මාෆියා එක තිබෙනවා. හිස නමලා තිබෙන්නේ තෙල් මාෆියා එකට. ඒ නිසා අපි අනිවාර්යයෙන්ම පුනර්ජනනීය බලශක්තිය ඇති කරන්න අවශ්‍යයි. ඒ සඳහා Battery Energy Storage System -BESS- එක ඇති කරන්නම ඕනෑ. ඔබතුමන්ලා මෙගාවොට් 200ක් ජනනය කරලා තිබෙනවා. ඒක හැබෑව. හැබැයි මම හිතන විධියට ධෛර්යවත් කරපු ඒ පුනර්ජනනීය විදුලි නිෂ්පාදනය මේ තෙල් මාෆියා එකෙන් අධෛර්යවත් කර තිබෙනවා. මේ ප්‍රශ්නය අවුරුදු 20ක් තිබුණා. මේ ප්‍රශ්නය අවුරුදු 20ක් තිබුණා නම් ඉන්න කට්ටියම තමයි ඒ ප්‍රශ්නය මේ තත්ත්වයට ගෙනැල්ලා තිබෙන්නේ. ඒ නිසා මේක ඔබතුමාගේ පිට උඩ තියාගෙන වැඩ කළාට හරියන්නේ නැහැ. අනිවාර්යයෙන්ම මේ ප්‍රශ්නයට දීර්ඝකාලීන සැලැස්මක් ඇතිව කටයුතු කරන එක තමයි කරන්න අවශ්‍ය වන්නේ. එදා මේක අහලා තිබුණා නම් මේ ප්‍රශ්නය මේ

තැනට එන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නයට විසඳුමක් ලෙස පෞද්ගලික අංශයත් එකතු කරගෙන පුළුවන් තරම් විදුලිය ජනනය කරන්න. පුනර්ජනනීය විදුලි නිෂ්පාදනය තුළ Battery Energy Storage System එක ඇති කරලා, එදා විදුලිය ඒකකයක් සඳහා තිබුණු රුපියල් 47, 48 ප්‍රචලිත කරන්න. ඒකෙන් අනිවාර්යයෙන්ම තෙල් සම්බන්ධයෙන් තිබෙන බලපෑම ඉබේම අඩු වෙන්න පටන් ගන්නවා. අපි එදා කිව්වා, අපට තිබෙන විදේශ සංචිත සීමිත නිසා බලශක්ති ආරක්ෂාව ගැන ප්‍රශ්නයක් ඇති වුණොත් ඒකෙන් අපි නැවත තර්ජනයට ලක් වනවා කියලා. දැන් අපි තර්ජනයට ලක් වෙලා තිබෙන්නේ ඒ නිසා නේද? අපට ස්වභාවධර්මයෙන් ලැබෙන සම්පත් ගැන විශ්වාසය තැබුවා නම් පුනර්ජනනීය බලශක්තියෙන් විදුලිය නිෂ්පාදනය කරන්න තිබුණා. එහෙම නම් දැන් ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. මම හිතන විධියට, දැනුත් සෝලා තුළින් මෙගාවොට් 2,300ක් විදුලිය ජනනය වනවා. සෙනසුරාදා, ඉරිදා තවම සියයට 15ක්, සියයට 20ක් විතර curtail කරනවා. Curtail කරන එක වහාම නවත්වන එක මේ අවස්ථාවේ ඔබිනවා.

මේ වන විට Lanka Marine Services සහ Interocean Services Limited කියන කොම්පැනි දෙක bunker තෙල් ගෙනැල්ලා විකුණනවා. අද සාමාන්‍යයෙන් තෙල් ලීටරයක මිල රුපියල් 370, 380යි. නමුත්, ලීටරයක් 660ට විකුණනවා. ලීටරයක් 660ට විකුණලා, ඒකට සියයට 18ක VAT එකත් එකතු කරලා, ඒකට ඩොලර්වලිනුත් ගෙවලා පවත්වාගෙන යනවා. තරගකාරී තත්ත්වයක් ඇති කළා නම් මෙහෙම වෙන්නේ නැහැ කියන එකයි මම කියන්නේ. මම කියපු විධියට අර කොම්පැනි හතරටත් මෙය විවෘත කළා නම් කිසිසේත්ම මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ. එහෙම නම් අද CPC එකට විතරක් මේ බර අදින්න වෙන්නේ නැහැ. එහෙම නම් මේ ප්‍රශ්නය නවත්වන්නේ කවුරුත් නොවෙයි, CPC එක.

ආණ්ඩුවේ කථිකයින් කියනවා මම දැක්කා, මේ බර ඇද්දේ එතුමන්ලා කියලා. නැහැ, ඇත්ත වශයෙන්ම ඒ බර දැරුවේ පාරිභෝගිකයන්. රනිල් වික්‍රමසිංහ එදා legacy debt එක ගත්තා. එදා ඉඳන් ගෙව්වා. සියයට 85ක් ගෙවලා අවසන් කළා. අද ඒ ගැන කථා කිරීම මිසක් වෙන දෙයක් නැහැ. දැන් සම්පූර්ණ ලාභය යන්නේ CPC එකට. දැන් ප්‍රශ්නය නිරාකරණය වෙලා තිබෙනවා. එදා ද, මෙදා ද වුණේ කියන එක නොවෙයි, දැන් ප්‍රශ්නය නිරාකරණය වෙලා ඉවරයි. මේ රටේ තිබෙන ප්‍රශ්න ටික විසඳන්න එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ බව තමයි මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ. ඒ, energy security ප්‍රශ්නය.

අපේ රටේ භූගෝලීය පිහිටීම අනුව කිව යුතු වැදගත් දෙයක් තිබෙනවා. සමුද්‍රීය ගමනාගමනයේ දී ලංකාව සන්ධිස්ථානයක්. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ හිටපු ප්‍රබල ඇමතිවරයකු වූ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා කොළඹ වරාය ප්‍රධාන නැව්ගත කිරීමේ මධ්‍යස්ථානය බවට පත් කළා. ඒ, ලෝකය එදා හිතලාවත් නොතිබුණු දෙයක්. අද ලෝකයේ හොඳම වරායවල් අතර කොළඹ වරාය 18වන තැනට ඇවිල්ලා තිබෙනවා. එතුමාගේ දූරදර්ශී ඥානය නිසා ගත්ත පියවරක ප්‍රතිඵලය ලෙස තමයි එය පෙනෙන්න තිබෙන්නේ. මේ අවස්ථාවේ මැද පෙරදිග යුද්ධයක් පවතිනවා. අපි කියමු, එම යුද්ධය තව මාසයකින් අවසන් වනවා කියලා. යුද්ධය මාසයෙන් අවසන් වුවත්, මැද පෙරදිග තිබෙන ප්‍රශ්න ටික ලෙහෙසියෙන් විසඳෙන්නේ නැහැ. එම ප්‍රශ්න ටික විසඳෙන්න අනිවාර්යයෙන්ම අවුරුදු ගණනාවක් ගත වෙයි. මොකද, යම් භයක් ඇති වෙලා තිබෙනවා.

ඉරානයේ තිබෙන ප්‍රශ්නය එක්ක, Saudi Arabia, Qatar, Dubai, Abu Dhabi, Bahrain, Oman කියන රටවල් අස්ථාවරභාවයට තල්ලු වෙලා තිබෙනවා. එම නිසා අපි ලංකාව නැව්ගත කිරීමේ කේන්ද්‍රස්ථානය බවට පත් කර ගන්න අවශ්‍යයි. මම හිතන විධියට මෙය තමයි ලංකාවට ලැබුණු හොඳම අවස්ථාව. නරක කාලය හැම දාම නැහැ කියනවා වාගේ මෙය අපට ලැබුණු අවස්ථාවක්. මේ අපි ඇති කරපු ප්‍රශ්නයක් නොවෙයි. අනෙක් අය ඇති කළ ප්‍රශ්නයේ වාසිය අපේ උරුමය තුළින් ලබා ගන්න අවශ්‍යයි. නමුත්, දැන් පවතින තත්ත්වය මොකක්ද? අද කොළඹ වරායේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, නැව් වරාය මඟහැර යනවා, bypass කරනවා. මොකද, අපේ වරායේ තිබෙන තදබදය නිසා. නමුත්, එය අපේ අතට ගන්න පුළුවන් හැකියාවක් තිබෙනවා. ඒ කොහොමද? දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති රත්මලානේ අක්කර 40ක් තිබෙනවා. ඊළඟට, SLBC එකට අයිති අක්කර 48ක් ඒකල තිබෙනවා. ගරු බිමල් රත්නායක ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවට එනවා. ඔබතුමා එදා කිව්වා, මේ ගැන කියන්න කියලා. දැන් මම එය කියනවා. ගරු ඇමතිතුමනි, වෙයන්ගොඩත් අක්කර 48ක් තිබෙනවා. පොල්ගහවෙලත් අක්කර 53ක් තිබෙනවා. අපේ දුම්රිය මාර්ග - rail tracks - පාවිච්චි කරලා dry port එකක් ඇති කරන්න පුළුවන්. Dry port එකක් ඇති කිරීමේදී යටිතල පහසුකම් - infrastructure - ඇති කරන්න ඕනෑ නැහැ. දුම්රියේ කන්ටේනර් one plus one දා ගෙන යන්න පුළුවන්. Port එක ඇතුළේ කන්ටේනර් 120,000යි තිබෙන්නේ. Dry port එකක් ඇති කළොත් අඩු ගණනේ ලක්ෂ දෙකහමාරක විතර කන්ටේනර් ප්‍රමාණයක් ප්‍රවාහනය කරන්න පුළුවන්.

වරායේ සභාපති දිසානායක මහතා ඉතා දැනුවත්කමක් තිබෙන නිලධාරියෙක්. එය හොඳ පත් කිරීමක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මිනිත්තු තුනකින් කථාව අවසන් කරන්නම්.

Director General of Customs විධියට පත් කර තිබෙන්නේ සීවලි අරුක්ගොඩ මැතිතුමායි. එතුමාත් ඉතා දැනුවත්කමක් තිබෙන නිලධාරියෙක්. ඒ අයගේ දැනුම පාවිච්චි කරලා කෙටි කාලයක් තුළ මෙය අවසන් කරන්න. Sri Lanka Ports Authority එක මඟින් dry port concept එක ඇති කරන්න ආණ්ඩුවක් වශයෙන් අවසර දෙන්න. මේ dry port concept එක ඇති කළොත් අපිට වරාය ඇතුළේ තිබෙන තදබදය නැති කරලා කෙළින්ම off port එකට ගෙනෙන්න පුළුවන්. ඒ off port එකට ගෙනෙන්න පුළුවන් දේවල්, - යම් දේවල් අපනයනය කරනකොට ආරක්ෂක හේතූන් නිසා එම කන්ටේනර් පැය 72ක් තිබෙනවා. මේක පිටස්තර තැනකට තියලා වරායට නැව ආවාට පස්සේ ගෙනෙන්න තත්ත්වයක් ඇති කරන්න පුළුවන්. මම හිතන විධියට ඒක තමයි අපිට logistically කරන්න පුළුවන් හොඳම දේ. කරුණාකරලා මේ අවස්ථාව උපයෝගී කර ගන්න. මේ අවස්ථාවේ දී වෙනත් රටක තිබෙන ප්‍රශ්නය අපේ පැත්තට වාසියක් ලෙස සලකන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඊළඟට මම කියන්න ඕනෑ අපේ Mattala Airport එක ගැන. Mattala Airport එක හදන්න ගියාම හුඟක් බැණුම් ඇහුවා. දැනට බිලියන 43ක් වියදම් කරලා එය පාඩු වශයෙන් තිබෙනවා. හැම අවුරුද්දේම පුනරාවර්තන වියදම රුපියල් මිලියන 3,800යි. මම හිතන විධියට, ගිය අවුරුද්දේ මිලියන 4,200යි. ඔක්කෝම carryforward loss එක එකතු කළාම රුපියල් බිලියන 43ක් තිබෙනවා. ඉතින්, මේ

[ගරු රවි කරුණානායක මහතා]

අවස්ථාව පාවිච්චි කරන්න. මම ආණ්ඩුවට නැවත කියනවා, කරුණාකරලා Mattala Airport එක මැද පෙරදිග රටවල airlinesවලට විවෘත කරන්න කියලා. අද එනවා Emirates. ඊයේ අනුර කරුණාතිලක මැතිතුමා උත්තර දෙනකොට කිව්වා, සුමානයකට රටකට seats 653,000ක් එනවා කියලා. ඊළඟට, Etihad Airways. ඒ වාගේම Qatar Airways. මම දන්නවා, Qatar Airways ගැන. මොකද, මගේ මල්ලි එතැන Vice President වශයෙන් වැඩ කරනවා. දවසකට flights 243ක් තිබෙන එක අද flights 43ක් අඩු වෙලා තිබෙනවා. ඒකත් මස්කට්වලින් තමයි ගෙනියන්නේ. ලංකාව සෘජුව - directly - යුරෝපයට flights තුන හතරක් පාවිච්චි කරලා තිබුණා. ඒ නිසා කරුණාකරලා මේ Qatar Airways, Emirates, Oman Air, SalamAir, Etihad Airways, Kuwait Airways, Gulf Air, Air Arabia කියන මේ ඔක්කොටම Mattala Airport එක විවෘත කරලා, එහි ground handling free - කිසිම මිලක් අය කරන්නේ නැතිව - දුන්නා නම් ඉබේම අපේ hotelsවලට, transportවලට, navigation charges, overflying charges යනාදී වශයෙන් ආදායම් ලැබිලා, මේවායෙන් රැකී රක්ෂා වාසිත් අපේ රටට එනවා. සාමාන්‍යයෙන් aircraft එකක් land කරන්න යූඑස් ඩොලර් මිලියන 1,200ක් 1,500ක්, 3,000ක් යනවා. මේක තමයි මෙහෙට ගෙනෙනවා ද, නැද්ද කියලා ඒගොල්ලන් තීන්දු කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අවසන් කරන්නම්. මට පෙනෙනවා වෙලාවත් එක්ක සටනක් තිබෙනවා කියලා.

කරුණාකරලා මේක කරන්න. බිමල් ඇමතිතුමා කිව්වා, මේක කරනවා කියලා. දැන් මේක වහාම ක්‍රියාත්මක කරලා රටට මේ අවස්ථාව ගන්න. මේ අවස්ථාවේ විපක්ෂය වශයෙන් ආණ්ඩුව සමඟ එකට වැඩ කරන්න පුළුවන් ස්වරූපයක් ඇති ඉදිරි දැක්මක් සහිත වැඩ පිළිවෙළක් අපට තිබෙනවා. එහෙම නැතිව, අපට බෝඩ් ලෑලි අල්ලන්න බැරි එක නොවෙයි, අපිට strike කරන්න බැරි එක නොවෙයි, රටට ඩොලර් එවන්න එපා කියන එක නොවෙයි තිබෙන්නේ. මම හිතන විධියට, රට තමයි වැදගත්ම දේ. අපි හැම දෙනාගේම රට තමයි ශ්‍රී ලංකාව. අපි එකට වැඩ කරලා රට සංවර්ධනය කරමු.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.47]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම මේ වෙලාවේ ලෝකයේ හැම රටක්ම මේ යුද්ධයත් එක්ක බැඳිලා තිබෙනවා කියලා අපි දන්නවා. මෙහිදී එක් එක් ආකාරයෙන් බැඳිලා තිබෙනවා. ලංකාව හැම තිස්සේම කියනවා, 'මේ යුද්ධයට අපි මධ්‍යස්ථයි' කියලා. හැබැයි, 'මධ්‍යස්ථ' කියනවාට වඩා මධ්‍යස්ථ වුණාද, යුද්ධය සම්බන්ධව නිෂ්ක්‍රිය වුණාද කියන බරපතළ ප්‍රශ්නය තිබෙනවා. මොකද, අපේ කලාපය තුළ නැවකට පහර දීමේ ප්‍රශ්නයේදී මීට වඩා හරි විධියට තීන්දු තීරණ ගන්න තිබුණා කියලා අපි විශ්වාස කරනවා. මානුෂීය ප්‍රතිචාර අවශ්‍ය වෙලාවට අපි ඒක දෙනවාද? ඒක ඉතා වැදගත්. මානුෂීය ප්‍රතිචාර තමයි ලෝකයට වැදගත්ම දේ. කොයි කාට වුණත් කමක් නැහැ, අපි එය භය නැතිව ලබා දිය යුතු වෙනවා. ඒක තමයි යුද්ධයේ දී විශේෂයෙන්ම අවශ්‍ය වෙන්නේ. අපි අතින් එක මොහොතකදී එය ගිලිහුණා. ඒක නැවත වතාවක් ගිලිහෙන්නේ නැතිව සමස්ත ලෝකයටම එක හා සමානව වැඩ කටයුතු කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

අපි දන්නවා මේ ආණ්ඩුව රාජ්‍යයන් අතර - ඇමෙරිකාව සහ ශ්‍රී ලංකාව, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර - ගිවිසුම් ගහ ගත් බව. දැන් කාලය හරි, මේ ගිවිසුම් මොනවාද කියලා හෙළි කරන්න. මොකද, මේ ගිවිසුම් හෙළි කරන්න ඕනෑ. හේතුව, අද අපි ලෝකය එක්ක වැඩ කරන්න යද්දී මේ යුද්ධයත් එක්ක වෙනස් ක්‍රමයකට වැඩ කරන්න වෙනවා. ලෝකයත් එක්ක ගනුදෙනු කරද්දී, වර්තමානයේ අපේ රටට බලපා තිබෙන මේ යුද්ධයේ ප්‍රශ්නත් එක්ක මේ ගිවිසුම් කොතරම් දුරට බලපානවා ද, නැද්ද කියන එක රටේ හැම කෙනෙකුම දැන ගත යුතුව තිබෙනවා. ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුව තුළ ඒ පිළිබඳව සාකච්ඡාවට ගත යුතුව තිබෙනවා. එහෙමත් නැත්නම් විපක්ෂය සහ ආණ්ඩුව එකතු වෙලා වාඩි වෙලා සාකච්ඡා කළ යුතු වෙනවා. හේතුව, එහෙම සාකච්ඡා නොකර මේ අත්සන් කරපු ගිවිසුමක යම් විධියක අඩුපාඩුවක් හෝ ප්‍රශ්නයක් මතු වුණොත්, ඉදිරි වැඩ කටයුතු කිරීමේදී ඒක මේ රටේ ජනතාවට බරපතළ ප්‍රශ්නයක් වනවා. එම නිසා තමයි අපි මේ බාල ගල් අඟුරු ප්‍රශ්නය ගැන හැම තිස්සේම කථා කරන්නේ. එදා පැවති ආණ්ඩු මොන විධියේ වැරදි කළත්, මොනවා කළත් බාල ගල් අඟුරු ගෙනෙන්න කියලා කිව්වේ නැහැ. මේ බාල ගල් අඟුරු සිද්ධියට සම්බන්ධ බොහෝ දෙනෙක් ඉන්නවා. අපි ළඟ ගොඩක් විස්තර තිබෙනවා. ආණ්ඩුව ඇතුළේ සිටින සමහර අයගෙන් මේ සම්බන්ධව ගොඩක් තොරතුරු අපට ලැබෙනවා, මේ ගැන කථා කරන්න කියලා. හැබැයි, අපි මේ මොහොතේ ඒ ගැන කථා කරනවාට වඩා රට ගැන කථා කරන්න ඕනෑය කියලා හිතනවා. හැබැයි, බාල ගල් අඟුරු නිසා මේ රටේ ඉදිරි කාලය තුළ විදුලි කප්පාදුවක් කළොත්, එහි සම්පූර්ණ වගකීම ආණ්ඩුව භාර ගන්න ඕනෑ. මොකද, බාල ගල් අඟුරු නිසා ඒක සිදු වෙච්ච නිසා. යුද්ධය නිසා ඒ පාඩුව වුණාය කියන්න එපා කියලාත් මේ අවස්ථාවේදී මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.

මේ ආණ්ඩුවේ ජයග්‍රහණයේදී, ඒ වාගේම මේ රටේ විදේශ විනිමය සම්බන්ධ ප්‍රශ්නයේදී විදේශගත ශ්‍රමිකයින් තමයි ඉදිරියෙන්ම ඉන්නේ. නමුත්, විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ පවුල් අද වන විට බොහෝ අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. සමහර අයට රැකියා කරන ස්ථානවල ප්‍රශ්න මතුව තිබෙනවා. සමහර අය වීසා නැතුව ඒ රටවල වැඩ කරනවා. හැබැයි, ඒ අය අද වන විට අසරණ වෙලා ඉන්නවා. ඒ අය ප්‍රශ්න කරමින් ඉන්නවා, යුද්ධය නිසා යම් දෙයක් සිදු වුණොත් අපට ඊළඟට ගත හැක්කේ කොයි ආකාරයක පියවරක්ද කියලා. විදේශගත ශ්‍රී ලාංකිකයා ගැන මීට වඩා දැවැන්ත වැඩසටහනකට අපි අතගැසිය යුතුයි. ඒ අතගසන වැඩසටහන තුළදී විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ජීවත් වන විදෙස්ගත අපේ ශ්‍රමිකයින්ගේ පවුල් එක්ක සම්බන්ධතා ගොඩ නඟාගෙන ඒ අයගෙන් විමසීමක් කළ යුතුයි, ඒ අයගේ කෙනා ඒ රටේ වැඩ කරන්නේ කොයි ආකාරයෙන්ද, එහෙම නැත්නම් ඒ කෙනාට තිබෙන ප්‍රශ්න මොනවාද කියලා.

අපි මේ වෙලාවේ බලාපොරොත්තු වනවා, රටවල් එක්ක G2G වැඩසටහන් එක්ක විශේෂයෙන් මේ තෙල් ප්‍රශ්නයට විසඳුමක් ලබා ගන්න. තෙල් අර්බුදය ඉදිරි කාලයේදී තවත් බරපතළ විධියට එන්න පුළුවන්. අපි දන්නේ නැහැ, මේ යුද්ධය කොයි පැත්තෙන් ගිහිල්ලා කොතැනින් ඉවර වෙයිද කියලා. තෙල් ප්‍රශ්නයේදී අපි රුසියාවත් එක්ක, චීනයත් එක්ක නිවැරදි ආකාරයට සාකච්ඡා කරලා හරි තීන්දු තීරණ ටික අරගත්තාද? මේක බරපතළ ප්‍රශ්නයක්. රටක් හැටියට එවැනි සාකච්ඡා පැවැත්වීම මේ අවස්ථාවේදී අත්‍යවශ්‍ය දෙයක්. ඒ වැඩ කටයුත්ත නිවැරැදිව කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

අපි ජනාධිපතිතුමාගෙන් බලාපොරොත්තු වන්නේ නැහැ, මේ සභාවට ඇවිල්ලා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිතුමාගේ කථාව කිරීම. ඒක නොවෙයි එතුමාට කරන්න තිබෙන කථාව. එතුමාට තිබෙන්නේ අතීතය ගැන කියන එක නොවෙයි. වර්තමාන සහ අනාගත සැලසුම් මොනවාද කියලා එතුමා කියන්න ඕනෑ. අපි සියලුදෙනා එකතු වෙලා රටක් හැටියට වැඩ කටයුතු කරනවා නම් මේ යෝජනා ටික නිවැරැදි විධියට ඉදිරිපත් කරලා ඒවා යම්කිසි විධියකින් සාකච්ඡාවකට අරගන්න වෙනවා. ඉදිරි කාලය තුළ කොයි විධියටද මේ ප්‍රශ්න විසඳන්නේ කියලා එහිදී අපට සාකච්ඡා කරන්න පුළුවන්. හැබැයි, එතුමා බොහෝ වෙලාවට කථා කරන්නේ සංඛ්‍යාලේඛන ගැන. සංඛ්‍යාලේඛන ගැන කියන එක නිලධාරියෙකුට දෙන්න. එතුමා මේ සභාවට ඇවිල්ලා ඒක කියන්න ඕනෑ නැහැ කියලායි අපි විශ්වාස කරන්නේ.

ආණ්ඩුව බදු ගහලා සල්ලි එකතු කරගෙන මේ වනකොට සල්ලි පුරවාගෙන ඉන්නේ. තෙල් මිල ඉදිරි කාලයේදී වැඩිවීම යම්කිසි ආකාරයකට සිදු වුණොත්, තෙල් පාවිච්චි කරන අපේ ජනතාව වෙනුවෙන් මේ බදු මුදල් පාවිච්චි කරලා යම් සහනාධාරයක් දෙන්න යම්කිසි වැඩ පිළිවෙළක් සකස් නොකරන්නේ ඇයි කියන එක විශේෂයෙන් අපි අහනවා. සාමාන්‍යයෙන් තෙල් ලීටරයක රුපියල් 120ක විතර බදු ප්‍රමාණයක් එකතු වෙලා තිබෙනවා. මේ මුදල විශේෂයෙන්ම මේ රටේ ජනතාව වෙනුවෙන් මුදා හරින්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

මේ වෙලාවේ විශේෂයෙන්ම මම තව කාරණයක් මතක් කරන්න ඕනෑ. අපි දැක්කා, සමහර මන්ත්‍රීවරුන් බොහොම උජාරුවෙන් කෑ ගහනවා. හැබැයි, ඔබතුමන්ලා කෑ ගැහුවාට මේ කාරණය මතක තියාගන්නකෝ. ඔබතුමන්ලාට QR එකවත් හදාගන්න බැරිව ගියා නේ. QR එක විධියට ඔබතුමන්ලාට පාවිච්චි කරන්න සිදු වුණේ පසුගිය ආණ්ඩුව හදපු QR එකමයි. ඒක තමයි පාවිච්චි කළේ. අන්තිමට ඒකත් අනාගත්තා. අඩු තරමේ QR එකවත් හදාගන්න බැරි තත්ත්වයට ඔබතුමන්ලා පත් වුණා කියන එකෙන් ඇත්තටම හැම කෙනාම ඔබතුමන්ලාගේ නිරුවත දැක්කා. අද කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, සංචාරක කර්මාන්තය කියන ඒ හැම ක්ෂේත්‍රයක්ම තිබෙන්නේ කොට උඩ. ඒ ක්ෂේත්‍රවල නියැළෙන අය අද බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙනවා. අපනයන ක්ෂේත්‍රයත් එහෙමයි. අදත් අපි සාකච්ඡාවට අරගත්තා, අපනයන ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු. විශේෂයෙන්ම අපනයන කෘෂි භෝග සම්බන්ධව කටයුතු කරද්දී ඒ අයට විශාල ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. එක පැත්තකින් නිෂ්පාදන වියදම වැඩි වනවා. පොහොර, ප්‍රවාහනය, ඉන්ධන ප්‍රශ්න ඇති වනවා. ඒගොල්ලන්ගේ නිෂ්පාදනය කඩා වැටුණොත් විශේෂයෙන්ම රැකියා ප්‍රශ්නත් ඇති වනවා.

යම් නිෂ්පාදනයක් කළාට පස්සේ ඒවා මිලදී අරගෙන export කරනකොට, ඒ export කරන කණ්ඩායම්වලට බලපාන පොදු කාරණා ටිකක් තිබෙනවා. අද ප්‍රවාහනය අපේ අපනයන ක්ෂේත්‍රයට බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ සඳහා ලබා දෙන සහනාධාර මොනවාද? ඒ සඳහා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ මොකක්ද? මෙන්න මේවා ගැන නිවැරදි වැඩසටහනක් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ඒක තමයි මේ වෙලාවේ ආණ්ඩුව කළ යුතු දේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.55]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම අද අපි සාකච්ඡා කරන්නේ විපක්ෂය විසින් ඉදිරිපත් කළ "ලෝකයේ පවතින වර්තමාන තත්ත්වය" පිළිබඳ සභාව කල් තැබීමේ යෝජනාව ගැනයි. එතුමන්ලා මේ යෝජනාව ඉදිරිපත් කරමින් කියනවා, මේ අර්බුදයට මුහුණ දීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීම පිළිබඳව, නැත්නම් සුදුසු වැඩ පිළිවෙළක් සකස් කිරීම පිළිබඳව. නමුත්, මේ විවාදය මම අද දවස පුරාම අහගෙන සිටියා. මාර්ග සිතියමක් සකස් කිරීම පිළිබඳව හෝ සුදුසු වැඩ පිළිවෙළක් සකස් කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් වුණේ ඉතාම සීමිතවයි. ඇත්තටම අපි හිතනවා, ගරු ජනාධිපතිතුමා මාර්තු මාසයේ 17වැනි දා ජාතිය අමතා කරපු කථාවේදී සහ ඉන් පසුව මාධ්‍ය සඟයින් එක්ක කරපු සාකච්ඡාවේදී පැයයි, විනාඩි 8ක් අරගෙන පැහැදිලි කරපු වැඩ පිළිවෙළ තමයි අපේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ හැටියට අපි ඉදිරිපත් කළේ කියලා. ජනාධිපතිතුමා අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා එතුමාගේ ඒ වැඩ පිළිවෙළ සනාථ කළා; ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා.

අපේ විදේශ ප්‍රතිපත්තියේ ඇති මධ්‍යස්ථභාවය පිළිබඳව උදේ ඉඳලා විපක්ෂයෙන් නැඟුණු අදහස් කිහිපයක් තිබුණා. ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී ඉතාම පැහැදිලිව සඳහන් කළා, අපේ විදේශ ප්‍රතිපත්තියේ ඇති නොබැඳි බව සහ මධ්‍යස්ථභාවය රැකගෙන කොහොමද අපි ප්‍රකාශ නිකුත් කළේ, කොහොමද අපි සම්මුතිවලට එළඹුණේ, කොහොමද අපි ක්‍රියාමාර්ග ගත්තේ කියලා. ඉතින් ඉතාම විධිමත් පැහැදිලි කිරීමක් තිබියදී විපක්ෂ මන්ත්‍රීවරුන් නැවත නැවතත් රටේ විදේශ ප්‍රතිපත්තිය සහ මධ්‍යස්ථභාවය පිළිබඳව ප්‍රශ්න නඟන එක අපට පුදුමයි. ඇත්තටම මේ අර්බුදය හමුවේ තමයි අපේ රටේ මධ්‍යස්ථභාවය වඩා හොඳින් පිළිබිඹු වුණේ. ඒක ජාත්‍යන්තරව ඉතාම විවෘතව පිළිගන්නවා වාගේම, මේ අර්බුදය වෙලාවේ ශ්‍රී ලංකාවේ හැසිරීම ඉතාම හොඳ අගය කිරීමකටත් ලක් වුණා. අපට හමු වන හැම තානාපති නිලධාරියෙක්ම කියන්නේ, මේ කාර්යයේදී ශ්‍රී ලංකාවේ හැසිරීම ඉතා අගය කරනවා කියායි. මොකද, අපේ ක්‍රියාදාමය අනුව යන්න දැන් ලෝකයේ රටවල් ගණනාවක් සූදානම් වෙමින් ඉන්නවා. ඒ නිසා අපි හිතනවා, අපේ මධ්‍යස්ථභාවය, අපේ විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අපේ රට ඉතා හොඳ ස්ථානයකට ගෙනැල්ලා තිබෙනවා කියලා.

ඇත්තටම මේ වාගේ අර්බුදයක් අවස්ථාවේ අපි ගන්නා ක්‍රියාමාර්ග මත තමයි ලෝකය තීරණය කරන්නේ, අපේ විදේශ ප්‍රතිපත්තිය මොන වාගේද කියලා. එහෙම නැතුව අපි කරන කථාවලින් නොවෙයි. ඉතින්, ඒ පිළිබඳව අපි සැලකිලිමත් ආදර්ශයක් ලොවට සපයා තිබෙනවා කියලා අපි හිතනවා.

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා]

ඒ වාගේම මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු අනිල් ජයන්ත මැතිතුමා ඉතා හොඳින් පැහැදිලි කළා, මේ අර්බුදය තුළ අපේ රටේ ආර්ථිකය කළමනාකරණය කර ගන්නා ආකාරය පිළිබඳව. ඇත්තටම මේ අර්බුදය හරහා අපට ඇති වන ගැටලුවක් තමයි, ප්‍රවාහනය සහ ප්‍රවාහනයට අවශ්‍ය ඉන්ධන සපයා ගැනීම. මොකද, අපේ රට ඉන්ධන, ගෑස්, ඖෂධ, තිරිඟු පිටි, පොහොර, ඒ වාගේම cooking oil වාගේ බොහෝ දේවල් ආනයනය කරන රටක්. ඒ නිසා මෙවැනි බාහිර සාධකයක් හේතුවෙන් ඇති වන අර්බුදයකදී අපට අනිවාර්යයෙන්ම මේ ගැටලුවලට මුහුණ දෙන්න සිද්ධ වනවා.

ඒ වාගේම මේ අර්බුදයෙන් විදුලිය උත්පාදනයටත් යම් කිසි බලපෑමක් ඇති වන්න පුළුවන්. විපක්ෂයේ මන්ත්‍රීවරුන් නිතර නිතර බාල ගල් අඟුරු පිළිබඳ කථාවක් ගේනවා. ඇත්තටම ගල් අඟුරු භාවිතය සහ එම ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් නොමැති නිසා තමයි මේ අය හැම වෙලාවේම බාල ගල් අඟුරු ගැන කථා කරන්නේ.

සාමාන්‍යයෙන් අපේ රටේ නිපදවන්නේ නැති භාණ්ඩයක් අපේ රටට ආනයනය කරනකොට අපට යම්කිසි ක්‍රමයක් අනුගමනය කරන්න වෙනවා; ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කරන්න වෙනවා. මේක ගල් අඟුරුවලටත් පොදුයි, ඖෂධවලටත් පොදුයි. මොකද, ඖෂධ මේ රටේ නිෂ්පාදනය කරන්නේ නැහැ. විදේශ රටවල නිෂ්පාදනය කරන ඖෂධ තමයි අපි සියයට 80ක් විතරම පාවිච්චි කරන්නේ. මේ දෙක ගැනම මට පෞද්ගලික අත්දැකීම් තිබෙනවා. ඖෂධ ගෙන්වීමේදීත්, ගල් අඟුරු වැනි දෙයක් ගෙන්වීමේදීත් අපට භාවිත කරන්න වෙන්නේ හොඳ ප්‍රසම්පාදන ක්‍රියාවලියක්. අපි ආනයනය කරන භාණ්ඩයේ යම්කිසි ගැටලුවක් ඇති වුණොත්, එහි quality failure එකක් වුණොත්, ඒකට යම්කිසි කොන්දේසි පැනවීමක් තිබෙනවා. මේ ගල් අඟුරු ගෙන්වීමේ ක්‍රියාවලියේදී සිද්ධ වෙලා තිබෙන්නේ ඒකයි. අපි දන්නවා, පසුගිය කාල සීමාව තුළ මේ කටයුත්ත ප්‍රසම්පාදන ක්‍රියාවලියකට බඳුන් වුණේ නැහැ කියලා. තමන් දන්න කියන, තමන්ට විශ්වාසවන්ත, තමන්ට හිතවත් අය ලවා තමයි මේ රටට ගල් අඟුරු ආනයනය කළේ. අපට එවැනි අවස්ථාවලටත් යන්න සිද්ධ වෙනවා. දැන් පවතින මේ අර්බුදයත් ඒ වාගේ අවස්ථාවක්.

අර්බුදයකදී සමහර විට අපි සාම්ප්‍රදායිකව ක්‍රියාත්මක කරන ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලියට යන්න අපට බැරි වෙන්න පුළුවන්. එහෙම වුණොත් ඒක සාධාරණයි. නමුත්, පසුගිය කාලයේ පැවැති ආණ්ඩු කිහිපයක්ම අර්බුද තුළදී පමණක් නොවෙයි, එදිනෙදා කාර්යයන්වලදීත් ප්‍රසම්පාදනයෙන් තොරව එවැනි ගනුදෙනු කළා. ගල් අඟුරු සම්බන්ධයෙනුත් වෙලා තිබුණේ ඒකයි. නමුත්, අපේ ආණ්ඩුව ගල් අඟුරුවලට නියම ප්‍රසම්පාදන ක්‍රියාවලියක් භාවිත කළා. ඒ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ගල් අඟුරු සැපයුම්කරුවෙක් තෝරා ගත්තා. ඒ සැපයුම්කරුවාගෙන් ගල් අඟුරු පිළිබඳව අදාළ අවස්ථාවලදී වාර්තා ලබා ගත්තා. අපේ රටට ඒ ගල් අඟුරු ගෙනාවාම අපේ නිරීක්ෂකයන් හඳුනා ගත්තා, ඒවා යම්කිසි ප්‍රමාණයකට ප්‍රමිතියෙන් බාලයි කියලා. එතකොට කරන්න තිබෙන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තිබෙන කොන්දේසි අනුව අයකර ගැනීම් කරන්නයි. ඒක තමයි සාමාන්‍ය ක්‍රියාවලිය. අපි පිට රටකින් යම්කිසි භාණ්ඩයක් ආනයනය කළාට, එහි quality එක ගැන දන්නේ නැහැ. මම හිතනවා, ඔබතුමන්ලා මේ පිළිබඳව ඕනෑ තරම් අහලා තිබෙනවා කියලා. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් ගෙන්වන ඖෂධ යම්කිසි කාල සීමාවකට පසුව හඳුනා ගන්නවා, quality fail කියලා. ඊට පසුව අපි ඒවා සම්පූර්ණයෙන් භාවිතයෙන් ඉවත් කරලා, ඒ සැපයුම්කරුවන්ගෙන් අර කොන්දේසි අනුව අය කිරීම් කරනවා. මේ ක්‍රියාවලිය නොතේරෙන තාක්කල් මේ කාරණය තේරුම් ගන්න බැහැ. ඒක තමයි ඇත්තටම අද සිදු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අර්බුදය බාහිර අර්බුදයක්. මේක "දිට්වා" සුළි කුණාටුව වාගේ, සුනාමිය වාගේ අපේ රටට නිශ්චිතවම කළමනාකරණය කර ගත හැකි වූ අර්බුදයක් නොවෙයි. මැද පෙරදිග යුද්ධයක් තිබෙනවා. ඒ යුද්ධය පවතින කාල සීමාව, එය කොතැනින් කෙළවර වෙයිද, කෙළවර වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට අවබෝධයක් නැහැ. මම හිතන විධියට යුද්ධයට මැදිහත් වෙලා ඉන්න අයටත් ඒ ගැන අවබෝධයක් නැහැ. ඒ නිසා මේ යුද්ධය නිසා ඇති වන ඵල විපාක පාලනය කරන්න අපට කරන්න තිබෙන්නේ මේ කටයුතු හොඳින් කළමනාකරණය කර ගැනීමයි.

කොවිඩ් වසංගතයත් ගෝලීය වසංගතයක්. හැබැයි, කොවිඩ් වසංගතයට මුහුණ දුන් වෙලාවේ ඒකට මුහුණ දෙන්න ඕනෑ තරම් ක්‍රම අපි අපේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් සකස් කරලා තිබුණා. අපි ඒ වෙලාවේ රාජ්‍ය පාලනයේ හිටියේ නැහැ; ආණ්ඩු පක්ෂයට උදවු කරමින් හිටියේ නැහැ. අපි ඒ වෙලාවේ විපක්ෂය නියෝජනය කරමින් හිටියේ. නමුත්, අපි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට උදවු කළා, ඒ වෙලාවේ ඒ තත්ත්වය කළමනාකරණය කර ගන්නේ කොහොමද කියලා. නමුත් ඔබට හොඳට මතක ඇති, ඒ වෙලාවේ හිටපු පාලකයන් වෛද්‍ය නිලධාරින් සකස් කරපු ඒ සැලසුම් වෙනස් කළ බව. එම නිසා ඒ තත්ත්වය දික්ගැස්සුණා. අපට ඒක තමයි වුණේ. ඒ කියන්නේ, අපට අභ්‍යන්තරව කළමනාකරණය කර ගත හැකි වූ අර්බුදයක් වුණත් පාලකයන්ගේ තිබුණු ඒ මැදිහත් වීම නිසා දීර්ඝ කාලීනව ඒකට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ නිසා දැන් අපි මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. මේක බාහිරව පවතින යුද්ධයක්. අපට මෙය පාලනය කර ගැනීමට තිබෙන හැකියාව සීමාසහිතයි. ඒ නිසා අපි ක්‍රමානුකූලව රාජ්‍ය පාලනය කර ගැනීම සහ කළමනාකරණය කර ගැනීම තමයි වැදගත් වෙන්නේ.

කොවිඩ් වසංගතයෙන් පසුව තමයි ආර්ථික අර්බුදය ආවේ. ඒ ආර්ථික අර්බුදය ආවේ අපේ රටේ ශක්තිමත් ආර්ථිකයක් තිබුණේ නැති නිසායි. ශක්තිමත් ආර්ථිකයක් තිබුණේ නැති නිසා කොවිඩ් වසංගතය අවසන් වනකොට අපේ විදේශ ප්‍රේෂණ අඩු වුණා; සංචාරකයන් එන එක අඩු වුණා; අපනයනවලින් ලැබෙන ආදායම අඩු වුණා. ඒ නිසා අපේ සංචිත හිඳුණා. අපේ හිටපු පාලකයන්ට ඒවා කළමනාකරණය කර ගන්න හැකියාවක් තිබුණේත් නැහැ. ඒ නිසා අවසානයේදී රට බංකොලොත් වුණා. එහෙම නැත්නම් රට බංකොලොත් කළා. නමුත් මේ වෙලාවේ තිබෙන මේ අර්බුදය බාහිර අර්බුදයක් වුණත් අපි එය හොඳින් කළමනාකරණය කර ගනිමින් ඉන්නේ, 2025 වසර වනකොට අපි සෑහෙන දුරකට අපේ ආර්ථිකය ශක්තිමත් කරගෙන හිටපු නිසායි. 2025 වසර අවසානයේදී අපි අය වැය වාර්තාව ඉදිරිපත් කරනකොට තමයි "දිට්වා" සුළි කුණාටුව ආවේ. අපි 2026දී ඉතාම හොඳට ආර්ථික කටයුතු කරන්න සැලසුම් කරමින් හිටියේ, "දිට්වා" සුළි කුණාටුව එනකොට. ඒ නිසා අපට ආර්ථිකය ගැන විශ්වාසයක් තිබුණා. දැන් අහනවා නේ, භාණ්ඩාගාරයේ අතිරික්තය සහනාධාර දෙන්න පාවිච්චි කරන්නේ නැත්තේ ඇයි කියලා. අර්බුදයකදී ආණ්ඩුවක් එහෙම ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි යම්කිසි පාලනයකට නතු කළ යුතුයි, අපට තිබෙන මුදල් ප්‍රමාණය; සංචිත ප්‍රමාණය. ජනතාවගේ එදිනෙදා ජීවන තත්ත්වය පවත්වාගෙන යෑමට තමයි අපි ක්‍රියාත්මක විය යුත්තේ. ආණ්ඩුව ඉතාම හොඳින් එය කළමනාකරණය කරනවා. ඇත්තටම පසුගිය 17වැනි දා ගරු ජනාධිපතිතුමාගේ කථාවේදී ජනතාවට අවශ්‍ය සැලසුම තමයි ඉදිරිපත් කළේ. පාර්ලිමේන්තුවටත් ඒක අදාළයි. ආර්ථික ක්‍රියාකාරකම් පවත්වා ගන්නේ කොහොමද, දරුවන් පාසල් යවා ගන්නේ කොහොමද, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සපයා ගන්නේ කොහොමද කියන කරුණු පිළිබඳව ජනාධිපතිතුමා පසුගිය 17වැනි දා ඉතාම හොඳ පැහැදිලි කිරීමක් කළා. ඒකේ දිගුවක් හැටියට තමයි අද එතුමා මධ්‍යස්ථභාවය ගැන කථා කරලා, ඉන්ධන, ගෑස්, විදුලිය අපි කළමනාකරණය කර ගන්නේ

කොහොමද කියන එක ගැන කරුණු ඉදිරිපත් කළේ. මේ කම්පනයට ඔරොත්තු දෙන ආර්ථිකයක් අපට තිබුණු නිසා තමයි අපි අද මේ තරමටවත් මේ තත්ත්වය පාලනය කරගෙන ක්‍රියාත්මක වෙමින් ඉන්නේ. ඒ ශක්තිය අපට ලැබුණේ අපි 2025 වසර පුරාම මේ රටේ ආර්ථිකය ඉතාම සාධනීය ලෙස කළමනාකරණය කරලා, අපේ ආදායම් එකතු කිරීම වැඩි කරගෙන, අපේ වියදම් අඩු කරගෙන, හොඳ ශක්තිමත්භාවයක් ආරක්ෂා කරගෙන හිටපු නිසාය කියලා මම හිතනවා. ඒ නිසා තමයි අද මේ බාහිර අර්බුදයක් තිබියදීත් අපේ රටේ ජනතාවට ජීවිතය පවත්වාගෙන යන්න හැකියාව ලැබී තිබෙන්නේ කියන කාරණය කියමින්, මට කථා කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

අද වනකොට ලෝකය තුළ ඇති වෙලා තිබෙන මේ යුදමය තත්ත්වය නිසා අපේ රටේ සෑම තරාතිරමකම සිටින අයට ලොකු බලපෑමක් සිද්ධ වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ දිස්ත්‍රික්කය ඇතුළුව අපේ රටේ සිටින වී ගොවීන්, ධීවරයන්, කර්මාන්තකරුවන් වාගේ නොයෙකුත් අංශවල රැකියාවල නියුතු අයට මේ ප්‍රශ්නය තදින්ම බලපා තිබෙනවා. මේ වනකොට වී අස්වනු නෙළීමේ කාලය උදා වෙලා තිබෙනවා. සමහරු අස්වනු නෙළමින් සිටිනවා. සමහර අය අස්වනු නෙළලා, නැවත යල කන්නයේ වගා කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ වගා කටයුතු ආරම්භ කරපු ගොවි මහත්වරුන්ට තෙල් ටික, ඩීසල් ටික නිසි වෙලාවට, නිසි කලට ලබා ගන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ගොවීන්ට විශේෂත්වයක් ලබා දීලා, මේ QR කේතය තුළින් හෝ එහෙම නැත්නම් ප්‍රාදේශීය ලේකම්තුමන්ලා හරහා හෝ ගොවිජන සංවර්ධන නිලධාරින් හරහා හෝ නිර්දේශ අරගෙන ඒ අයටත් ඩීසල් ලබා දෙන වැඩ පිළිවෙළක් කඩිනමින් සකස් කර දෙන්න කියලා. ධීවර ක්ෂේත්‍රය ඇතුළු රටේ අනෙකුත් අංශවලටත්, ඒ ඒ ක්ෂේත්‍රවලට පහසුවෙන් තෙල් ලබා ගැනීමට හැකි වැඩ පිළිවෙළක් සූදානම් කර දෙන්නය කියන ඉල්ලීම මම කරනවා.

ඒ වාගේම තමයි ප්‍රවාහන කටයුතු. මේ වනකොට පැල්වත්ත, සෙවනගල වාගේ කර්මාන්තශාලා වැඩ ආරම්භ කර තිබෙනවා. මේ කර්මාන්තශාලාවලට උක් දඩු සපයන අයගේ උක් ගස් කපලා සති ගණන් ඉඩම්වල වේළෙන තත්ත්වයක් තිබෙනවා. ඒ උක් ගස් ටික ප්‍රවාහනය කරගන්න බැරිව තිබෙනවා. ඒ නිසා උක් ගොවියාටත් ඩීසල් ටික ලබාදෙන වැඩ පිළිවෙළක් කඩිනමින් සකස් කර දෙන්න කියන ඉල්ලීම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ තෙල් අර්බුදය ඇති වෙන්න ගල් අඟුරු ගෙන ඒම බලපෑමක් වෙලා තිබෙනවා කියන එක තමයි මගේ විශ්වාසය. ප්‍රමිතියෙන් තොර ගල් අඟුරු නැව් 12ක් මේ වනකොට මේ රටට ගොඩ බාලා තිබෙනවා. මේ ගල් අඟුරු නැව් 12න් මේ වනකොට මේ රටට රුපියල් කෝටි 12,000ක් පමණ පාඩුවෙලා තිබෙනවා. මෙතැන වංචාවක් සිදු වෙලා තිබෙන බව විපක්ෂයේ විතරක් නොවෙයි, රටේ, ගමේ, කඩේ පිලේ හැම තැනකදීම දැන උගත්, තේරෙන අය කථා කරනවා. තැන් තැන්වල මේ ගැන කථා කරනවා. අන්න ඒ නිසා මම කියනවා, මේ වංචාව වෙලා තිබෙනවා කියලා. මේ ආණ්ඩුව ලබාගන්න කලින් මේ රටේ ජනතාව ඔබ කෙරෙහි විශාල විශ්වාසයක් තැබුවා. අන්න ඒ නිසා තමයි ජනාධිපතිතුමාට වාගේම ඔබතුමන්ලාට විශාල බලයක් සහිතව පාර්ලිමේන්තුවට එන්න පුළුවන්කම ලැබුණේ.

එදා ඔබතුමන්ලා ප්‍රකාශ කරපු දේවල් මොනවාද? එක් පැත්තකින් බැංකු හොරු ඉන්න කථාවක් ප්‍රකාශ කළා. අනික් පැත්තෙන්, ගුවන් යානාවලින් හොරකම් කරපු අය ගැන කථා කළා. තවත් පැත්තකින් උගන්ඩාවේ සල්ලි ගැන කථා කළා. ඒ සල්ලි ගැන කථා කරලා, "මේ ඉන්න වල් පැළ වෙනුවට මල් පැළ පාර්ලිමේන්තුවට එවන්න" කියන කථාව ඔබතුමන්ලා ප්‍රකාශ කළා. ඔබතුමන්ලාගේ කථාව ජනතාව විශ්වාස කළා. ඒ විශ්වාසය තුළින් ඔබතුමන්ලා ජයග්‍රහණය කළා. හැබැයි, මිනිස්සුන්ගේ ඒ විශ්වාසය මේ වෙනකොට බිඳ වැටිලා තිබෙනවා. ගල්අඟුරු වංචාව තුළින් ඒ බව මේ රටට ඔප්පු වෙලා තිබෙනවා කියන කථාව සෑම තැනකම කථා වෙනවා. ඒ කථාව අද පාර්ලිමේන්තුවේත් දිගින් දිගටම කථා වුණා. මම විශ්වාස කරනවා, මේ ගල් අඟුරු වංචාව නිසා තමයි අද අපට, ගොවීන්ට ඩීසල් ගන්න පෝලිමේ ඉන්න වෙලා තිබෙන්නේ කියලා. ධීවරයාට පෝලිමේ ඉන්න සිද්ධ වෙලා තිබෙන්නේ මේ වංචාව නිසායි. මේ ගල් අඟුරු වංචාව නිසා අපට මේ තෙල් අර්බුදය ඇති වුණාය කියන විශ්වාසය ඇති වෙලා තිබෙනවා. ඔබතුමන්ලා මේ රටට ගෙන්වන ලද මේ ගල් අඟුරු ප්‍රමිතියෙන් බාල නිසා විදුලිය නිපදවන්න ඩීසල් අවශ්‍ය වෙනවා. ඔබතුමන්ලා මේ රටට ගෙන්වන ඩීසල්වලින්, ඩීසල් ලීටර් ලක්ෂ ගණනක් මේ බාල ගල් අඟුරු නිසා දවසකට අපතේ යනවා.

ඒ නිසා මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේ දේවල් නිවැරදි කරගෙන, තමුන්නාන්සේලා වල් පැළ නොවී අපේ දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් කටයුතු කරන්න කියලා. විශේෂයෙන් මම මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව වෙනුවෙන් මේ ඉල්ලීම කරනවා. මේ ගොවි ජනතාවගේ ගොවිතැන් කටයුතු කර ගැනීම සඳහා ඩීසල් ලබා ගන්නා ක්‍රමය කඩිනමින් ඉටු කරදෙන්න කියන ඉල්ලීම කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.13]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளு மன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා මට මේ අවස්ථාව ලබා දීම ගැන.

[ගරු බිමල් රත්නායක මහතා]

අද මතු කරන ලද විශේෂ කරුණු දෙක තුනක් ගැන සඳහන් කරමින් මේ මාතෘකාවට එළඹෙන්න මම කැමැතියි, මේ ගැන දැන් ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමිය, ගරු විපක්ෂ නායකතුමා වාගේ ප්‍රධාන දේශපාලන නායකයන් හැම කෙනාම කථා කර තිබෙන නිසා. පළමු කාරණය මේකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද උදේ ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් චෙම්මනි මිනී වළ ගැන ප්‍රශ්න කළා. එතුමා අධිකරණ ඇමතිතුමාට කළ චෝදනාව වුණේ, මේ ආණ්ඩුව මෙම සමූහ මිනී වළේ පරීක්ෂණ කටයුතු කරන්නේ නැහැ, අපි ජාත්‍යන්තර වශයෙනුත් එක්සත් ජාතීන්ටත් ඒක පොරොන්දු වෙලා තිබෙනවා, එසේ තිබියදීත් මේ ආණ්ඩුව මේක කරන්නේ නැහැ කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි අඩුපාඩුකම් පිළිගන්න ලෑස්ති දේශපාලන ව්‍යාපාරයක්. නමුත්, ඇත්තටම ඉතාම කනගාටු හිතෙන කාරණය මෙයයි. කරපු දේ අගය නොකළාට කමක් නැහැ. නමුත් කරපු දේ දැනගෙන විවේචනය කරන එක තමයි වැරැද්ද.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1999දී තමයි චෙම්මනි සමූහ මිනී වළෙන් මිනිස් ඇටකටු සොයා ගත්තේ. එදා සිට 2024 දක්වා අවුරුදු 25ක් ගත වුණා. ඒ අවුරුදු 25ටම මේ චෙම්මනි සමූහ මිනී වළෙන් සොයා ගත්තේ මිනිස් ඇටසැකිලි 15යි. 2015 සිට 2019 දක්වා අවුරුදු 5 තුළ තිබුණු ඒ ආණ්ඩුව යටතේ, ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂය, විශේෂයෙන්ම එහි හිටපු නායකයන් - සුමන්තිරන් මන්ත්‍රීවරයා වාගේ අය- ඇත්තටම ඒ අය විපක්ෂයේ සිටියා වුණත් සුවිශාල දේශපාලන කාර්යභාරයක් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ධුරය දරපු ඒ ආණ්ඩුවේ සිටියදී කළා. ඒ අයට ඇමති කෙනෙකුට වඩා බලතල තිබුණා. එතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියටත් කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, අවසාන කාලයේදී මිලියන හාර පන්සීය දුන්නා, ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට එතුමන්ලාගේ ප්‍රදේශයේ වැඩ කරන්න. අපි ඒකේ විශේෂ වරදක් දකින්නේ නැහැ. නමුත්, ඒ අවුරුදු පහේදී තමිළ් අරසු කච්චි පක්ෂයේ නායකයන්ට චෙම්මනි මිනී වළ අමතක වුණේ ඇයි?

අපි බලය ගත්තේ 2024 සැප්තැම්බර් මාසයේ. ඊට පස්සේ අපට හරියට ආණ්ඩුව හදාගන්න පුළුවන් වුණේ පාර්ලිමේන්තු බලයත් එක්ක 2024 නොවැම්බර්වල. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2024 නොවැම්බර් මාසයේ පාර්ලිමේන්තු බලය ලැබුණාට පස්සේ ඉඳලා 2026 අවුරුද්දේ අද වෙනකොට මෙම මාස 17 තුළදී චෙම්මනි මිනී වළෙන් සොයා ගන්නා ලද මිනිස් ඇටසැකිලි ප්‍රමාණය 224ක්. පරීක්ෂණ කරලා කරලා, ඒවාට නිලධාරින් වෙන් කරලා, අධිකරණය මැදිහත් කරගෙන අද වනකොට මිනිස් ඇටසැකිලි 224ක් සොයා ගෙන තිබෙනවා. අපි මාස 17ට මිනිස් ඇටසැකිලි 224ක් සොයාගෙන තිබෙනවා. නමුත් ඊට කලින් අවුරුදු 25ටම කැණීම් කරලා සොයා ගත්තේ මිනිස් ඇටසැකිලි 15යි. එතුමන්ලාත් විශාල වගකීම් දරපු ආණ්ඩුවක හිටියා. විග්නේෂ්වරන් මැතිතුමා උතුරු පළාත් සභාවේ මහ ඇමතිකම දැරුවා. නමුත් දැන් මෙහෙම කටයුතු කරන ආණ්ඩුවකට තමයි මේ විවේචනය කරන්නේ. චෙම්මනි මිනීවළ තිබෙන කොට්ඨාසයත් අපි දිනලා තිබෙන්නේ. චෙම්මනි මිනීවළ තිබෙන මැතිවරණ කොට්ඨාසයත් අපි දිනලා තිබෙන්නේ. ඒ ප්‍රදේශයේ මන්ත්‍රීතුමා ජාතික ජන බලවේගයේ කෙනෙක්. අපි මේකේ සම්පූර්ණ කරුණු දන්නවා. අපි මේක ගැන හොයනවා; අපි එතැනට ගිහිල්ලාත් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක මීට අවුරුදු 30කට හෝ ඊටත් කලින් වෙච්ච අපරාධයක්. ඊට පස්සේ, මේ අපරාධය කරපු අය හෝ කරන්න දායක කර ගත්ත අය නායකත්වය දුන්නු අය ආණ්ඩු ගණනාවක් කර තිබෙනවා. ඔබතුමිය මේ ගැන දන්නවා. ඔබතුමිය නුවර දිස්ත්‍රික්කයේ ඉතාම දක්ෂ නීතිඥතුමියක්. ඔබතුමිය දන්නවා අපට සැක හිතුණු පළියට ගිහිල්ලා මිනිස්සු අල්ලන්න බැහැ කියලා. අනික, මේක අවුරුදු 30ක් විතර පරණ නඩුවක්. මේ වාගේ දෙයක් සම්බන්ධයෙන් කටයුතු කරනකොට පොඩ්ඩක් හරි වරදක් වුණොත් අපරාධකරුවා බේරෙනවා. ඒ නිසා තමයි මම මේ ප්‍රශ්නයට උත්තර දුන්නේ. ඒ වාගේම, මේකට අපේ ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමාත් උත්තර දුන්නා. මම මේක ගැන පාඩම් කරගෙන ඉන්න නිසා, මම මේ ගැන උනන්දු නිසා අපි මේක හොයනවා. අපට ජන වරමක් තිබෙනවා මේක හොයන්න. මේක ගැන විතරක් නොවෙයි, මාතලේ ඇතුළු හැම මිනී වළක් ගැනත් හොයන්න ඕනෑ. යුක්තිය ඉටු කරන එක අධිකරණ ක්‍රියාවලියක් හරහා යනකොට ඒකට කාලයක් යනවා.

මේ යුක්තිය ඉටු කරන එක අධිකරණ ක්‍රියාවලියක් හරහා පමණක් නොවෙයි, දේශපාලන, සමාජ සාධාරණත්වය පැත්තෙනුත් කරන්න පුළුවන්. අද අපි ඒක උතුරේ කරලා තිබෙනවා. අද උතුරේ සිටින කිසිම දෙමළ මනුස්සයෙක් පීඩනයෙන් ඉන්නේ නැහැ. මම ඒ හැම කුඩා ගමකටම ගියාම අහනවා, දෙමළ වීම නිසා කලින්ට වඩා කුමන හෝ පීඩනයක් දැනෙනවා ද කියලා. ඔවුන් මොකක්ද කියන්නේ? එහෙම දැනෙන්නේ නැහැ කියනවා. දැන් එහෙම වෙන්නේ නැහැ. නමුත් සමහරු රට එකතු කිරීමේ දේශපාලනය වෙනුවට, බෙදීමේ දේශපාලනයම පදනම් කර ගත්තාට පස්සේ මෙවැනි විවේචන පමණයි ඉදිරිපත් කරන්නේ. ඒ නිසා තමයි මම කිව්වේ, අපි මේක කරනවා කියලා. මම මේ ගැන උතුරේ ආණ්ඩුකාරතුමාගෙනුත් විමසුවා. මගේ දැනීමේ හැටියට අප්‍රේල් 20 නැවත මේ කැණීම් පටන් ගන්නවා. මොකද, විවිධ හේතු නිසා මෙහි කැණීම් නතර වෙනවා. නමුත්, ඒවා දේශපාලන හේතු නොවෙයි. ඒවා සහමුලින්ම පරිපාලන සහ සමහර විට අධිකරණමය හේතු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මේ කාරණයත් ඔබතුමියට කියන්න ඕනෑ. දැන් මේ දවස්වල ඉන්දියාවේ ප්‍රාන්ත මැතිවරණ තියන්න යනවා. තමිල්නාඩුවේ ශ්‍රී ලාංකිකයන් පිරිසක් ඉන්නවා, එදා මේ රටේ පැවැති යුද්ධය නිසා සහ විවිධ හේතු මත මේ රටින් යන්න සිදු වෙච්ච. එම සංඛ්‍යාව ගැන එක එක ඉලක්කම් කියනවා. නමුත් OfERR සංවිධානය කියන ඉලක්කම අනුව ගත්තොත්, එහේ 89,000ක විතර පිරිසක් ඉන්නවා. OfERR කියන සංවිධානය ඒ ජනතාව වෙනුවෙන් අවුරුදු 30ක් තිස්සේ වැඩ කරනවා. මා හිතන විධියට, ඊටත් වැඩි කාලයක්. හිටපු විශිෂ්ට නායකයෙකු වෙච්ච එස්.ජේ.වී. චෙල්වනායගම් මැතිතුමාගේ පුතා තමයි ඒ සංවිධානයේ නායකත්වය දරන්නේ. අද මෙහේ ඒ ක්‍රියාකාරී නායක නායිකාවන් ගණනාවක් ඉන්නවා. මමත් 2007දී තමිල්නාඩුවේ ඒ කඳවුරුවලට ගිහිල්ලා තිබෙනවා, අපේ ගරු චන්ද්‍රසේකර් ඇමතිතුමා එක්ක. එහි ගිහිල්ලා ඇවිත් පාර්ලිමේන්තුවේ Select Committee එකක් දාලා, එදා මේ රටින් පිටව ගිය පුරවැසිභාවය නොතිබිච්ච 28,500කට මුළු පාර්ලිමේන්තුවම එකතු වෙලා පුරවැසිභාවය ලබා දීලාත් තිබෙනවා.

අද ඉන්දියාවේ ප්‍රාන්ත ඡන්ද ළං වෙච්ච නිසා ඒ අයට පුරවැසිභාවය ලබා දෙන්න කියලා යෝජනාවක් ඇවිත් තිබෙනවා, ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ ස්ටාර්ලින් මහ ඇමතිතුමාගෙන්. අපි ඒක අගය කරනවා. හැබැයි, අපි එක දෙයක් කියන්න කැමැතියි. ඒ මිනිස්සු ඇති තරම් බැට කාලා ඉන්නේ. ඒ අයට පුරවැසිභාවය දෙන්න කියලා ඔවුන් ඉල්ලා තිබෙනවා. මොකද, ඒ සමහර අය ඉපදිලා තිබෙන්නේත් ඉන්දියාවේ. අපේ කිලිනොච්චියේ කරච්චි ප්‍රාදේශීය සභාවේ ප්‍රශාන්තිනී කියලා මන්ත්‍රීතුමියක් ඉන්නවා. එතුමිය ඉපදිලා තිබෙන්නේත් ඉන්දියාවේ. 2014දී අම්මා, තාත්තා, නංගිලා, මල්ලිලා එක්ක

මෙහේ ආපු එතුමිය දැන් අපේ පක්ෂයේ මන්ත්‍රීතුමියක්. ඉතින් අපි කියන්න කැමැතියි, මේ ප්‍රශ්නයේදී අප කොතැනද ඉන්නේ කියලා. මොකද, සුමන්තිරන් හිටපු මන්ත්‍රීතුමා මීට මාස දෙකකට කලින් ලොකු ගෝරනාඩුවක් ඇල්ලුවා, ඉන්දියාවේ ඉඳලා ආපු returnee කෙනෙක් Palaly Airport එකෙන් එනකොට Immigration and Emigration Department එකෙන් අත්අඩංගුවට ගත්තා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නමුත් ඔබතුමියත් දන්නා පරිදි, එදා පැවැති යුද්ධය නිසා මේ රටින් පිට වෙලා ඉන්දියාවට ගිහින් අනාථ වෙච්ච අය අතරින් 2009.01.01වන දා ඉඳන් ලංකාවට ඇවිත්, පවුල් 1,339ක පුද්ගලයන් 4,011ක් නැඟෙනහිර පළාතේ පදිංචි වෙලා ඉන්නවා. ඒ වාගේම, පවුල් 5,241ක පුද්ගලයන් 14,531ක් ලංකාවට ඇවිත් උතුරු පළාතේ පදිංචි වෙලා ඉන්නවා. ඒ කියන්නේ, ඒ ජනතාව ලංකාවට එන්න කැමැතියි; ලංකාවේ ඉන්න කැමැතියි. ඒක තමයි පවතින තත්ත්වය.

සමස්තයක් ලෙස ගත්තොත්, යුද්ධය නිසා ඉන්දියාවට ගිය ජනතාවගෙන් පවුල් 6,580ක පුද්ගලයන් 18,542ක් මෙහේට ඇවිල්ලා තිබෙනවා. මේ කාලය ගත්තොත්, එනම් පෙබරවාරි මාසය වනකොට, තවත් පවුල් 46ක 246 දෙනෙක් මෙහේට ඇවිල්ලා තිබෙනවා. අපි ඒගොල්ලන්ට ඉඩම් ලබා දීලා - ඒගොල්ලන්ගේ පාරම්පරික ඉඩම් ලබා දීලා - විදුලි බලය ආදි ඔක්කෝම ලබා දීලා තිබෙනවා. අපි ඒ කටයුතු සඳහා මහන්සි වෙලා තිබෙනවා. මීට කලින් පැවැති ආණ්ඩුත් යම් යම් වැදගත් දේවල්, හොඳ දේවල් කරලා තිබෙනවා. අපි ඒකත් කියන්න ඕනෑ. ඉතින් මේක තමයි ඒ කටයුතු කරගෙන යන විධිය. ඒ නිසා ශ්‍රී ලංකාවට එන්න කැමැති ඉන්දියාවේ සිටින සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම අපි කියන්නේ, අපි අත් දෙකම දිගු කොට ඔයගොල්ලන් භාර ගන්න ලෑස්ති බවයි. මා අර අපේ මන්ත්‍රීතුමිය ගැන කිව්වේත්, එහෙම අය ඇවිල්ලා දැන් මේ රටේ දේශපාලන නායිකාවන් වෙලා සිටින බව කියන්නයි. ඒ නිසා මේ රටට එන්න. නමුත් එහේ ඉපදිලා, එහේ ඉස්කෝලේ ගිහිල්ලා, ඉන්දියානු ජාතිකයෙකු කසාද බැඳලා එහේම ඉන්න ඕනෑ කියලා ඔබ හිතනවා නම්, අපි ඉන්දියානු ආණ්ඩුවෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා ඒ අයට එහේ පුරවැසිභාවය ලබා දෙන්න කියලා. මොකද, ඒ ජනතාව යුද්ධයෙන් බැට කාලා ඉන්දියාවට ගිය අය. ඉන්දියාවේ කලින් Citizenship Act එක වෙනස් කරද්දී ඒ අයට - ලංකාවෙන් ගිය අපේ ඒ ජනතාවට - පුරවැසිභාවය ලැබුණේ නැහැ. ඒ නිසා මේ සැරේ මෙය ඡන්ද පොරොන්දුවක් බවට පත් කර ගන්නේ නැතුව, පුරවැසිභාවය ඉල්ලන අයට එය ලබා දෙන්න කියා අපි ඉල්ලා සිටිනවා. ඒ ජනතාව ඒ රටේ පුරවැසිභාවය ඉල්ලනවා නම් -අවුරුදු 30කට වඩා එහේ හිටපු නිසා- ඒ අයට ලබා දෙන්න. ඒ අය අපේ රටේ මිනිස්සු, ඒ ගොල්ලන් අපේ රටට තමයි එන්න කැමැති. අපි කියන්න කැමැතියි, ඒ අයට එන්න කියලා.

ඒ වාගේම අපි මේ කාරණයත් කියන්න කැමැතියි. අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා සම්පූර්ණයෙන්ම උපදෙස් දීලා තිබෙනවා, ඒ අය එනකොට අත්අඩංගුවට ගන්න එපා කියලා. මොකද, ඒ මිනිස්සු පණ බේරා ගන්නයි රටින් පිටව ගියේ. එදා නීත්‍යානුකූල portsවලින්ම යන්න ඒ අයට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ අය ජීවිත බේරා ගන්න ඕනෑ නිසා අහු වුණු හැම තැනකින්ම ගියා. නමුත් ඔවුන් ආපසු එනකොට, ගිය සීල් එක passport එකේ නැහැ. ඉතින් illegally port එකකින් ගියා කියන පදනමින් ඔවුන් අත් අඩංගුවට ගන්න එපා කියා උපදෙස් දීලා තිබෙනවා. එම නිසා මේ වන කොටත් කටුනායකින් එවැනි දසදහස් ගණනක් ඇවිල්ලා තිබෙනවා. මා හිතන විධියට, ඒ දහඅටදහස් ගණනින් 18,500ක් ම එන්න ඇත්තේ ඒ ගුවන් තොටු පොළෙන්. නමුත්, අත්අඩංගුවට අරගෙන නැහැ. මොකද, මහජන ආරක්ෂක ඇමතිතුමා ඒ උපදෙස් දීලා තිබුණා. නමුත් Palaly Airport එකේදී එක්කෙනෙක් අත්අඩංගුවට ගත්තාම තමයි ඔය සුමන්තිරන් හිටපු මන්ත්‍රීතුමා ලොකු නැටුමක් නැටුවේ. ඒ හැම නැටුමකින්ම මොකක්ද වෙන්නේ? එන්න ඉන්න කෙනාත් අධෛර්යයට පත් කරන එකයි. ඒකෙන් එතුමාත් යම්කිසි ගැටලුවකට මුහුණ දුන්නා කියා මට මතකයි. ඒ ප්‍රශ්නයට දෙන්න තිබෙන උත්තරය ඒකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, තුන්වෙනි කාරණය මේකයි. අපේ රට කුඩා රාජ්‍යයක්. අපේ රට දූපතක්. ඒ නිසාම අපි දන්නවා, අපට ස්වෛරීත්වය කියන එක අතිශය වැදගත් බව. අපට ස්වාධීනත්වය කියන එක අතිශය වැදගත්. ගරු ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව ප්‍රකාශ කළා, ඉරාන - ඇමෙරිකානු, ඊශ්‍රායල යුද්ධයේ සෘජු බලපෑම අපේ රටට ආපු අවස්ථාවක් ගැන. මොකද, ඉරාන නැව විතරක් නොවෙයි, American planesවලට පවා රට තුළට ගන්න සිදු වන තත්ත්වයක් තිබුණේ.

අපේ රට ආර්ථික අර්බුදයක් මැද යන්තමින් ගොඩ එමින් තිබෙන රටක්. ඒ වාගේ වෙලාවකදීත් ගරු ජනාධිපතිතුමා කටයුතු කරපු විධිය ප්‍රශංසනීයයි. අපි ඇමෙරිකාවටත් "බැහැ" කිව්වා; ඉරානයටත් "බැහැ" කිව්වා. අපට ඒ දේශපාලන පෞරුෂය තිබෙනවා. ඒ දේශපාලන පෞරුෂය තියා ගන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ ඇයි? එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝකයේ සම්මත කරපු අතිශය වැදගත් නීති තිබෙනවා. අපිත් ඒවාට සම්මාදම් වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මම කියන්න කැමැතියි කියුබාව ගැනත්. අපේ රට වාගේම ස්වෛරී රටක් තමයි කියුබාව කියන්නේ. කියුබාවට විරුද්ධව දාලා තිබෙන සම්බාධකවලට විරුද්ධව "මේක වැරැදියි, වැරැදියි, වැරැදියි" කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් 194න් 190කට වඩා වැඩි ප්‍රමාණයක් 35 වතාවක් - අවුරුදු 35ක් තිස්සේ - කියලා තිබෙනවා. ඒ යෝජනාව පරදින නිසා දැන් ඇමෙරිකාව ඒ යෝජනාව ගේන්නේ නැති මට්ටමට ඇවිල්ලා තිබෙනවා. රාජ්‍ය තාන්ත්‍රික ජාත්‍යන්තර නීතියට පටහැනියි, කියුබාවට කරන කෙනෙහිලිකම්. නමුත්, අද වනකොට කියුබාවට කරමින් තිබෙන්නේ මොකක්ද? මාස තුනක් තිස්සේ එක තෙල් නැවකටවත් එන්න දෙන්නේ නැතිව කියුබාවේ ජනතාව මරමින් තිබෙනවා. ඒක වැරැදියි. ලෝකයේ මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක වුණොත්, එනම් ලොකු එකා පොඩි එකා ගිලින න්‍යාය ක්‍රියාත්මක වුණොත් මොකද වෙන්නේ? දැනටමත් එය පටන් අරගෙනයි තිබෙන්නේ. ඉරානය මිලියන සියයක ජනගහනයක් ඉන්න රටක්; අවුරුදු 50ක් තිස්සේ සම්බාධක මැද්දේ ගොඩ නැඟිච්ච රටක්. ඒ ගොල්ලන්ට යම්කිසි ශක්තියක් තිබෙන්න පුළුවන්. නමුත්, දැන් ඒ ගොල්ලන්ගේ infrastructure විනාශ වෙමින් තිබෙන්නේ. ඒ ගොල්ලන්ගේ ධෛර්යයයි, හමුදා ශක්තියයි තමයි දැන් තිබෙන්නේ. ලෝකය සාමකාමී කරන්න තමයි එක්සත් ජාතීන්ගේ සංවිධානය හදලා තිබෙන්නේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය කියන ඒවාට විරුද්ධව යම්කිසි රටක් හෝ දෙකක් හෝ පහක් හෝ වැඩ කරනවා නම්, ඒකෙන් අපි තේරුම් ගන්න ඕනෑ, එය ඒ රටට විතරක් අදාළ ප්‍රශ්නයක් නොව, හෙට අපටත් බලපෑ හැකි බව. අපේ ජනාධිපතිතුමාට ඉරානයට "බැහැ" කියන්නත්, ඇමෙරිකාවට "බැහැ" කියන්නත් ශක්තිය එන්නේ ජනවරමේ ශක්තිය වාගේම ලෝක නීතිය අනුව සාධාරණත්වය, ස්වෛරීත්වය පිළිගන්නා නිසායි. අපි ඇත්තටම හෙළා දකිනවා, කියුබාවේ ජනතාව බඩගින්නේ මරන මට්ටමට කටයුතු කරන එක. කියුබාව කවදාවත් ඇමෙරිකාවට පහර දෙන්න කල්පනා කරලා නැහැ. ඒ විතරක් නොවෙයි, එක්සත් රාජධානියේ - Englandවල - ආරක්ෂක ලේකම් කියනවා මම දැක්කා, ඉරානයත් ඇමෙරිකාවට පහර දෙන්න කිසිම සූදානමක් තිබුණේ නැහැ කියලා. ඒවා අපි නොවෙයි කියන්නේ. විශාල රටවල නායකයෝ තමයි එහෙම කියන්නේ.

අද මේ කථා කරන ප්‍රශ්නයට කෙළින්ම ආවොත්, අපි කියන්න කැමැතියි, විදේශගත ශ්‍රී ලාංකිකයන්, මැද පෙරදිග කලාපයේ කටාර්හි දෝහා ආදි ප්‍රදේශවල ඉන්න අපේ ජනතාව ගැන විදේශ

[ගරු බිමල් රත්නායක මහතා]

කටයුතු අමාත්‍යාංශයෙන් විශේෂ මැදිහත් වීමක් කරන බව. අපේ ජාතික ජන බලවේගයේ විවිධ සංවිධානත් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔවුනුත් ඒවාට උපරිම වශයෙන් මැදිහත් වන බව ඔබතුමියත් දන්නවා. මේ යුද්ධය දැන් සිවිල් ඉලක්කවලට යමින් තිබෙන නිසා ඒ තුළින් ජනතාව අනිවාර්යයෙන් පීඩාවට පත් වනවා.

ඒ වාගේම, අපි මේක තනියම කරන දෙයක් නොවෙයි. ජනාධිපතිතුමා අද විපක්ෂයේ පක්ෂ නායකයන්, ගරු මන්ත්‍රීතුමන්ලා එක්ක පැය එකහමාරකට ආසන්න කාලයක් සාකච්ඡා කළා. ගරු විපක්ෂ නායකතුමා ඇතුළු මන්ත්‍රීවරු ඇවිල්ලා බොහොම සුහදව සහ සමහර වෙලාවල විවේචනාත්මකව, නමුත් constructively කථා කළා. මම හිතනවා, අපට කථා කරලා බේරා ගන්න පුළුවන් ගොඩක් දේවල් තිබෙනවා කියලා. එතුමන්ලා කෘෂිකර්මය සම්බන්ධ ප්‍රශ්න ගැනත් කථා කළා. ඒ වාගේම, දුර ප්‍රදේශවලට තිබෙන තෙල් ප්‍රශ්න ගැනත් කථා කළා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ ඉදිරිපත් කරපු සමහර ගැටලු විසඳන්න. අපේ පැත්තෙනුත් කරගෙන යන දේවල් ටික අපි පැහැදිලි කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඉක්මනින් කරුණු ටික කියාගෙන යන්නම්. QR code system එක ගැන ඊයේත් ගැටලුවක් ආවා. මම ඒ ගැන පැහැදිලි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා මෙහිදී පැහැදිලි කළ විධියට මුලදී QR code system එකේ ප්‍රශ්නයක් තිබුණා. මම ඒකට හේතුව කිව්වා. අපි ඒ ප්‍රශ්නය පෙරේදා රාත්‍රියේ විසඳුවා. එම නිසා QR code එකට register වන ප්‍රමාණය මේ වනකොට විශාල වශයෙන් වැඩි වෙලා තිබෙනවා. QR code එකට register වෙලා නැති වාහන යම් ප්‍රමාණයක් ද තිබෙනවා. ඒවා වැඩි කොටසක් රජයට අයිති වාහන; රාජ්‍ය වාහන. මොකද, රාජ්‍ය වාහනවල QR code එක open කරන්න ගන්න telephone number එක ගැන හිත හිතා ඉන්නවා; එහේට මෙහේට ලිය ලියා ඉන්නවා. සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත බලශක්ති අමාත්‍යාංශය නිකුත් කරපු නිවේදනයක් තිබෙනවා. "ඉන්ධන කෝටා ක්‍රමය අනුව රජයේ වාහනවලට ඉන්ධන ලබා දීම සම්බන්ධවයි" යන මාතෘකාව යටතේ නිකුත් කරන ලද එම නිවේදනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

දැන් කරන්න තිබෙන්නේ, රාජ්‍ය වාහන assign කරලා තිබෙන Transport Officerගේ හෝ ඩ්‍රයිවර් මහත්මයාගේ හෝ telephone number එකට අදාළව QR ක්‍රමය යටතේ register කර ගන්නයි. එවිට QR code එක open වෙනවා. එය open වුණාට පසුව අපට පුළුවන්, ඒවා special category එකේ ඒවා නම් ඒ අනුව කටයුතු කරන්න. Ambulancesවලට නම් අපි QR code දෙන්න යන්නේ නැහැ. මොකද, ඒවාට ඕනෑ තරම් ඉන්ධන ලබා දෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු ඇමතිතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩි 2ක කාලයක් දෙන්න.

රජයේ සියලු නිලධාරින්ගෙන් අප ඉල්ලා සිටින්නේ, ඔබ සතුව තිබෙන වාහන ඔබේ telephone numbersවලට ලියාපදිංචි කරන්න කියලායි. ඒවාට වැඩිපුර තෙල් අවශ්‍ය නම්, විශේෂත්වයන් යටතේ තෙල් ලබා දෙන්න අපට පුළුවන්. දැන් QR code එකේ විශේෂ ප්‍රශ්නයක් නැහැ. මීට කලින් - මාර්තු 18ට කලින් - ලක්ෂ තුනක් වාගේ තමයි දවසකට register වුණේ. ඊයේ ලක්ෂ හයහමාරක් register වුණා. එතකොට ඒ ගැටලුවත් විසඳෙමින් යනවා. හැබැයි, පොඩි පොඩි ප්‍රශ්න ඉතුරුවෙන්න පුළුවන්.

පොදු ප්‍රවාහනය ගත්තාම, බස්වලට SLTB ඩිපෝ 103කින් තෙල් දෙන්න සූදානම් කරලා තිබෙනවා. බස්වලටත් QR codes හදලා තිබෙනවා. අද මධ්‍යාහ්න 12.00 වෙනකොට private buses 593ක් වාගේ ප්‍රමාණයක් තමයි SLTB එකේ ඩිපෝවලට ඇවිල්ලා තෙල් ගහගෙන තිබෙන්නේ. අපි private busesවලටත් ඒ අවස්ථාව දීලා තිබෙනවා.

ඊළඟට ගොඩක් අයට කර්මාන්තවලට සම්බන්ධ ප්‍රශ්න තිබෙනවා. පෞද්ගලික අංශයේ විශාල ඉදිකිරීම්වලට තෙල් අවශ්‍යයි. ඒගොල්ලෝ කිව්වොත්, - ඉදිකිරීමක් සම්බන්ධව නම් - මෙන්න මේ විශාල පෞද්ගලික ව්‍යාපෘතියට මෙච්චර තෙල් අවශ්‍යයි කියලා, අපි Ministry of Housing, Construction and Water Supply යටතේ ඒ තෙල් ප්‍රමාණය අනුමත කරලා දෙනවා. ඒ වාගේම Mannarවල garment factories ගැන රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා කිව්වා. ගාමන්ට් එකට ළමයි ගෙනෙන බස් තිබෙනවා. ඒ බස් 50ට කොච්චර තෙල් ඕනෑ ද කියලා බලන්න, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ අමාත්‍යාංශයේ register වෙන්න පුළුවන්. ඒගොල්ලෝ කිව්වාට පස්සේ අපි ඒ බස්වලට අදාළ තෙල් ටික දෙනවා. හැබැයි, තවම අහුවුණේ නැති ඒවා තිබෙනවා. උදාහරණයක් විධියට, තණකොළ කපන machinesවලට QR codes නැහැ. අපි ඒවාට ක්‍රමයක් හදන්න ඕනෑ. ඊයේ ටී.බී. සරත් මැතිතුමා මතු කළා, 48cc - "මදුරුවා" කියන - බයිසිකලය register වෙන්නේ නැහැ කියලා. අපි ඒවාට chassis number එක, දමලා හදනවා. ඒ වාගේ තවත් දේවල් තිබෙන්න පුළුවන්. ඒ නිසා අපට තව දවසක් දෙකක් ඕනෑ වෙයි. අපි මේක සම්පූර්ණයෙන්ම පිළියෙල කරගෙන යනවා. සාමාන්‍ය තත්ත්වයට අදාළ network එක මේ සති අන්තයට කලින් සම්පූර්ණ කරගන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. මොකද, මේක විශේෂ තත්ත්වයක් නේ. අපි වතුකරයේ තේ දළු ගෙනයන එක ගැනත් අවධානය යොමු කරලා තිබෙනවා. වතු සමාගමෙන් කියනවා නම්, ඒගොල්ලන්ගේ තේ දළු ගෙන යන වාහනවලට - trucksවලට - මෙච්චර තෙල් ඕනෑ කියලා, - ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා වතු ක්ෂේත්‍රයේ හිටපු නායකයෙක් - අපි ඒ අයට තෙල් දෙනවා. වත්තේ තෙල් ලීටර් 25,000ක්, 50,000ක් දමන්න පුළුවන් ලොකු storage facility එකක් තිබෙනවා නම්, අපට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට කියන්න පුළුවන් එතැනටම ගිහිල්ලා බාන්න කියලා. ඒ ගාස්තු ගෙවන්න වෙයි. නමුත් ඒක ලේසියි. අපි එතකොට truck එකෙන් truck එකට තෙල් දෙන්නේ නැහැ. අපි දැන් Central Expressway එක හදනවා. ඒකට තෙල් විශාල ප්‍රමාණයක් ඕනෑ. අපි ඒ අයට කියලා තිබෙනවා, ඔබට අවශ්‍ය තෙල් ප්‍රමාණය කියන්න, අපි එතැනට deliver කරන්නම්, ඊට පස්සේ ඔබතුමන්ලාගේ trucksවලට බෙදන්න කියලා. අපි ඒ trucksවලට බෙදන්න යන්නේ නැහැ. ඒක තමයි අපි කරගෙන යන වැඩසටහන. අපට සාමූහික නායකත්වයක් තිබෙනවා. අපේ

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

එහෙට මෙහෙට ඇදිල්ලක් නැහැ. ජනාධිපතිතුමා, ආණ්ඩුව කියන්නේ එක කණ්ඩායමක්. අර ඇමති මේ ඇමති කියලා වෙනසකුත් නැහැ. අපි ඔක්කෝම team එකක් විධියට වැඩ කරනවා. අපි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, අපේ අඩුපාඩුකම් තිබෙනවා නම් අපට ඒවා පෙන්වන්න කියලා. හැම රාජ්‍ය ආයතනයක් වාගේම පාර්ලිමේන්තුවට අදාළ කරන දේවල්වලටත් මහලේකම්තුමිය සහ කාර්‍යනායකතුමා මැදිහත්වෙලා තිබෙනවා. පාර්ලිමේන්තුව තවත් ආයතනයක් ලෙස සලකලා වැඩ කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි බොහොම ස්තුතියි මට වැඩිපුර වෙලාව ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.32]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

වර්තමානයේ ලෝකයේ යුද තත්ත්වයක් ඇති වී තිබෙන මොහොතක, ගල්ෆ් කලාපය ගිනිගත් මොහොතක එහි බලපෑම අපි වාගේ රටකට බලපාන්නේ කොහොමද, ඒ බලපෑම තුළ අපේ ආර්ථිකය, අපේ ජනතාවගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යන්නේ කොහොමද කියන එක පිළිබඳව බරපතළ ප්‍රශ්නයක තමයි අපි ඉන්නේ. විශේෂයෙන්ම මේ යුද තත්ත්වය තුළ අපට තිබෙන අපහසුකම්, ආර්ථිකයේ කඩා වැටීම්, අපේ සැපයුම් ජාලයේ තිබෙන බිඳවැටීම් පිළිබඳව අපි අවධානය යොමු කරනවා වාගේම, රටක් විධියට මේ තත්ත්වය තුළින් වාසි ලබා ගන්නේ කොහොමද කියන එක ගැනත් අපේ අවධානය යොමු කරන්න ඕනෑ. අපේ රට අප්‍රිකානු මහද්වීපයෙන්, ඕස්ට්‍රේලියානු මහද්වීපයෙන් මැදිවෙච්ච ඉතාම කේන්ද්‍රීය ස්ථානයක පිහිටි ආසියානු රටක්. මැද පෙරදිග කඩා වැටෙනකොට, ගල්ෆ් කලාපය කඩා වැටෙනකොට අපට ඉදිරියේ දී අත්පත් කරගන්න පුළුවන් ආර්ථික අවස්ථා අත්පත් කරගන්න කටයුතු කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවත් අපි බලන්න ඕනෑ, ගරු බිමල් රත්නායක ඇමතිතුමනි.

විශේෂයෙන්ම නාවුක ක්ෂේත්‍රය, ඒ වාගේම ගුවන් ක්ෂේත්‍රය හරහා අපේ රටේ පිහිටීම ඉතාම වැදගත් විධියට දකින විශාල පිරිසක් අද ඉන්නවා. British Airways එක අපේ රටේ ගමනාන්තයක් පටන් ගත්තේ ඇයි? ඒ අපේ රටේ තිබෙන වැදගත්කම නිසා. අපේ රට උපාය මාර්ගික - strategic - කේන්ද්‍රස්ථානයක් නිසා. ඒ නිසා ගුවන් සැපයුම් පැත්තෙන්, නාවුක සැපයුම් පැත්තෙන් කඩිනම්ව කටයුතු කරලා, ඉදිරියේදී ඇති වන ඒ අවශ්‍යතාවලට, ඒ ජාලවලට සේවා සපයන්න පුළුවන් තත්ත්වයක් උදා කරගන්න පුළුවන් වුණොත් ඒක අපට ගොඩක් වටිනවා. මොකද, මේ ඇති වෙලා තිබෙන තත්ත්වය කාලයක් පවතිනවා. එක එක්කෙනා කියයි, මේක සතියෙන් ඉවර කරනවා, දෙකෙන් ඉවර කරනවා, මාසයෙන් ඉවර කරනවා කියලා. නමුත්, මේකේ බලපෑම කාලයක් පවතිනවා. අද වන විට එක්සත් අරාබි එමීර් රාජ්‍යය ආර්ථිකමය වශයෙන් විශාල අර්බුදයක ඉන්නේ. කටාර් රාජ්‍යයත් විශාල අර්බුදයක ඉන්නේ. ගුවන් සැපයුම් පැත්තෙන් ගත්තාම, ප්‍රධානම ගුවන් තොටු පොළවල් දෙකක් සහ ප්‍රධානතම ගුවන් සමාගම් දෙකක් තිබෙන්නේ ඒ රටවල් දෙකේ. අද ඔවුන්ගේ සේවා කටයුතු කරගන්න බැරිව විශාල අර්බුදයක ඉන්නේ. අප්‍රිකානු මහද්වීපයේ සියලු transits වෙන්නේ කටාර් සහ ඩුබායි ගුවන් තොටුපොළවල් කේන්ද්‍ර කරගෙන. අපේ රටේ පිහිටීමත් එක්ක අපි කොහොමද මේ ගුවන් අවකාශය අත්පත් කරගන්නේ? අපි මේ ගුවන් සේවා අත්පත් කර ගැනීම ඉතා වැදගත්. ඒ වාගේමයි තෙල් සැපයුමත්.

බිමල් රත්නායක ඇමතිතුමනි, එක්දහස් නවසියහැට ගණන්වල ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - අපේ චාමර සම්පත් මැතිතුමාත් මෙතැන ඉන්නවා - අපේ රටේ තිබුණු Esso oil company එක Caltex oil company එක අපේ රටෙන් එළවා දැම්මා. මම ඒ ගැන කනගාටු වෙනවා. ඒ එළවා දමපු සමාගම් තමයි සිංගප්පූරුවට ගිහිල්ලා ඒ ව්‍යාපාර Jurong Islandවල පටන් ගත්තේ. සිංගප්පූරුව තෙල් නැති රටක් වුණත්, තෙල් hub එකක් බවට පත් වුණේ එදායින් පස්සේ. අන්න, අපට තිබුණු අවස්ථා නැති වෙච්ච කාරණා. ඒවා වමේ ආණ්ඩුවක් විධියට එදා ගත්ත වැරදි තීන්දු. එතැනින් පස්සේ අපට ඒ වෙළඳ පොළ නැවත අත්පත් කරගන්න බැරිව ගියා. හැබැයි, දැන් හොඳ අවස්ථාවක් තිබෙනවා, බිමල් රත්නායක ඇමතිතුමනි. මේක එක පාරටම අවුරුද්දෙන් දෙකෙන් කරන්න පුළුවන් කියලා නොවෙයි මම කියන්නේ. හැබැයි ඒ අවස්ථාව අපි දැක්කොත්, ඒ අවස්ථාව අපි address කළොත් අපේ රටේ පිහිටීමත් එක්ක තව අවුරුදු ගණනාවකින් අපට තෙල් වෙළෙඳ පොළට පිවිසෙන්න පුළුවන්. ඒ අවස්ථා අපි ගන්න ඕනෑ.

ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා - අපේත් ජනාධිපති තමයි ඉතින් නේද? - ඇවිල්ලා කිව්වා, කහ පාට ගෑස් ප්‍රශ්නය විසඳනවා කියලා. ඇත්තටම බිමල් රත්නායක ඇමතිතුමනි, අපේ වැඩිම වෙළෙඳ පොළක් තිබෙන්නේ ලිට්රෝ ගෑස් එකට. ඔවුන්ගේ storage facility එක මෙට්‍රික් ටොන් 8,000යි. හැබැයි ලාෆ් සමාගමට තිබෙනවා, මට මතක විධියට මෙට්‍රික් ටොන් 90,000ක්. ඔවුන්ට ගෑස් export කරන්න පුළුවන් විධියට තමයි නීති රීති තිබුණේ. ඔබතුමන්ලා අද තීන්දු කළා නම් tax ගෙවලා ඔවුන්ට දේශීය වෙළඳ පොළටත් ගෑස් නිකුත් කරන්න පුළුවන් කියලා, ඒක බොහොම හොඳයි. හැබැයි, ඒක කරන්න තිබුණේ මීට කලින්. මීට කලින් ඒගොල්ලොත් ඉල්ලා තිබෙනවා. මීට කලින් කළා නම් හොඳයි. ඒ නිසා කඩිනමින් මේ තීන්දු තීරණ ගත්තොත්, මේ ඇති වෙලා තිබෙන තත්ත්වය කළමනාකරණය කරගන්න පුළුවන් වාගේම, ලෝකයේ මේ යුධ තත්ත්වයත් එක්ක ඇති වෙන ආර්ථික සංකූලතාවල වාසිය අනාගතයේදී රටක් විධියට අපට අත්පත් කරගන්නත් පුළුවන් වෙනවා.

මම දැක්කා අද පත්තරේ මුල් පිටුවේ තිබෙනවා, ලෝක සතුටු දර්ශකයේ 134 වෙනි ස්ථානයට අපි පහළ බැස තිබෙනවා කියලා. මම දන්නේ නැහැ ඊට කලින් අපි කී වෙනි ස්ථානයේද හිටියේ කියලා. මේක බරපතළ තත්ත්වයක්. බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමා දැන් හිනාවෙන්නෙත් නැහැ, මුහුණත් වහගෙන ඉන්නේ. මම හිතන්නේ අසනීප නිසා වෙන්න ඇති. නමුත්, අපි ආයෙත් හිනාව ගන්න ඕනෑ. සතුටු දැයක් විධියට, සතුටු රටක් විධියට අපේ රට පත් කරගන්න නම්, වහාම මේ තීන්දු තීරණ අරගෙන, මේ වෙනස්කම් කරලා, මේ නතර වෙලා තිබෙන එහෙම නැත්නම් එක තැන කැරකෙන මැෂින් එක ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ සඳහා ඔබතුමන්ලා තීන්දු තීරණ ගන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අවසාන වශයෙන් මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මේ කාරණය කියන්න.

1980 සිට වසර 40කට ආසන්න කාලයක් මේ පාර්ලිමේන්තුවේ වේත්‍රධාරි දෙපාර්තමේන්තුවේ දුරකථන ඇමතුම් ක්‍රියාකරුවකු විධියට සේවය කළ සිසිර කුමාර මහත්මයා අද විශ්‍රාම යනවා. අපි එතුමාගේ විශ්‍රාම දිවියට සුබ පතනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක් කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.38]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම අද කථා කරපු කාරණා ගොඩක් නිරවුල් වුණා, මුදල් අමාත්‍යවරයා හැටියට, ආරක්ෂක අමාත්‍යවරයා හැටියට ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේදී කරුණු ඉදිරිපත් කිරීමත් එක්ක.

කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්තමානයේ තත්ත්වය ගැන පැහැදිලි කළොත්, බිමල් රත්නායක ඇමතිතුමාත් කියපු විධියට අපි ආයතනයෙන් ආයතනයට වෙන වෙනම ඉන්ධන සපයන ක්‍රමයක් නොවෙයි හදා ගත්තේ. අපේ තිබෙන කර්මාන්ත වර්ගීකරණය යටතේ අපි ක්ෂේත්‍ර 21ක නිෂ්පාදන කර්මාන්තවලට, මූලිකව අපනයන කර්මාන්තවලට, ඒ වාගේම කර්මාන්ත අගය දාමයේ තිබෙන සේවා සපයන ආයතනවලට මූලිකත්වය දෙන්න තීරණය කළා. මොකද, මේ අර්බුදය තුළ ආර්ථිකය පවතින ආකාරයටම පවත්වාගෙන යමින් මේකට මුහුණ දෙන එක තමයි අපේ මූලිකම ප්‍රතිපත්තිය වුණේ. ඊයේ වනකොට අපේ කර්මාන්තවල අවශ්‍යතාව පරිදි ලියාපදිංචි වෙච්ච ප්‍රමාණයක් තිබෙනවා. අද උදේ 9.00ට ලැබුණු ඉල්ලීම් ප්‍රමාණය, ආයතන 2,298යි. ඊයේ හවස 4.00 වෙනකොට ක්ෂේත්‍රවල ආයතන හැටියට අපි නිර්දේශ කරලා යවලා තිබෙන ප්‍රමාණය 1,848යි. ඒ වාගේම අපනයන කර්මාන්ත 757කට අපි නිර්දේශ කරලා යවලා තිබෙනවා. ඒ නිර්දේශ අනුව ඛනිජ තෙල් සංස්ථාව loads 293ක් - මේ load එකකට ලීටර 6,600 බැගින් තිබෙනවා - පිළිගෙන තිබෙනවා. ඒ 293න් දැනටම අපි 180ක් නිකුත් කර තිබෙනවා. විශේෂයෙන්ම, automobile component manufacturing and assembling කරන ආයතන, board manufacturing sector එක, granite sector එක, coir and coir products sector එක, cosmetics sector එක, electric and electronic sector එක, gem and jewellery sector එක, machinery sector එක, production sector එක, packaging sector එක, paint, chemical and printing sector එක, pharmaceutical sector එක, processed food sector එක, rubber and plastic products sector එක, spices sector එක, value-added tea industry එක, wood and wood-based sector එක, event management sector එක ආදී sectorsවලට අපි යවා තිබෙනවා.

උදාහරණයක් හැටියට "Food City" chain එක ගත්තොත්, ඒ "Food City" ආයතනය රට පුරා ජාලගතවෙලා තිබෙනවා. අපි ඒ ආයතනයට තමයි ඉන්ධන නිකුත් කරන්නේ. එහෙම නැතිව ඒ ආයතනයේ තිබෙන එක එක අංශවලට, ඒ ආයතනයේ තිබෙන වාහනවලට වෙන වෙනම අපි ඉන්ධන නිකුත් කරන්නේ නැහැ. මොකද, ඒ ආයතනය තමයි ඒක තීරණය කරගන්නේ. ඒ ආයතනය ඒක කළමනාකරණය කර ගන්නවා. ඒක අපට පහසුවක් වෙලා තිබෙනවා. අපනයන ක්ෂේත්‍රයේත් එහෙමයි. කර්මාන්ත ක්ෂේත්‍රයේ කාගෙන්වත් මේ ප්‍රමාණය මදියි කියලා අපට කිසිම මැසිවිල්ලක් නැහැ. හැබැයි, සමහර අංශ තිබෙනවා, සමහර ආයතන තිබෙනවා, තවම ඒවා හරියාකාරව කළමනාකරණය වෙන්නේ නැහැ කියලා අපි දන්නවා. උදාහරණයකට ගත්තොත්, Uber, PickMe වාගේ භාණ්ඩ ප්‍රවාහනය කරන, ආහාර ප්‍රවාහනය කරන තනි තනි අය ඒවායේ register වෙලා ඉන්න බව අපි දන්නවා. ආයතන හැටියට එකතු වෙන්න කියලා අපි ඔවුන්ටත් කියලා තිබෙනවා. බේකරි නිෂ්පාදන කරන අය ඉන්නවා. ආහාර නිෂ්පාදකයන්ගේ සංගම් තිබෙනවා. ආයතනයක් හැටියට, association එකක් හැටියට, එකමුතුවක් හැටියට එන්න කියලා අපි ඒ අයට කියා තිබෙනවා. එතකොට ඒ අයට පුළුවන් මේ ක්‍රමයට එකතු වෙන්න. ඉන් ගිලිහෙන අය ඉන්නවා නම් අපි ඛනිජ තෙල් සංස්ථාවෙන්, බලශක්ති අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට පෝරමයක් නිකුත් කරලා තිබෙනවා. ඒ ආයතනවලට පුළුවන් ඒ පෝරමය පුරවලා ප්‍රාදේශීය ලේකම්වරයා හරහා පුංචි පුංචි ආයතනවලට තෙල් ලබා ගන්න. එතකොට ප්‍රශ්නය ඉවරයි. මෙතැන ගැටලුව තිබෙන්නේ, සමහර අය තමන්ගේ සාමාන්‍ය අවශ්‍යතාවටත් වඩා වැඩියෙන් ඉන්ධන එකතු කරගන්න පෙලඹී තිබෙන එක. ඒ, හේතු දෙකක් නිසා. පළමුවැනි එක, මේ යුද්ධය කොච්චර කල් ඇවිළෙයි ද කියා ඔවුන්ට තිබෙන සැකය නිසා. දෙවැනි එක, අනෙක් පැත්තෙන් ඔබතුමන්ලා තෙල් "නැහැ, නැහැ" කියලා ගෙන යන මතය නිසා. ඒ දෙකම මේකට බලපා තිබෙනවා.

මම පොඩි උදාහරණයක් කියන්නම්. එක බැංකුවක මැනේජර් මහත්මයෙක් මට කථා කරලා කිව්වා, "අපේ බැංකුවේ generator එකට තෙල් නැහැ" කියලා. බැංකුවේ generator එකට තෙල් ඕනෑ. මම ඇහුවා, ඔබේ generator එකට කොච්චර තෙල් ප්‍රමාණයක් අවශ්‍ය ද කියලා. ලීටර 30ක් අවශ්‍යයි කිව්වා. මම ඇහුවා, දැන් ලීටර කීයක් තිබෙනවා ද කියලා. ලීටර 20ක් තිබෙනවා කිව්වා. ලීටර් 30ක් අවශ්‍යයි, ලීටර් 20ක් දැනට තිබෙනවා. බැංකුවේ මේ generator එක හැම වෙලාවෙම ක්‍රියාත්මක වෙන්නේ නැහැ නේ. ඒක අවශ්‍ය වෙන්නේ කරන්ට් එක ගියාම විතරයි. කරන්ට් එක ගිය අවස්ථාවක පාවිච්චි කරන්න ලීටර 20ක් තිබෙනවා. ඒත් මම කිව්වා, කමක් නැහැ ප්‍රාදේශීය ලේකම්තුමාට form එක යවන්න, අපි ඒක ලැබෙන්න සලස්වන්නම් කියලා.

සමහර විශේෂ අවස්ථා තිබෙනවා. වාහනයක් DMT එකේ ලියාපදිංචි වෙලා නැතිව garage number එකෙන් ඇවිල්ලා තිබෙන අවස්ථාවක, ඒ වාහනය රේගුවෙන් නිදහස් කරගෙන අදාළ ගමට හෝ ප්‍රදේශයට ගෙනියන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ගරු වානක මාදුගොඩ මන්ත්‍රීතුමාට මයික් එක දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු ඇමතිතුමාට බොහොම ස්තුතියි, අවස්ථාව දුන්නාට.

ඇත්තටම ගාල්ල දිස්ත්‍රික්කයේත් generators පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තවම ඒ පිළිබඳව regulation එකක් හෝ ඒ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ලබා දීලා නැහැ. ඒ නිසා ඇත්තටම ඒ ප්‍රශ්නය තවම තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හැමෝම දැනුවත් කරලා තිබෙනවා. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමාත් අපේ ජනාධිපතිතුමා කැඳවන සාකච්ඡාවේ ඉන්නවා. අද හවස 5.00ටත් අපි රැස් වෙනවා. මම එතැනදීත් මතක් කරන්නම්, කොහේ හරි මහ හැරීමක් තිබෙනවා නම් ඒ ගැන කටයුතු කරන්න කියලා. නමුත් දිස්ත්‍රික් ලේකම්වරුන්ට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ ගැන දැනුම් දීලා තිබෙනවා. ඒක ඕනෑ තැනකින් කර ගන්න පුළුවන්, ගැටලුවක් නැහැ.

මම කියන්නේ තිබෙන සමහර ප්‍රායෝගික දේවල් ගැන. මම කියපු වාහනයේ ප්‍රශ්නය, ඊයේ මම මුහුණ දුන් ප්‍රශ්නයක්. වාහනය ලියාපදිංචි කරලා. නමුත් QR code එක ලැබිලා නැහැ. නමුත් වාහනය ගෙනියන්න ඕනෑ, ඒක විශේෂිත තත්ත්වයක්. ඒ වාගේ විශේෂිත අවස්ථා වුණත් අපි කළමනාකරණය කරලා තිබෙනවා. මේ හැම එකකටම අවශ්‍ය ප්‍රමාණයටත් වඩා, ඉදිරියේ බලාපොරොත්තු වෙන සැකයටත් එක්ක එකතු කළොත් එහෙම ඒක ගැටලුවක්. මේ තිබෙන යුද තත්ත්වය යටතේ අපට තිබෙන සීමිත ප්‍රමාණය, තිබෙන සීමිත දේ කළමනාකරණය කර ගන්නේ කොහොමද? එහිදී අපි හැමෝටම වගකීමක් තිබෙනවා. පුරවැසියන් හැටියට නිෂ්පාදකයන්, කර්මාන්තකරුවන්, ව්‍යවසායකයන් කියන හැමෝම සහයෝගයෙන් මේ කටයුත්ත කරන්න ඕනෑ. ඒකේදී අපේ මූලික අදහස පැහැදිලියි. පවතින තත්ත්වය යටතේ lock down වෙන්නේ නැතිව, රට සම්පූර්ණයෙන් වහන්නේ නැතිව ආර්ථිකයේ කටයුතු පවත්වාගෙන යමින් මේ ප්‍රශ්නයට මුහුණ දෙන එක තමයි සාර්ථකත්වය. අපි ඒ සාර්ථකත්වය ලබාගෙන තිබෙනවා කියලා අපි හිතනවා. ඒක විශේෂත්වයක්. තෙල් නිෂ්පාදනය කරන්නේ නැති රටක් හැටියට, විශාල වශයෙන් තෙල් සංචිත පවත්වා ගන්න තරම් හැකියාවක් නැති රටක් හැටියට අපි මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. සමහර අයට මේක තේරෙනවා කියලා මම හිතනවා. ජනාධිපතිතුමාත් පැහැදිලිව කිව්වා, ප්‍රතිශතයක් හැටියට අපට වඩා තෙල් මිල වැඩි වුණු රටවල් තිබෙන බව. ඒ මිල වැඩි වුණු රටවලට සාපේක්ෂව හිතනකොට අපි මේක කළමනාකරණය කරලා තිබෙනවා.

කර්මාන්ත ක්ෂේත්‍රය ගත්තොත්, හැම ක්ෂේත්‍රයකම කර්මාන්තකරුවන් අපට උදවු කරලා තිබෙනවා. ඇත්තටම මම ඔවුන්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. Tea industry එක ගත්තොත්, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් ඊයේ ඒ ගැන කථා කළා. තේ ෆැක්ටරිවලට ගැටලුවක් මතු වුණු තැනක් නැහැ. කාට හරි ගැටලුවක් මතු වෙලා තිබෙනවා නම්, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් මම ඉල්ලනවා කරුණාකරලා අපට කියන්න. අපට කියන්න, අප දැනුවත් කරන්න. අපට ඒ සම්බන්ධයෙන් සොයා බලා මැදිහත් වෙන්න පුළුවන්. අපට විතරක් නොවෙයි, ඔබතුමන්ලාටත් ඒක කරන්න පුළුවන්. අපි සාමූහිකව ඒ කටයුත්ත කරමු කියන ඉල්ලීම තමයි තිබෙන්නේ. එහෙම කළොත් විතරයි අපට මේකට මුහුණ දෙන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ තත්ත්වය ඉක්මනින් නිරවුල් වෙයි කියන එක තමයි අපේ බලාපොරොත්තුව, අපේ ප්‍රාර්ථනාව. ඒක තමයි අපේ අපේක්ෂාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තවත් දෙයක් කියන්න ඕනෑ. ඕනෑම අර්බුදයක අවස්ථාවක් තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඊළඟට එන තත්ත්වය යටතේ අපටත් අවස්ථාවක් ලැබෙයි කියලා. අපේ අපනයන වෙළෙඳ පොළ, තේ කර්මාන්තය, කුළුබඩු කර්මාන්තය ඇතුළු අපේ බොහෝ ක්ෂේත්‍ර දැන් අභියෝගයට ලක් වෙලා තිබෙනවා. දැන් අපනයන ක්ෂේත්‍රයේ කටයුතු කරන සමහර අයට වෙළෙඳ පොළ අවස්ථා අහිමි වෙයිද කියලා සැකයකුත් තිබෙනවා. එහෙම වෙන්නේ නැහැ. මොකද, හැම කලාපයකම රටවල් එක්ක අපි ගනුදෙනු කරන මධ්‍යස්ථභාවය නිසා එහෙම වෙන්නේ නැහැ. යුද්ධයට මැදිහත් වෙලා තිබෙන රටවල් සහ යුද්ධයට මැදිහත් නොවී තිබෙන රටවල් එක්ක පවා අපේ තිබෙන මධ්‍යස්ථභාවයත් එක්ක අපේ වෙළෙඳ පොළ අහිමි වෙන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. ඒවා හුඟක්ම අපේ සංචාරක කර්මාන්තයට සම්බන්ධ, අපේ අපනයක ක්ෂේත්‍රයට සම්බන්ධ, අපේ අවශ්‍යතා සම්පූර්ණ කර ගන්න ආනයනය කරන අතරමැදි භාණ්ඩ, අපි අමුද්‍රව්‍ය හැටියට පාවිච්චි කරන භාණ්ඩ මිලදී ගන්න රටවල්. මැද පෙර දිග කලාපයේ රටවල් බොහොමයක් ගත්තොත් අපි තෙල්, පොහොර ඇතුළු විශේෂයෙන් බලශක්ති ක්ෂේත්‍රයේ බොහෝ දේවල් ලබා ගන්නා රටවල්. අපේ අපනයන වෙළෙඳ පොළෙන් සියයට 25ක් ඇමෙරිකා එක්සත් ජනපදය දරනවා. ඒ හැම ක්ෂේත්‍රයක්ම අපට අත්‍යවශ්‍යයි. අපි හිතනවා, ඒ වෙළෙඳ පොළ ආරක්ෂා කරගෙන, අපේ මධ්‍යස්ථභාවය රැකගෙන අපට මේ කටයුතු කළමනාකරණය කර ගන්න පුළුවන්කමක් තිබෙනවා කියලා.

මේ ගැන ගරු බිමල් රත්නායක ඇමතිතුමාත් කථා කළා. අපි මේකට කණ්ඩායමක් හැටියට තමයි මුහුණ දෙන්නේ. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යනාදී වශයෙන් අපි එක කණ්ඩායමක් හැටියට මේකට මුහුණ දෙනවා. ජනතාව ඒක දන්නවා. ජනතාව ඒක විශ්වාස කරනවා. ඒක තමයි වැදගත්ම දේ. අපි ඇත්තටම සතුටු වෙන්නේ ඒකයි.

මේ අර්බුදය ආණ්ඩුව හදපු අර්බුදයක් නොවෙයි. මේ අර්බුදය අපි හිතා මතා හදා ගත්ත අර්බුදයකුත් නොවෙයි. මේ අර්බුදය අපේ ඩොලර් ආදායමේ අඩුවක් නිසා ඇති වුණු අර්බුදයකුත් නොවෙයි. මේක ආදායම් පිළිබඳ ප්‍රශ්නයකුත් නොවෙයි කියන එක අද සාතිශය බහුතරයක් ජනතාව පිළිගන්නවා. මේ ගැන මාධ්‍යවලින් ප්‍රචාරය වනකොට, එක් එක් දේශපාලන න්‍යාය පත්‍ර අනුව මාධ්‍ය තුළින් ප්‍රචාරය වන බවක් අපට පෙනෙනවා. මම හිතනවා, ඒවාට ජනතාවම උත්තර ලබා දෙයි කියලා. ඒකට අපි උත්තර දෙන්න අවශ්‍ය නැහැ, ජනතාවම උත්තර දෙනවා. ඒවා ඒ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මාධ්‍යවල න්‍යාය පත්‍ර අනුව සිද්ධ වනවා කියලා දැන් අපට වඩා හොඳට ජනතාව දන්නවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, ඊළඟ අදියරට සූදානම්වීම තමයි අපි රටක් හැටියට කළ යුත්තේ කියලා. අපේ සංචාරක කර්මාන්තය සඳහා, අපේ අපනයන කර්මාන්ත සඳහා අලුත් ක්ෂේත්‍ර, අලුත් රටවල් හඳුනා ගෙන ඒවාට අපි ප්‍රවේශ වෙන්නේ කොහොමද කියන එක සහ ඒවා කළමනාකරණය කිරීම තමයි මේ මොහොතේ අපට තිබෙන වගකීම වන්නේ. අපි විශ්වාස කරනවා, ඒ වගකීම ඉෂ්ට කරන්න අපට පුළුවන්කම තියෙයි කියලා.

ඒ වාගේම අවශ්‍ය නම් අපට ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්, ආයතන හැටියට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හැටියට, දිස්ත්‍රික්ක හැටියට මේ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා අවශ්‍යතාව අනුව තෙල් ලබා ගෙන තිබෙන්නේ කොයි ආකාරයෙන්ද කියලා විස්තර ඇතුළත් ලේඛන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම කවදා හරි දවසක අපි මෙහෙම කළේ නැහැ කියලා කියන්න කාට හෝ ඉඩ කඩ තිබෙන නිසා, අපි කරපු දේවලුත් නැහැ කියලා කියන නිසා, ඒ විස්තර ඇතුළත් ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. එහි සඳහන් වනවා, අපි ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට orders ඉදිරිපත් කළේ කොහොමද කියන තොරතුරු. මොකද, මේ වෙනුවෙන්ම අපි දත්ත පද්ධතියක් සකස් කළා. ඒ දත්ත පද්ධතියේ සියලු කර්මාන්ත ක්ෂේත්‍ර හැටියට ලියාපදිංචි කරලා තිබෙනවා. එහි town එක අනුව විස්තර ඇතුළත් කර තිබෙනවා. මේ ලේඛනයේ ආයතනයේ නම, අපි දීලා තිබෙන code එක, city/town එක, දිස්ත්‍රික්කය, මොන මට්ටමේද කියන එක, කොච්චර ඉන්ධන load ප්‍රමාණයක් deliver කළාද කියලා සඳහන් වෙලා තිබෙනවා. මේ එක් ලැයිස්තුවක 2026.03.19 දින ආයතන 61ක consumer order delivery allocation එක තිබෙනවා. ඒ වාගේම 2026.03.20වැනි දා තවත් ආයතන 101කට අදාළව ඉදිරිපත් කරපු ලේඛනය තිබෙනවා. ඒවා අනාගතයේ කවදා හරි දවසක වැදගත් වෙයි කියලා මා විශ්වාස කරනවා. ඒ නිසා අද දවස දක්වා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කර්මාන්තවලට, ව්‍යාපාරවලට නිකුත් කරපු තෙල් loads ප්‍රමාණය ඇතුළත් මේ ලැයිස්තු දෙකම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා මම **සභාගත*** කරනවා.

ඒ වාගේම ඔබතුමන්ලාට මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා, මේ ගැන සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම වෙනුවෙන්. ඒක අපේ අවශ්‍යතාවක්. මේ තමයි රටේ වර්තමාන තත්ත්වය. විපක්ෂය සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා එය විවාදයට ගැනීම නිසා අමාත්‍යාංශ හැටියටත්, මහජන නියෝජිතයන් හැටියටත්, ආණ්ඩුව හැටියටත් මේ තත්ත්වය ඇති වුණු මොහොතේ සිට මේ දක්වා අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳව රටට අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම ගැන මම ඉතාම සන්තෝෂ වනවා. අද සවසත් ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අපි රැස්වෙලා මේ ගැන සාකච්ඡා කරනවා.

ඒ වාගේම ක්ෂේත්‍ර හැටියට ගත්තොත්, ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන්, ගරු උපාලි පන්නිලගේ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආදී වශයෙන් රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳව, යටිතල පහසුකම් සැපයීම පිළිබඳව, අත්‍යවශ්‍ය සේවා සැපයීම පිළිබඳව අපි එකතු වෙලා සාකච්ඡා කරලා කණ්ඩායම් හැටියට කටයුතු කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒ වාගේම මේ වෙලාවේ මම තවත් වැදගත් දෙයක් කියන්න ඕනෑ. අපේ රාජ්‍ය සේවයේ නිලධාරීන් මේ තෙල් අර්බුදය ඔවුන්ටත් තිබියදී, ප්‍රවාහන ගැටලු ඔවුන්ටත් තිබියදී, quota එකේ ප්‍රශ්නය ඔවුන්ටත් තිබියදී, කිසිම මැසිවිල්ලක් නැතුව ස්වේච්ඡාවෙන් මේ කාලය තුළ වැඩ කරනවා. මගේ අමාත්‍යාංශය වන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර මැතිනිය ඇතුළු අපේ කාර්ය මණ්ඩලය දිවා රාත්‍රී නොබලා වැඩ කරමින් ඉන්නවා.

අපි quota එක ඉල්ලුවේ නැහැ. අවංකව කියන්නේ, අපි quota එක ඉල්ලුවේ නැහැ. අපේ අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙක් quota එක ඉල්ලුවේ නැහැ. සාමාන්‍ය විධියට අපේ වාහනවලට ලැබුණු quota එකට අනුව තමයි අපේ නිලධාරීන් ඉන්ධන පහසුකම් ලබා ගත්තේ. අපේ නිලධාරීන්ගෙන් ටිකදෙනායි කැඳෙව්වේ. අවශ්‍යතාව අනුව ඔවුන් කැඳවා අපි ඒ කටයුතු කළමනාකරණය කරගෙන යනවා. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, බලශක්ති අමාත්‍යාංශය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ අපේ එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා, Dr. Hans Wijayasuriya ඇතුළු කණ්ඩායම දිවා රාත්‍රී නොබලා මේ වෙනුවෙන් මහන්සි වුණා. මම ඒ ගැන දන්නවා. ඒ නිසා ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, ඒ අය දිවා-රාත්‍රී මහන්සි වෙලා ඒ කටයුතු සම්බන්ධීකරණය කළ බව. විශේෂයෙන්ම සුමුදු රත්නායක මහතා ඒ කටයුතු මෙහෙයවීම ඉතාම හොඳින් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතැනදී අපි අපේ සීමාවෙන් කල්පනා කළේ නැහැ. මේක විශේෂ අවස්ථාවක් හැටියට සලකා අපි හැමදෙනාම එකට වැඩ කළා. දැනුත් අපි හැමෝම එකට වැඩ කරමින් ඉන්නවා. එසේ වැඩ කරමින් ඇති වුණු මේ තත්ත්වයට අපි සාර්ථකව මුහුණ දුන්නා. විශේෂයෙන්ම රාජ්‍ය සේවය තුළ සිටින නිලධාරීන් විසින් රට තුළ ඇති වන විශේෂ තත්ත්වයකදී වැඩ කළ යුත්තේ කොහොමද කියන එක පිළිබඳව හොඳ උදාහරණයක් දීලා තිබෙනවා, නැවත වතාවක්. "දිට්වා" සුළි කුණාටුව ආපු වෙලාවේදීත් අපි ඒ තත්ත්වය දැක්කා. මෑත කාලයේදී අපේ ආණ්ඩුවේ කටයුතුවලදී ත්‍රිවිධ හමුදාව, ආපදා කළමනාකරණ අංශ, ප්‍රාදේශීය ලේකම්වරුන්, නිලධාරීන් වැඩ කළේ කොහොමද කියලා අපි දැක්කා. රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් ඉතාම විශිෂ්ට සේවයක් මේ වෙලාවේදීත් කරමින් ඉන්නවා. එයටත් හිස නමා ආචාර කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි, හැම දෙනාටම.

***** *කථාව අවසානයේ පළ කර ඇත.*
* *உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
* *Produced at end of speech.*

*සභාමේසය මත තබන ලද ලැයිස්තු:
சபாபீடத்தில் வைக்கப்பட்ட பட்டியல்:
*Lists tabled:*

## Consumer Order Dilivery Allocations for 19.03.2026

| No. | Cust. Code | RO Name | Town/City | District | State | Loads |
|---|---|---|---|---|---|---|
| 1 | 101528 | KANDY MUNICIPAL COUNCIL | ARUPPOLA | Kandy | CEN | 1 |
| 2 | 103611 | ROAD DEVELOPMENT AUTHORITY | GAMPOLA | Kandy | CEN | 1 |
| 3 | 106724 | ASIRI HOSPITAL KANDY (PVT) LTD | KANDY | Kandy | CEN | 1 |
| 4 | 103683 | ROAD DEVELOPMENT AUTHORITY -MEDAWAC | MEDAWACHCHYA | Anuradhapura | NOC | 1 |
| 5 | 109800 | NATIONAL SALT LIMITED | KILINOCHCHI | Killinochchi | NOR | 1 |
| 6 | 107844 | M A M FARM HOUSE (PVT) LTD | BINGIRIYA | Kurunegala | NOW | 1 |
| 7 | 108126 | QUICK GROW NATURAL PRODUCTS (PVT) L | WEWAGAMA, KULIYAPITIYA | Kurunegala | NOW | 1 |
| 8 | 105316 | WEEHENA FARMS | MAHAWEWA | Puttalam | NOW | 1 |
| 9 | 103235 | PUTTALAM SALT LTD. | PUTTLAM | Puttalam | NOW | 1 |
| 10 | 101918 | ROYAL CERAMICS LANKA LTD | EHELIYAGODA | Ratnapura | SAB | 1 |
| 11 | 102077 | SIAM CITY CEMENT (LANKA) | GALLE | Galle | SOU | 1 |
| 12 | 101155 | KALUBOWITIYANA TEA FACTORY LTD | NELLUWA | Galle | SOU | 1 |
| 13 | 108011 | SLA SPICE (PVT) LTD | AHANGAMA | Galle | SOU | 1 |
| 14 | 101939 | MS.LANKA SALT LTD | HAMBANTHOTA | Hambantota | SOU | 1 |
| 15 | 106157 | LANWA SANSTHA CEMENT CORPORATION | MIRIJJAWILA | Hambantota | SOU | 1 |
| 16 | 107272 | MANISHA EN CARBON (PVT) LTD | WEERAKETIYA | Hambantota | SOU | 1 |
| 17 | 101193 | MS.NAKIADENIYA ESTATE | NAKIYADENIYA | Matara | SOU | 1 |
| 18 | 101944 | MS.HARISCHANDRA MILLS LTD | MATARA | Matara | SOU | 1 |
| 19 | 101179 | AGARAPATANA PLANTATIONS LIMITED | HAPUTALE | Badulla | UVA | 1 |
| 20 | 109770 | SEED & PLANTING MATERIAL DEVELOPMEN | MAHIYANGANAYA | Badulla | UVA | 1 |
| 21 | 101934 | LANKA SUGAR COMPANY (PVT)LTD | BUTTALA | Badulla | UVA | 1 |
| 22 | 108603 | DOLE LANKA (PRIVATE) LIMITED | BUTTALA | Monaragala | UVA | 1 |
| 23 | 101721 | PELWATTE DAIRY INDUSTRIES(PVT) | BUTTALA | Monaragala | UVA | 1 |
| 24 | 101809 | LINEA AQUA (PVT) LTD | GIRIDARA | Colombo | WES | 1 |
| 25 | 106670 | HETTIGODA CITY (PVT) LTD | GALKISSA | Colombo | WES | 1 |
| 26 | 102053 | SRI LANKAN AIR LINES LTD | KATUNAYAKE | Colombo | WES | 1 |
| 27 | 107080 | MITSUKI CONSTRUCTION COMPANY LANKA | COLOMBO 02 | Colombo | WES | 1 |
| 28 | 101532 | COLOMBO MUNICIPAL COUNCIL - BORELLA | COLOMBO 08 -CAMBAL PARK | Colombo | WES | 1 |
| 29 | 101525 | COLOMBO MUNICIPAL COUNCIL - COL. 14 | COLOMBO 14 | Colombo | WES | 1 |
| 30 | 102188 | LITRO GAS TERMINAL LANKA (PVT)LTD | KERAWALAPITIYA, WATTALA | Colombo | WES | 1 |
| 31 | 101506 | STATE PHARMACEUTICAL MANUFACUTURE C | RATMALANA | Colombo | WES | 1 |
| 32 | 102052 | MS.ASIRI SURGICAL HOSPITAL LTD. | COLOMBO 05 | Colombo | WES | 1 |
| 33 | 106769 | PUSSALLA MEAT PRODUCERS ( PRIVATEE) | KOSGAMA | Colombo | WES | 1 |
| 34 | 109136 | JFI CONSOLIDATED (PVT) LTD | COLOMBO 10 | Colombo | WES | 1 |
| 35 | 102057 | DIALOG TELECOM | COLOMBO 09 | Colombo | WES | 1 |
| 36 | 101968 | KOTMALE DAIRY PRODUCT (PVT) LTD | MULLERIYAWA | Colombo | WES | 1 |
| 37 | 102024 | HOTEL DEVELOPERS LANKA LIMITED | COLOMBO 01 | Colombo | WES | 1 |
| 38 | 101967 | RENUKA AGRI FOODS LTD | COLOMBO 02 | Colombo | WES | 1 |
| 39 | 108905 | MARINE DRIVE HOTELS (PRIVATE) LIMIT | COLOMBO 03 | Colombo | WES | 1 |
| 40 | 102023 | MS.MOUNT LAVINIA HOTEL | MT. LAVINIA | Colombo | WES | 1 |
| 41 | 101535 | KOLONNAWA URBAN COUNCIL | KOLONNAWA | Colombo | WES | 1 |
| 42 | 107896 | ROYAL COLOMBO GOLF CLUB | COLOMBO 08 | Colombo | WES | 1 |
| 43 | 102827 | MILCO (PVT)LTD | NARAHENPITA, COLOMBO 05 | Colombo | WES | 1 |
| 44 | 101945 | MALIBAN BISCUIT MANUFACTORIES (PVT) | RATHMALANA | Colombo | WES | 1 |
| 45 | 101936 | G.O.B.U.OF CEYLON COLD STORES LTD | KADUWELA | Colombo | WES | 1 |
| 46 | 106764 | POWER HOUSE LIMITED (TV DERANA) | COLOMBO 10 | Colombo | WES | 1 |
| 47 | 101484 | SRI LANKA TELECOM PLC. | COLOMBO 01 | Colombo | WES | 1 |
| 48 | 102213 | NOYON LANKA (PVT)LTD | MALWANA | Gampaha | WES | 1 |
| 49 | 102281 | MS.LION BREWERY (CEYLON) PLC | BIYAGAMA | Gampaha | WES | 1 |
| 50 | 500510 | MELWIRE ROLLING (PVT)LTD. | JAELA | Gampaha | WES | 1 |
| 51 | 107224 | NATIONAL WATER S & D BOARD -KATUNAY | KATUNAYAKE | Gampaha | WES | 2 |
| 52 | 101464 | SRILANKAN CATERING LTD | KATUNAYAKA | Gampaha | WES | 1 |
| 53 | 107114 | DIYATHA HOLDINGS (PVT) LTD | JAELA | Gampaha | WES | 1 |
| 54 | 102101 | AIRPORT & AVIATION SERVS | KATUNAYAKE | Gampaha | WES | 2 |
| 55 | 107990 | AQUA DYNAMICS (PVT) LTD | ALUTHWATTA, NEGAMBO | Gampaha | WES | 1 |
| 56 | 101946 | MS.CARGILLS DAIRIES (PVT) LTD | BANDURAGODA | Gampaha | WES | 1 |
| 57 | 101873 | CARGILLS FOOD & BEVERAGE LIMITED | DEMANHANDIYA | Gampaha | WES | 1 |
| 58 | 106908 | DINUTH CEY FOODS | SEEDUWA | Gampaha | WES | 1 |
| 59 | 102969 | ROAD DEVELOPMENT AUTHORITY GAMPAHA | KOTADENIYAWA (PLANT - 5A- | Gampaha | WES | 1 |
| 60 | 103058 | ROAD DEVELOPMENT AUTHORITY -INGIRIY | INGIRIYA | Kalutara | WES | 1 |
| 61 | 101970 | MS.WIJAYA PRODUCTS (PVT)LTD. | KALUTARA | Kalutara | WES | 1 |

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

## Consumer Order Dilivery Allocations for 20.03.2026

| No. | A/c no. | A/c no. | Name | Location | District | Loads |
|---|---|---|---|---|---|---|
| 1 | 104860 | PUWAKARANBA AGENCIES (PVT) LTD | HABARANA | Anuradhapura | CEN | 1 |
| 2 | 107655 | KEGALLE PLANTATIONS PLC | UDAPUSSELLAWA | Kandy | CEN | 1 |
| 3 | 101181 | MS.DELTA ESTATE | PUPURESSA | Kandy | CEN | 1 |
| 4 | 101953 | MS.SRI LANKA DISTILLERIES LTD | KANDY | Kandy | CEN | 1 |
| 5 | 102777 | KANDALAMA HOTEL | DAMBULLA | Kandy | CEN | 1 |
| 6 | 501094 | SRI LANKA TELECOM PLC-MATALE | MATALE | Matale | CEN | 1 |
| 7 | 107085 | MATURATA PLANTATION LTD | HALGRANOYA | Nuwara Eliya | CEN | 1 |
| 8 | 101969 | MS.TEA FACTORY | KANDAPOLA | Nuwara Eliya | CEN | 1 |
| 9 | 105115 | GALOYA PLANTATIONS ( PVT) LIMITED | HINGURANA | Ampara | EAS | 1 |
| 10 | 101350 | SRI LANKA PORTS AUTHORITY | TRINCOMALEE | Trincomalee | EAS | 1 |
| 11 | 109371 | ULAGALLA WALAWWA | ANURADHAPURA | Anuradhapura | NOC | 1 |
| 12 | 102729 | MILCO (PVT) LTD - POLONNARUWA | POLONNARUWA | Polonnaruwa | NOC | 1 |
| 13 | 103215 | THE HALO TRUST | JAFFNA | Jaffna | NOR | 1 |
| 14 | 108087 | LOTUS ENTERPRISES | BINIGIRIYA | Kurunegala | NOW | 1 |
| 15 | 107389 | RIOCOCO LANKA (PVT) LTD | BAMUNAKOTUWA | Kurunegala | NOW | 1 |
| 16 | 107221 | BEST PACIFIC TEXTILES LANKA (PVT) L | PANNALA | Kurunegala | NOW | 1 |
| 17 | 107069 | MARSYLKA MANUFACTURING LANKA (PVT) | POLGAH | Kurunegala | NOW | 1 |
| 18 | 107131 | CONSARC ( PVT) LTD | KULIYAPITIYA | Kurunegala | NOW | 1 |
| 19 | 107034 | BOTANICOIR LANKA (PVT) LTD | KOVIL KANDA, HIBUTANA SAD | Kurunegala | NOW | 1 |
| 20 | 106792 | UNION NORTH (PVT) LTD | DANKOTUWA | Puttalam | NOW | 1 |
| 21 | 109384 | S-LON LANKA (PVT) LTD | SANDALANKAWA | Puttalam | NOW | 1 |
| 22 | 107029 | M G APPARAL (PVT) LTD | RUWANWELLA | Kegalle | SAB | 1 |
| 23 | 108236 | LALAN RUBBERS (PVT) LTD | DERANIYAGALA | Kegalle | SAB | 1 |
| 24 | 101199 | MS.CECILIYAN ASSOCIATES LTD. | KALAWANA | Ratnapura | SAB | 1 |
| 25 | 105565 | NEW J K ENTERPRISES | KURUWITA | Ratnapura | SAB | 1 |
| 26 | 107876 | NILGIRI PLANTATION (PVT) LTD | BENGAMUWA | Galle | SOU | 1 |
| 27 | 101986 | MS.SAMSON RUBBER PRODUCTS PVT LTD | GALLE | Galle | SOU | 1 |
| 28 | 102022 | AITKEN SPENCE HOTEL HOLDINGS PLC | AHUNGALLA | Galle | SOU | 1 |
| 29 | 106856 | CAPE WELIGAMA (PVT) LTD | WELIGAMA | Galle | SOU | 1 |
| 30 | 107780 | M C ENTERPRISES (PVT) LTD | AMBALANGODA | Galle | SOU | 1 |
| 31 | 101527 | GALLE MUNICIPAL COUNCIL | GALLE | Galle | SOU | 1 |
| 32 | 109512 | UGA ESCAPES YALA (PVT) LTD (CHENA H | TISSAMAHARAMA | Hambantota | SOU | 1 |
| 33 | 103094 | DAVID PIERIS MOTOR CO. (LANKA) LTD | RANNA | Matara | SOU | 1 |
| 34 | 101934 | LANKA SUGAR COMPANY (PVT)LTD | BUTTALA | Badulla | UVA | 2 |
| 35 | 107275 | A F JONES EXPORTERS CEYLON (PVT) LT | COLOMBO 10 | Colombo | WES | 1 |
| 36 | 106866 | MALIBAN WOVENS (PVT) LTD | COLOMBO 10 | Colombo | WES | 1 |
| 37 | 106677 | TOYOTA LANKA (PRIVATE) LIMITED | KADAWATHA | Colombo | WES | 1 |
| 38 | 101848 | MS.ASSOCIATED MOTORWAYS LTD | KALUTHARA | Colombo | WES | 1 |
| 39 | 104376 | IDEAL MOTORS (PRIVATE) LTD | RATHMALANA | Colombo | WES | 1 |
| 40 | 106805 | BUILT ELEMENT LTD | RATHMALANA | Colombo | WES | 1 |
| 41 | 106707 | PUSSELLAWA PLANTATION LTD | AVISSAWELLA | Colombo | WES | 1 |
| 42 | 101938 | DISTILLERIES COMPANY OF SRI LANKA | SEEDUWA | Colombo | WES | 1 |
| 43 | 101971 | MS.CBL FOODS INT. (PVT)LTD | RANALA | Colombo | WES | 1 |
| 44 | 104815 | ROYAL CASKS DISTILLERIES (PVT) LTD | PADUKKA | Colombo | WES | 1 |
| 45 | 106903 | NEWRO MEAT PRODUCTS (PVT) LTD | HENPITA, HANWELLA | Colombo | WES | 1 |
| 46 | 101974 | ACME LANKA DISTILLERS (PVT)LTD, | HANWELLA | Colombo | WES | 1 |
| 47 | 102134 | ASIAN GROUP OF COMPANIES (PVT)LTD | KOHILAWATTA | Colombo | WES | 1 |
| 48 | 102271 | JAYA CONTAINER TERMINALS LTD | BLOEMENDHAL-COLOMBO 15 | Colombo | WES | 1 |
| 49 | 108044 | ELCARDO INDUSTRIES (PVT) LTD | RATHMALANA | Colombo | WES | 1 |
| 50 | 103209 | SWISSTEK ALUMINIUM LTD | DOMPE | Colombo | WES | 1 |
| 51 | 102236 | MS.MELWIRE ROLLING (PVT)LTD. | COLOMBO 12 | Colombo | WES | 1 |
| 52 | 107196 | SINGER SRI LANKA PLC | PILIYANDALA | Colombo | WES | 1 |
| 53 | 108146 | A BAUR & CO. (PVT) LTD | COLOMBO 14 | Colombo | WES | 1 |
| 54 | 102890 | NATIONAL WATER SUPPLY & DRAINAGE BO | MULLERIYAWA | Colombo | WES | 1 |
| 55 | 102892 | NATIONAL WATER S & D BOARD | KALATUWAWA | Colombo | WES | 1 |
| 56 | 108168 | MEGA HEATERS (PVT) LTD | UDA INDUSTRIAL ZONE, KATU | Colombo | WES | 1 |
| 57 | 107556 | SAMITH TRADERS AND TRANSPORTERS (PV | COLOMBO15 | Colombo | WES | 1 |
| 58 | 106849 | GATEWAY COLLEGE | NAWAL, RAJAGIRIYA | Colombo | WES | 1 |
| 59 | 101471 | MS.BOC PROPERTY DEVE. & MGT.PVT LTD | COLOMBO 03 | Colombo | WES | 1 |
| 60 | 108167 | HAYLEYS AVENTURA (PVT) LTD | MALABE | Colombo | WES | 1 |
| 61 | 106726 | HUTCHISON TELECOMMUNICATION LANKA(P | RAGAMA | Colombo | WES | 1 |
| 62 | 103392 | UNION RESIDENCIES (PVT) LTD | COLOMBO 01 | Colombo | WES | 1 |
| 63 | 107205 | MAHESH MALLWARATCHIE ENTRYPRISES (P | COLOMBO 06 | Colombo | WES | 1 |
| 64 | 102898 | MINISTRY OF HELTHCARE & NUTRITION | MULLERIYAWA | Colombo | WES | 1 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 65 | 103291 | CEYLON OXYGEN | COLOMBO 15 | Colombo | WES | 1 |
| 66 | 101515 | DEPARTMENT OF POST | COLOMBO 10 | Colombo | WES | 1 |
| 67 | 101525 | COLOMBO MUNICIPAL COUNCIL - COL. 14 | COLOMBO 14 | Colombo | WES | 1 |
| 68 | 103042 | JAY JAY MILLS LANKA (PVT) LTD | AWISSAWELLA | Colombo | WES | 1 |
| 69 | 107888 | MAXIM IMPRESSIONS LANKA (PVT) LTD | HOMAGAMA | Colombo | WES | 1 |
| 70 | 103383 | CENTRAL ENVIRONMENT AUTHORITY | BATTRAMULLA | Colombo | WES | 1 |
| 71 | 108383 | FARMCHEMIE MANUFACTURES (PVT) LTD | HOMAGAMA | Colombo | WES | 1 |
| 72 | 106700 | SUNSHINE TEA (PVT) LTD | KELANIYA | Colombo | WES | 1 |
| 73 | 101850 | MS.RANATHUNGA MOTERS (PVT) LTD | GAMPAHA | Gampaha | WES | 1 |
| 74 | 106438 | SWISSTEK (CEYLON) PLC | BELUMMAHARA | Gampaha | WES | 1 |
| 75 | 106984 | ATLASAXILLIA COMPANY (PRIVATE) LIMI | WATTALA | Gampaha | WES | 1 |
| 76 | 106813 | AB MANUFACTURING (PVT) LTD | MILLANIYA, BANDARAGAMA | Gampaha | WES | 1 |
| 77 | 101931 | COCA-COLA BEVERAGES SRI LANKA LTD | BIYAGAMA | Gampaha | WES | 1 |
| 78 | 101996 | CEAT KELANI INTERNATIONAL TYRESLTD | KELANIYA | Gampaha | WES | 1 |
| 79 | 102800 | ESBEE TRADING (PVT)LTD | NEGAMBO | Gampaha | WES | 1 |
| 80 | 104039 | RHINO PRODUCTS LTD | EKALA, JA -ELA | Gampaha | WES | 1 |
| 81 | 108539 | BALFOUR BEATTY CEYLON (PVT) LTD | KATUNAYAKE | Gampaha | WES | 1 |
| 82 | 102191 | MS.CENTRAL INDUSTRIES LTD | HENDALA-WATTALA | Gampaha | WES | 1 |
| 83 | 102063 | LANKA ALUMINIUM INDS.LTD | EKALA | Gampaha | WES | 1 |
| 84 | 102179 | PRINTCARE PLC | KELANIYA | Gampaha | WES | 1 |
| 85 | 107036 | MS.PRINTCARE UNIVERSAL (PVT) LTD | KELANIYA | Gampaha | WES | 1 |
| 86 | 107321 | PACKSCO CEYLON (PVT) LTD | COLOMBO ROAD, WELISARA | Gampaha | WES | 1 |
| 87 | 106931 | MODERN PACK LANKA (PV) LTD | GONAPOLA | Gampaha | WES | 1 |
| 88 | 107086 | AMILA TRANSPORT AND LOGISTICS (PVT) | SIYABALAPE | Gampaha | WES | 1 |
| 89 | 101762 | STRETCHLINE(PVT)LTD | BIYAGAMA | Gampaha | WES | 1 |
| 90 | 107390 | BADUWATTA DESICATED COCONUT MILLS L | KATANA | Gampaha | WES | 1 |
| 91 | 107145 | BUSAN DIPPING KO-LANKA PVT LTD | KADAWALA-KATANA | Gampaha | WES | 1 |
| 92 | 101587 | V.V.KARUNARATNE & CO | KELANIYA | Gampaha | WES | 1 |
| 93 | 107278 | CARGILLS FOOD COMPANY (PVT) LTD | MIRISWATTE - DEMANHANDIYA | Gampaha | WES | 1 |
| 94 | 101854 | SENOK TRADE COMBINE LTD. | WILIMBULLA | Gampaha | WES | 1 |
| 95 | 108521 | NATIONAL LIVESTOCK DEVELOPMENT BOAR | RAGAMA | Gampaha | WES | 1 |
| 96 | 101464 | SRILANKAN CATERING LTD | KATUNAYAKA | Gampaha | WES | 1 |
| 97 | 103303 | MS.NAWALOKA PILING (PVT) LTD. | PELIYAGODA | Gampaha | WES | 1 |
| 98 | 500510 | MELWIRE ROLLING (PVT)LTD. | JAELA | Gampaha | WES | 1 |
| 99 | 107562 | HEDIGALLA TEA FACTORY (PVT) LTD | BADURALIYA | Kalutara | WES | 1 |
| 100 | 102029 | GOLDEN SUN RESORT (PVT)LTD | WASKADUWA | Kalutara | WES | 1 |
| 101 | 107292 | CEYRING (PVT) LTD | WAGAWATTE, HORANA | Kalutara | WES | 1 |

**ගරු මුලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Amirthanathan Adaikkalanathan. You have six minutes.

[பி.ப. 4.55]

**ගරු අමිර්තනාදන් අඩෙයික්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தற்போதைய உலகளாவிய நெருக்கடியால் உள்நாட்டுப் பொருளாதாரத்துக்கு ஏற்படும் பாதிப்பு தொடர்பான இன்றைய ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு சில கருத்துகளைச் சொல்லலாமென நினைக்கின்றேன்.

இன்று காலையில் வீட்டுத்திட்டம் சம்பந்தமாக கேள்வி கேட்கப்பட்டபோது, அந்த வீட்டுத்திட்டத்தைச் செய்து முடிப்பதாக கௌரவ பிரதி அமைச்சர் அவர்கள் வாக்குறுதி அளித்திருந்தார். அது நடைமுறைக்கு வர வேண்டும் என்பது என்னுடைய கருத்தாகும். ஏனென்றால், எந்தவொரு வழியும் இல்லாத சாதாரண குடும்பத்தைச் சேர்ந்த பலர் இந்த வீட்டுத்திட்டத்தால் மாண்டுபோய் இருக்கிறார்கள். இன்னும் பலர் கடனைச் செலுத்த முடியாமல் திண்டாடிக்கொண்டு இருக்கிறார்கள். எனவே, கௌரவ பிரதி அமைச்சர் அவர்கள் சொன்ன கருத்தின் அடிப்படையில், உடனடியாக நடவடிக்கை எடுக்க வேண்டுமென நான் வலியுறுத்துகின்றேன்.

இப்பொழுது எரிபொருள், எரிவாயு போன்ற விடயங்கள் பேசுபொருளாக மாறி இருக்கின்றன. எங்களுடைய பிரதேசத்தில் குறிப்பாக வன்னிப் பிரதேசத்திலுள்ள எல்லா எரிபொருள் நிரப்பு நிலையங்களிலும் நீண்ட queue இருப்பதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. உணவுப் பொருட்கள் இல்லாமல் போய்விடுமா, எரிபொருள் இல்லாமல் போய்விடுமா என்ற அச்சத்தோடு மக்கள் இருக்கின்றார்கள். இதற்குள் தரகர்களுடைய செயற்பாடுகளால் மாபியா போன்ற விடயங்களும் அதிகரித்து இருக்கின்றன. குறிப்பாக, எரிபொருளைப் பதுக்கி வைத்து கூடுதல் விலைக்கு விற்கின்ற சூழல் காணப்படுகின்றது.

இன்றைய தினம் சனாதிபதி அவர்கள் இரண்டு கூட்டங்களை நடத்தியிருந்தார். அவர் நாடாளுமன்றத்தில் உரையாற்றிய பின்னர், இங்கிருக்கின்ற கட்சித் தலைவர்களைச் சந்தித்து உரையாடினார். ஓரளவுக்கு நிலைமையைச் சமாளிக்க முடியுமென அரசு சொல்கின்றது. சனாதிபதி அவர்கள் இவ்விடயம் தொடர்பில் தன்னுடைய கருத்தை மக்கள் மத்தியில் சொன்னது சாலச் சிறந்தது என்பது என்னுடைய கருத்து.

வன்னியில் இரண்டு சமூகத்தினர்தான் அதிகமாக இருக்கிறார்கள். ஒன்று, விவசாயிகள்; மற்றையது, கடற்றொழிலாளர்கள். தற்போதைய நிலைமையில் இந்த

[ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

இரண்டு சமூகத்தினரையும் அரசாங்கம் எப்படி தூக்கி உயர்த்தப் போகின்றது என்ற பிரச்சினை இருக்கின்றது. QR முறைமைமூலம் கிடைக்கும் எரிபொருளைப் பயன்படுத்தி மீனவர்கள் குறிப்பிட்டளவு தூரம்தான் செல்ல முடியுமே ஒழிய, நீண்ட தூரம் செல்ல முடியாது. அவர்கள் நீண்டதூரம் சென்றுதான் மீனைப் பிடிக்க வேண்டும்.

இந்த நிலையில், அவர்களுக்குக் கொடுக்கப்படுகின்ற மண்ணெண்ணெய், பெற்றோலின் அளவு QR முறைமைமூலம் 20-25 லீற்றர் என மட்டுப்படுத்துகின்றபோது, அவர்களின் தொழில் பாதிக்கப்படுகின்ற நிலைமை ஏற்படும். இன்றைக்கு இரண்டு வகையான விவசாயிகள் இருக்கிறார்கள். ஒன்று, தோட்டம் செய்கின்ற விவசாயிகள்; மற்றையது, நெல்லை உற்பத்தி செய்கின்ற விவசாயிகள். இன்றைக்குக் கூடுதலான கவனம் நெல்லை உற்பத்தி செய்கின்ற விவசாயிகள்மீது இருந்துகொண்டு இருக்கின்றதே ஒழிய, தோட்டம் செய்கின்ற விவசாயிகள்மீது அல்ல. இதனால் தோட்டம் செய்கின்ற விவசாயிகள் எரிபொருளைப் பெறுவது என்பது மிகவும் கஷ்டமாக இருக்கின்றது.

நான் ஓர் ஆலோசனையைச் சொல்லலாமென நினைக்கின்றேன். இன்றைக்கு எங்களுடைய விவசாயிகள் பல வழிகளில் பாதிக்கப்படுகின்றார்கள். நெல்லை விற்கும்போதும் அவர்கள் பாதிக்கப்படுகின்றார்கள். அங்கு தனியார் யார்? விவசாயிகள் யார்? என்று கண்டுபிடிக்க முடியாமல், அரச நிறுவனங்கள் எல்லோரிடமிருந்தும் நெல்லை வாங்குகின்ற நிலை காணப்படுகின்றது. இதனால் விவசாயிகள் பாதிக்கப்படுகின்றார்கள். எனவே, அரசாங்கம் இது தொடர்பில் ஓர் அறிவித்தலைச் செய்ய வேண்டும். நான் மாண்புமிகு சனாதிபதி அவர்களுடன் பேசியபோது, விவசாய அமைப்புகள் கொடுக்கின்ற கடிதங்களுக்கு முன்னுரிமை வழங்குகின்ற வாய்ப்பை உண்டுபண்ணப் போவதாக அவர் சொன்னார். அதேபோன்று, எரிபொருள் வழங்குகின்ற விடயத்தில் மீனவ அமைப்புகள் கடிதங்களைக் கொடுக்கின்றபோது, அவற்றுக்கும் முன்னுரிமை வழங்க வேண்டும் என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அடுத்து, புதன்கிழமை பொது விடுமுறை தினமாக அறிவிக்கப்பட்டு இருக்கின்றது. எரிபொருளை மிச்சப்படுத்துவதற்காகவே இவ்வாறு அறிவிக்கப்பட்டதாகச் சொல்லப்படுகின்றது. மாதச் சம்பளம் பெறும் அதிகாரிகளுக்குச் சம்பளம் கிடைக்கும். ஆனால், அன்றாடம் உழைக்கின்ற சாமானிய மக்களுக்கு இந்த புதன்கிழமை லீவு என்பது பாதிப்பை ஏற்படுத்துகின்றது. நாங்கள் இந்த விடயத்தை சனாதிபதி அவர்களிடம் எடுத்துக் கூறியபோது, அவர்கள் மீதும் கவனம் செலுத்தப்பட வேண்டுமென அவர் சொல்லியிருந்தார். எனவே, முடிவுகளை எடுக்கும்பொழுது எந்தச் சமூகத்தினரும் பாதிக்கப்படாத வகையில் எடுக்க வேண்டும். இதனை அரசாங்கம் கவனத்தில் எடுப்பது சாலச் சிறந்ததாக இருக்குமென நான் கருதுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is up.

**ගරු අමීර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
Madam, please give me one more minute.

எங்களுடைய நாட்டில் எரிபொருள் உற்பத்தி எதுவும் நடைபெறுவதில்லை. இன்றைக்கும் நாங்கள் வெளிநாடுகளிலேயே தங்கியிருக்கின்றோம். நான் இன்னோர் ஆலோசனையைச் சொல்ல விரும்புகின்றேன். அதாவது, தூர நாடுகளிலிருந்து பெற்றோல், டீசலைக் கொண்டுவருவதிலும் பார்க்க, அண்மையில் இருக்கின்ற இந்தியாவுடன் ஓர் ஒப்பந்தத்தைச் செய்து எந்தத் தடையும் இல்லாமல் எரிபொருளைக் கொண்டுவருவதற்கான வாய்ப்பை ஏற்படுத்தினால், எங்களுடைய தேசத்தில் எரிபொருள் பிரச்சினை என்பது இருக்காது. எனவே, என்றைக்கும் இலங்கைக்கு ஆதரவு அளிக்கின்ற, அயல் நாடான இந்தியாவைப் பயன்படுத்துங்கள்! நீங்கள் இந்தியாவோடு எரிபொருள், உணவுப் பொருட்கள் உட்பட எல்லா விடயங்களையும் பகிர்ந்துகொள்வீர்களாக இருந்தால், நிச்சயமாக எங்களுடைய நாடு இவ்வாறான பிரச்சினைகளுக்குள் முழ்கிப்போகாது என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.03]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මුලින්ම මා සුබ ප්‍රාර්ථනා එක් කරනවා, පාර්ලිමේන්තුවේ වේත්‍රධාරි දෙපාර්තමේන්තුවේ සේවය කර අද දින විශ්‍රාම යන බී. සිසිර කුමාර මහත්මයාට. එතුමා අවුරුදු 40ක කාලයක් පාර්ලිමේන්තුවේ සේවය කර තිබෙනවා. එතුමාගේ විශ්‍රාම දිවිය සාර්ථක වේවා කියලා මා සුබ පතනවා.

අද උදේ වරුවේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පැයක විතර කාලයක් කථා කළා. එතුමාගේ කථාව තුළ කියැවුණේ රටේ ප්‍රශ්න ගැනයි. ගෑස්, ඩීසල් සහ අනෙකුත් ප්‍රශ්න සියල්ලම අද වෙනකොට විසඳිලා වාගේ තමයි එතුමා කථා කළේ. නමුත්, අද වෙනකොට ගෑස් සිලින්ඩර පාරේ තිබෙන විධියට කථා කළාට, තවම සමහර තැන්වල කඩවල්වල ඇවිදලා හොයා බලා තමයි ගෑස් මිලදී ගන්න වෙලා තිබෙන්නේ. එහෙම නැතුව ගිය ගමන් ගන්න දැන් ගෑස් නැහැ. තෙලුත් එහෙම තමයි. ප්‍රශ්න නැතුවා නොවෙයි.

එතුමා කියනවා, මේ යුද්ධය සම්බන්ධව ජනාධිපතිතුමා ඇතුළු ආණ්ඩුව මැදි ප්‍රතිපත්තියක් ගෙන යනවා කියලා. නමුත්, එතැනදී විපක්ෂය ඇවිළෙන ගින්නට පිදුරු දමනවා වාගේ හැසිරෙන කථාවක් තමයි ජනාධිපතිතුමා කිව්වේ. අපි ඇවිළෙන ගින්නට පිදුරු දමන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ජනාධිපතිතුමා දැන ගන්න ඕනෑ, ලෝකය balance කර ගන්න. ආණ්ඩුව දැන ගන්න ඕනෑ, රටවල් balance කර ගන්න. කටාර්වලට මිසයිල ගහනකොට, ජනාධිපතිතුමා ඊයේ පෙරේදා කටාර්වලට කථා කරලා තිබුණා; සවුදියට කථා කරලා තිබුණා. ඒ විධියට ඉරානයේ තානාපති ගෙන්වා ඉරානයටත් කථා කරලා, ඇමෙරිකාවටත් කථා කරලා එහෙම balance කර ගන්න එක ජනාධිපතිතුමාගේ හා ආණ්ඩුවේ වැඩක්. දැනටත් මේ රටේ මිනිස්සු විපක්ෂයක් නැහැ කියලා කියනවා. විපක්ෂය කථා කරන්නේ නැහැ කියනවා. බුදියන විපක්ෂයක් ඉන්නේ කියලා තමයි රටේ මිනිස්සු කියන්නේ. විපක්ෂය හැටියට අපට යුතුකමක්

තිබෙනවා, මේ රටේ ජනතාවට සත්‍යය අවබෝධ කර දීමට සහ අපට එන ප්‍රශ්න මේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන්නට. ඒ වෙනුවෙන් අපි කථා කරනවා.

ආණ්ඩුව මහ පම්පෝරි ගහනවා, සල්ලි තිබෙනවා කියලා. හැබැයි, ඩොලර් බිලියන 7යි තිබෙන්නේ. රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව භාර දෙනකොට, 2024 සැප්තැම්බර් 22වැනි දා වනවිට ඩොලර් බිලියන 5.8ක් තිබුණා. ඒ අනුව බලද්දී ඩොලර් මිලියන 1,200යි වැඩි කරගෙන තිබෙන්නේ.

සංචාරක ව්‍යාපාරයෙන් අපේ රටට මාසයකට ඩොලර් මිලියන 450ක පමණ ආදායමක් ලැබුණා. අපි කල්පනා කරන්න ඕනෑ, මේ වෙලාවේදී අඩුම වශයෙන් ඩොලර් මිලියන 200ක් විතර සංචාරක ව්‍යාපාරයෙන් අපට නැති වෙන එක ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි, අඩුම වශයෙන් තෙල්වලට, ගෑස්වලට ඩොලර් මිලියන 150කවත් loss එකක් එනවා. මොකද, මේ අවස්ථාවේදී වැඩි ගණන්වලට තමයි තෙල් ගන්න වෙන්නේ, වැඩි ගණන්වලට තමයි ගෑස් ගන්න වෙන්නේ. ඒ විතරක් නොවෙයි, ඇඟලුම් ක්ෂේත්‍රයේත් loss එකක් එනවා. ඊළඟට, තැඹිලි ගෙඩි විතරක් තුන්ලක්ෂ ගණනක් සතියකට මැද පෙරදිගට යවා තිබෙනවා. තේ කොළ, තැඹිලි, ඇඟලුම් ඇතුළු ඒ සියල්ලම අපනයනය කිරීම දැන් නතර වෙලා තිබෙනවා. ඒ නිසා ඩොලර් මිලියන 100ක, 200ක loss එකක් අපට එනවා. දැන් නැව් ගාස්තු වැඩියි, insurance වැඩියි. ඒ නිසා අත්‍යවශ්‍ය ආහාර ගන්නත් තව ඩොලර් මිලියන 50ක, 75ක, 100ක අමතර වියදමක් අපට දරන්න සිදු වනවා.

ඒ විතරක් නොවෙයි, දැන් ඩුබායිවලින් වෙනත් රටවල අයට කියලා තිබෙනවා, ඒ රටින් යන්න කියලා. මැද පෙරදිග ඉන්න ගොඩක් රටවල අයට කියනවා, ඒ රටවලින් යන්න කියලා. අපේ මිනිස්සු එන්න විධියක් නැතුව ඉන්නවා. ඒ අයට ඉඳලාත් බැහැ, ඇවිල්ලාත් බැහැ. එහෙම ප්‍රශ්නයක් අද ගල්ෆ් ප්‍රදේශයේම ඇති වෙලා තිබෙනවා. විදේශ රටවල ඉන්න ශ්‍රමිකයන් ලංකාවට එවන මුදලේත් ඩොලර් මිලියන 100ක විතර loss එකක් තිබෙනවා. මේ සියල්ලේම එකතුව බැලුවාම මාසයකදී ඩොලර් මිලියන 750ක විතර loss එකක් ඇවිල්ලා රජයට පාඩු වෙනවා. අපි කියන්නේ නැහැ, දිගටම මේ යුද්ධය තිබෙන්න ඕනෑ කියලා. යුද්ධය දිගටම පැවතුණොත් ඒකට අපට සූදානම් වෙන්න වෙයි. මොකද, ඩොලර් බිලියන 7ක් තිබුණාට ඩොලර් බිලියන 5ක් විතර තමයි වියදම් කරන්න වෙන්නේ. ඉතුරු ඩොලර් බිලියන 2 වියදම් කරන්න බැහැ. ඒවා එක එක බැඳීම් එක්ක තිබෙන්නේ.

දැන් මේ සභාවේ කථා කරපු ආණ්ඩුවේ සමහර ඇමතිවරු කිව්වා, මේ යුද්ධය ලෝක යුද්ධයක් කියලා. මේ තත්ත්වයම තමයි කොවිඩ් වසංගතය වෙලාවේදී ඇති වුණේත්. ඒ වෙලාවේ injections ගෙනැල්ලා පළමුවැනියට injections ගැහුවේ මේ පාර්ලිමේන්තුවේ අපි. අනුර කුමාර ජනාධිපතිතුමා, හරිනි අමරසූරිය අගමැතිතුමිය, විජිත හේරත් ඇමතිතුමා ඇතුළු අපි ඔක්කෝම එදා එක්කගෙන ගිහිල්ලා යුධ හමුදා රෝහලේදී අපට තමයි ඉස්සෙල්ලාම injections ගැහුවේ. ඒ කාලයේදීත් injectionsවලට මුදල් වියදම් වුණා; තෙල් ගණන් ගියා; ලොකු ප්‍රශ්න ආවා. ඒ නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුවත් ටික ටික හිර වෙලා ඩොලර් ඉවර වුණේ. ඒ වාගේ අවදානමක් නැහැ, අපට සල්ලි තිබෙනවා, අපට ඩොලර් තිබෙනවා කියලා ආණ්ඩුවට කියා - කියා ඉන්න බැහැ. මේ පාඩුව - loss එක - අල්ලන්න වෙනවා. මාසයකට ඩොලර් මිලියන 750ක් පාඩු වෙනවා කියන්නේ මාස 5කට ඩොලර් මිලියන 3,750ක් නැති වෙනවා කියන එකයි. එහෙම නම් විකල්පයක් හැටියට ආණ්ඩුවට ඒ ගැන කල්පනා කරලා වැඩ කරන්න වෙනවා.

මේ අවස්ථාවේදී ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්න හින්දා මම මේ කාරණයත් කියනවා. CID එක කියනවාලු, සාරා ජස්මින් ඉන්නවා කියලා. සාරා ජස්මින් ඉන්නවා නම් ඇය ගෙනැල්ලා රටට කියන්න, සාරා ජස්මින් ඉන්නවා කියලා. සාරා ජස්මින් කෙනෙක් ඉන්නවාද, නැද්ද කියලා පාස්කු ඉරුදින ප්‍රහාරයේ ඉඳලාම හොයනවා. මේ රටට කියන්න ඕනෑ, සාරා ජස්මින් ඉන්නවා කියලා. නමුත් තවම ඒ ගැන කියන්නේ නැහැ.

ඊළඟ කාරණය මෙයයි. ඊයේ උසාවියට ඉදිරිපත් කළා, කපිල චන්ද්‍රසේන. ඔහු දිවුරුම් ප්‍රකාශයකින් යම් කාරණයක් ඉදිරිපත් කළා. එය වගකිව යුතු කාරණයක්. ඔහු මොකක්ද ඉදිරිපත් කළේ? ඔහුගේ lawyer නැති වෙලාවේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ DG ඔහුට බලපෑමක් කළා කියලා. එතැනදී ඒ DG කියලා තිබෙනවා, කෙහෙළිය රඹුක්වැල්ලගේ මස්සිනා බෙල්ල වැල ලා ගත්තේ DGගේ බලපෑමට කියලා. ඒක ඒ දිවුරුම් ප්‍රකාශයේ තිබෙනවා. හැබැයි, ඒක වගකිව යුතු ප්‍රකාශයක්. මොකද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වාගේ තැනකට කටඋත්තර දෙන්න ගියාම "ඔයාටත් ඒ දේ වෙන්නේ" කියලා ඒ DG ඔහුට කියා තිබෙනවා. කෙහෙළිය රඹුක්වැල්ලගේ මස්සිනා බෙල්ල වැල ලාගෙන මැරුණා. මම හිතන විධියට කෙහෙළිය රඹුක්වැල්ලගේ මස්සිනා මැරුණු එක සම්බන්ධයෙනුත් ඒ DGට ලොකු වගකීමක් ගන්න වෙයි.

ඊළඟට, QR එක සම්බන්ධවත් මේ වෙලාවේදී මම කියන්න ඕනෑ. QR එක ගත්තොත්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ database එක ඒගොල්ලන් වෙන කාටවත් දුන්නේ නැහැ. මේ QR එක හදන්න කංචන විජේසේකර ඇමතිතුමා වශයෙන් සිටියදීත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ database එක ඉල්ලුවා. නමුත් තුන්වැනි පාර්ශ්වයකට database එක දෙන්න බැහැ. මේ වෙනකොට ආණ්ඩුවෙන් තුන්වැනි පාර්ශ්වයකට database එක ඉල්ලා තිබෙනවා. මොකද, මුළු රටේම වාහන අංක, වැසි අංක එහි තිබෙන නිසා මේ database එක වෙනත් කාගේ හරි අතකට ගියොත් ප්‍රශ්නයක් වෙනවා. මේ වෙනකොට ලිපි මඟින්, අරවායෙන්, මේවායෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් මේ database එක ඉල්ලනවා. ඒක බොහොම කල්පනාවෙන් කරන්න ඕනෑ වැඩක්. QR එක හදා ගන්න database එක ඕනෑ නැහැ. QR එක හදා ගන්න පුළුවන්, ආදායම් බලපත්‍රය ගත්තාම. මොකද, ධාවනයට නොගන්නා වාහන රටේ ඕනෑ තරම් තිබෙනවා. Database එකෙන් ගත්තොත් මුළු රටේම වාහන විස්තර ලැබෙනවා. ගරාජ්වල තිබෙන ධාවනය නොවන වාහනත් තිබෙනවා. පාරේ ධාවනය වන වාහනවලට විතරයි නේ QR code එක හදන්න ඕනෑ. ඒ නිසා ආදායම් බලපත්‍රය අනුව හැදුවාම හරි. පාරේ ධාවනය නොවන ඒවාට මොකටද QR codes හදන්නේ? පාරේ ධාවනය වන වාහනවලට QR codes හදනවා නම් database එක නොවෙයි, අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙන්නේ ආදායම් බලපත්‍රය. ඒ ආදායම් බලපත්‍රය ගත්තා නම් හරි. පළාත්වල තිබෙන හැම කච්චේරියකම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහ පළාත් සභාවල ආදායම් බලපත්‍ර විස්තර තිබෙනවා, ගන්න ලේසියි. ඒ අනුව QR එක හදන එක තමයි හරි යන්නේ.

ඊළඟ කාරණය මේකයි. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමා දැන් කථාව කරලා ගියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මාසයේ ඉඳන්ද කොහේද සෙස් බද්ද අයින් කරනවා. සෙස් බද්ද අයින් කරනවා කියන්නේ, දේශීය සුළු කර්මාන්ත කඩා වැටෙනවා කියන එක. දේශීය සුළු කර්මාන්තවල 150,000ක් යෙදිලා ඉන්නවා. මෙච්චර කල් තිබුණේ, දක්ෂිණාංශික ආණ්ඩු නේ. දක්ෂිණාංශික ආණ්ඩු අයින් කරලා

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

වාමාංශික සහ සමාජවාදී ආණ්ඩුවක් නේ බලයට ගෙනාවේ. ඒක ඇමෙරිකාවේ ලයින් එකේ යන, ඉන්දියාවේ ලයින් එකේ යන ආණ්ඩුවක් නොවෙයි නේ. මේ ආණ්ඩුව ගැන කවදාවත් එහෙම බලාපොරොත්තු වුණේ නැහැ. සෙස් බද්ද අයින් කළොත් දේශීය සුළු කර්මාන්තකරුවෝ ඉවරයි. දේශීය සපත්තු කොම්පැනි ඇතුළු සුළු පරිමාණයේ හැම දේශීය කර්මාන්තයක්ම ඉවර වනවා. සෙස් බද්ද ඉවත් කළොත් ලොකු ප්‍රශ්නයක් ඇති වනවා. රටේ 150,000කට වැඩිය සුළු කර්මාන්තකරුවෝ ඉන්නවා. සුළු කර්මාන්ත පැවතෙන්න සෙස් බද්ද අවශ්‍යයි. සෙස් බද්ද පැනෙව්වේ සුළු කර්මාන්ත ආරක්ෂා කරන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව මැතිනියගේ කාලයේ ඉඳන් මුල් තැන දුන්නේ දේශීය කර්මාන්තවලට. අනෙක් කාරණය තමයි, දේශීය කර්මාන්ත කඩා වැටුණොත් එක පැත්තකින් රස්සා නැති වනවා. අනෙක් පැත්තෙන් ඩොලර් සංචිත අඩු වනවා. මොකද, අවුරුද්දකට ඩොලර් මිලියන 100ක් විතර වෙන රටවලට දෙන්න වනවා. ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් සභාවේ ඉන්න නිසා මම මේ කාරණය කියන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සෙස් බද්ද අයින් කළොත් දේශීය සුළු කර්මාන්තකරුවන්ට ලොකු ප්‍රශ්නයක් ඇති වනවා. අපරාදේ සෙස් බද්ද අයින් කරන්නේ. සෙස් බද්ද නිසා තමයි මෙතෙක් කල් දේශීය සුළු කර්මාන්තකරුවෝ රැකිලා හිටියේ. මේ වනකොට සෙස් බද්ද අයින් කරලා තිබෙනවා. පසුගිය කාලයේ තිබුණු කිසිම ආණ්ඩුවකින් සෙස් බද්ද අයින් කළේ නැහැ. නමුත්, අපි හිතුවේ නැහැ දක්ෂිණාංශික ආණ්ඩු කළ වැඩ මේ සමාජවාදී ආණ්ඩු කරයි කියලා. සමාජවාදී ආණ්ඩුවකින් සෙස් බද්ද අයින් කිරීම තමයි අපට තිබෙන කනගාටුව. මේ නිසා ලොකු ප්‍රශ්නයක් ඇති වනවා කියන එක මම මේ වෙලාවේ කියනවා. මේ ගැන ආණ්ඩුවට හිතන්න වනවා. සෙස් බද්දක් ගහන්නේ පිට රටින් ගෙනෙන බඩුවලට. ඒක අයින් කළොත් චීනයේ බඩු මේ රටේ පිරෙයි. අනෙක් රටවල බඩුත් ආයේ මේ රටේ පුරවයි. එතකොට අපේ කර්මාන්තකරුවන්ට නිකම් ගෙවල්වලට වෙලා ඉන්නයි වෙන්නේ. ඒ ගැන අවබෝධයකින් කටයුතු කරන්න වන බව මම මේ අවස්ථාවේදී කියනවා.

ඊළඟ කාරණය, ශ්‍රී ලංකා පරිපාලන සේවය සම්බන්ධවයි. Sri Lanka Planning Service එකේ සහ Sri Lanka Accountants' Service එකේ අය නඩුවක් දාලා තිබුණා. දැන් නඩු තීන්දුව ඇවිල්ලා තිබෙනවා, Sri Lanka Planning Service එකේ, Sri Lanka Accountants' Service එකේ සහ පරිපාලන සේවයේ සියලුදෙනා එකම සේවයේ පිහිටුවන්න කියලා. හැබැයි, දැන් පරිපාලන සේවය සම්බන්ධව ලොකු ප්‍රශ්නයක් එනවා. මොකද එතකොට දිසාපති කෙනෙක් පත් වනවා, Sri Lanka Accountants' Service එකෙන්. එහෙම නැත්නම් Sri Lanka Planning Service එකෙන්. එහෙම පත් කරන්න පුළුවන්. මොකද, පරිපාලන සේවයේ අයම ඒ තනතුරට පත් කරන්න ඕනෑ කියලා එකක් දැන් නැහැ. දැන් වෙන වෙන සේවාවලිනුත් පත් කරන්න පුළුවන්. රාජ්‍ය පරිපාලන විෂය භාර ඇමතිතුමා දැන් ඉන්න නිසා මම මේ කාරණය කියන්නේ. ගරු ඇමතිතුමනි, මට ආරංචියි ඒ නඩුව දාපු Sri Lanka Planning Service එකේ එක්කෙනෙක් මේ ආණ්ඩුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති කරන්නයි හදන්නේ කියලා. හොඳට තියෙයි. පරිපාලන සේවයේ ඉන්න නෝනලාට, මහත්වරුන්ට, ලේකම්තුමන්ලාට සහ ලේකම්තුමියලාට එතකොට තේරෙයි. පරිපාලන සේවයේ කට්ටිය හෙට අනිද්දාට ඒ තනතුරුවලින් විසි වෙයි. ඒ නිසා පරිපාලන සේවයේ ඉන්න ලේකම්ලාට මම කියනවා, ඔබතුමන්ලා කල්පනාවෙන් වැඩ කරගෙන යන්න කියලා.

ඊළඟ කාරණය තමයි, විද්‍යාපීඨවලට බඳවා ගැනීම. 2023, 2024 වර්ෂවලට අදාළව විද්‍යාපීඨවලට බඳවා ගැනීමට තවම ගැසට් කරලා නැහැ; ළමයි බඳවා ගෙන නැහැ. යුද්ධ තිබෙනවා, රටේ ප්‍රශ්න තිබෙනවා කියලා ඒවා එක පාරටම නවත්වන්න බැහැ. ඒ බඳවා ගැනීම් කරන්න ඕනෑ. විද්‍යාපීඨවලින් ගුරුවරු එළියට එනකොට, විද්‍යාපීඨවලට ළමයින් ඇතුළත් කර ගත්තේ නැත්නම් ලොකු ප්‍රශ්නයක් එනවා. මොකද, ගුරුවරු retire වෙනකොට විද්‍යාපීඨ ගුරුවරු අඩු වෙනවා; දුෂ්කර පළාත්වලට ගුරුවරු නැති වෙනවා. ඒ වාගේ ප්‍රශ්න ගොඩක් ඇති වෙනවා. ආණ්ඩුවක් හැටියට මේවා මහ හැරලා යන්න බැහැ, අමාරුයි. එහෙම ගියාම මේ රටේ ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. අපට එන ප්‍රශ්න අපි මේ පාර්ලිමේන්තුවේ දී හරියට ඉදිරිපත් කරන්න ඕනෑ. එහෙම නැතිව මේ එන ප්‍රශ්න මඟහැරලා ඒවා පැත්තකින් තියලා යන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම තමයි පොල් වගාකිරීමේ මණ්ඩලයේ සභාපති හැටියට අලුතින් පත් වෙලා ඉන්නේ පොල් පිට රට යවන ව්‍යාපාරයක කටයුතු කරන, පොල් සම්බන්ධ විෂයයම දරන කෙනෙක්. ඒකෙන් අනෙක් ව්‍යාපාරිකයන්ට ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. විදේශ රටවලට පොල් යවලා ලොකු ආදායමක් ගන්න වැඩ කරන අයට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මොකද, එක එක දවසට මිල වැඩි කරනවා. එක එක දවසට මිල අඩු කරනවා. ඒක නිසා ප්‍රශ්න ගොඩකට ඒ අය පැටලිලා තිබෙනවා. මෙවැනි බොහෝ ප්‍රශ්න මේ රටේ ඇති වී ගෙන යනවා. මේවාට උත්තර හොයන්න ඕනෑ.

ලෝකයේ යුද්ධයක් තිබෙනවා කියලා අපි කවුරුත් දන්නවා. රටට තෙල් ගෙනෙන්නත් ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැනට ඇවිල්ලා ගෑස් සම්බන්ධව කථා කළාම ජනාධිපතිතුමා කිව්වා, අපි එක එක කාරණා කියනවා කියලා. අපට පෙනෙන දේ අපි කියනවා. අපි කියන්නේ ගෑස් දෙන්න පුළුවන් නම් හොඳයි. ලීටරෝ ගෑස්වලට අමතරව හම්බන්තොටින් ගෑස් හදලා දෙනවා කිව්වා. එහෙම දෙන්න පුළුවන් නම් කිසි ප්‍රශ්නයක් නැහැ. මිනිස්සු පෝලිම්වල නැත්නම් අපට ප්‍රශ්න නැහැ. මිනිස්සු පාරවල්වල නැත්නම් අපට ප්‍රශ්නයක් නැහැ. මේ ප්‍රශ්න හදා ගත්තේ අපි නොවෙයි. දැන් යුද්ධය තිබුණා හෝ නැහැ කියලා නැහැ, අවුරුදු එකහමාරක් ඔය ගොල්ලන්ගේ ආණ්ඩුව හොඳට ගියානේ. අන්න, ඒ විධියට යන්න. තිබෙන අඩු පාඩු හදා ගන්න. යුද්ධය තිබුණා කියලා බැහැ, හැම කෙනාම එකතු වෙලා මේක කරන්න වෙනවා. ඒවාට අපි කවුරුත් බලපෑම් කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ මැද පෙරදිග යුද්ධය ආරම්භ වෙලා මාසයක් යන්න කලින් අපට ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා තිබෙනවාය කියන එක. මට පොඩි කාලයක් ලැබී තිබෙන නිසා කෙටියෙන් පැහැදිලි කරන්නම්. කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා වාගේ අපට තිබෙන ප්‍රධාන ආදායම් මාර්ග බැලුවාම තේ ඇතුළු අපනයන භෝග ගණනාවකට ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි සංචාරක ව්‍යාපාරය. සංචාරක ව්‍යාපාරයටත් ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා තිබෙනවා.

විදේශ රැකියාවලින් තමයි අපේ රටට වැඩිම ආදායමක් එන්නේ. අපේ අය වැඩි ප්‍රමාණයක් මැද පෙරදිග කලාපයේ තමයි රැකියාවල නිරත වෙලා ඉන්නේ. ඒ අය ගැන විශේෂ අවධානයක් යොමු කරන්න වෙනවා. එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ 350,000ක් ඉන්නවා. සවුදි අරාබියේ 246,000ක් ඉන්නවා. කුවේට්වල 175,000ක් ඉන්නවා. කටාර්වල 140,000ක් ඉන්නවා. ඕමානයේ 32,000 ඉන්නවා. ඊශ්‍රායලයේ 30,000ක් ඉන්නවා. ජෝර්දානයේ 14,500ක් ඉන්නවා. බහරේන්වල 13,000ක් ඉන්නවා. ලෙබනනයේ 7,000ක් ඉන්නවා. මේ ආකාරයට අපේ අය ලක්ෂ 10කට වඩා යුද්ධය තිබෙන කලාපයේ රැකියාවල නිරත වෙලා ඉන්නවා. දැන් ඒ අයට ප්‍රශ්න ගණනාවක් එනවා. අපි දැක්කා, කොවිඩ් වසංගතය කාලයේත් ඒ අයට ලොකු අසාධාරණයක් සිදු වුණු බව. ඒ නිසා මේ අය ගැන රජයේ අවධානය යොමු කරන්න ඕනෑ. ඒ අය අපේ රටට විශාල වශයෙන් ඩොලර් ගෙනෙන අය. වසරකට ඩොලර් බිලියන 7ක් ගෙනැවිත් දුන්න ඒ කණ්ඩායම අද අනතුරට පත් වෙලා ඉන්නවා. මේ ප්‍රශ්නය ගැන විශේෂයෙන්ම මේ කලාපයේ ඉන්න තානාපති කාර්යාල හරහා - විශේෂයෙන්ම විදේශ රැකියාවල නිරත වෙලා ඉන්න අය ගැන - දැන්මම අපි අවශ්‍ය පියවර ගත යුතු වනවා. ඒ අයට අද වන විට ජීවිත තර්ජන තිබෙනවා. තවත් ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. එම නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ආණ්ඩුවට කියනවා, මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරලා විදේශ රැකියා ක්ෂේත්‍රයේ ඉන්න අපේ සහෝදර සහෝදරියන් ආරක්ෂා කර ගන්නත්, ඒ අයගේ ප්‍රශ්න විසඳන්න අවශ්‍ය පියවර ගන්නත් කටයුතු කරන්න කියලා. මේ වනකොට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිටින විදේශිකයන්ට ඉවත් වෙන්න කියලා තිබෙනවා. මේ සම්බන්ධව ප්‍රශ්න ගොඩක් තිබෙනවා. මේ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්න කියා අපි ආණ්ඩුවෙන් පැහැදිලිවම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු රුවන් විජේවීර මහතා**
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද මේ සාකච්ඡාව පැවැත්වෙන්නේ, අපේ ජීවිත කාලය තුළ අප මුහුණ දෙන බරපතළම යුදමය අර්බුදයක් ලෝකය පුරා වර්ධනය වෙමින්, එය දිනෙන් දින වෙනස් වෙමින්, ව්‍යාප්ත වෙමින් තිබෙන වකවානුවකයි. විශේෂයෙන් ගත්තොත්, ඒ යුදමය තත්ත්වයත් එක්ක අපේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය සහ එහිදී රජය විධියට අප ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අපි දැඩි අවධානය යොමු කර තිබෙනවා. මිලියන 22ක් පමණ වන අපේ රටේ ආදරණීය ජනතාවගේ ජීවිත සහ ඔවුන්ගේ සමාජ, ආර්ථික වටපිටාව ආදි හැම දෙයක්ම සුරක්ෂිත කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අප අවධානය යොමු කරමින් සිටින මොහොතක්, මේක.

මේ අර්බුදයේ ස්වභාවය තේරුම් ගැනීම විශේෂයෙන්ම වැදගත් වෙනවා. එයට හේතුව මේකයි. අද මේ පාර්ලිමේන්තුවේදී කරන ලද කථාවලින් අපට පැහැදිලි වුණා, මේ අර්බුදයේ ස්වභාවය, මේ අර්බුදය මොන වාගේ අර්බුදයක්ද කියන කාරණාව. ඒ පිළිබඳ යම් ආකාරයක ගැටලුසහගත ප්‍රකාශ විපක්ෂය පැත්තෙන් මතු වුණා. ඒ නිසා මේ අර්බුදයේ නියම ස්වභාවය මොකක්ද කියා අපි විමසා බලමු. The gravity of the conflict that has arisen in the Middle East had been discussed yesterday on the Al Jazeera Media Network. I would like to quote some facts taken from that discussion. "අල්ජසීරා" එක කරපු ඒ discussion එකේ මාතෘකාව වුණේ, "Could the Iran war trigger a global recession?" යන්නයි. ඉරාන යුද්ධය global recession එකක් හෙවත් ගෝලීය ආර්ථික අවපාතයක් දක්වා වර්ධනය විය හැකිද කියන කාරණාව තමයි එහිදී සාකච්ඡා කළේ. එම සාකච්ඡාවේ මූලික කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න මා කැමැතියි. එහිදී සඳහන් කරනවා, "All eyes are on the Strait of Hormuz. The longer it remains closed, the greater the damage to the global economy. Iran continues to block tankers from shipping close to 20 per cent of the world's oil supply" යනුවෙන්. ඉරානය හෝමුස් සමුද්‍ර සන්ධිය වසා දැමීම නිසා ගෝලීය තෙල් සැපයුමෙන් සියයට 20ක් වාගේම ගෑස් සැපයුමද අවහිර කරමින් තිබෙනවා. එහිදී තවදුරටත් කියනවා, "That is roughly twice the disruption the world suffered during the energy shock of the 1970s". 1970දී ලෝකය බලශක්ති අර්බුදයකට මුහුණ දුන්නා. එහිදී ලෝකය අත් විඳපු බාධා මෙන් දෙගුණයකට වඩා වත්මන් අර්බුදයේ බලපෑම විශාල බව කියනවා. ඊත් එක්කම කියනවා, "Big oil shocks have historically led to major economic turmoil,.." - තෙල් අර්බුදයත් එක්ක මතු වන කාරණා හේතුවෙන් ලෝකයේ වෙන්න පුළුවන් වෙනස්කම් ගැන ඔවුන් කියනවා - "......high inflation, stagnation, even recession. Oil and gas prices are already surging and economies are expected to slow." මතු වෙලා තිබෙන මේ ගෝලීය අර්බුදයත් එක්ක ගෝලීය ආර්ථිකයේ බරපතළ විධියේ කැලඹිලිසහගත තත්ත්වයක් නිර්මාණය වෙන්න පුළුවන්, උද්ධමනය වැඩි වෙන්න පුළුවන්, ගෝලීය ආර්ථිකයේ stagnation එකක් - එක තැන නැවතීමක් - වෙන්න පුළුවන් වාගේම එය අවපාතයක් - even recession - දක්වා වර්ධනය වෙන්න පුළුවන් බවත් කියනවා. ඉන්ධන මිල දිනෙන් දින ඉහළ යන බවත්, ඊත් එක්කම ලෝකයේ සමස්ත ආර්ථිකය පසුබෑසීමකට ලක් වෙන්න පුළුවන් බවත් කියනවා. මේක තමයි අද ඇති වෙලා තිබෙන තත්ත්වය. මේ මතු වන ගෝලීය යුදමය තත්ත්වයත් එක්ක රටක් විධියට තීන්දු තීරණ ගන්නේ කොහොමද කියන එක තමයි අප සාකච්ඡා කරන්න ඕනෑ කාරණාව.

අද උදෑසන පාර්ලිමේන්තුවට පැමිණි ගරු ජනාධිපතිතුමා මේ සම්බන්ධව පූර්ණ පැහැදිලි කිරීමක් කළා. මේ බරපතළ අර්බුදයක් පවතින අවස්ථාවේ මධ්‍යස්ථභාවය ආරක්ෂා කර ගනිමින් අප මේ අර්බුදයට මුහුණ දෙන්නේ කොහොමද කියන කාරණාව එතුමා ඉතාම පැහැදිලිව සඳහන් කළා. එසේ සඳහන් කර තිබියදීත් විපක්ෂය පැත්තෙන් මතු වෙච්ච කාරණා කිහිපයකට මේ ගරු සභාවේ අවධානය යොමු කරවමින් ඒ ගැන කෙටියෙන් සඳහන් කරන්න මා කැමැතියි. එතුමන්ලා අපෙන් ප්‍රශ්න කළා, අපේ ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිය ගැන. එතුමන්ලා කථා කළා අපේ ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය පිළිබඳව. එතුමන්ලා කිව්වා, "The present Government is having an unfair foreign policy" යනුවෙන්. අපේ විදේශ ප්‍රතිපත්තිය "unclear and unfair" කියලා අද උදේ කිව්වා.

ඇත්තටම අපේ විදේශ ප්‍රතිපත්තිය මොකක්ද? "IRIS Dena" සහ "IRIS Bushehr" කියන නෞකා දෙක සම්බන්ධයෙන් ඇති වුණු තත්ත්වය මොකක්ද? ඒ වෙලාව වනකොට ලෝකය තුළ tension එක බරපතළ ලෙස වැඩි වෙමින් තිබුණා. ඒ වෙලාවේ අපි මොකක්ද කළේ? ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අපට සිටින උපදේශකයන් - ඒ සම්බන්ධයෙන් අපට උපදෙස් ලබා දෙන අය -

[ගරු රුවන් විජේවීර මහතා]

වාගේම අපේ ගරු ජනාධිපතිතුමා ප්‍රධාන ආණ්ඩුවේ ඒ සම්බන්ධයෙන් වග කිව යුතු පාර්ශ්ව ඇතුළු සියලුදෙනා එකතු වෙලා ඒ සම්බන්ධයෙන් ගත හැකි හොඳම තීන්දුව ගත්තා. අන්තර්ජාතික නීතිවලට අනුකූලව, අන්තර්ජාතික වශයෙන් අප අත්සන් කර තිබෙන agreementsවලට අනුකූලව, ඒ සියල්ල මත පදනම් වෙමින් අපේ රටේ ජනතාවගේ පැත්තෙන් හිතලා ගත හැකි හොඳම තීන්දුව ගත්තා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගෝලීය වශයෙන් මෙවැනි බරපතළ ආපදාවක් මතු වෙලා තිබෙන වෙලාවක ඕනෑම රටක් ඉස්සෙල්ලාම හිතන්නේ තමන්ගේ රටේ ජනතාව ගැනයි. ඒ නිසා ආණ්ඩුව විධියට අපි අපේ රටේ ජනතාවට වෙන්න පුළුවන් අවම හානිය ගැන නිතරම කල්පනා කරනවා; අපේ රටේ ජනතාවගේ ජීවිත සුරක්ෂිත කරන්න සහ ඔවුන්ගේ ජීවිත වඩා යහපත් ආකාරයෙන් යාවත්කාලීන කිරීම ගැන කල්පනා කරනවා. ඒ අනුව තීන්දු තීරණ අරගෙන අපි ඒ පළමු නැව වන "IRIS Dena" නෞකාවේ හිටපු තිස්දෙදෙනෙකු බේරා ගත්තා, අසූහතරදෙනෙකුගේ bodies අරගෙන ආවා. අප ඒ මොහොතට අදාළව ජාත්‍යන්තර නීතිවලට අනුව ක්‍රියා කරන කොට, ඒ වෙලාවේ ඒ ගැන මුළු ලෝකයේම අවධානය බරපතළ විධියට යොමු වුණා.

ඊට පස්සේ "IRIS Bushehr" නෞකාව අපේ රටට ගන්නවාද, නැද්ද කියන කාරණාව දිහාත් මුළු ලෝකයම බලාගෙන සිටියා. අපි මොකක්ද කළේ? ඒ සම්බන්ධයෙන් නිවැරදි උපදෙස් අරගෙන, ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් අපට උපදෙස් දෙන කණ්ඩායමේ උපදෙස් අරගෙන, අපේ ආරක්ෂක කවුන්සලයේත් උපදෙස් අරගෙන, අප සියලුදෙනා එක්ව ඒ සම්බන්ධයෙන් පවත්වපු ඉතාම හොඳ සාකච්ඡාවකින් අනතුරුව ඒ මොහොතට අදාළව ගන්න තිබුණු හොඳම සහ වැදගත්ම තීරණය ගත්තා. ඒ තීරණය ගත්තාට පස්සේ ඉරානය පැත්තෙන්, ඇමෙරිකා එක්සත් ජනපදය පැත්තෙන් විතරක් නොවෙයි, ගෝලීය වශයෙනුත් එය අගය කිරීමකට - globally appreciate කිරීමකට - ලක් වුණා, අප ගත් තීන්දුව ඉතාම හොඳ තීන්දුවක් කියලා. ශ්‍රී ලංකාව තමන්ගේ ස්වාධිපත්‍යය සහිතව, තමන්ගේ ගෞරවනීයභාවය තියාගෙන තීන්දුවක් ගත්තා කියලා ලෝකයෙන් ප්‍රශංසාවක් ලැබුණා. හැබැයි, අද උදේ කථා කරපු කබීර් හෂීම් මන්ත්‍රීතුමා මොකක්ද කිව්වේ? ඒ වෙලාවේ අපි නිවැරදිව වැඩ කළේ නැහැ කිව්වා. අප මේ ප්‍රශ්නය ඉතාම ධනාත්මකව කළමනාකරණය කරලා තිබියදීත් International Humanitarian Law එක යටතේ අපව ප්‍රශ්න කරන්න පුළුවන් කියලා මේ ප්‍රශ්නය වෙන තැනකට අරගෙන යන්න උත්සාහ කළා.

ගෝලීය වශයෙන් අද මතු වෙලා තිබෙන්නේ බරපතළ යුද්මය තත්ත්වයක්. කුඩා ආර්ථිකයක් සහිත රටක් වන අපේ රට, ඒ වාගේම ඉතාම වැදගත් ස්ථානයක පිහිටා තිබෙන අපේ රට, උපායමාර්ගිකව සහ ඉතාම හොඳින් කටයුතු කළමනාකරණය කරමින් යනකොට, ඒ ගැන ප්‍රශ්න කරන තත්ත්වයක් හදලා ඒක ඇතුළේ ජාත්‍යන්තර වශයෙන් අපට අර්බුදයක් හදන්න පුළුවන්ද කියලා තමයි විපක්ෂය පැත්තෙන් මෙතැන සාකච්ඡා කළේ. ඒ නිසා අපි කනගාටු වෙනවා, මේ වගේ අවස්ථාවක එවැනි ප්‍රකාශ කරපු එක ගැන.

ඒ වාගේම තමයි, විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේදී කිව්වා, අපේ රටේ සමුද්‍රීය කලාපීය දැනුවත්භාවය සම්බන්ධයෙන් USAත් එක්ක Agreement එකක් sign කරලා තිබෙනවා කියලා. ජනාධිපතිතුමා කිව්වා, සමුද්‍රීය කලාපීය දැනුවත්භාවය කියන්නේ ඒ Agreement එකේ තිබෙන එක කාරණයක් කියලා. එහෙම කිව්වාට පස්සේ විපක්ෂ නායකතුමා අහපු ප්‍රශ්නය තමයි, සමුද්‍රීය කලාපීය දැනුවත්භාවය තිබුණා නම්, එතැනදී ඇමෙරිකාව විසින් ඉරාන නෞකාවට පහර දෙන බව අපට කිව්වේ නැත්තේ ඇයි කියන එක. අපට ඒ ගැන කිව්වාද කියලා එතුමා ඇහුවා. එතැනින් මතු වන තර්කය මොකක්ද? What is the logic behind what the Hon. Leader of the Opposition is trying to say? මොකක්ද, Hon. Leader of the Opposition කියන්න හදන්නේ? අද වනකොට තිබෙන නවීන යුද්මය තත්ත්වයන් - modern warfare - එක්ක ගත්තොත් ඇති වෙලා තිබෙන්නේ undeclared war එකක්. සාමාන්‍යයෙන් ගත්තොත්, declare කරලා පහර දීමක් නොවෙයි අද කරන්නේ. Undeclared war එකක් අද තිබෙන්නේ. එතැනදී රටක් තව රටකට පහර දෙනකොට ඒක කිය කියා ඉන්නේ නැහැ. එහෙම බැලුවොත්, ඕනෑම කෙනෙකුගේ සරල බුද්ධියට වුණත් තේරෙනවා, එහෙම එකක් වෙන්නේ නැහැ කියන කාරණය.

ඒ වාගේම විපක්ෂ නායකතුමා කිව්වා, අපේ ආණ්ඩුව tourism සම්බන්ධයෙන් අවධානය යොමු කරලා නැහැ කියන කාරණාව. අපේ ආණ්ඩුව tourism සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. අපේ රටේ ආර්ථිකයේ බරපතළ කොටසක්; බරපතළ ගුරුත්වයක් tourism කියන එකට තිබෙනවා කියලා අපි දන්නවා. ඒක නිසා අපි tourism සම්බන්ධයෙන් විශේෂ තීන්දු තීරණ ගණනාවක් අපි අරගෙන තිබෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, introducing a special QR code system for vehicles of the tourism sector and those relating to hotel operations, doubling the normal vehicle fuel quota for eligible tourism entities, introducing a dedicated fuel arrangement for hotel generators and allowing priority access for independent tourists upon presentation of passport and visa details වැනි තීන්දු අරගෙන තිබෙනවා. ඒ වාගේම, සංචාරක කර්මාන්තය ඉතා හොඳින් පවත්වාගෙන යෑම සඳහා හෝටල් කර්මාන්තයට, සංචාරකයන්ට, සංචාරක සේවා සපයන ආයතනවලට ඉන්ධන ලබා දීමේ සිට එම සේවා වඩා හොඳින් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන්නට කමිටු පිහිටුවලා, ඒවාට උපදෙස් ලබා දීලා, සියලු දැනුවත් කිරීම් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

තව එක ප්‍රශ්නයක් ඇහුවා දුප්පත් අය පිළිබඳව. මෙවැනි ගෝලීය අර්බුදයක් ඇති වෙනකොට ඉන්ධන මිල ඉහළ යන්න පුළුවන්. ඒත් එක්කම භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යන්න පුළුවන්. ආර්ථිකයේ යම් යම් වෙනස්කම් බරපතළ විධියට වෙන්න පුළුවන්. ඒක සාමාන්‍ය තත්ත්වය. එවැනි සාමාන්‍ය තත්ත්වයක් යටතේ සමාජයේ ඉලක්කගත කණ්ඩායම් ඉන්නවා. ඒ කණ්ඩායම්වල ආර්ථික මට්ටම බරපතළ විධියට පහළ වැටෙන්න පුළුවන්. ඒ නිසා ඒ ගැන ඉතා හොඳ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඔවුන් සඳහා විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. මේ තත්ත්වය කළමනාකරණය සඳහා ආණ්ඩුව පැත්තෙන් ජනාධිපතිවරයාගේ මූලිකත්වයෙන් ආර්ථික ආවේක්ෂණ කමිටුව - Economic Surveillance Committee - කියලා ප්‍රධාන කමිටුවක් නිර්මාණය කරලා තිබෙනවා. ජනාධිපතිවරයා, ආර්ථිකය සම්බන්ධ උපදෙස් සපයන්නන්, ආරක්ෂාව සම්බන්ධ උපදෙස් සපයන්නන් ඇතුළු සියලුදෙනා මේ කමිටුව නියෝජනය කරනවා. මේ කමිටුව දෛනිකව රැස්වෙමින්, සමහර වෙලාවට එක දිනයක අවස්ථා දෙකක රැස්වෙමින් කටයුතු කරනවා.

ආර්ථිකය සම්බන්ධව අපට තිබෙන මූලිකම කාරණාව තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ ආර්ථිකය 2025දී අත්පත් කර ගන්නා ලද ජයග්‍රහණ, ආර්ථික ස්ථාවරභාවයේ ඇතිකරගෙන තිබෙන ස්වභාවය ඒ ආකාරයෙන්ම ඉදිරියට පවත්වාගෙන යන්නට උපරිම උත්සාහ කිරීම. උපරිම උත්සාහ කරන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. සෞඛ්‍යය, airport, වරාය වැනි අත්‍යවශ්‍ය සේවා ටික අපි නිවැරදිව නඩත්තු කරගෙන යන්න

ඕනෑ. ඒ වාගේම කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, කර්මාන්ත වැනි ක්ෂේත්‍ර තිබෙනවා. ආර්ථිකයේ පණ නල ගැට ගැහිලා තිබෙන්නේ එවැනි ක්ෂේත්‍ර එක්ක. ඒ ක්ෂේත්‍ර ඉදිරියට පවත්වාගෙන යන්න අවශ්‍ය සහයෝගය දෙන්න ඕනෑ. ඒ සම්බන්ධව ආර්ථික ආවේක්ෂණ කමිටුව - Economic Surveillance Committee එක - කටයුතු කරමින් තිබෙනවා. ඒ කමිටුවත් එක්ක තවත් අනුකමිටු හතරක් හදලා තිබෙනවා. ඒ අනුකමිටු හතර ඇතුළේ අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් යුත්, රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා වන අනුකමිටුවක් තිබෙනවා.

ඒ වාගේම බලශක්ති සැපයුම ගත්තොත්, බලශක්තිය තමයි අපේ ආර්ථිකයේ ජීව රුධිරය බවට පත් වෙලා තිබෙන්නේ. අපේ රට විතරක් නොවෙයි, මුළු ලෝකයම ඉදිරියට ධාවනය කරවන ජීව රුධිරය වෙන්නේ බලශක්තියයි. ජනතාවට බලශක්තිය අඛණ්ඩව සැපයීම සඳහා අනුකමිටුවක් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම අත්‍යවශ්‍ය සේවා නඩත්තු කිරීම සඳහා අනුකමිටුවක් සකස් කරලා තිබෙනවා.

ඒ වාගේම සුබසාධන කටයුතු ඉදිරියට පවත්වාගෙන යන්නේ කොහොමද, සුබසාධනය ඉදිරියට පවත්වාගෙන යන්නේ කොයි ආකාරයෙන්ද කියන කාරණා සඳහා Welfare Support Committee එක සකස් කරලා තිබෙනවා. අර ඉලක්කගත කණ්ඩායම්, විශේෂයෙන් ආර්ථිකයෙන් හැලෙන්න පුළුවන් කණ්ඩායම්, මේ රටේ ඉන්න දුප්පත් ජනතාව වෙනුවෙන් කුමන ආකාරයේ සහනාධාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුද කියන කාරණාව සඳහා තමයි ඒ කමිටුව සකස් කරලා තිබෙන්නේ.

ඒ වාගේම මහ බැංකුව සෑම දින දෙකකට වරක් රැස්වෙමින් ආර්ථිකයේ සිදුවන වෙනස්කම්, ගෝලීය වශයෙන් සිදුවෙන වෙනස්කම් සියල්ල එකට අරගෙන අපි කොයි ආකාරයෙන්ද ඉදිරියට යා යුත්තේ කියන කාරණාව සාකච්ඡා කරමින් තිබෙනවා.

මම අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. අපි බරපතළ තත්ත්වයකට මුහුණ දීලා තිබෙනවා. අපට මිලියන 22ක ජනතාවගේ ජීවිත සම්බන්ධ වගකීමක් තිබෙනවා. අපට අත්‍යවශ්‍ය සේවා නඩත්තු කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ජන ජීවිත ඉතා හොඳින් පවත්වාගෙන යන්න අවශ්‍ය කරන සියලු සහාය ලබා දීමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. එවැනි අවස්ථාවක තෙල් පෝලිම් ඇති වෙයි, ගෑස් ටික නැති වෙයි, අවුරුදු කන්න බැරි වෙයි, කිසි දෙයක් කරගන්න බැරි වෙයි, ආර්ථිකය බරපතළ විධියට කඩාගෙන වැටිලා උන් හිටිතැන් නැති වෙයි වාගේ චෝදනා කරන්නේ නැතිව, ඊට වඩා වැදගත්කමකින්, ඊට වඩා වගකීමකින්, ඊට වඩා ගෞරවනීයභාවයකින් යුතුව කටයුතු කිරීමේ වගකීම විපක්ෂයට තිබෙනවා. ඒ වෙනුවෙන් සියලුදෙනා එකතු වෙන්න කියන කාරණාව මතක් කරමින් මා නිහඬ වෙනවා.

ස්තූතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.35ට, 2026 අප්‍රේල් 07වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.35க்கு, பாராளுமன்றம் 2026 ஏப்பிரல் 07, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.35 p.m until 9.30 a.m. on Tuesday, 07th April, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.